පාඨමාලාව	මාධ්‍යය	පළමු වසර		දෙවන වසර		තෙවන වසර		සිවුවන වසර		පස්වන වසර		උපාධිලත් සංඛ්‍යාව	
		2021	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**
වෛද්‍ය විද්‍යාවේදී	ඉ	224	225	190	224	190	190	380	381	190	189	189	199
භෞතවේදය පිළිබඳ විද්‍යාවේදී	ඉ	43	47	28	34	30	29	39	29	-	-	28	-
සෞඛ්‍ය අධ්‍යයන විද්‍යාවේදී	ඉ	-	-	-	-	-	-	-	-	-	-	-	2
එකතුව		**267**	**272**	**218**	**258**	**220**	**219**	**419**	**410**	**190**	**189**	**217**	**201**

ඇ. පශ්චාත් උපාධි

පාඨමාලාව	මාධ්‍යය	බඳවා ගැනීම් (2022 ලියාපදිංචි වූ නව සිසුන් සංඛ්‍යාව)	වත්මන් ශිෂ්‍ය සංඛ්‍යාව(දැනට සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව **2022**
සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය සහ රෝගීන්ගේ ආරක්ෂාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	35	34
ස්ත්‍රී පුරුෂ භාවය සහ සෞඛ්‍යය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	12	11
සෞඛ්‍ය සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	35	57
රසායනාගාර ඝත්ව විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ඉංග්‍රීසි	00	16
අණුක ව්‍යාධි විද්‍යාව පිළිබඳ විද්‍යාපති	ඉංග්‍රීසි	03	08
ජාත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ විද්‍යාපති	ඉංග්‍රීසි	28	28
දර්ශනපති	ඉංග්‍රීසි	4	31
දර්ශනසූරී	ඉංග්‍රීසි	-	20
එකතුව		**117**	**205**

ඈ. විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර:

පාඨමාලාව	මාධ්‍යය	බඳවා ගැනීම් - **2022**	පළමු වසර සිසුන් උ. පෙ/ **2020**	දෙවන වසර සිසුන් උ. පෙ / **2019**	තෙවන වසර සිසුන් උ. පෙ / **2018**	සිවුවන වසර සිසුන් උ. පෙ / **2017**	සිවුවන වසර සිසුන් උ. පෙ / **2016**	අවසන් වසර සිසුන් උ. පෙ / **2015**	උපාධිලත් සංඛ්‍යාව **2022**
එම් බී බී එස්	ඉංග්‍රීසි	17	17	13	15	13	7	7	9
එකතුව		**17**	**17**	**13**	**15**	**13**	**7**	**7**	**9**

ඉ. අධ්‍යයන කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	සහාය මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	ආධුනික කථිකාචාර්ය	එකතුව
17	49	01	64	19	21	171

ඊ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය :

ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ	කනිෂ්ඨ	සුලු සේවක	කොන්ත්‍රාත්	එකතුව
18	50	84	92	38	282

උ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂයය	ප්‍රකාශයට පත්කළ		ඉදිරිපත් කළ	
	2021	**2022**	**2021**	**2022**
අ. පර්යේෂණ සංඛ්‍යාව	172	166	181	91
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	3	-	-	-
ඇ. වාරසඟරා ලිපි සංඛ්‍යාව	246	182	8	32
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	16	17	2	-
ඉ. ලිපි සංඛ්‍යාව	35	5	1	-
උ. ග්‍රන්ථ පරිච්ඡේද සංඛ්‍යාව	-	28	-	-
ඌ. වෙනත්	26	2	51	15
එකතුව	**498**	**400**	**243**	**138**

උ. පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු

විෂයය	සහභාගී වූ		සම්පූර්ණ කළ		ඉදිරිපත් කිරීම් කළ	
	2021	2022	2021	2022	2021	2022
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	23	3	10	-	51	2
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සංඛ්‍යාව	2	1	5	3	19	2
ඇ.උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	1	-	23	-
ඈ.ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව	-	-	-	-	10	10
ඉ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	5	-	1	-	16	11
ඊ.වෙනත්	60	6	2	-	22	10
එකතුව	**90**	**10**	**19**	**03**	**141**	**35**

එ. ලැබුණු සම්මාන පිළිබඳ තොරතුරු

විෂයය	සම්මාන සංඛ්‍යාව		ආචාර්යවරුන් සංඛ්‍යාව		ශිෂ්‍ය සංඛ්‍යාව	
	2021	2022	2021	2022	2021	2022
අ. දේශීය සම්මාන	152	222	82	108	03	29
ආ. ජාතික සම්මාන	18	15	21	14	01	00
ඇ.අන්තර්ජාතික සම්මාන	04	13	03	07	03	17
ඈ. වෙනත්	03	01	01	01	10	00
එකතුව	**177**	**251**	**107**	**130**	**17**	**46**

ඒ. අරඹන ලද නව පාඨමාලාවල විස්තර:

පාඨමාලාව	මාධ්‍යය	කාලසීමාව	පාඨමාලා වර්ගය (ප.උ. ඩිප්./ දෙවන උපාධි(දර්ශනපති/ දර්ශනසූරී)
ඛෘත්තිය සෞඛ්‍යය සහ ආරක්ෂාව විද්‍යාපති	ඉංග්‍රීසි	වර්ෂ 2	විද්‍යාපති

ඔ. පීඨයේ නව මධ්‍යස්ථාන / ඒකක පිළිබඳ විස්තර

මධ්‍යස්ථානය / ඒකකය	ස්ථාපිත දිනය
පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදන සඳහා වන මධ්‍යස්ථානය (CDRI – UCFM)	14/09/2022
භාවනා පර්යේෂණ මධ්‍යස්ථානය	17/02/2022

2.7 විද්‍යා පීඨය

දැක්ම

ජාතිකව සහ ජාත්‍යන්තරව විද්‍යා සහ තාක්ෂණ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

මෙහෙවර

ජාතියේ සංවර්ධනය උදෙසා දායකවීමේ දැක්මක් සහිතව රාජ්‍ය සහ පෞද්ගලික අංශ සහ පොදුවේ සමාජය සමග අන්තර්ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කරන ඉතා ඉහළ ශිෂ්ට විඥානයකින් සහ විශ්ලේෂණ හැකියාවෙන් හෙබි බහු විෂයික දැනුමෙන් සහ නිර්මාණාත්මක චින්තනයකින් යුක්ත අවංක සහ ස්ථානයට උචිත උත්පාදක ශක්තියෙන් යුත් පුරවැසියන් බිහිකිරීම හා සම්පත් සහ යටිතල පහසුකම් වර්ධනය සඳහා අවශ්‍ය සම්බන්ධතා යාන්ත්‍රණ ආයතනගත කිරීම.

රසායන විද්‍යාව, ගණිතය, න්‍යෂ්ටික විද්‍යාව, භෞතික විද්‍යාව, ශාක විද්‍යාව, සංඛ්‍යාලේඛන සහ සත්ත්ව විද්‍යාව සහ පරිසර විද්‍යාව යන අධ්‍යයන අංශ හතක් සමඟ අඛණ්ඩව ක්‍රියාත්මක වන විද්‍යා පීඨය බොහෝ විෂය ක්ෂේත්‍රයන්හි විද්‍යාවේදී උපාධිය (BSc) පිරිනමයි. වසර තුනක උපාධි වැඩසටහන සඳහා පුළුල් පරාසයක විෂය සංයෝජන ලබා ගත හැකි අතර (ක්‍රෙඩිට් 90) ගෞරව උපාධි වැඩසටහන් (වසර හතරක කාලසීමාව- ක්‍රෙඩිට් 120) බොහෝ තේමාත්මක ක්ෂේත්‍රවල පවතී. පීඨය විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල සමඟ එක්ව සියලුම සිසුන් සඳහා විෂයයක් ලෙස පරිගණනය සපයන අතර ඒකාබද්ධ ගෞරව උපාධි වැඩසටහන් කිහිපයක් ද පිරිනමයි. පීඨයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU) විසින් පවත්වනු ලබන වැඩසටහන් සිසුන්ට කාර්මික නිරාවරණය ලබා ගැනීමට සහ ඔවුන්ගේ මෘදු කුසලතා වර්ධනය කර ගැනීමට සහය වීමට අවස්ථාව සලසා දෙයි.

අ. මානව සම්පත් පිළිබඳ විස්තර

මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ප්‍ර. උ. සහ ප.උ.)		මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය		මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය	
2021	**2022**	**2021**	**2022**	**2021**	**2022**
2759	3000	118	118	103	108

ආ. ප්‍රථම උපාධි

පාඨමාලාව	මාධ්‍යය	පළමු වසර		දෙවන වසර		තෙවන වසර		සිවුවන වසර		උපාධි ලත් සංඛ්‍යාව	
		2021	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**
විද්‍යාවේදී සාමාන්‍ය	ඉ	564	624	489	540	475	480	341	382	444	416
විද්‍යාවේදී විශේෂ											

ඇ. පශ්චාත් උපාධි

පාඨමාලාව	මාධ්‍යය	බඳවා ගැනීම් (2022 ලියාපදිංචි වූ නව සිසුන් සංඛ්‍යාව)	වත්මන් ශිෂ්‍ය සංඛ්‍යාව(දැනට සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව **2022**
ප.උ. ඩිප්ලෝමා	ඉංග්‍රීසි	-	-
විද්‍යාපති	ඉංග්‍රීසි	303	764
දර්ශනපති	ඉංග්‍රීසි	18	139
දර්ශනසූරී	ඉංග්‍රීසි	12	71
එකතුව		**333**	**974**

ඇ. විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර:

පාඨමාලාව	මාධ්‍යය	බඳවා ගැනීම් - 2022	පළමු වසර සිසුන්	දෙවන වසර සිසුන්	තෙවන වසර සිසුන්	සිවුවන වසර සිසුන්	**2022** උපාධි ලත් සංඛ්‍යාව
වෛද්‍ය භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාපති	ඉංග්‍රීසි	02	-	-	-	-	01
එකතුව		**02**	**-**	**-**	**-**	**-**	**01**

ඉ. අධ්‍යයන කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	සහාය මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	ආධුනික කථිකාචාර්ය	එකතුව
13	23	00	62	11	09	118

ඊ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ	කනිෂ්ඨ	සුලු සේවක	එකතුව
08	04	42	54	108

එ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂයය	ප්‍රකාශයට පත්කළ		අලෙවි කළ		ඉදිරිපත් කළ	
	2021	**2022**	**2021**	**2022**	**2021**	**2022**
අ. පර්යේෂණ සංඛ්‍යාව	165	04	-	-	23	16
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	09	03	01	-	-	-
ඇ. වාරසඟරා ලිපි සංඛ්‍යාව	208	241	-	-	43	02
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	10	08	-	-	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	20	29	-	-	16	33
ඊ. වෙනත්	81	38	-	-	97	14
එකතුව	**493**	**323**	**01**	**-**	**179**	**65**

ඒ. පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු :

විෂයය	සහභාගී වූ		සම්පූර්ණ කළ		ඉදිරිපත් කළ	
	2021	**2022**	**2021**	**2022**	**2021**	**2022**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	01	03	05	02	05	03
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සංඛ්‍යාව	-	01	01	-	-	-
ඇ.උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	-	-	-	-
d. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව	04	01	02	-	-	01
ඉ. වෙනත්	70	03	-	-	59	01
එකතුව	**75**	**08**	**08**	**02**	**64**	**05**

ඔ. ලැබුණු සම්මාන පිළිබඳ තොරතුරු :

විෂයය	සම්මාන සංඛ්‍යාව		ආචාර්යවරුන් සංඛ්‍යාව		ශිෂ්‍ය සංඛ්‍යාව	
	2021	**2022**	**2021**	**2022**	**2021**	**2022**
අ. දේශීය සම්මාන	12	54	06	33	02	-
ආ. ජාතික සම්මාන	09	13	04	09	03	09
ඇ.අන්තර්ජාතික සම්මාන	02	03	02	01	-	01
ඈ. වෙනත්	04	01	03	02	03	-
එකතුව	**27**	**71**	**15**	**45**	**08**	**10**

ඕ. **2022** අරඹන ලද නව පාඨමාලාවල විස්තර:

අධ්‍යයන අංශය	පාඨමාලාව	මාධ්‍යය	කාලසීමාව	පාඨමාලා වර්ගය (ප.උ. ඩිප්./ දෙවන උපාධි/ දර්ශනපති/ දර්ශනසූරී)
සත්ව විද්‍යා අධ්‍යයන අංශය	ප්‍රතිශක්තිවේදය සහ අණුක ජීව විද්‍යාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව	ඉංග්‍රීසි	මාස 3	උසස් සහතික පත්‍ර පාඨමාලාව
සත්ව විද්‍යා අධ්‍යයන අංශය	පරිසරය, සංවර්ධනය සහ තිරසාර බව පිළිබඳ විද්‍යාවේදී (බාහිර).	ඉංග්‍රීසි	වර්ෂ 3	ප්‍රථම උපාධි
භෞතික විද්‍යා අධ්‍යයන අංශය	තාරකා විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	ඉංග්‍රීසි	මාස 4	සහතික පත්‍ර පාඨමාලාව
සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා බහුවිධ දත්ත විශ්ලේෂණය පිළිබඳ කණ්ඩායම් පුහුණු වැඩසටහන	ඉංග්‍රීසි	පැ. 30	සහතික පත්‍ර පාඨමාලාව

පීයයේ අනෙකුත් වැදගත් කරුණු

<u>කාර්ය මණ්ඩලය ලද ජයග්‍රහණ</u>

- 2020 සහ 2021 වර්ෂයන් උදෙසා වන පර්යේෂණ විශිෂ්ටතා උපකුලපති සම්මානය සඳහා පිළිවෙළින් පහත සඳහන් ආචාර්යවරුන් නාමයෝජනා ලබා ඇත.

➢ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.එම්.එන් ද සිල්වා, රසායන විද්‍යා අධ්‍යයන අංශය - 2020
➢ මහාචාර්ය එස්.එස්.එන්.පෙරේරා, ගණිත අධ්‍යයන අංශය - 2021

- භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය කේ. පී. එස්. සී. ජයරත්න 3 වැනි ජාතික ඇපෙක්ස් සම්මාන උළෙලේදී සහ වෘත්තීය සංගම් සංවිධානයේ (OPA) 35 වැනි වාර්ෂික සමුළුවේ සමාරම්භයේදී විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීය විශිෂ්ඨත්වය ඇගයීම සඳහා වන 2022 ජාතික ඇපෙක්ස් යාවජීව සම්මානයෙන් පිදුම් ලබා ඇත.

- භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය ඩබ්. ඒ. එම් මාධවී සහ ආචාර්ය ලක්මාල් වීරරත්න යන ආචාර්යවරුන්ට TWAS පර්යේෂණ ප්‍රදාන දෙකක් ප්‍රදානය කර ඇත.

- 2020 වර්ෂය සඳහා පර්යේෂණ විශිෂ්ඨත්වය සහ අධ්‍යයන කටයුතු උදෙසා පහත ආචාර්යවරුන්ට පීඨ සම්මාන ප්‍රදානය කරන ලදී . (2022 දී පැවැත්විණි.)

පර්යේෂණ විශිෂ්ඨත්වය සඳහා වන පීඨ සම්මාන

➢ ආචාර්ය ජී එන් සිල්වා	රසායන විද්‍යා අධ්‍යයන අංශය
➢ ආචාර්ය එච්.අයි.සී.එම්. ද සිල්වා	රසායන විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය ජී.එහෙට්ටිආරච්චි	රසායන විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය ඩබ්.ආර්.එම් ද සිල්වා	රසායන විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය කේ.එම්.එන්.ද සිල්වා	රසායන විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය ආර්.එස්.දසනායක	රසායන විද්‍යා අධ්‍යයන අංශය
➢ ආචාර්ය එම්.එන්.කෙෆමාල්	රසායන විද්‍යා අධ්‍යයන අංශය
➢ ආචාර්ය ඩී.එල්.වීරවර්ධන	භෞතික විද්‍යා අධ්‍යයන අංශය
➢ ඩී. ඩී. සී. වික්‍රමරත්න මහතා	භෞතික විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය ඩී.යූ.ජේ. සොන්නාදර	භෞතික විද්‍යා අධ්‍යයන අංශය
➢ ආචාර්ය එම්. ජයනන්ද	භෞතික විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය කේ. පී. එස්. සී. ජයරත්න	භෞතික විද්‍යා අධ්‍යයන අංශය
➢ .මහාචාර්ය සී.එම්.නානායක්කාර	ශාක විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය එස්.එස්.එන්.පෙරේරා	ගණිතය අධ්‍යයන අංශය
➢ ආචාර්ය එම්.කේ.ඒ.සී.මහසිංහ	ගණිතය අධ්‍යයන අංශය
➢ මහාචාර්ය එම්.ආර්.සූරියආරච්චි	සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය
➢ ආචාර්ය එස්.ඩී. විශ්වකුල	සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය
➢ ආචාර්ය ආර්.එන්.එම්.ජලාල්ඩීන්	සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය අයි.සී.පෙරේරා	සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
➢ ආචාර්ය ජී ගල්හේන	සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය සී.ඩී. දංගල්ල	සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය ඊ.වයි.කේ ලොකුපිටිය	සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය එම්.ආර්.විජේසිංහ	සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
➢ මහාචාර්ය පී උඩගම	සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය

ශාස්ත්‍රීය ප්‍රවේශය සඳහා වන පීඨ සම්මාන

- ආචාර්ය එච්.අයි.සී. ද සිල්වා — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය කේ.ජී.ඩී.ඒ.ඩී.තිලකරත්න — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එල්. එච්. ආර්. පෙරේරා — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය ජී. එච්. සී. එම්. හෙට්ටිආරච්චි — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එම්.එන්.කෞමාල් — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය කේ. පී. එස්. සී. ජයරත්න — භෞතික විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එස්. විශ්වකුල — සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ආර්.ඒ.බී.අබේගුණවර්ධන — සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය එස්.එම්.ඩබ්.රන්වල — ශාක විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එච්.අයි.යූ. කල්දේරා — ශාක විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය ඩී වික්‍රමසිංහ — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය

- පහත සම්මානලාභීන්ට 2020 සහ 2021 වර්ෂ සඳහා පර්යේෂණ විශිෂ්ටතාව වෙනුවෙන් සනාතන සම්මාන පිරිනමන ලදී. (ගූගල් ස්කොලර් උද්ධෘත මත පදනම්ව 2022 දී පවත්වන ලදී).

2020 පර්යේෂණ විශිෂ්ටතා සනාතන සම්මාන.

<u>සාමාන්‍ය සම්මාන</u>

හොඳම සම්මානලාභීන් දෙදෙනා

- මහාචාර්ය ඩී.යූ.ජේ. සොන්නාදර — භෞතික විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය කේ.එම්.එන්.ද සිල්වා — රසායන විද්‍යා අධ්‍යයන අංශය

අනෙකුත් සම්මානලාභීන්

- මහාචාර්ය ජී. එච්. සී. එම්. හෙට්ටිආරච්චි — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය ඩබ්.ආර්.එම් ද සිල්වා — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එච්.අයි.සී. ද සිල්වා — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එම්.එන්.කෞමාල් — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය කේ. පී. එස්. සී. ජයරත්න — භෞතික විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය සී.එම්.නානායක්කාර — ශාක විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය එස්.එම්.ඩබ්.රන්වල — ශාක විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය එස්.එස්.එන්.පෙරේරා — ගණිතය අධ්‍යයන අංශය
- මහාචාර්ය එම්.ආර්.සූරියආරච්චි — සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එස්.ඩී. විශ්වකුල — සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය පී.එන්.දයාවංශ — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය අයි.සී.පෙරේරා — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය සී.ඩී දංගල්ල — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය ඊ.වයි.කේ. ලොකුපිටිය — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය එම්.ආර්.විජේසිංහ — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය පී උඩගම — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය එස්.එස්.සෙනෙවිරත්න — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ජී ගල්හේන — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය

<u>ආරම්භක වෘත්තීය සම්මාන</u>

හොඳම සම්මානලාභියා

- ආචාර්ය එස් අමරසේකර — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය

අනෙකුත් සම්මානලාභීන්

- ආචාර්ය එස්.එම්.විතානාරච්චි — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ඩබ්.ඒ.එම්.මාධවී — භෞතික විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ඩී.එල්.වීරවර්ධන — භෞතික විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එම්.කේ.ඒ.සී.මහසිංහ — ගණිතය අධ්‍යයන අංශය

පර්යේෂණ විශිෂ්ටතා සඳහා වන සනාතන සම්මාන 2021

<u>සාමාන්‍ය සම්මාන</u>

හොඳම සම්මානලාභීන් දෙදෙනා

- මහාචාර්ය ඩී.යූ.ජේ. සොන්නාදර — භෞතික විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය කේ.එම්.එන්.ද සිල්වා — රසායන විද්‍යා අධ්‍යයන අංශය

අනෙකුත් සම්මානලාභීන්

- මහාචාර්ය ජී. එච්. සී. එම්. හෙට්ටිආරච්චි — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය ඩබ්.ආර්.එම් ද සිල්වා — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය කේ.ආර්.ආර් මහානාම — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය සී.ඩී.විජයරත්න — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එස්.එම්.විතානාරච්චි — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එල්.ආර්. එච්. පෙරේරා — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එම්.එන්.කෞමාල් — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය කේ. පී. එස්. සී. ජයරත්න — භෞතික විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය සී.එම් එදිරිසිංහ — භෞතික විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ඩී.ආර්.ජයසුන්දර — භෞතික විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය සී.එම්.නානායක්කාර — ශාක විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එච්.එස්.කත්‍රිආරච්චි — ශාක විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එච්.ඩී.ඩී. බන්දුප්‍රිය — ශාක විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය එස්.එස්.එන්.පෙරේරා — ගණිතය අධ්‍යයන අංශය
- මහාචාර්ය එම්.ආර්.සූරියආරච්චි — සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එස්.ඩී. විශ්වකුල — සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය අයි.සී.පෙරේරා — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය සී.ඩී දංගල්ල — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය ඊ.වයි.කේ. ලොකුපිටිය — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය පී.වී.උඩගම — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය එස්.එස්.සෙනෙවිරත්න — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- මහාචාර්ය ඩී වික්‍රමසිංහ — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ඩී හල්වතුර — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ජී ගල්හේන — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ජේ ජෙයසුගීදන් — නෘෂ්ටික විද්‍යා අධ්‍යයන අංශය

<u>ආරම්භක වෘත්තීය සම්මාන</u>

හොඳම සම්මානලාභියා

- ආචාර්ය එස් අමරසේකර — සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශය

අනෙකුත් සම්මානලාභීන්

- ආචාර්ය ජී එන් සිල්වා — රසායන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ඩී.එල්.වීරවර්ධන — භෞතික විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ඩබ්.ඒ.එම්.මාධවී — භෞතික විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ඩී.එම්.ආර්.ජී මායාකඩුව — ශාක විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය එස්.එස්.එදිරිවීර — ශාක විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය වයි ජයතුංග — ගණිතය අධ්‍යයන අංශය
- ආචාර්ය එම්.කේ.ඒ.සී.මහසිංහ — ගණිතය අධ්‍යයන අංශය
- ආචාර්ය අයි.ටී.ජයමාන්න — සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය
- ආචාර්ය ඒ.ඒ.සුනේත්‍රා — සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය
- ඩී.එම් සතරසිංහ මහතා — න්‍යාෂ්ටික විද්‍යා අධ්‍යයන අංශය

<u>විද්‍යාර්ථීන් ලබාගත් ජයග්‍රහණ</u>

- සැප්තැම්බර්, ඔක්තෝබර් මාසවල පැවති ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ Select E2 විසින් සංවිධානය කරන ලද අන්තර් විශ්වවිද්‍යාල රසායන විද්‍යා ප්‍රශ්නාවලිය සහ පෝස්ටර් තරඟාවලිය සඳහා සහභාගී වූ කොළඹ විශ්වවිද්‍යාලයීය රසායන විද්‍යා අධ්‍යයන අංශයේ විද්‍යාර්ථීහු එහි ප්‍රථම හා දෙවන ස්ථාන දිනා ගත්හ.

2.8 තාක්ෂණ පීඨය

දැක්ම

ඉගැන්වීම හා පර්යේෂණ තුළින් සමාජයේ වෙනස්වන තාක්ෂණික අවශ්‍යතා සමඟ සමපාත වෙමින් ජාත්‍යන්තරව පිළිගත් විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීම .

මෙහෙවර

ඒකාබද්ධ බහු-ශික්ෂිත විෂයමාලා සහ බහු- ශික්ෂිත පර්යේෂණ තුළින් නවීන තාක්ෂණයන් කෙරෙහි අවධානය යොමු කරමින් සමාජ අවශ්‍යතා සපුරාලීම සඳහා උසස් දැනුම වර්ධනය කිරීම සහ තාක්ෂණ ව්‍යාන්තිකයන් සහ නවෝත්පාදකයින් පෝෂණය කිරීම.

අ. මානව සම්පත් පිළිබඳ විස්තර

මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ප්‍ර. උ. සහ ප.උ.)		මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය		මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය	
2021	**2022**	**2021**	**2022**	**2021**	**2022**
917	1247	28	27	15	25

ආ. ප්‍රථම උපාධි

පාඨමාලාව	මාධ්‍යය	පළමු වසර		දෙවන වසර		තෙවන වසර		සිවුවන වසර		උපාධි ලත් සංඛ්‍යාව	
		2021	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**
ප්‍රථම උපාධි	ඉංග්‍රීසි	350	683	219	216	173	173	175	175	-	-

ඇ. අධ්‍යයන කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	සහාය මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	ආධුනික කථිකාචාර්ය	එකතුව
01	02	00	11	05	08	27

ඈ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ	කනිෂ්ඨ	සුලු සේවක	එකතුව
02	01	16	06	25

ඉ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂයය	ප්‍රකාශයට පත්කළ		ඉදිරිපත් කළ	
	2021	**2022**	**2021**	**2022**
අ. පර්යේෂණ සංඛ්‍යාව	22	18	07	02
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	03	-	-
ඇ. වාරසහරා ලිපි සංඛ්‍යාව	31	23	-	-
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	ග්‍රන්ථ 03 හා ග්‍රන්ථ පරිච්ඡේද 04	03	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	8	-	-	-
ඊ. වෙනත්	30	22	03	-
එකතුව	**99**	**69**	**10**	**02**

ඊ. පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු

විෂයය	සහභාගි වූ		සම්පූර්ණ කළ		ඉදිරිපත් කිරීම් කළ	
	2021	**2022**	**2021**	**2022**	**2021**	**2022**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	01	-	03	-	02
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සංඛ්‍යාව	-	06	-	-	-	-
ඇ. ඩිප්ලෝමා සංඛ්‍යාව	30	01	-	-	-	-
ඈ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	-	-	-	-	-
ඉ. වෙනත්	-	-	-	-	-	-
එකතුව	**30**	**08**	**-**	**03**	**-**	**02**

a. උ. ලැබුණු සම්මාන පිළිබඳ තොරතුරු

විෂයය	සම්මාන සංඛ්‍යාව	ආචාර්යවරුන් සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව
	2022	**2022**	**2022**
අ. දේශීය සම්මාන	07	07	-
ආ. ජාතික සම්මාන	-	-	-
ඇ.අන්තර්ජාතික සම්මාන	-	-	-
ඈ. වෙනත්	-	-	-
එකතුව	**07**	**07**	**-**

ඌ. **2022** අරඹන ලද නව පාඨමාලා:

පාඨමාලාව	මාධ්‍යය	කාලසීමාව	පාඨමාලා වර්ගය (ප.උ. ඩිප්./ දෙවන උපාධි/දර්ශනපති/ දර්ශනසූරී)
අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව	සිංහල/ ඉංග්‍රීසි	වර්ෂ 01	ඩිප්ලෝමා

2.9 හෙද පීඨය

කොළඹ විශ්වවිද්‍යාලයේ හෙද පීඨය උපාධිධාරී හෙද වෘත්තිකයන් බිහි කිරීම සඳහා වෙන් කර ඇති ප්‍රථම සහ එකම පීඨය වන අතර ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන අවශ්‍යතාවක් වූ හෙද අධ්‍යාපනය සවිමත් කිරීම හා ඉහළ නැංවීම සපුරාලීම සඳහා 2017 දී එය ස්ථාපිත කරන ලද්දේ 2017 ජනවාරි 18 දිනැති 2002/32 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟිනි. හෙද පීඨයට ඇතුළත් වන අයට හෙද පීඨය මඟින් හෙදවිද්‍යාවේදී (BScN) (ශ්‍රී ලංකා සුදුසුකම් රාමු මට්ටම 6) හි සිවි අවුරුදු උපාධියක් ලබා දෙයි.

පීඨයට ඇතුළත් වීමේ ක්‍රම දෙකක් පවති. පීඨය සිසුන්ගෙන් 70%ක් අ.පො.ස. උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාවෙන් තෝරා ගන්නා අතර ඉතිරි 30% සඳහා ඩිප්ලෝමා මට්ටමේ අධ්‍යාපනයක් ඇති හෙද හෙදියෝ පාර්ශ්වික ප්‍රවේශ මාර්ගයෙන් බඳවා ගැනෙති. හෙද පීඨයේ සමස්ත අරමුණ වන්නේ මනා න්‍යායික සහ ප්‍රායෝගික පදනමක් මත පදනම් වූ උසස් දැනුම සහ කුසලතා ඇති ජාතික සහ ජාත්‍යන්තර සෞඛ්‍ය සේවා අවශ්‍යතා සපුරාලීමට හැකියාව ඇති උපාධිධාරී හෙද හෙදියන් බිහිකිරීමෙහිලා ශ්‍රී ලංකාවට ඇති හැකියාව ඉහළ නැංවීමයි. වර්තමානයේ විද්‍යාර්ථීන් 462 දෙනෙකුගෙන් සමන්විත ශිෂ්‍ය කණ්ඩායම් පහක් පීඨයේ අධ්‍යයන කටයුතුවල නිරත වෙති.

දැක්ම

ජාතික හා අන්තර්ජාතික කීර්ති නාමයක් සහිත විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් වීමට උත්සාහ කිරීම හා ආරක්ෂිත හා ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සඳහා හෙද අධ්‍යාපනය, පර්යේෂණ සහ භාවිතය අතර සම්බන්ධතා ගොඩනැගීම

මෙහෙවර

ජාතික හා අන්තර්ජාතික සෞඛ්‍ය සේවා සේවාවන්හි නිපුණතාවයෙන් යුතු හා දයානුකම්පිතව නව නිපැයුම් සඳහා කැපවන හෙද උපාධිධාරීන්ට විශිෂ්ටතා ලබා දීම

අ. මානව සම්පත් පිළිබඳ විස්තර

මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ප්‍ර.ල.)		මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය		මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය	
2021	**2022**	**2021**	**2022**	**2021**	**2022**
362	498	17	17	20	16

ආ. ප්‍රථම උපාධි

පාඨමාලාව	මාධ්‍යය	පළමු වසර		දෙවන වසර		තෙවන වසර		සිවුවන වසර		උපාධි ලත් සංඛ්‍යාව	
		2021	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**	**2021**	**2022**
හෙද විද්‍යාවේදී		105	228	90	91	83	94	84	85	-	-

ඇ. අධ්‍යයන කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	සහාය මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	ආධුනික කථිකාචාර්ය	එකතුව
00	01	00	07	02	07	17

ඇ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ	කනිෂ්ඨ	සුලු සේවක	එකතුව
0	0	7	9	16

ඉ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂයය	ප්‍රකාශයට පත්කළ		ඉදිරිපත් කළ	
	2021	**2022**	**2021**	**2022**
අ. පර්යේෂණ සංඛ්‍යාව	9	23	3	14
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-	-
ඇ. වාරසහරා ලිපි සංඛ්‍යාව	14	17	-	06

ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	6	-	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	-	04	-	03
ඊ. වෙනත්	26	04	26	-
එකතුව	**55**	**48**	**29**	**23**

ඊ. පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු

විෂයය	සහභාගි වූ		ඉදිරිපත් කිරීම් කළ	
	2021	**2022**	**2021**	**2022**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	02	-	-
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සංඛ්‍යාව	-	-	-	-
ඇ. ඩිප්ලෝමා සංඛ්‍යාව	-	-	-	-
ඈ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	-	-	03
ඉ. වෙනත්	-	-	-	01
එකතුව	**-**	**02**	**-**	**04**

උ. ලැබුණු සම්මාන පිළිබඳ තොරතුරු

විෂයය	සම්මාන සංඛ්‍යාව
	2022
අ. දේශීය සම්මාන	02
ආ. ජාතික සම්මාන	-
ඇ.අන්තර්ජාතික සම්මාන	-
ඈ. වෙනත්	-
එකතුව	**02**

2.10 කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගම් පිළිබඳ විස්තර

1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 115 සහ 116 වගන්ති වලට අනුව, විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගම් සහ වෙනත් සංගම් පිළිගැනීම පාලක සභාවේ එකඟතාවයෙන් සිදු කෙරේ. සමාලෝචනය කරන ලද 2022 වර්ෂය තුළදී, එවැනි ශිෂ්‍ය සංගම් සහ වෙනත් සංගම් හතලිස් අටක් (48) විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක විය.

1. AIESEC ශිෂ්‍ය සංගමය
2. කලා සංගමය / වෛද්‍ය පීඨය
3. වනජීවී සහ ඡායාරූප ශිෂ්‍ය සංගමය
4. තාරකා විද්‍යා සමාජය
5. පාරිසරික විද්‍යාව හා සත්ව විද්‍යාව පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා වන පදනම (BEEZ)
6. උද්භිද විද්‍යා සමාජය
7. බෞද්ධ සහෝදරත්ව සංගමය
8. කතෝලික වෛද්‍ය ශිෂ්‍ය සමාජය
9. කතෝලික ශිෂ්‍ය සංගමය
10. රසායනික සමාජය
11. ක්‍රිස්තියානි සහෝදරත්ව ශිෂ්‍ය සමාජය
12. පරිගණක විද්‍යා සමාජය
13. ආපදා සහන සමිතිය සඳහා මූලික කණ්ඩායම
14. ප්‍රජාවිද්‍යා ශිෂ්‍ය සංගමය
15. ආර්ථික විද්‍යා ශිෂ්‍ය සංගමය
16. එක්සත් භික්ෂු සංගමය
17. එජ්සිලන් ඩෙල්ටා සමාජය
18. Euphoney සමාජය
19. ගැවල් සමාජය
20. ගවේෂකයෝ සමාජය

21. භූගෝල විද්‍යා ශිෂ්‍ය සංගමය
22. ගෝල්ඩන් ඉසෙඩ් සමාජය
23. හින්දු සංගමය - වෛද්‍ය පීඨය
24. හින්දු සංගමය - විද්‍යා පීඨය
25. හින්දු සංගමය - කොවිවි ශාස්ත්‍ර පීඨය
26. ඉතිහාසය සංගමය
27. මානව ජානවිද්‍යා සංගමය -වෛද්‍ය පීඨය
28. සිංහ සමාජය/ ශාස්ත්‍ර පීඨය
29. වෛද්‍ය ශිෂ්‍ය බෞද්ධ සමිතිය
30. වෛද්‍ය ශිෂ්‍ය සුභසාධන සමිතිය
31. සමාකරණ අධිකරණ සහ විවාද සමාජය
32. මුස්ලිම් මජ්ලිස්
33. භෞතික විද්‍යා සංගමය
34. භෞත චිකිත්සක ශිෂ්‍ය සමාජය
35. රොටරැක්ට් සමාජය / ශාස්ත්‍ර පීඨය
36. රොටරැක්ට් සමාජය/ කළමනාකරණ හා මූල්‍ය පීඨය
37. රොටරැක්ට් සමාජය/ විද්‍යා පීඨය
38. විද්‍යා සමාජය
39. සිංහල සංගමය
40. සමාජ විද්‍යාව ශිෂ්‍ය සංගමය
41. ක්‍රීඩා සමාජය/ තාක්ෂණ පීඨය
42. සංඛ්‍යාන කවය
43. කාර්මික හා මූල්‍ය විශ්ලේෂණ ශිෂ්‍ය සංගමය (SAIFA)
44. බෞද්ධ අධ්‍යයන ශිෂ්‍ය සංගමය - ශාස්ත්‍ර පීඨය
45. සිසුන්ගේ පරිගණක විවේකාගාරය සහ පුස්තකාලය
46. දෙමළ සංගමය/ නීති පීඨය
47. සුභසාධන සමිතිය/ තාක්ෂණ පීඨය
48. සුභසාධන සමිතිය - කළමනාකරණ හා මූල්‍ය පීඨය

2.11 ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය (NOC)

විශ්වවිද්‍යාලය සඳහා වන සම්පූර්ණ ඩිජිටල් යටිතල පහසුකම් හසුරුවන්නේ ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය විසිනි. කොළඹ විශ්වවිද්‍යාලයීය සියලු වෙබ් අඩවි, ඉගෙනුම් කළමනාකරණ පද්ධති, ගෙවීම් දොරටු සහ වෙනත් ඔන්ලයින් සේවා ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයේ සත්කාරක වන අතර අපගේ කාර්‍ය මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලැබේ. ඩිජිටල් සේවාවන්හි බාධා අවම කිරීම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නව යෙදුම් ස්ථාපනය කිරීම සඳහා අප විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහාය ලබා දෙනු ලැබේ.

2022 වසර තුළ මධ්‍යස්ථානයෙහි ක්‍රියාකාරකම්

- ස්ථාපිත කිරීම/ විස්තිරණය කිරීම්
    - පීඨාධිපති කාර්යාලය සඳහා ජාල සහ වයිෆයි සම්බන්ධතාව: විද්‍යා පීඨය
    - සංවෘත පථ රූපවාහිනී කැමරා පද්ධතිය සහ මුහුණු අනාවරක: කාලිංග මාවත නේවාසිකාගාරය
    - ERP පද්ධතිය සඳහා සේවාදායක කාමර පහසුකම
    - සේවාදායක කාමරයට 10 Gbps ෆයිබර් සම්බන්ධතාව: විද්‍යා පීඨය (භෞතික වි.අ.අ)
    - වයිෆයි සම්බන්ධතාව: විද්‍යාල මන්දිරය
- නව පද්ධති සඳහා සත්කාරක පහසුකම් සැපයීම.
    - ආබාධිත පර්යේෂණ, අධ්‍යාපනය සහ භාවිතය සඳහා වූ මධ්‍යස්ථානයේ (CEDREP) ඩිජිටල් ශ්‍රව්‍ය පොත් පුස්තකාලය
    - මාර්ගගත රැකියා ද්වාරය https://cgu.cmb.ac.lk/job-portal
    - ඩිජිටල් මානව ශාස්ත්‍ර විද්‍යාගාරය, ඉංග්‍රීසි අ.අ., ශාස්ත්‍ර පීඨය
    - Find UOC https://find.cmb.ac.lk
- නව වෙබ් අඩවි සංවර්ධනය කිරීම්.
    - වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ සැසි සමූළුව (ARS) 2022 https://cmb.ac.lk/ars-2022
    - ශාරීරික අධ්‍යාපන අ.අ. https://cmb.ac.lk/dpe
    - ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය (NOC) https://cmb.ac.lk/noc
    - පිළිකා රෝග නිර්ණය සහ පර්යේෂණ සඳහා වන මධ්‍යස්ථානය (CeDARC) https://cmb.ac.lk/cedarc
    - ARS 2022 සඳහා මාර්ගගත සහතික සත්‍යාපන පද්ධතිය

- සංවර්ධනය කිරීම් සහ ප්‍රකාශයට පත් කිරීම්.
    - ත්‍රෛභාෂික දෘශ්‍ය අනන්‍යතා අත්පොත (https://cmb.ac.lk/visual-identity)
    - විවිධ පීඨවල සහකාර ජාල කළමනාකරුවන්ගේ වැඩ සඳහා Matrix ආයතනික ව්‍යුහය
- ප්‍රමාණ බිල්පත් (BOQ) සැපයීම
    - වයි ෆයි වැඩිදියුණු කිරීම: ශාස්ත්‍ර පීඨය
    - සංශෝධිත: නීති පීඨය: ජාල ස්ථාපනය
    - සංශෝධිත: ප්‍රධාන පුස්තකාලය: වයි ෆයි ස්ථාපනය-අදියර 1
    - පරිපාලක ගොඩනැගිල්ල සඳහා ජාල ස්ථාපනය: ශ්‍රීපාලි මණ්ඩපය
- විශ්වවිද්‍යාල ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMS) වෙබ් අඩවි සහ සියලුම සත්කාරක සේවා සඳහා තාක්ෂණික සහ යටිතල පහසුකම් සහාය ලබා දීම.
- තොරතුරු තාක්ෂණය සහ ජාල සම්බන්ධ ගැටළු සඳහා තාක්ෂණික සහාය ලබා දීම.

2.12 "සයිබර් මණ්ඩපය" - විවෘත හා දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය

සයිබර් මණ්ඩපය'' – විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය යනු කොළඹ විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි වැඩසටහන් (EDPs) සහ පීඨ / අධ්‍යයන අංශ හරහා පිරිනමන ව්‍යාප්ති පාඨමාලා හා සම්බන්ධ කටයුතු මෙහෙයවීමේ පරිපාලන ආයතනයයි. එය පළමුව කොළඹ විශ්වවිද්‍යාලයේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වන අතථ්‍ය මණ්ඩපය නමින් උසස් තාක්ෂණය භාවිතා කරමින් ව්‍යාප්තිය, දුරස්ථභාවය හා මිශ්‍ර කිරීම තුළින් උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සඳහා පහසුකම් සපයන්නෙකු වීම මගින් ජාතික තාක්ෂණයට දායක වීමට අදහස් කරමින් ස්වයං මූල්‍යකරණ මධ්‍යස්ථානයක් ලෙස 2011 ඔක්තෝබර් මස ස්ථාපිත කරන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ අතථ්‍ය මණ්ඩපය - සම්බන්ධීකරණ මධ්‍යස්ථානය 2016 ජුනි මාසයේදී කොළඹ විශ්ව විද්‍යාලයේ අතථ්‍ය මධ්‍යස්ථානය ලෙස නම් කරන ලදී. නැවතත්, 2019 ජනවාරි මාසයේදී එය ''සයිබර් මණ්ඩපය'' - කොළඹ විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ලෙස යලිත් නම් කරන ලදි. මිශ්‍ර ඉගෙනුම තුළින් උසස් අධ්‍යාපනය සඳහා වැඩි දේශීය හා විදේශීය ආකර්ෂණය දිනා ගැනීම මෙහි අරමුණයි.

දැක්ම

විවෘත හා දුරස්ථ ඉගෙනුම් පරිසරයක් තුළින් උසස් අවස්ථාවන් සඳහා වැඩි දියුණු කළ අවස්ථා ලබා දීම සඳහා ස්වයංපෝෂිත මධ්‍යස්ථානයක් වීමට පරිශ්‍රම දැරීම

මෙහෙවර

උසස් තාක්ෂණය භාවිතා කරමින් අතථ්‍ය සහ මිශ්‍ර ඉගෙනුම් පරිසරයන් හරහා පුළුල් වූ උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සපයන්නෙකු වීම සහ එමඟින් ජාතික සංවර්ධනයට දායක වීම.

සයිබර් මණ්ඩපයෙහි ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

1. ගාස්තු අය කරන බාහිර උපාධි වැඩසටහන් සහ විස්තීරණ පාඨමාලා පිරිනමන පීඨ/ අධ්‍යයන අංශවල ගැටළු සාකච්ඡා කිරීමට සහ ප්‍රතිපත්තිමය කරුණු තීරණය කිරීමට පොදු සංසදයක් ලෙස කටයුතු කිරීම.
2. පීඨ/ අධ්‍යයන අංශ විසින් පිරිනමනු ලබන ගාස්තු අය කරන බාහිර උපාධි වැඩසටහන් සහ විස්තීරණ පාඨමාලා සඳහා පරිපාලන සහාය (ශිෂ්‍ය ලියාපදිංචිය, විභාග සහ මූල්‍ය පරිපාලනය) සැපයීම
3. වර්තමාන සහ නැඟී එන වෙළෙඳපොළ ඉල්ලීම් සපුරාලීමට බාහිර උපාධි වැඩසටහන් සහ විස්තීරණ පාඨමාලා සැලසුම් කිරීම සඳහා පීඨ/ අධ්‍යයන අංශ දිරිමත් කිරීම සහ සහයෝගය දීම.
4. බාහිර උපාධි වැඩසටහන් සහ විස්තීරණ පාඨමාලා ලබා දීම සඳහා නවීන අතථ්‍ය සහ මිශ්‍ර ඉගෙනුම් ක්‍රම සැලසුම් කිරීමට සහ භාවිතා කිරීමට පීඨ/ අධ්‍යයන අංශ දිරිමත් කිරීම සහ සහාය වීම.
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් බාහිර උපාධි වැඩසටහන් සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය සුසාධ්‍යකරණය
6. කොළඹ විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලියට දායක වීම.
7. බාහිර උපාධි වැඩසටහන් සහ විස්තීරණ පාඨමාලා භාවිතා කිරීමට සම්බන්ධ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු සැසි සංවිධානය කිරීම

අ. සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
	2022	**2022**	**2022**
ඉලෙක්ට්‍රෝන විද්‍යාව හා ස්වයංකරණ තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (බාහිර)	189	*	09
මූල්‍ය ඉංජිකේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (බාහිර)	172		
එකතුව	**361**	-	**09**

* සියළුම අධ්‍යයන, අධ්‍යයන සහය සහ සමහර අනධ්‍යයන කාර්ය මණ්ඩලය විශ්ව විද්‍යාලයෙන් පරිබාහිර වේ. මධ්‍යස්ථානය මගින් සිදු කරන්නේ උපාධි වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම පමණකි

ආ. ප්‍රථම උපාධි බඳවා ගැනීම්

පාඨමාලාව	බඳවා ගැනීම් **(2022 ලියාපදිංචි වූ නව සිසුන් සංඛ්‍යාව)**	පළමු වසර සිසුන්	දෙවන වසර සිසුන්	තෙවන වසර සිසුන්	උපාධිලත් සංඛ්‍යාව
ඉලෙක්ට්‍රෝන විද්‍යාව හා ස්වයංකරණ තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (බාහිර)	92	92	52	45	20
මූල්‍ය ඉංජිකේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (බාහිර)	74	74	55	43	40
එකතුව	**166**	**166**	**107**	**88**	**60**

ඇ. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර:

* සියලුම අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය බාහිර පදනම මත බඳවා ගනු ලැබේ, මණ්ඩපය වැඩසටහන් සම්බන්ධීකරණය කරයි.

ඇ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර :

ජ්‍යෙෂ්ඨ	අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	කනිෂ්ඨ	සුලු සේවක	කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	ක්‍රමලේඛක සහ පද්ධති විශ්ලේෂක (01)	කළමනාකරණ සහකාර (02)	වැඩ සහායක (01)	පරිගනක යෙදවුම් සහකාර (01)
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී		කළමනාකරණ සහකාර (සරප්) (01)		Moodle සම්බන්ධීකාරක
02	**01**	**03**	**01**	**02**

ඉ. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	**2022** රු.
අ. පෞද්ගලික වැටුප් හා චේතන	18,598,981.36
ආ. ප්‍රවාහන	6,915.00
ඇ.සැපයුම්	3,612,999.21
ඈ.නඩත්තු	82,215.45
ඉ. කොන්ත්‍රාත් සේවා	810,947.01
ඊ.වෙනත්	302,792.50
එකතුව	**23,414,850.53**

ඊ. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	2022 රු.
අ. ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම	10,346,189.00
ආ. යන්ත්‍ර අත්පත් කර ගැනීම	-
ඇ. ගොඩනැගිලි හා සැකිලි අත්පත් කර ගැනීම	9,631,507.35
ඈ. වෙනත්	-
එකතුව	**19,977,696.35**

උ. මූල්‍ය ප්‍රගතිය සම්බන්ධ විස්තර (වැය)

විෂයය	2022 වසරෙහි ප්‍රතිපාදන රු.	2022 වසරෙහි වියදම රු.	ඉතුරුම්/ අතිරික්ත රු.
අ. ව්‍යාපෘතිය හැර වැය	63,563,500.00	23,414,850.53	40,148,649.47
ආ. ව්‍යාපෘතිය හැර ප්‍රාග්ධන	-	-	-
ඇ. ව්‍යාපෘති- දේශීය අරමුදල්	-	-	-
ඈ. ව්‍යාපෘති- විදේශීය අරමුදල්	-	-	-
එකතුව	**63,563,500.00**	**23,414,850.53**	**40,148,649.47**

ඌ. මූල්‍ය ප්‍රගතිය සම්බන්ධ විස්තර(උත්පන්න ආදායම)

ආදායම් ප්‍රභවය	2022 වසරෙහි ප්‍රතිපාදන රු.	2022 වසරෙහි රැස් කිරීම් රු.	හිඟ/ අතිරික්ත
අ. ව්‍යාපෘතිය හැර වැය	63,563,500.00	59,999,000.00	3,564,500.00
ආ. ව්‍යාපෘතිය හැර ප්‍රාග්ධන	-	-	-
ඇ. ව්‍යාපෘති- දේශීය අරමුදල්	-	-	-
ඈ. ව්‍යාපෘති- විදේශීය අරමුදල්	-	-	-
එකතුව	**63,563,500.00**	**59,999,000.00**	**3,564,500.00**

එ. මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය - 2022

විෂයය	සූත්‍රය	සිසුවෙකු සඳහා වැය (රු.)
අ. සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම් (RE)	RE/ ශිෂ්‍ය සංඛ්‍යාව	64,861.08
ආ. සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම් (CE)	CE/ ශිෂ්‍ය සංඛ්‍යාව	55,339.88
එකතුව		**120,200.96**

2.13 ශ්‍රීපාලි මණ්ඩපය

දැක්ම

අධ්‍යාපනය, පර්යේෂණ, නිර්මාණශීලිත්වය සහ ව්‍යවසායකත්වය තුළින් පරිවර්තනීය දැනුම නිපදවීමේ ගෝලීය පැවැත්මේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයකි

මෙහෙවර

1. සිසුන් උදෙසා පරිවර්තනීය අධ්‍යාපන ක්‍රියාවලියක් සහ ඉගෙනීමේ අත්දැකීම් නිර්මාණය කිරීම
2. සමාජ වගකීම්, විවේචනාත්මක චින්තනය, නිර්මාණශීලිත්වය, සහයෝගීතා ස්වභාවය සහ වෘත්තීයභාවය සඳහා කැපවී සිටින ඒකාබද්ධ ජීවන සංකල්පය මත පදනම් වූ විවිත්‍රවත්, නිරත හා සෞඛ්‍ය සම්පන්න විශ්වවිද්‍යාල ප්‍රජාවක් බිහි කිරීම
3. අධ්‍යාපනය, මාධ්‍ය සහ කලාව තුළින් සාමූහික විඥානය කෙරෙහි පරිවර්තනීය බලපෑමක් ඇති කිරීම

අ. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
	2022	**2022**	**2022**
ජනමාධ්‍ය	360	14	06
ප්‍රාසංගික කලා	363	10	05
පරිගණක අධ්‍යයනය/ ජාල මධ්‍යස්ථානය	----	02	01
භාෂා	----	03	02
එකතුව	**723**	**29**	**14**

දේශීය සිසුන් පිළිබඳ විස්තර

අ. ප්‍රථම උපාධි

මණ්ඩපය	**පාඨමාලාව**	**මාධ්‍යය**	**බඳවා ගැනීම්**	**පළමු වසර සිසුන්**	**දෙවන වසර සිසුන්**	**තෙවන වසර සිසුන්**	**සිවුවන වසර සිසුන්**	**උපාධි ලත් සංඛ්‍යාව**
			2022	2022	2022	2022	2022	2022
ශ්‍රීපාලි	ජනමාධ්‍ය	සිංහල	110	108	102	78	72	78
	ප්‍රාසංගික කලා	සිංහල	110	109	106	76	72	83
එකතුව			**220**	**217**	**208**	**154**	**144**	**161**

ආ. පශ්චාත් උපාධි

පාඨමාලාව	**මාධ්‍යය**	**බඳවා ගැනීම් (2022 ලියාපදිංචි වූ නව සිසුන් සංඛ්‍යාව)**	**වත්මන් ශිෂ්‍ය සංඛ්‍යාව(දැනට සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2022**
ජනමාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රපති	සිංහල	26	67
ජනමාධ්‍ය අධ්‍යයන ප. උ.ඩි.		43	103
මාධ්‍ය පර්යේෂණ ශාස්ත්‍රපති		51	100
එකතුව		**120**	**270**

ඇ. අධ්‍යයන කාර්ය මණ්ඩලය :

තනතුර	**වැටුප් පරිමාණය**	**අනුමත සේවක සංඛ්‍යාව**	**සිටින සේවක සංඛ්‍යාව**			**පුරප්පාඩු**
			ස්ත්‍රී	**පුරුෂ**	**මුළු එකතුව**	
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	---	36	---	---	---	07
මහාචාර්ය	U-AC 5 (II)		---	03	**03**	
සහාය මහාචාර්ය	---		---	---	**---**	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	---			---	**---**	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	U-AC 3 (II)		09	05	**14**	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (සංක්‍රාන්ති) / කථිකාචාර්ය (ස්ථිර නොවූ)	U-AC 3 (III)		04	----	**04**	
කථිකාචාර්ය	U-AC 3(IV)		---	01	**01**	
ආධුනික කථිකාචාර්ය	U-AC 3(IV)		03	04	**07**	
පුස්තකාලයාධිපති	---	---	---	---	---	
නියෝජ්‍ය පුස්තකාලයාධිපති	---	01	---	---	---	
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (I ශ්‍රේණිය)	---		---	---	---	
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (II ශ්‍රේණිය)	U-AC 3 (II)		01	---	**01**	
සහකාර පුස්තකාලයාධිපති	---		---	---	---	

ඈ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය :

සේවා ප්‍රවර්ගය	කාර්ය මණ්ඩල ප්‍රවර්ගය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව						ස්ථීර සේවක පුරප්පාඩු	තථ්‍ය සේවක පුරප්පාඩු
				ස්ථීර			කොන්ත්‍රාත්				
				පි	ගැ	එ	පි	ගැ	එ		
ද්විතියික මට්ටම	තාක්ෂණික කාර්ය මණ්ඩපය	U-MN 4	**08**	01		01				05	04
		U-MN 3									
		U-MN 2		01		01					
		U-MN 1									
		U-MT 1		01		01		01	01		
ද්විතියික මට්ටම	ලිපිකරු හා සම කාර්ය මණ්ඩලය	U-MN 4	**42**	02	10	12				03	03
		U-MN 3		02	01	03					
		U-MN 2									
		U-MN 1		12	16	28					
ප්‍රාථමික මට්ටම	ප්‍රාථමික කාර්ය මණ්ඩලය	U-PL 3	**49**	11		11				14	14
		U-PL 2		6		6					
		U-PL 1		11	2	13	06	03	09		
	එකතුව		**99**	**47**	**29**	**76**	**06**	**04**	**10**	**22**	**21**

ඉ. පරිපාලන කාර්ය මණ්ඩලය සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය

	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව			පුරප්පාඩු
			ගැහැණු	පිරිමි	මුළු එකතුව	
පරිපාලන කාර්ය මණ්ඩලය	U EX I	02	01	---	**01**	**02**
පරිපාලන කාර්ය මණ්ඩලය	U EX II	02	01	---	**01**	
අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය	U EX 1	03	01	01	**02**	**01**
අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය	---	---	---	---	**---**	**---**
වෛද්‍ය නිලධාරී	---	01	---	---	**---**	**01**
අධ්‍යයන සහායක	U-AS 1	11	01	05	**06**	**03**
අධ්‍යයන සහායක	U-AS 2		01	01	**02**	

ඊ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂයය	ප්‍රකාශයට පත්කළ	අලෙවි කළ	ඉදිරිපත් කළ
	2022	**2022**	**2022**
අ. පර්යේෂණ සංඛ්‍යාව	13	02	13
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	01	01	01
ඇ. වාරසඟරා ලිපි සංඛ්‍යාව	25	04	07
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව	08	04	-
ඉ. ලිපි සංඛ්‍යාව	20	-	03
එකතුව	**67**	**11**	**24**

උ. පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු

විෂයය	සහභාගි වූ	සම්පූර්ණ කළ	ඉදිරිපත් කිරීම් කළ
	2022	2022	2022
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	07	02	03
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සංඛ්‍යාව	-	-	-

ඇ.උපාධි පාඨමාලා සංඛ්‍යාව	01	03	-
ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව	04	02	02
ඉ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	05	05	05
ඊ.වෙනත්	22	24	22
එකතුව	**39**	**36**	**32**

උ. ලැබුණු සම්මාන පිළිබඳ තොරතුරු

විෂයය	**සම්මාන සංඛ්‍යාව**	**ආචාර්යවරුන් සංඛ්‍යාව**	**සිසුන් සංඛ්‍යාව**
	2022	**2022**	**2022**
අ. දේශීය සම්මාන	01	01	-
ආ. ජාතික සම්මාන			
ඇ.අන්තර්ජාතික සම්මාන			
ඈ. වෙනත්	01	01	-
එකතුව	**02**	**02**	**-**

එ. අරඹන ලද නව පාඨමාලාවල විස්තර:

මණ්ඩපය	**පාඨමාලාව**	**මාධ්‍යය**	**කාලසීමාව**	**පාඨමාලා වර්ගය (ප.උ. ඩිප්./ දෙවන උපාධි/දර්ශනපති/ දර්ශනසූරී)**
ශ්‍රීපාලි මණ්ඩපය, භාෂා අ.අ.	ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව – CCE XVI – 2022/2023	ඉංග්‍රීසි	මාස 6	සහතික පත්‍ර පාඨමාලාව

පුස්තකාලය - ශ්‍රීපාලි මණ්ඩපය

<u>හැඳින්වීම</u>

2022 දෙසැම්බර් 31 අවසානයේ මණ්ඩප පුස්තකාලයේ පොත් 27000 කට අධික සංඛ්‍යාවක් හා සංයුක්ත තැටි හා ඩිජිටල් දෘශ්‍ය තැටි 953 ක් විය.

<u>2022 පොත් හා වාර සඟරා මිලට ගැනීමට වෙන් කිරීම්</u>

2022 වර්ෂය සඳහා ශ්‍රීපාලි මණ්ඩපයේ පුස්තකාලය සඳහා පොත් සහ වාර සඟරා මිලදී ගැනීමට මුදල් වෙන් කර නොමැත.

පරිත්‍යාග ලෙස ලැබුණු පොත් ගණන - 100

<u>කවුළු සේවා – 2022</u>

පුස්තකාල සාමාජිකත්වය:

සිසුන්	-	723
අධ්‍යයන කාර්ය මණ්ඩලය	-	32
පරිපාලන කාර්ය මණ්ඩලය	-	04
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	-	65
නිකුත් කළ පොත් ගණන	-	4932
නිකුත් කළ ඩීවීඩී ගණන	-	35

<u>දේශීය පුවත්පත්</u>

2022 වර්ෂය තුළ, පුස්තකාලය සඳහා ඉංග්‍රීසි සහ සිංහල පුවත්පත් 14 ක් සහ එක් දේශීය සිංහල සඟරාවක් මිලදී ගන්නා ලදී.

පුවත්පත් සඳහා ගෙවූ මුදල (2022.11.30 දක්වා) - රු. 105290.00

<u>අස්ථානගත වූ පොත්</u>

පොත් 03 ක් අස්ථානගත වූ බව පාඨකයන් විසින් ප්‍රකාශ කරන ලදී.

ඒවා ප්‍රතිස්ථාපනය සඳහා ඔවුන් ගෙවූ මුදල - රු. 2900.00

<u>බාහිර සිසුන් ලියාපදිංචි කිරීම</u>

2022 වසර සඳහා විවිධ විශ්ව විද්‍යාල සහ ආයතන වල සිසුන් පුස්තකාලයේ බාහිර සාමාජිකයින් ලෙස ලියාපදිංචි වී නොමැත.

<u>පුස්තකාල දඩ</u>

නියමිත දිනට පුස්තකාල ද්‍රව්‍ය ආපසු ලබා දීමට අසමත් වූ සිසුන්ට පුස්තකාලය සාමාන්‍යයෙන් දඩ නියම කරයි.

පුස්තකාල දඩ ලෙස ලැබුණු මුදල - රු. 7016.15

<u>පුස්තකාල සුළු මුදල්</u>

පුස්තකාල සුළු මුදල් ලෙස භාවිතා කරන ලද මුළු එකතුව - රු. 5000.00

කේවල ශාස්ත්‍රීය කටයුතු

ප්‍රකාශයට පත්කිරීමට නියමිත
විශ්වවිද්‍යාල පුස්තකාලවල තොරතුරු අලෙවිකරණය සඳහා සමාජ මාධ්‍ය භාවිතයේ ඇති අභියෝග: ශ්‍රී ලංකා සන්දර්භය.**(2022).** "පාර්ලිමේන්තු සාර සංහිතා" තිරක සඟරාව - තුන්වන වෙළුම., ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ

2.14 සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය (CCIS)

සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය (CCIS) යනු දෙරට අතර ආයතනික ජාලයක් හරහා ඉන්දියාවේ සමකාලීන අධ්‍යයන පිළිබඳ ශ්‍රී ලංකාවේ දැනුම වර්ධනය කිරීම සහ ඉන්දු-ලංකා සබඳතාව ශක්තිමත් කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා බහුවිධ පර්යේෂණ මධ්‍යස්ථානයකි. සමකාලීන ඉන්දියාව පිළිබඳ අධ්‍යයනය සඳහා කැප වූ ශ්‍රී ලංකාවේ එකම පර්යේෂණ ආයතනය එයයි. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලය අතර අවබෝධනා ගිවිසුමක් (අවබෝධනා ගිවිසුම) යටතේ 2012 දී CCIS පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානය අධ්‍යයන හා පරිපාලන කටයුතු සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය (FGS) යටතේ ක්‍රියාත්මක වන අතර එය එහි උපදේශක මණ්ඩලය සහ කළමනාකරණ මණ්ඩලය හරහා වෙනත් පීඨ සමඟ සම්බන්ධ වේ.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව සියවස් ගණනාවකට පෙර සිට පැවත එන සමාජ, ආගමික, භාෂාමය, සංස්කෘතික, ආර්ථික සහ උපායමාර්ගික සබඳතා හරහා සම්බන්ධ වේ. කෙසේ වෙතත්, ඉන්දියාවේ සමකාලීන වර්ධනයන් සහ වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයට සැලකිය යුතු තරම් අඩු වැදගත්කමක් ලබා දී ඇති බව අවබෝධ වේ. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආසනයක සිදු කරනු ලබන එවැනි පර්යේෂණ සහ අධ්‍යයනය රටේ සමාජ හා ආර්ථික සංවර්ධනය සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින මිත්‍රත්වය සඳහා මග පෙන්වීම සහ ශක්තිමත් කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇති බව වටහා ගැනීමෙන්, මෙම සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය ශ්‍රී ලංකාව තුළ සමකාලීන ඉන්දියාව පිළිබඳ අවබෝධය පෘථුල කිරීමට උපකාරී වනු ඇත.

මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යය වන්නේ සමකාලීන ඉන්දියානු අධ්‍යයන ක්ෂේත්‍රයේ සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ පශ්චාත් උපාධිධාරීන් සඳහා බුද්ධිමය සංසදයක් සැපයීම සහ එහි සාමාජිකයින්ට සහ වෙනත් ආයතන සමඟ

සහයෝගයෙන් පර්යේෂණ සඳහා පදනමක් සැපයීමයි. සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති ඇතුළුව ක්ෂේත්‍රයේ දේශන, සම්මන්ත්‍රණ සහ වෙනත් පර්යේෂණ සිදුවීම් සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස සේවය කිරීම මධ්‍යස්ථානයේ අරමුණයි. සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වෙනත් විද්වතුන් සමඟ සම්බන්ධතා සාදරයෙන් පිළිගනී.

දැක්ම

සමකාලීන ඉන්දියාව පිළිබඳ පර්යේෂණ සහ දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහා ශාස්ත්‍රීය කේන්ද්‍රස්ථානයක් ලෙස පරිණාමය වීම සහ වර්ධනය වීම

අරමුණු

- කොළඹ විශ්වවිද්‍යාලයට සීමා නොවූ පර්යේෂණ, ඉගැන්වීම්, ශිෂ්‍ය/කාර්ය මණ්ඩල හුවමාරු සහ වෙනත් අධ්‍යයන ක්‍රියාකාරකම් හරහා සමකාලීන ඉන්දියාව පිළිබඳ ශ්‍රී ලංකාව තුළ දැනුම වර්ධනය කිරීම.
- පර්යේෂණ, ඉගැන්වීම්, ශිෂ්‍ය/කාර්ය මණ්ඩල හුවමාරු සහ වෙනත් අධ්‍යයන ක්‍රියාකාරකම් හරහා ඉන්දියාව-ශ්‍රී ලංකාව පිළිබඳ දැනුම වර්ධනය කිරීම.
- ශ්‍රී ලාංකික සිසුන්, විද්වතුන් සහ පොදු ව්‍යාපාරික සහ විදේශ ප්‍රතිපත්ති ප්‍රජාවන්ට සමකාලීන ඉන්දියාව පිළිබඳ තොරතුරු සහ ඉන්දියානු ආයතන වෙත ප්‍රවේශය ලබා දීම.
- ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආයතනික ජාල සංවර්ධනය කිරීම.
- සමකාලීන ඉන්දියානු අධ්‍යයන පිළිබඳව පුස්තකාල සහ තොරතුරු තාක්ෂණය පදනම් වූ සම්පත් සංවර්ධනය කිරීම.
- බාහිර දේශන, සම්මන්ත්‍රණ, සම්මේලන සහ සමකාලීන ඉන්දියානු අධ්‍යයන සම්බන්ධ අනෙකුත් ශාස්ත්‍රීය කාර්යයන් සඳහා සංසදයක් සැපයීම.
- විද්වත් දේශන මාලාවක් පවත්වාගෙන යාම.
- බාහිර විද්වතුන් සහ සාමාජිකයින්ගේ වැඩසටහනක් පවත්වාගෙන යාම.

2022 දී මධ්‍යස්ථානය / ඒකකය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

1. CCIS විසින් සිය දසවන සංවත්සරය සැමරීම සඳහා ඉන්දියාවේ කේරළයේ, කැලිකට් විශ්ව විද්‍යාලය සහ රාජ්‍ය සේවා, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය (NILET) හා එක්ව 'සාහිත්‍යය, සංස්කෘතිය සහ ගෝලීයකරණය: හින්දි සහ සිංහල සාහිත්‍යය සම්බන්ධව' යන තේමාවෙන් 2022.01.13 වනදා පෙ.ව. 10.00 සිට ප.ව. 2.00 දක්වා ජාත්‍යන්තර වෙබිනාවක් සංවිධානය කරන ලදී. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් අතිගරු ගෝපාල් බග්ලේ මැතිතුමාය. මෙම වෙබිනාවෙහි වාර්තා සටහන් වෙබ් අඩවියට දියත් කරන ලද්දේ උපකුලපතිවරුන් දෙදෙනා වන කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රිකා එන්. විජයරත්න සහ ඉන්දියාවේ කේරළයේ කැලිකට් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය (ආචාර්ය) එම්. කේ. ජයරාජ් විසිනි. මෙම වැඩ සටහනේ සම්පත් පුද්ගලයන් වූයේ මෙම විද්වතුන්ය:

   - මහාචාර්ය සත්‍යකේතු සංක්‍රිත්, හින්දි අධ්‍යයන අංශය, අම්බෙඩ්කාර් විශ්වවිද්‍යාලය, දිල්ලි, ඉන්දියාව.
   - මහාචාර්ය අශිෂ් ත්‍රිපති, හින්දි අධ්‍යයන අංශය, බෙනාරිස් හින්දු විශ්වවිද්‍යාලය, ඉන්දියාව.
   - මහාචාර්ය සංගීත් රත්නායක, භාෂා අධ්‍යයන අංශය, සබරගමුව විශ්වවිද්‍යාලය.
   - මහාචාර්ය නිලන්ති කුමාරි රාජපක්ෂ, භාෂා, සංස්කෘතික සහ ප්‍රාසාංගික කලා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

2. CCIS හි දසවන සංවත්සරය සහ 75 වැනි ඉන්දීය නිදහස් දින සංවත්සරය සැමරීම සඳහා සංවිධානය කරන ලද සිංහල මාධ්‍යය මාසික විද්වත් දේශන මාලාවේ සමාරම්භක උත්සවය 2022 ජනවාරි 27 වන දින සවස 4:00 ට විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙහි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්විණි. එහි පළමු දේශනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රත්නසිරි අරංගල විසින් 'ප්‍රාකෘත සාහිත්‍යයේ ලාලිත්‍යය' මැයෙන් පවත්වන ලදී.

3. CCIS කොළඹ විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා පවත්වන ලද පීඨාධිපති සම්මාන සාහිත්‍ය තරඟය සඳහා අනුග්‍රාහකත්වයක් දැරීමෙන් ඊට දායක විය.

4. ඉන්දියානු සාහිත්‍යය පිළිබඳ මාසික විද්වත් දේශන මාලාවේ දෙවන දේශනය 2022 පෙබරවාරි 28 වන දින සවස 4:00 ට විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙහි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්විණි. 'සංස්කෘත සාහිත්‍යයේ ලාලිත්‍යය' මැයෙන් මෙම දේශනය පවත්වන ලද්දේ ප්‍රවීණ සාහිත්‍යවේදී කරුණාරත්න අමරසිංහ මහතා විසිනි.

5. ඉන්දියානු සාහිත්‍යය පිළිබඳ මාසික විද්වත් දේශන මාලාවේ තෙවන දේශනය 2022 මාර්තු 28 වන දින සවස 4:00 ට විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙහි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්විණි. 'තාගෝර් සාහිත්‍යයේ ලාලිත්‍යය' මැයෙන් ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වින්තක රණසිංහ විසින් මෙය පවත්වන ලදී.

6. CCIS සිය පුවත් පත්‍රිකාව වූ 'සමකාලීන' හි 2022 ජනවාරි-මාර්තු කලාපය ප්‍රකාශයට පත්කළේය.

7. ඉන්දියානු සාහිත්‍යය පිළිබඳ මාසික විද්වත් දේශන මාලාවේ සිව්වන දේශනය 2022 අප්‍රේල් 29 වන දින සවස 4:00 ට විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙහි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්විණි. 'ද්‍රවිඩ සාහිත්‍යයේ ලාලිත්‍යය' යන තේමාව අනුව මෙම දේශනය පවත්වන ලද්දේ රුහුණු විශ්වවිද්‍යාලයේ හින්දි අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ධම්මික ජයසිංහ විසිනි.

8. 161 වැනි තාගෝර් ජයන්ති උත්සවය නිමිත්තෙන් ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය (SVCC) සමඟ එක්ව CCIS විසින් ගුරුදේව රබීන්ද්‍රනාත් තාගෝර් පිළිරුවට පුෂ්ප උපහාර දැක්වීමේ උත්සවයක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ වැඩබලන ඉන්දීය මහ කොමසාරිස්, අතිගරු විනෝද් කේ ජේකබ් සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.මානවඩු විසින් 2022 මැයි 9 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ පිහිටි ගුරුදේව රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ පිළිරුවට පුෂ්ප උපහාර දක්වන ලදී. CCIS හි නිර්මාතෘ අධ්‍යක්ෂ, සභාපති මහාචාර්ය සඳගෝමී කොපරහේවා ද ආරාධිතයෙකු ලෙස මෙම අවස්ථාවට සහභාගී වූ අතර, 'ගීතාංජලී වසර සියයක්' රචනා එකතුව අතිගරු ශ්‍රී විනෝද් කේ ජේකබ් වෙත පිළිගැන්වීය. මෙම අවස්ථාවට කොළඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරු සහ ප්‍රවීණ සාහිත්‍යධරයෝ රැසක් සහභාගී වූහ.

9. CCIS විසින් 2022.06.14 දින (පොසොන් පොහොය දින) පූජනීය අනුරාධපුර ශුද්ධ නගරයෙහි පිහිටි ස්වර්ණමාලි ස්ථූප පරිශ්‍රයේදී අති ගෞරවනීය භික්ෂූන් වහන්සේලා සහ ශ්‍රී ලංකා ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයෙහි නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 'සිංහල ජාතක කතා ශ්‍රව්‍ය පොත' එළිදක්වන ලදී. ජාතක කතා 50 කින් සමන්විත වන [ජාතකට්ඨකථාවෙන් තෝරාගත් 'යහපත් උපදෙස්' පිළිබඳ ජාතක කතා එකතුවකි] මෙම ශ්‍රව්‍ය පොතෙහි පිදුම ශ්‍රී ලංකාවේ ආබාධිත සහෝදර සහෝදරියන් වෙනුවෙන් වෙන් කර තිබේ.

10. CCIS විසින් සංවිධානය කරන ලද සිංහල මාධ්‍යය මාසික විද්වත් දේශන මාලාවේ 5 වන දේශනය 2022 අගෝස්තු 18 වන දින සවස 4:00 ට විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙහි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්විණි. මෙම දේශනය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ (සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය) විසින් 'පශ්චාත් යටත්විජිත හා නූතන ඉන්දියානු සමාජය වෙත සාහිත්‍ය ප්‍රවේශයක්: රබීන්ද්‍රනාත් තාගෝර්, මහාශ්වේතා දේවි, අනන්ත මූර්ති සහ කමලේෂ්වර් යන මැයෙන් පවත්වන ලදී.

11. CCIS විසින් සංවිධානය කරන ලද සිංහල මාධ්‍යය මාසික විද්වත් දේශන මාලාවේ 6 වන දේශනය 2022 සැප්තැම්බර් 22 වන දින සවස 4:00 ට විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙහි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්විණි. එය 'සිංහල පාඨකයා කෙරෙහි දකුණු ඉන්දීය ලේඛක ආර්.කේ.නාරායන්ගේ සාහිත්‍ය දායකත්වයේ බලපෑම' මැයෙන් ප්‍රවීණ සාහිත්‍යවේදී ආචාර්ය ඩබ්ලිව්.ඒ.අබේසිංහ විසින් ඉදිරිපත් කරන ලදී.

12. CCIS විසින් සංවිධානය කරන ලද සිංහල මාධ්‍යය මාසික විද්වත් දේශන මාලාවේ 7 වන දේශනය 2022 ඔක්තෝම්බර් 26 වන දින සවස 4:00 ට විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙහි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්විණි. 'ඉන්දියානු සිනමා සාහිත්‍යයට නව ප්‍රවේශයක්' මැයෙන් ප්‍රවීණ සිනමාවේදී ජයන්ත චන්ද්‍රසිරි මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

13. සංඝමිත්තා තෙරණිය ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට වැඩම කිරීම සිහිපත් කරමින්, ජාතක කතා ශ්‍රව්‍ය ග්‍රන්ථයේ දෙවන වෙළුම 2022 දෙසැම්බර් 2 වන දින ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයෙහි සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේදී (SVCC) නිකුත් කරන ලදී. මෙය CCIS සහ SVCC හි හවුල් ව්‍යායාමයකි. ශ්‍රව්‍ය පොතෙහි 'යහපත් උපදෙස්' යන තේමාව යටතේ ජාතකට්ඨකථාවලින් තෝරා ගත් ජාතක කතා 50ක් අඩංගු වන අතර එය ශ්‍රී ලංකාවේ ජනතාවට, විශේෂයෙන්ම දෘෂ්‍යාබාධිතයන් වෙනුවෙන් කැප කර ඇත.

අ. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	2022 රු.
අ. පෞද්ගලික වැටුප් හා වේතන	1,588,450.00
ආ. ප්‍රවාහන	29,874.55
ඇ.සැපයුම්	628,233.24
ඈ.නඩත්තු	-
ඉ. කොන්ත්‍රාත් සේවා	-
ඊ.වෙනත්	2,618,054.14
එකතුව	**4,864,611.93**

ආ. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	2022 රු.
අ. ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම	494,000.00
එකතුව	**494,000.00**

2.15 මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය (CSHR)

දැක්ම: සියලු මිනිසුන්ගේ ගෞරවයට හා අයිතිවාසිකම්වලට ගරු කරන අයිතිවාසිකම් පිළිබඳ සවිඥානික ජාතියක් බිහි කිරීම.

මෙහෙවර: බහුවිධ ප්‍රවේශයක් භාවිතා කරමින් මානව හිමිකම් අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා විශිෂ්ට මධ්‍යස්ථානයක් වීම.

ක්ෂේත්‍රයේ දශක තුනක අත්දැකීම් මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රයට සිය මුලපිරීම් දැනීම සඳහා නව මංපෙත් සැකසීම සඳහා සමාජයේ හදගැස්ම මැන බැලීමේ අවබෝධය සහ හැකියාව ලබා දෙයි. 1991 දී ජනවාර්ගික ගැටුමේ සහ යුද්ධයේ මෙන්ම දකුණේ කැරැල්ලේ ප්‍රතිඵලයක් ලෙස රටේ මානව හිමිකම් තත්ත්වය තීරණාත්මක සන්ධිස්ථානයකට පැමිණ තිබූ අවස්ථාවක මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය ආරම්භ වූයේ සියලු මිනිසුන්ගේ ගෞරවයට හා අයිතිවාසිකම්වලට ගරු කරන අයිතිවාසිකම් පිළිබඳ සවිඥානකත්වයක් ඇති ජාතියක් නිර්මාණය කිරීමේ දැක්ම ඇතිවය. මානව හිමිකම් කඩකිරීම් සහ අපයෝජනයන් පෙර නොවූ විරූ තරම් පුලුල්ව හා කුරිරුව පැතිරුනු යුගයක් විය.

කොළඹ විශ්වවිද්‍යාලය රටේ කාලීන අවශ්‍යතාවයට ප්‍රතිචාර දක්වමින් CSHR නිර්මාණය හරහා මානව හිමිකම් අධ්‍යාපනය මහජන අවධානයට ලක් කළේය. CSHR යනු කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයට අනුබද්ධ ලාභ නොලබන අධ්‍යාපන ආයතනයකි. එහි විධානය වන්නේ මෙහෙවර බහුවිධ ප්‍රවේශයක් භාවිතා කරමින් මානව හිමිකම් අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා විශිෂ්ටතා මධ්‍යස්ථානයක් වීමේ මෙහෙවර ඉටු කිරීමට විශ්ව විද්‍යාල ප්‍රජාව සහ පොදුවේ සමස්ත ප්‍රජාව සඳහා මානව හිමිකම් අධ්‍යාපනය සහ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සහ පහසුකම් සැලසීම මෙහි අරමුණයි.

විශ්ව විද්‍යාල පද්ධතිය තුළ මානව හිමිකම් අධ්‍යාපනයට කැපවූ පුරෝගාමී ආයතනය වීම නිසා CSHR ප්‍රමුඛ මානව හිමිකම් අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගැනීමක් ලබා ගත් අතර, මානව හිමිකම් අධ්‍යාපනය ජනගහනයේ පුළුල් හරස්කඩකට බෙදා හැරීමට මෙමගින් අරමුණු කරයි. සිය තිස් වසරක පැවැත්ම තුළ, CSHR මානව හිමිකම් අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා පුළුල් පරාසයක ක්‍රියාකාරකම් සිදු කර ඇති අතර, ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්, පොලිසිය, බන්ධනාගාර නිලධාරීන් සහ රැඳවියන්, රාජ්‍ය යාන්ත්‍රණයේ පරිපාලන අංශයට අනුයුක්ත සියලුම තරාතිරම්වල නිලධාරීන්, නීතිඥයින්, විද්වතුන් සහ අනෙකුත් වෘත්තිකයන්, විශ්ව විද්‍යාල ප්‍රජාව, අධ්‍යාපන ක්ෂේත්‍රය, පාසල් සිසුන්, ප්‍රජා නායකයින්, භෞතිකව හා සමාජීය වශයෙන් ආන්තික කණ්ඩායම් සහ මහජනතාව වෙත ළඟා වී ඇත.

CSHR හි ක්‍රියාකාරකම් ප්‍රධාන කුළුණු පහක් යටතේ සිදු කෙරේ. එනම් අධ්‍යාපනය, පර්යේෂණ, ධාරිතා ගොඩනැගීම, දැනුම සේවා සහ ආයතනික සංවර්ධනයයි.

අධ්‍යාපනය සම්බන්ධයෙන් ගත් කල, විවිධ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සහ ඔවුන්ගේ ව්‍යවස්ථාපිතව සහතික කර ඇති අයිතිවාසිකම් පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා CSHR විසින් පශ්චාත් උපාධි සිට සහතික මට්ටම දක්වා මානව හිමිකම් වැඩසටහන් පවත්වයි.

පර්යේෂණ ක්ෂේත්‍රය තුළ, CSHR ප්‍රායෝගිකව අදාළ වන පර්යේෂණ සිදු කරයි. රිමාන්ඩ් සිරකරුවන්, බන්ධනාගාරවල නීති ආධාර, බන්ධනාගාරවල පුනරුත්ථාපන වැඩසටහන්, අවතැන් වූවන්, රිමාන්ඩ් නිවාසවල සිටින ළමුන්, අණදීමේ වගකීම, තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කර ඇත.

ඒ අතරම නැහෙනහිර පළාතේ අයිතිවාසිකම් සහ වැද්දන්ගේ අධ්‍යාපන මට්ටම, තැපෑල තුළ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සංකල්පය ගවේෂණය කිරීම ශ්‍රී ලාංකේය සමාජය, භාෂා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ භාවය සිදු කරන වෙනත් පර්යේෂණ අතර විය.

ධාරිතා වර්ධනය සම්බන්ධයෙන්, CSHR විසින් අනෙකුත් අයගේ මෙන්ම ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් අයිතිවාසිකම් සහ වගකීම් ක්ෂේත්‍රයේ තම හවුල්කරුවන් ශක්තිමත් කිරීමට අඛණ්ඩව කටයුතු කළේය. ධාරිතා වර්ධනයට සම්බන්ධ කණ්ඩායම් වන්නේ ද්විතීයික සහ තෘතීයික පාසල් සිසුන්, පූර්ව සේවා සහ සේවයෙහි නිරතව සිටින ගුරුවරුන්, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල, මාධ්‍යවේදීන්, ආබාධිත පුද්ගලයින්, ත්‍රිවිධ හමුදාව, පොලිස් සහ බන්ධනාගාර නිලධාරීන්, රැඳවියන්, ක්වාසිවරුන්, ග්‍රාමීය සහ වතුකරයේ ප්‍රජාවන් සහ සාමාන්‍ය මහ ජනතාව ඔවුන්ගේ සවිබල ගැන්වීම් ලබන අන් අය අතර වෙති.

දැනුම සේවා ක්ෂේත්‍රය තුළ, CSHR සිය සම්පත් මධ්‍යස්ථානය හරහා සිසුන්ට, විද්වතුන්ට, පර්යේෂකයන්ට සහ මහජනතාවට සේවා සහ තොරතුරු සැපයීම දිගටම කරගෙන ගියේය. මධ්‍යස්ථානය වසර පුරාවට ප්‍රවේශ විය හැකි ඉ-සම්පත් ආකාරයෙන් විද්‍යුත් මාධ්‍ය හරහා තොරතුරු ලබා දුන්නේය.

ආයතනික සංවර්ධනය සම්බන්ධයෙන් ගත් කල තමා සමග වැඩ කරන අයට උසස් තත්ත්වයේ වැඩසටහන් ලබා දීමට CSHR අවධානය යොමු කරයි. මේ සඳහා, CSHR සිය කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දැනුම සහ කුසලතා වැඩිදියුණු කිරීමට අවස්ථාව ලබා දීමට සෑම උත්සාහයක්ම ගනී. එය වැඩසටහන්වල තත්වය වැඩිදියුණු කිරීම සඳහා සහ රට තුළ මානව හිමිකම් සංස්කෘතියක් ඇති කිරීමට දායක වේ.

මානව හිමිකම් අධ්‍යාපනය සහ පර්යේෂණ කෙරෙහි මූලික අවධානය යොමු කරමින්, CSHR මානව හිමිකම් අධ්‍යාපනයේ සහ පර්යේෂණවල ප්‍රධාන ආයතනය සහ කේන්ද්‍රස්ථානය බවට පත්වීමේ මාවතේ ගමන් කරයි.

2022 වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්

- මානව හිමිකම් සහරාව I සහ II වෙළුම් ප්‍රකාශයට පත් කරන ලදී.
- ළමා දින සැමරුම් වැඩසටහන 2022
- ඡායාරූප තරගයේ ප්‍රතිඵල නිකුත් කිරීම
- 2021 සහතිකපත් ප්‍රදානෝත්සවය
- සියලුම අධ්‍යයන වැඩසටහන් වල අතුරු ව්‍යවස්ථා සමාලෝචන වැඩමුළු
- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන
- කනිෂ්ඨ අණදෙන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් (වසරකට වැඩසටහන් තුනක්).
- මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා දෙදින ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන

2.16 සෞඛ්‍ය මධ්‍යස්ථානය

මෙහෙවර

වෛද්‍ය මානසික සහ නිවාරණ සෞඛ්‍ය ප්‍රවර්ධනය ලබා දීමෙන් ශිෂ්‍යයාගේ අධ්‍යාපන අත්දැකීම් වැඩි දියුණු කිරීම සඳහා සහාය ලබා දීම

අරමුණු

1. විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ප්‍රශස්ත සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම
2. ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ප්‍රාථමික සෞඛ්‍ය සහ සුවතා අවශ්‍යතා සම්බන්ධයෙන් ආධාර කිරීම සහ උපදෙස් දීම.

2022 දී මධ්‍යස්ථානය / ඒකකය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

පැවති ආර්ථික අර්බුදය මධ්‍යයේ වුවද සෞඛ්‍ය මධ්‍යස්ථානය විසින් සාමාන්‍යයෙන් සපයනු ලබන සියලුම සේවාවන් සිදු කරන ලදී .

සෞඛ්‍ය මාර්ගෝපදේශ සැපයීම සහ විශ්වවිද්‍යාලයේ පැවැත්වෙන සියලුම ප්‍රධාන උත්සව අධීක්ෂණය සෞඛ්‍ය මධ්‍යස්ථානය මගින් සිදු කරන ලදී.

2.17 ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය (NEREC)

ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය (NEREC) ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය ප්‍රතිපත්ති ගොඩනැගීම සඳහා පර්යේෂණ මත පදනම් වූ දත්ත සැපයීමේ අරමුණින් 2000 වසරේදී ස්ථාපනය කෙරිණි. එය පිහිටුවීමේ අරමුණට අනුගත වෙමින් ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ ශිෂ්‍ය කාර්ය සාධනයට අදාළ පර්යේෂණ සහ ඇගයීම් අධ්‍යයන පර්යේෂණ ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම සඳහා කැපවී සිටියි. ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ලෝක බැංකුවේ උපදේශකත්වය යටතේ දසකයකට අධික කාලයක් විවිධ ශ්‍රේණිවලට අයත් ශිෂ්‍යයන් ගේ කාර්ය සාධනය ජාතික මට්ටමින් ඇගයීම් ක්‍රියාවට නංවා ඇත. අධ්‍යාපනය හා ඇගයීම්වලට සම්බන්ධ සම්මන්ත්‍රණ, වැඩමුළු, ධාරිතා සංවර්ධන පුහුණු සැසි අධ්‍යාපනය සහ පර්යේෂණ මගින් ජාතික පර්යේෂණ සහ මධ්‍යස්ථානය රජයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වෙත තම සේවා ලබාදෙයි. මෙසේ අධ්‍යාපනික පර්යේෂණ සඳහා කැප වූ පර්යේෂණාත්මක ප්‍රජාවක් නිර්මාණය කිරීමට ජාතික අධ්‍යාපන පර්යේෂණ සහ ඇගයීම් මධ්‍යස්ථානය කැපව සිටියි.

දැක්ම

පර්යේෂණ, ඇගයීම්, සංවර්ධනය, බෙදාහැරීමේ කාර්ය සහ අධ්‍යාපන තොරතුරු සැපයීමේ සේවා මගින් ජාතික සහ කලාපීය මට්ටමින් අධ්‍යාපනය සහ පුහුණුව වර්ධනය කිරීම.

මෙහෙවර

ජාතික හා කලාපීය පැතිකඩක් ඇති ශක්ති සම්පන්න, ඉදිරි දැක්මක් ඇති, අධ්‍යාපන පර්යේෂණ, ඇගයීම්, පරීක්ෂණ සහ පුහුණු කිරීමේ ආයතනයක් ස්ථාපිත කිරීම

2022 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- NEREC විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය සමඟ එක්ව අධ්‍යාපන පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ' Mendeley Reference Manager'හැඳින්වීම ' යන මැයෙන් වැඩමුළුවක් පවත්වන ලදී.
- සම සමාලෝචිත ‘ශ්‍රී ලංකා අධ්‍යාපන සඟරාව’ (SLJE) 1 වන වෙළුම, අංක 1 ප්‍රකාශනය
- සම සමාලෝචිත ‘ශ්‍රී ලංකා අධ්‍යාපන සඟරාව’ (SLJE) 1 වන වෙළුම, අංක 2 ප්‍රකාශනය
- ජාතික අධ්‍යයන දෙකක් පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශයට ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීම,
    - 2022 වසරේ 4 ශ්‍රේණිය සම්පූර්ණ කරන සිසුන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමේ ජාතික තක්සේරුව (ව්‍යාපෘති කාලය: ජනවාරි - ඔක්තෝබර් 2023)
- 2022 වසරේ 04 ශ්‍රේණිය සම්පූර්ණ කරන සිසුන්ගේ මව් භාෂා (සිංහල/දෙමළ) කාර්ය සාධනය පිළිබඳ ජාතික ඇගයුම’ (ව්‍යාපෘති කාලය: ජනවාරි - දෙසැම්බර් 2023) ජාතික අධ්‍යයනයක් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ යුනිසෙෆ් වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

2.18 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC)

කොළඹ විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) එහි ස්ථාපනයේ සිට සාර්ථක විසි පස්වන වසරද සම්පූර්ණ කර ඇත. කොළඹ විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ශ්‍රී ලාංකේය ජාතික විශ්වවිද්‍යාල

පද්ධතිය තුළ ප්‍රථම කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වශයෙන් 1997 ආරම්භ වුයේ ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාලයන්හි සැලසුම්සහගතව කාර්ය මණ්ඩල සංවර්ධනය කිරීමට ඇති අවශ්‍යතාව පදනම් කර ගනිමිනි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයෙහි මෙහෙවර වන්නේ " සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සහ විශේෂයෙන් කොළඹ විශ්වවිද්‍යාලය තුළ කාර්ය මණ්ඩලය සහ සිසුන් විසින් සිදු කරනු ලබන අධ්‍යයන කටයුතුවල ගුණාත්මක භාවය ඉහළ නැංවීමයි". මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා, විශ්ව විද්‍යාල ඉගැන්වීම/ඉගෙනීම වඩාත් ඵලදායී, වඩාත් අදාළ, ශිෂ්‍ය නැඹුරුවක් සහිත සහ ජාත්‍යන්තරව උසස් ප්‍රමිතියෙන් යුක්ත කිරීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පහසුකම් සපයයි. අධ්‍යයන හා අධ්‍යයන කාර්ය මණ්ඩලය ඇතුළුව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් අතර වඩාත් ඵලදායී හා කාර්යක්ෂම කාර්ය සාධනයක් සඳහා අවශ්‍ය කුසලතා සහ නිපුණතා වර්ධනය කිරීමට ද එය පහසුකම් සපයයි. පවතින මූල්‍ය හා මානව සම්පත් සීමාවන් තුළ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනයට සහාය වන අදාළ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සිදු කරයි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අරමුණු සහ අපේක්ෂිත ක්‍රියාකාරකම් [1]

1. විෂයමාලා සංශෝධනය සහ සැකසීම, ඉගැන්වීම සහ පර්යේෂණය යනාදී අධ්‍යයන කාර්ය සඵල කරගැනීම සඳහා අවශ්‍ය විවිධ හැකියා ප්‍රවර්ධනය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහයෝගය සහ උපකාර සැපයීම.

2. විවිධ අධ්‍යයන සහයක සේවා සහ කාර්යයන් සඳහා අවශ්‍ය හැකියා ප්‍රවර්ධනය පිණිස අනධ්‍යයන කාර්ය මණ්ඩලයට උදව් උපකාර සැපයීම.

3. අධ්‍යයන පරිපාලන තනතුරු දරන අධ්‍යයන කාර්ය මණ්ඩලයට (අංශාධිපතිවරු, පීඨාධිපතිවරු, අධ්‍යක්ෂවරු , මණ්ඩපාධිපතිවරුන්) සහය සහ උදව් සැපයීම හෝ එම තනතුරු හෙබවීම සඳහා අවශ්‍ය ශක්‍යතා සහ නිපුනතා අත්පත්කරගැනීමට උනන්දු කරවීම.

4. අධ්‍යයනාංශ, වෙනත් අධ්‍යයන ඒකක, පාඨමාලා, වැඩසටහන් සහ පීඨවල සිටින පුද්ගලයන් සහ කණ්ඩායම්වලට ඉගැන්වීම පුනරීක්ෂණය සහ ඇගයීම සඳහා සහයවීම
5. විශ්වවිද්‍යාල ඉගැන්වීම සහ ඉගෙනීම ප්‍රවර්ධනය ඉලක්ක කරගත් ව්‍යාපෘතිවල නිරත විශ්වවිද්‍යාලය තුළ සිටින පුද්ගලයන් සහ කණ්ඩායම් සමග ඒකාබද්ධ වීම.

6. ඉල්ලීම මත ගුරුවරුන්ට ශිෂ්‍ය ප්‍රතිපෝෂණ සේවා ලබාදීම

7. ඉගැන්වීම සහ ඉගෙනීමට අදාලව විශ්වවිද්‍යාලය තුල පවතින ප්‍රතිපත්ති සහ සාමාන්‍ය ක්‍රියාවලීන්ට දායක වීම.

8. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය හා සම්බන්ධව පුළුල් පර්යේෂණ සහ ශාස්ත්‍රීය ක්ෂේත්‍රයට දායක වීම
9. කොළඹ විශ්වවිද්‍යාලයේත් අනෙක් උසස් අධ්‍යාපන ආයතනවලත් භාවිතය සඳහා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සංවර්ධනය පිළිබඳ පොදුවෙත්, ඉගැන්වීම සහ ඉගෙනීම පිළිබඳව සුවිශේෂ වශයෙනුත් ප්‍රකාශන පළ කිරීම

10. සමාන අරමුණු ඇති දේශීය සහ විදේශීය කාර්ය මණ්ඩල සංවර්ධන සංගම් සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම.

11. විශ්වවිද්‍යාලය විසින් ලබා දුන් අරමුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවල තම ක්‍රියාකාරකම් සඳහා විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතියට යටත්ව දේශීය සහ විදේශීය මූලාශ්‍රය ඇසුරින් අරමුදල් රැස් කිරීම
12. විශ්ව විද්‍යාලයට අදාළ වන විෂයයන්වල පාඨමාලා ව්‍යුහ, විෂයමාලා වෙනස්කම්, ඉගනුම් හා ඉගැන්වීම් හා පර්යේෂණ විධික්‍රම පිළිබඳ සම්පත් සහිත තොරතුරු මධ්‍යස්ථානයක් ගොඩනැගීම

[1] [1] මූලාශ්‍ර: කො.වි.වි. පාලක සභා සටහන් 252/34 පි.75 . 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පණතේ 135 වගන්තිය සහ ආනුෂංගික සංශෝධන යටතේ කො.වි.වි. පාලක සභාව විසින් සකසන ලද (2010 අංක 01) දරන අ. ව්‍යවස්ථාව.

වර්තමානයේ මෙම මධ්‍යස්ථානය සියලු අධ්‍යයන, පරිපාලන හා වෙනත් සහකාර කාර්ය මණ්ඩල ඉලක්ක කර ගනිමින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සංවර්ධනය උදෙසා මනාව කේන්ද්‍රගතව පුහුණු වැඩසටහන්වල නිරත වේ.

අධ්‍යයන කාර්ය මණ්ඩලය ඉලක්ක කරගත් ප්‍රධානතම පාඨමාලාව වන්නේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සහ බ්‍රිතාන්‍යයේ කාර්ය මණ්ඩල සහ අධ්‍යාපන සංවර්ධන සංගමය විසින් පිළිගත් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවයි (CTHE). මීට අමතරව, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් ශාස්ත්‍ර පීඨයෙහි ආබාධිකත්ව පර්යේෂණ, අධ්‍යාපනය හා භාවිතය සඳහා වූ මධ්‍යස්ථානය (CEDREP) සමග එක්ව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආබාධිතභාවය පිළිබඳ දැනුවත් කිරීම සහ සංවේදී කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවන් පැවැත්වීය.

මීට අමතරව, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයෙහි ආබාධිකත්ව පර්යේෂණ, අධ්‍යාපනය හා භාවිතය සඳහා වූ මධ්‍යස්ථානය (CEDREP) සමඟ එක්ව අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළුවක් පවත්වන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය පමණක් නොව ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාල/ආයතනවල අධ්‍යයන හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීමට සහ වැඩිදියුණු කිරීමට සිය සුවිශේෂී දායකත්වය ලබා දෙයි. 2022 වර්ෂය තුළ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයට විවිධ මාණ්ඩලික කාණ්ඩ යටතේ සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කිහිපයක කාර්ය මණ්ඩල සාමාජිකයින් 170 කට අධික සංඛ්‍යාවක් සාර්ථකව පුහුණු කළ හැකි වූ අතර, පෞද්ගලික විශ්ව විද්‍යාලවල අයදුම්කරුවෝ ද රාජ්‍ය විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය සමඟ පහසුවෙන් මිශ්‍ර වූහ.

කොළඹ විශ්වවිද්‍යාලයේ පිහිටි කාර්යාල සංකීර්ණයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙයි.

කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (CTHE)

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසි හතරවන වරටත් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව ඉදිරිපත් කළේය. ශ්‍රී ලංකාවේ විවිධ විශ්වවිද්‍යාලවල (කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල (UCSC) , දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය (IIM), රුහුණු විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS), මොරටුව විශ්ව විද්‍යාලය, තොරතුරු තාක්ෂණ ආයතනය) ආචාර්යවරු 93 දෙනෙක් මීට සහභාගිවූහ.

2022 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

2022 දී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පිරිනමන ලදපාඨමාලා සහ පවත්වන ලද වැඩමුළු ලැයිස්තුව පහත දැක්වේ. :

#	වැඩමුළුව/පාඨමාලාව	දිනය / දින	සම්පත් පුද්ගලයා / පුද්ගලයන්
1.	උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (CTHE - batch 25)	2022 මාර්තු - දෙසැම්බර්	1. මහා. නාසිමා කමර්දීන්, වාණිජ නීති අ.අ., නීති පීඨය, කො.වි.වි. 2. මහාචාර්ය පණ්ඩුක කරුණානායක, අධ්‍යක්ෂ, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, කොළඹ විශ්වවිද්‍යාලය. 3. මහාචාර්ය මනීෂා එස් වනසිංහ – පැස්කුවල්, ජාත්‍යන්තර සම්බන්ධතා අ.අ., ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය. 4. මහාචාර්ය චමින්ද පද්මකුමාර,

			ජාත්‍යන්තර සම්බන්ධතා අ.අ., ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.
2.	අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආබාධිතභාවය පිළිබඳ දැනුවත් කිරීම සහ සංවේදී කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01.02.2022 සිට 31.05.2022 දක්වා	1. නිලූකා ගුණවර්ධන මෙනවිය (BA,MA,) බාහිර කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය. 2. දිනූෂා වික්‍රමසේකර මෙනවිය කථිකාචාර්ය, රෝයල් ඉන්ස්ටිටියුට් 3. මැනික් ගුණරත්න මෙනවිය, කළමනාකරු - විශේෂිත පුහුණු සහ ආබාධිත සම්පත් මධ්‍යස්ථානය, ලංකා සේවා යෝජකයින්ගේ සම්මේලනය 4. රේඛා අත්තිඩිය මෙනවිය, (මනෝ විද්‍යාඥ, ආචාර්ය උපාධි අපේක්ෂක - කොළඹ විශ්වවිද්‍යාලය) 5. ශ්‍යාමනී හෙට්ටිආරච්චි මෙනවිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය. 6. මධුෂාන් මහතා, ආබාධ සහිත සිසුන් සඳහා සහකාර පුස්තකාලයාධිපති 7. කසුන් නයනජිත් මහතා, SJU 12. ගයනි ද සිල්වා මිය, CEDREP, නේවාසිකාගාර පාලිකාවන්, ශිෂ්‍ය කටයුතු
4	අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආබාධිතභාවය පිළිබඳ දැනුවත් කිරීම සහ සංවේදී කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	24.02.2022 and 31.03.2022	1. නිලූකා ගුණවර්ධන මෙනවිය (BA,MA,) බාහිර කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය. 2. මැනික් ගුණරත්න මෙනවිය, කළමනාකරු - විශේෂිත පුහුණු සහ ආබාධිත සම්පත් මධ්‍යස්ථානය, ලංකා සේවා යෝජකයින්ගේ සම්මේලනය 3. ඉෂාන් ජලීල් මහතා 4.සුහානි උදේශිකා මෙනවිය 5. ගයානි දිසානායක මෙනවිය
5	මානසික යහපැවැත්ම පිළිබඳ වැඩමුළු 1.ආතතිය සහ එය කළමනාකරණය 2. ඔරොත්තු දෙන මනසේ බලය 3.දැඩි පුරුදු වෙනස් කිරීම	29.11.2022 06.12.2022 13.12.2022	මහාචාර්ය ප්‍රියංජලී ද සොයිසා, මනෝ වෛද්‍ය අ.ඇ, වෛද්‍ය පීඨය.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ කළමණාකරන තොරතුරු දත්ත සමුදාය - විවිප්‍රකෝ පීඨ සමාලෝචනයේ භාවිතාව

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් එහි පුහුණු ක්‍රියාකාරකම් සහ පුහුණුවූ කාර්ය මණ්ඩලය පිළිබඳ වල දත්ත සමුදායක් පවත්වාගෙන යයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විධිමත් වැඩසටහන් විමර්ශන හරහා විශ්වවිද්‍යාල , අධ්‍යයන අංශ හා පීඨ වලින් බලාපොරොත්තුවන ගුණාත්මක ප්‍රමිතීන් සපුරාලීමට මෙම දත්ත පදනම ඉතා වටිනා බව සොයාගෙන තිබේ. ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ හා ඔවුන්ගේ අධ්‍යයන අංශවලට ඔවුන්ගේ වැඩසටහන් සමාලෝචන සඳහා සූදානම් වීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (2012 සිට 2019 දක්වා මෙම අවස්ථාවෙහි) තොරතුරු සපයන ලදී. වැඩසටහන් සමාලෝචනයේ 7.9 වන නිර්ණායකය වන ‘‘සිසුන් ඇගයීමට ලක් කරන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ කාර්යභාරය හා වගකීම් ඉටු කිරීමට ශක්‍යතා සහිත හා අවශ්‍යතා පිළිබඳ ගැටුම් රහිත පිරිසක්වන බවට පීඨය/ ආයතනය වගබලා ගනියි’’ යන්න සැපිරීම පිළිබඳ සාක්ෂි ලෙස මෙම දත්ත අත්‍යවශ්‍ය අංගයක් වේ.

පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු

විෂයය	සහභාගි වූ	සම්පූර්ණ කළ
	2022	**2022**
සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව		
උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (CTHE25)	93	කෙරෙමින් පවතී.
අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආබාධිතභාවය පිළිබඳ දැනුවත් කිරීම සහ සංවේදී කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	19	17
මානසික යහපැවැත්ම පිළිබඳ වැඩමුළු 01 දිනය - ආතතිය සහ එය කළමනාකරණය	15	15
02 දිනය - ඔරොත්තු දෙන මනසේ බලය	09	09
03 දිනය - දැඩි පුරුදු වෙනස් කිරීම	12	12
එකතුව	**148**	**53**

2.19 සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ පර්යේෂණ මධ්‍යස්ථානය (SPARC)

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ හා පර්යේෂණ මධ්‍යස්ථානය (SPARC) ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනයේ තීරණාත්මක ක්ෂේත්‍රයන් පිළිබඳ පර්යේෂණ, පුහුණුව, ප්‍රතිපත්ති විශ්ලේෂණය සහ උපදේශනය ඒකාබද්ධ කිරීම සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කේන්ද්‍රීය ස්ථානයක් සපයයි. සමාජ ප්‍රතිපත්තියට අදාළ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ඇතුළුව විශ්වවිද්‍යාලයේ විවිධ ශික්ෂණ පසුබිම්වල සිටින විශ්වවිද්‍යාල විද්වතුන්ට මෙන්ම විශ්වවිද්‍යාල පද්ධතියෙන් පිටත ආයතන අතර සහයෝගීතාවයට මෙම මධ්‍යස්ථානය පහසුකම් සපයයි.

මෙම මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ 273 වන සනාතන සභා රැස්වීමේදී අනුමැතිය ලබා දුන් අතර, ඉන් අනතුරුව 2005 ජුනි 10 වෙනිදා කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී (SLFI) නිල වශයෙන් ආරම්භ කෙරිණි.

අරමුණු

- සමාජ සංවර්ධනය හා සම්බන්ධ ගැටළු පිළිබඳව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල තුළ ස්වාධීන පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම
- විවිධ පසුබිම්වල විද්වතුන් අතර අන්තර්ශික්ෂණ හුවමාරුව සඳහා පහසුකම් සැලසීම
- පුහුණුව ලබා දීම සහ සමාජ විද්‍යා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- දරිද්‍රතාවය අවම කිරීම සහ සමාජ ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ විශ්ව විද්‍යාල තුළ දේශීය විශේෂඥතාව ශක්තිමත් කිරීම
- ලංකාවේ සමාජ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා අවස්ථා හඳුනාගැනීම

මෙම මධ්‍යස්ථානය සිය පර්යේෂණ සිදු කරනු ලබන්නේ තෝරාගත් නාභිගත ක්ෂේත්‍ර ගණනාවකට ය. එමඟින් විශ්ව විද්‍යාලයෙන් ප්‍රමාණවත් විශේෂඥ දැනුම හා දැනුම ලබා ගත හැකිය. මෙම නාභීය ක්ෂේත්‍ර වරින් වර සමාලෝචනය කරනු ලබන්නේ විශ්වවිද්‍යාලය තුළ ලබා ඇති නව අත්දැකීම් හා විශේෂඥ අවධානය අවශ්‍ය වන නැගී එන තිරණාත්මක කරුණු අනුව ය.

අ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු:

විෂයය	ප්‍රකාශයට පත්කළ	ඉදිරිපත් කළ
	2021	**2021**
අ. පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව	5	10
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-
ඇ. වාරසඟරා ලිපි සංඛ්‍යාව	1	1
ඈ. ලිපි සංඛ්‍යාව	4	4
ඉ. සාරසංක්ෂේප සංඛ්‍යාව	5	5
එකතුව	**15**	**20**

ආ. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	**2021 (රු.)**
අ. පෞද්ගලික වැටුප් හා වේතන	2,460,000.00
ආ. ප්‍රවාහන	-
ඇ.සැපයුම්	-
ඈ.නඩත්තු සුළු මුදල්	60,000
ඉ. කොන්ත්‍රාත් සේවා	-
ඊ.වෙනත්	-
එකතුව	**2,520,000.00**

ඇ. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර :

විෂයය	**2021 (රු.)**
අ. ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ ලබා ගැනීම	370,00.00
ආ. යන්ත්‍ර අත්පත් කර ගැනීම	-
ඇ. ගොඩනැගිලි හා සැකිලි අත්පත් කර ගැනීම	-
ඈ. වෙනත්	-
එකතුව	**370,000.00**

ඇ. ව්‍යාපෘති පිළිබඳ තොරතුරු (දේශීය/විදේශීය ආධාර සහිත): :

නම හා විස්තර	ණය / ආධාර	අනුග්‍රාහක ආයතනය	TCE (ලං.රු.)
රුසියාව, ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශයේ විශ්වවිද්‍යාල වල බලශක්ති කාර්යක්ෂමතාව සහ දේශගුණික විපර්යාසයන්ට අදාළ පාරිභෝගික හැසිරීම් සමඟ අධ්‍යාපනය ඒකාබද්ධ කිරීම	ආධාර	Erasmus + යුරෝපා සංගමය	13,335,497.08
අවතැන් වීමෙන් පසු නැවත ගොඩනැගීම (REGARD)	ආධාර	Erasmus + යුරෝපා සංගමය	6,717,553.24
නිවර්තන කෘෂි පරිසර පද්ධති තුළ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම (BRITAE)	ආධාර	Erasmus + යුරෝපා සංගමය	15,736,316.76
දේශගුණික අනුවර්තනය සඳහා ගොඩනඟන ලද පරිසරය ඉගෙනීම (BEACON) 2020-2023	ආධාර	Erasmus + යුරෝපා සංගමය	8,464,896.72
බහු අන්තරායකාරී පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති හරහා කොවිඩ් -19 සහ වසංගත සූදානම වැඩිදියුණු කිරීම	ආධාර	UKRI GCRF/ COVID-19 විසඳීමට නිව්ටන් අරමුදල් ප්‍රතිචාර කැඳවීම	2,455,947.56

*TCE: ස්පෘශ්‍ය පොදු කොටස්

ඉ. ව්‍යාපෘති ව්‍යදම් පිළිබඳ තොරතුරු (දේශීය/විදේශීය ආධාර සහිත)

නම	TCE (රු.)	2021 වැය (රු.)	31.12.2021 දිනට සමුච්චිත වැය	භෞතික ප්‍රගති ප්‍රතිශතය
රුසියාව, ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශයේ විශ්ව විද්‍යාල වල බලශක්ති කාර්යක්ෂමතාව සහ දේශගුණික විපර්යාසයන්ට අදාළ පාරිභෝගික හැසිරීම් සමඟ අධ්‍යාපනය ඒකාබද්ධ කිරීම	13,335,497.08	695,902.88	-	85%
අවතැන් වීමෙන් පසු නැවත ගොඩනැගීම (REGARD)	6,717,553.24	888,900.00	-	95%
නිවර්තන කෘෂි පරිසර පද්ධති තුළ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම (BRITAE)	15,736,316.76	508,959.28	-	40%
බහු අන්තරායකාරී පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති හරහා කොවිඩ් -19 සහ වසංගත සූදානම වැඩිදියුණු කිරීම	2,455,947.56	1,038,776.96	-	75%
දේශගුණික අනුවර්තනය සඳහා ගොඩනඟන ලද පරිසරය ඉගෙනීම (BEACON) 2020-2023	8,464,896.72	1,145,334.824	-	20%

*TCE: ස්පෘශ්‍ය පොදු කොටස්

2.20 ජාත්‍යන්තර කාර්යාලය (IOUC)

උසස් තත්ත්වයේ ඉගැන්වීම් හා පර්යේෂණ තුළින් දැනුම නිෂ්පාදනයේ ගෝලීය හවුල්කරුවකු බවට පත්වීම සඳහා අන්තර්ජාතික පිළිගත් ශාස්ත්‍රීය විශිෂ්ටතා මධ්‍යස්ථාන සමඟ උපාය මාර්ගික සබඳතා වර්ධනය කර ගැනීමට කොළඹ විශ්වවිද්‍යාලය සතුව දැඩි කැපවීමක් ඇත. 2008 දී පිහිටුවන ලද කොළඹ විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික කාර්යාලය ප්‍රසිද්ධ විශ්ව විද්‍යාල සමඟ අන්තර්ජාතික සහයෝගිතාවයන්, අධ්‍යාපන මධ්‍යස්ථාන, අධ්‍යාපනික වැඩසටහන්, වෘත්තීය ශාස්ත්‍රීය සංගම් සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්, කාර්ය මණ්ඩල සංචලන වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ ඒකාබද්ධ පර්යේෂණ තුළින් එවැනි සම්බන්ධතා වර්ධනය කර ගැනීමට හා වැඩිදියුණු කිරීමට උත්සාහ කරයි.

කොළඹ විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර සබඳතා වර්ධනය කිරීම සඳහා පහසුකම් සැපයීම, කොළඹ විශ්වවිද්‍යාලය පිළිබඳ තොරතුරු යථා කාලයේ දී පැමිණෙන ශිෂ්‍යයන් හට ලබා දීම සහ ඔවුන් ආචාර්ය මණ්ඩලය සමඟ සම්බන්ධ කිරීම, විශ්වවිද්‍යාලයට පැමිණෙන ජාත්‍යන්තර සිසුන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් මෙරට වාසය කරන කාල සීමාව තුළ ඔවුන්හට උපකාර කිරීම සුසාධ්‍යකරණය මෙහි මෙහෙවර වේ.

2008 වසරේ දී ජාත්‍යන්තර කාර්යාලය ආරම්භ කළ දා පටන් ම කොළඹ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සම්බන්ධතා ප්‍රවර්ධනයෙහි ලා එය මහෝපකාරී විය. ව්‍යාප්තව පැවති කොවිඩ් -19 වසංගතය හේතුවෙන් බොහෝ ක්‍රියාකාරකම් කල් තැබීමට සිදු වුවද එය සතුව වර්තමානයේ දී සාර්ථක ශිෂ්‍ය හුවමාරු හා කාර්යමණ්ඩල සංචරන වැඩසටහන් බොහොමයක් ද පවතී.

කොළඹ විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර කාර්යාලයේ අරමුණු:

1. කොළඹ විශ්වවිද්‍යාලය හා සහයෝගී විශ්වවිද්‍යාල/අධ්‍යයනායතන අතර සහයෝගිතා පර්යේෂණ හා නව්‍යජනන සඳහා පර්යේෂණ ප්‍රවර්ධනය.
2. විදේශ අධ්‍යාපනය ලැබීමේ නව වැඩසටහන් ස්ථාපනය කිරීම හා පවත්නා සහයෝගිතාවන් වර්ධනය
3. ආයතනික සම්බන්ධතා හරහා කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා විදේශයන්හි පශ්චාත් උපාධි අවස්ථා නිර්මාණය
4. පශ්චාත් උපාධි සිසුන් සඳහා ඊ- ඉගෙනුම් හා දුරස්ථ ඉගෙනීම් වැඩසටහන් සවිමත් කිරීම හා තොරතුරු තාක්ෂණ සංවර්ධනය
5. සම්බද්ධ විශ්වවිද්‍යාල සමග ඒකාබද්ධ සම්මන්ත්‍රණ, සමුළු හා වැඩමුළු සංවිධානය
6. හවුල්කාර ආයතන සමඟ උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි සිසුන් සඳහා නව පර්යේෂණ අවස්ථා ඇති කිරීම සහ පවතින පර්යේෂණ ජාල ශක්තිමත් කිරීම.

ඉහත කී අරමුණු අනුව යමින් 2022 වසරේ දී ජාත්‍යන්තර ඒකකය ක්‍රියාකාරකම් රැසකට සහභාගී වූ අතර විදේශයන්හි විශ්වවිද්‍යාල හා අධ්‍යයනායතන සමග නව සබඳතා ගොඩ නැගීය.

<u>ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සමග සහයෝගිතා</u>:

විශ්වවිද්‍යාලය 2018 වර්ෂය තුළ පහත සඳහන් විදේශීය විශ්වවිද්‍යාල හා ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම්වලට එළැඹිණි:

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජපන් තානාපති කාර්යාලය සමග ඇති කරගත් ගිවිසුම
2. ජිනන් විශ්ව විද්‍යාලය, චීනය
3. රීගා තාක්ෂණික විශ්වවිද්‍යාලය, ලැට්වියාව
4. බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව
5. චෙයිඩොන්ග් ක්ලවුඩ් අධ්‍යාපන සමූහය, චීනය.
6. සීමාසහිත ලන්ඩන් විභාග මණ්ඩලය, එ.රා.
7. මෙරියල් SAS, ප්‍රංශය
8. යුනෙස්කෝ කලාපීය කාර්යාලය, බැංකොක්
9. හයිනන් විශ්ව විද්‍යාලය, චීන මහජන සමූහාණ්ඩුව
10. OXFAM, ඕස්ට්‍රේලියාව
11. ජස්ටස් ලීබිග් විශ්වවිද්‍යාලය, ජීසෙන්, ජර්මනිය.
12. ක්ෂය රෝගය සහ පෙනහළු රෝගවලට එරෙහි ඒකාබද්ධ ජාත්‍යන්තර සංගමය , ප්‍රංශය
13. ඩර්හැම් විශ්වවිද්‍යාලය, එ.රා.
14. ඕජි විශ්වවිද්‍යාලය, ජපානය
15. ෂැංහයි විශ්වවිද්‍යාලය, චීනය
16. ජවහර්ලාල් නේරු විශ්වවිද්‍යාලය, ඉන්දියාව
17. ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව
18. ලුසාන් විශ්වවිද්‍යාලය, ස්විට්සර්ලන්තය.
19. ෆිලිප්ස් වෛද්‍ය පද්ධතිය, නෙදර්ලන්තය.
20. යුනාන් විශ්වවිද්‍යාලය, චීනය

විශ්වවිද්‍යාලය 2019 වර්ෂය තුළ පහත සඳහන් විදේශීය විශ්වවිද්‍යාල හා ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම්වලට එළැඹිණි:

1. වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CIMA), එක්සත් රාජධානිය
2. ආතරයිටිස් සහ රූමැටික් කවුන්සිලය, එක්සත් රාජධානිය

3. පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව, එක්සත් රාජධානිය
4. නිව් මෙක්සිකෝ විශ්ව විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය
5. විල්නියස් ගෙඩිමිනාස් තාක්ෂණික විශ්ව විද්‍යාලය, ලිතුවේනියාව
6. හඩර්ස්ෆීල්ඩ් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය
7. ග්‍රාස් විශ්ව විද්‍යාලය, ඔස්ට්‍රියාව
8. ටෙම්පල්ටන් ලෝක පුණ්‍යාධාර පදනම, බහමාස්
9. සූරිච් විශ්ව විද්‍යාලය, ස්විට්සර්ලන්තය
10. හුබෙයි විශ්වවිද්‍යාලය, චීනය
11. ෂිංහුවා විශ්වවිද්‍යාලය, චීනය
12. චෝර්සෝ විශ්වවිද්‍යාලය, පෝලන්තය.

විශ්වවිද්‍යාලය 2021 වර්ෂයේදී විදේශීය ආයතන සහ සංවිධාන 22ක් සමඟ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සහ අභිප්‍රාය ලිපි වලට අත්සන් කළේය.

1. අභිප්‍රාය ලිපිය- ඉන්දියානු විද්‍යා ආයතනය, බැංගලෝර්, ඉන්දියාව

2. ගිවිසුම- බර්මින්හැම් විශ්වවිද්‍යාලය- එක්සත් රාජධානිය

3. ගිවිසුම- වේක් ෆොරස්ට් විශ්ව විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය

4. අභිප්‍රාය ලිපිය- ජාන වෛද්‍ය විද්‍යා පදනම, එක්සත් රාජධානිය

5. අවබෝධතා ගිවිසුම- රොබට් කොක් ආයතනය, ජර්මනිය

6. බද්ධ දර්ශනසූරී ගිවිසුම- ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියාව

7. අනුපූරක ගිවිසුම- බීජිං විදේශ අධ්‍යයන විශ්ව විද්‍යාලය, හොංහේ විශ්ව විද්‍යාලය, භාෂා අධ්‍යාපනය සහ සහයෝගිතා මධ්‍යස්ථානය, චීන ජාත්‍යන්තර අධ්‍යාපන පදනම, චීනය.

8. ගිවිසුම- අලුත් කිරීම- මහිඩෝල් විශ්වවිද්‍යාලය, තායිලන්තය.

9. Erasmus+ ගිවිසුම- ව්‍රීජ් විශ්වවිද්‍යාලය, බ්‍රසල්ස්, බෙල්ජියම

10. Erasmus+ ගිවිසුම- ග්‍රැනඩා විශ්වවිද්‍යාලය, ස්පාඤ්ඤය.

11. ව්‍යාපෘති ගිවිසුම- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ශ්‍රී ලංකාව.

12. ගිවිසුම – ගෝලීය ජාන වෛද්‍ය විද්‍යා සාමූහිකය, ඇ.එ. ජ.

13. ව්‍යාපෘති ගිවිසුම- හඩර්ස්ෆීල්ඩ් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය

14. Erasmus + ගිවිසුම- හඩර්ස්ෆීල්ඩ් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය

15. Erasmus + ගිවිසුම- හඩර්ස්ෆීල්ඩ් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය

16. ව්‍යාපෘති ගිවිසුම- ටෙලර්ස් විශ්ව විද්‍යාලය, මැලේසියාව

17. ව්‍යාපෘති ගිවිසුම සංශෝධනය- චෝටර්ලූ විශ්වවිද්‍යාලය, කැනඩාව.

18. ව්‍යාපෘති ගිවිසුම සංශෝධනය- ඩි ලා සාලේ විශ්වවිද්‍යාලය, පිලිපීනය.

19. Erasmus + ගිවිසුම - ක්‍රිස්ටියන්ස්ටඩ් විශ්වවිද්‍යාලය, ස්වීඩනය

2021 වර්ෂයේදී කොළඹ විශ්වවිද්‍යාලය විසින් ඇති කරගත් අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සහ අභිප්‍රාය ලිපි - 2022 [2022 ජුනි දක්වා]

1. ජාතික යුනානි වෛද්‍ය ආයතනය සහ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය අතර අවබෝධතා ගිවිසුම
2. ශ්‍රී ලංකාවේ උග්‍ර වෙනස් නොවන උණ රෝග සඳහා රෝග විනිශ්චය සහ වසංගත රෝගවේදය පිළිබඳව සිවිල් පර්යේෂණ සහ සංවර්ධන පදනම (CRDFGLOBAL) සමඟ අවබෝධතා ගිවිසුම
3. ධාරක ප්ලාස්මා පටල ප්‍රෝටියෝමයේ වෙනස්කම් ඇති කිරීම මගින් ආසාදිත නොවන සෛල තුළ ඩෙංගු වෛරස් ආසාදනය ප්‍රබල කිරීම සඳහා ඩෙංගු NS1 ප්‍රෝටීනයේ කාර්යභාරය විමර්ශනය කිරීම සඳහා ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණ පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB) සමඟ අවබෝධතා ගිවිසුම.
4. නම්‍යශීලී දෙමුහුන් ඉලෙක්ට්‍රොනික උපකරණ නිෂ්පාදනය සඳහා සන්නායක ග්‍රැෆීන් තීන්තයක් සංවර්ධනය කිරීම පිළිබඳ ලෝක විද්‍යා විද්වතුන් (TWAS) සමඟ අවබෝධතා ගිවිසුම
5. ‘‘විද්‍යාව සහ ආගම සහ වර්ණාවලිය ගවේෂණය: ගෝලීය දෘෂ්ටිකෝණයක්’’ බර්මින්හැම් විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුම

6. ශ්‍රී ලංකාව සහ ජර්මනිය අතර උසස් අධ්‍යාපනය සහයෝගීතාව ප්‍රවර්ධනය සඳහා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ ජර්මනියේ ඩ්‍රෙස්ඩන්හි ටෙක්නීෂ් විශ්වවිද්‍යාලය (TUD) සමඟ අවබෝධතා ගිවිසුම
7. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ ඔස්ට්‍රේලියාවේ ධූලක විද්‍යාව සහ විෂ ජාලය අතර අවබෝධතා ගිවිසුම.
8. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය සහ ඉන්දියාවේ බෙනාරිස් හින්දු විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
9. තුර්කියේ හාජෙටෙපෙ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.
10. ජපාන ආයුර්වේද ප්‍රවර්ධනය සඳහා වූ සංගමය [JAPA] සහ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය අතර අවබෝධතා ගිවිසුම.
11. JICA මූලාසන වැඩසටහන පිළිබඳ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) ශ්‍රී ලංකාව සමඟ අවබෝධතා ගිවිසුම.

2023/2024 සඳහා ඇති කරගත හැකි සහයෝගීතා

1. බෙල්ජියමේ බ්‍රසල්ස්හි වී්‍ර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ජොනතන් වැන් ප්‍රමුඛ ඉන්දියන් සාගර කලාපයේ ආපදා අවදානම් අවම කිරීම සහ කළමනාකරණය සඳහා වන විශ්වවිද්‍යාල ජාලය (UN4DRR) 2021.12.13 දින කොළඹ විශ්වවිද්‍යාලයෙහි සංචාරයක නිරත වූ අතර කොළඹ විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීව ව්‍යාපෘතියේ ප්‍රගතිය යාවත්කාලීන කරන ලදී.
2. ආචාර්යවරුන් වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයෙහි කටයුතු සඳහා ආදී කේම්බ්‍රිජ් විද්‍යාර්ථීන්ගෙන් ලබා ගත හැකි සහය පිළිබඳව කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ස්ටීවන් ටූප් සහ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ දකුණු ආසියානු අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය එස්.පී. සිවසුන්දරම් සමඟ 2022.01.06 දින පැවති සූම් රැස්වීම.
3. විශ්වවිද්‍යාල දෙක අතර සහයෝගීතාවයේ විභව ක්ෂේත්‍ර පිළිබඳව තුර්කියේ ඉස්තාන්බුල් විශ්වවිද්‍යාලය සමඟ 2022.01.06 දින පැවති සූම් රැස්වීම.

4. එක්සත් ජනපද විශ්වවිද්‍යාල සහ ශිෂ්‍යත්ව වැඩසටහන්වලට අදාළ සබඳතා ශක්තිමත් කර ගැනීමේ හැකියාව පිළිබඳව අථත්‍ය රැස්වීමක් 2022.02.24 දින ප්‍රධාන ලේකම් කෙලී මැකාති මහත්මිය සමඟ පැවැත්විණි.
5. දකුණු ක්වීන්ස්ලන්ත විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර කාර්යාලයේ මහාචාර්ය රෙන් යී සහ ඔහුගේ කණ්ඩායම සමඟ 2022.06.20 දින සූම් රැස්වීමක් පවත්වමින් ඒකාබද්ධව අධීක්ෂණය කෙරෙන ආචාර්ය උපාධි වැඩසටහන් ආරම්භ කිරීමේ හැකියාව පිළිබඳව සාකච්ඡා කරන ලදී.
6. චීනයේ යැන්ග්ලින්හි වයඹ දිග කෘෂිකර්ම සහ වන විද්‍යා විශ්වවිද්‍යාලය සමඟ 2022.06.22 දින ඒකාබද්ධ සහයෝගීතාවයන් පිළිබඳව පැවති සූම් රැස්වීම.
7. රුසියාවේ මහජන මිත්‍රත්ව විශ්වවිද්‍යාලය [RUDN] සහ කොළඹ විශ්වවිද්‍යාලය සමඟින් 2022 සැප්තැම්බර් 26 දින කාර්ය මණ්ඩලය/ශිෂ්‍ය හුවමාරුව, ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන් මාර්ගගත හා නොබැඳි ආකාරයෙන් පවත්වන ලදී.
8. කොළඹ විශ්ව විද්‍යාලය සමඟ දිගුකාලීන හවුල්කාරිත්වයක් සඳහා ආරම්භක ක්‍රියා පටිපාටිය පිළිබඳව චීනයේ බීජිං හි Ambition Health Care හි ආචාර්ය ෆ්‍රෙඩ් සන් සමඟ හමුවීම.
9. බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ විද්‍යාත්මක සහ අධ්‍යාපනික සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා රුසියාවේ මහජන මිත්‍රත්ව විශ්ව විද්‍යාලයේ (RUDN) නියෝජිත පිරිස සමඟ 2022.09.26 දින පැවති රැස්වීම.

ජාත්‍යන්තර කාර්යාලය විසින් සිදු කළ අනෙකුත් ක්‍රියාකාරකම්

1. ජාත්‍යන්තර කාර්යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය එක්ව 2022 පෙබරවාරි 17 වන දින Weidong සුහුරු පංති කාමරය නිල වශයෙන් විවෘත කිරීම සහ කොළඹ විශ්වවිද්‍යාලය වෙත පැවරීමේ උත්සවය සංවිධානය කර තිබුණි. Weidong Cloud Education Group සහ උසස් අධ්‍යාපන නවෝත්පාදන සඳහා යුනෙස්කෝ ජාත්‍යන්තර මධ්‍යස්ථානය ඇතුළු විදේශීය හවුල්කරුවෝ සහ පරිත්‍යාගශීලීහු සූම් මාධ්‍යය හරහා උත්සවයට එක් වූහ.
2. 2020 AUA තරුණ සංසදය 2022 ඔක්තෝබර් 24 සිට 29 දක්වා කඳකස්ථානයෙහි නූර් සුල්තාන් නුවර නසර්බයෙව් විශ්වවිද්‍යාලයේදී පැවැත්වීමට නියමිත අතර ඒ සඳහා පහත සිසුන් තිදෙනා කොළඹ විශ්වවිද්‍යාලයෙන් නම් කරන ලදී.
   1. ආර්.ඒ.ඩී.ඩී. මනීෂා මහත්මිය, කලා පීඨය
   2 ඒ. බී.ඒ. ෆර්වීස් මහතා, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල
   3. අයි.වයි.අබේකෝන් මහත්මිය, නීති පීඨය
   සිසුන් තිදෙනාම මාර්ගගතව සහභාගී වූහ.

AUA මාර්ගගත අධ්‍යාපන වෙළඳපොල– 2022

1. ජාත්‍යන්තර කාර්යාලය AUA මාර්ගගත අධ්‍යාපන ප්‍රදර්ශනය -2022 හි ලියාපදිංචි වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරයි. උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා හඳුන්වා දීම සඳහා සැසි 30කට අධික සංඛ්‍යාවක් පැවැත්විණි.
2. ඉලක්ක කණ්ඩායමක් ලෙස රටවල් 150 ක සිසුන් මිලියන 3.6 කට අධික සංඛ්‍යාවක් සහ ගුරුවරුන් 220,000 කට අධික සංඛ්‍යාවක් සමඟ කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධි සහ පශ්චාත් උපාධි සැසි 2022 සැප්තැම්බර් 24 සහ ඔක්තෝබර් 09 යන දිනවල ClassIn හරහා පැවැත්විණි. සැසිවාරයේදී නරඹන්නන් 400 කට වැඩි පිරිසක් සිටියහ.
3. ජපානයේ අත්දැකීම් සහ එහි නවීකරණය සහ සංවර්ධනය තුළින් උගත් පාඩම් අනුගමනය කරමින් අනාගත නායකයින් පෝෂණය කිරීමේ අරමුණ ඇතිව ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) විසින් ශ්‍රී ලංකාව සමඟ එක්ව JICA මූලාසන වැඩසටහන දියත් කරන ලදී. "මෙයිජි විප්ලවය: පූර්ණ පරිමාණ නවීකරණයේ ආරම්භය"" නම් වූ වැඩසටහනේ සමාරම්භක සැසිය 2022 නොවැම්බර් 14 වැනි දින සවස 4.00 සිට 6.30 දක්වා දෙමුහුන් ඉසව්වක් ලෙස පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වන ලදී.
4. 2022 මාර්තු 16 සිට 29 දක්වා පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල තරුණ හා මැදි වයසේ අධ්‍යාපන අංශයේ නිලධාරීන්ගේ සම්මන්ත්‍රණය සඳහා පහත සඳහන් ආචාර්යවරු නම් කරන ලදහ.

1. මහාචාර්ය ඉරේෂා ලක්ෂ්මන්, ශාස්ත්‍ර පීඨය
2. සකීන් අලිඛාන් මහත්මිය, පුස්තකාලය
3. කලණි ධර්මසිරි මිය, ශ්‍රීපාලි මණ්ඩපය
4. යූ.ජී. චන්ද්‍රජිත් මයා, අධ්‍යාපන පීඨය
5. ඒ.සී.අයි. කිංකිණි මිය, අධ්‍යාපන පීඨය
6. අයි.ටී.ඩබ්.විලාසිතා මිය, අධ්‍යාපන පීඨය
7. ආර්.ඒ.බී.යූ.අයි. පෙරේරා මිය, අධ්‍යාපන පීඨය

ශිෂ්‍ය හුවමාරු වැඩසටහන:

පැමිණෙන ශිෂ්‍යයන්:

#	නම	වී. ගමන් බලපත්‍ර අංකය	විශ්ව විද්‍යාලය	කො.වී.වී. අනුබද්ධතාව	සටහන්
1	වෙරීනා බෙකර් මෙය	C2T7M4HM7	හයිඩිල්බර්ග් වී.වී, ජර්මනිය	SPARC	
2	ජොසපින් ඒකර්ට් මෙය		ඩ්‍රෙස්ඩන් කාර්මික වී.වී, ජර්මනිය	ඉංග්‍රීසි අ.අ.	ජර්මනියේ සිට අන්තර්ජාලය හරහා සම්බන්ධ විය
3	ලෑන්ඩර් ජොසෆින් මෙය	CCHK00581	ඩ්‍රෙස්ඩන් කාර්මික වී.වී, ජර්මනිය	ඉංග්‍රීසි අ.අ.	
4	බුඩී පියා තෙරීසා මෙය	CCR2C25HW	ඩ්‍රෙස්ඩන් කාර්මික වී.වී, ජර්මනිය	ඉංග්‍රීසි අ.අ.	
5	බී. නතාලි ඒද්‍රියන් මෙය	C2MKGZ4YC	ඩ්‍රෙස්ඩන් කාර්මික වී.වී, ජර්මනිය	ඉංග්‍රීසි අ.අ.	

පිටවන ශිෂ්‍යයන්:

1. කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ තරුණ ආචාර්යවරයකු වන ප්‍රනීත් රත්නායක මහතා සහයෝගිතා පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා ඉන්දියානු විද්‍යා ආයතනයට අනුයුක්තව මහාචාර්ය බික්‍රම්ජිත් බාසු යටතේ2022 ජූනි 1 සිට දෙසැම්බර් 31 දක්වා කටයුතු කළේය.

ශාස්ත්‍ර පීඨයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ මෙම සිසුහු 2021 සිසිර සෙමෙස්තරය ජර්මනියේ හයිඩිල්බර්ග් විශ්වවිද්‍යාලයෙහි අධ්‍යාපනය ලැබීමට තෝරා ගනු ලැබූහ.

1. විදුර රොඩ්‍රිගෝ (2018/BA/22771)

2. දුමේෂා විමලසිරි (2018/BA/22942)
3. තුරුමි රත්නායක (2018/BA/22763)
4. ෂැනල් බණ්ඩාර (2019/BA/23680)

ශිෂ්‍යත්ව සඳහා ශිෂ්‍ය නාමයෝජනා

මිට්සුබිෂි UFJ ශිෂ්‍යත්ව - 2022

1. ලක්ෂියා යෝගරත්නම්

2. එච්.ආර්.එන්. හපුගල

3. වී වත්සංකිතසර්ම

4. කේ.එල්. දෙල්වත්ත

5. බී.ඒ.එස්. වම්තාරා

6. එච්.ඒ.බී.බී. පෙරේරා

7. පී පතීරතන්

8. කේ.ඒ.සී.එම්. පෙරේරා

9. ටී.ටී වික්‍රමනායක

10. එස්.එම්. විජේවර්ධන

11. එම්.එෆ්.එෆ්. ෆස්රිනා

12. එච්.ආර්.ඊ. ආරච්චි

13. බී.ජී. සංදීපනී දේශානි ඩග්ලස්

14. රුවිමල් යසන්ත පතිරාජ

15. එස්.එච්. පුන්සරා සත්සරණි ප්‍රනාන්දු

16. මුදලිගේ ඉෂිනි ලක්මා ගුණවර්ධන

17. සී.බී වික්‍රමනායක

රෝඩිස් ශිෂ්‍යත්වය - 2022

ජාගොඩගේ නිශානි චතුරිකා මෙනවිය

ආරාධිත දේශන, වැඩමුළු, සම්මුඛ සාකච්ඡා, පැමිණීම් සහ වෙනත් ක්‍රියාකාරකම් - 2022:

AUA දේශන මාලාව 2022: බලශක්තියේ අනාගතය (මාර්ගගත)

ධරණීය සංවර්ධන ඉලක්ක අංක 07 යටතේ 2022 AUA දේශන මාලාව පවත්වන ලද්දේ ධරණීය සහ හරිත බලශක්තිය යන තේමාව ඔස්සේය. කොළඹ විශ්වවිද්‍යාලය 2022 ඔක්තෝබර් 25 වැනි දින AUA ලේකම් කාර්යාලය සමඟ එක් සැසියක සම සත්කාරකත්වය දැරීය.

විද්‍යා පීඨයේ භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය මහේන්ද්‍ර ප්‍රනාන්දු විසින් පුනර්ජනනීය බලශක්තිය; ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා බලශක්තිය සුරක්ෂිත කිරීම පිළිබඳ දේශනය පවත්වන ලදී. එම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීහු තිදෙනෙක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

2.21 කොන්ෆියුසියස් ආයතනය

මෙම ආයතනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ චීන භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ දැනුම හා ප්‍රවීණතාවය ලබා ගැනීමට පහසුකම් සැලසීමයි. මීට අමතරව, මෙම ආයතනය මෙම රටවල් දෙකට සම්බන්ධ වෙනත් ආශ්‍රිත අධ්‍යයන ක්ෂේත්‍ර ගණනාවක පර්යේෂණවල නිරත වීමට කැමති විද්වතුන්ට අවස්ථා සලසා දෙනු ඇත. කොන්ෆියුසියස් තමා නවෝත්පාදකයෙකු නොව, පැරණි චීන සම්ප්‍රදායේ සහ සදාචාරයේ සම්ප්‍රේෂකයෙකු පමණක් බව ප්‍රකාශ කිරීමට තරම් නිහතමානී වුවද, කෘතවේදී චීන ජනතාව ඔහු භාෂාව, දර්ශනය, සදාචාරය, අධ්‍යාපනය, දේශපාලනය යනාදි සංරචකයන්ගෙන් සැදුම්ලත් සමස්ත චීන සංස්කෘතියේ මූලය ලෙස සලකමින් මහා ඍන්තුවරයෙකු වැනි ගුරුවරයෙකු ලෙස ඔහුට ඉතා ඉහළින් සලකති. ඇත්ත වශයෙන්ම, චීන ජනතාව කොන්ෆියුසියස්තුමන් සමස්ත චීන ප්‍රායෝගික සංස්කෘතික ජීවිතයේ සාරාංශ ලකුණ ලෙස ගනිමින් ඉතා ගෞරවාන්විතව ඔහුව සලකති.

දැක්ම

දැනුම, අධ්‍යාපනය, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය අතර සහයෝගීතාව ගොඩනඟමින් කලාපීය හා ජාත්‍යන්තර කීර්තියේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීමට උත්සාහ කිරීම

මෙහෙවර

ජාතික සංවර්ධනයට දායක වන ස්වාධීන චින්තනයෙන් හා විශ්ලේෂණාත්මක කුසලතාවයෙන් නව්‍යකරණය වූ උසස් ප්‍රමිතීන් සහ සමාජ වගකීම් සහිත මානව දක්ෂතා ඇති කිරීමට කැපවීමෙන් ඉගැන්වීම් සහ පර්යේෂණ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීම.

අරමුණු

පහත සඳහන් නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට ආයතනය උත්සාහ කරයි:

- කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය යටතේ සියලුම පහසුකම් සහිත චීන භාෂාව සහ සංස්කෘතිය ඉගෙනීම සඳහා කොන්ෆියුසියස් ආයතනයක් පිහිටුවීම.
- අනෙකුත් පිළිගත් ආයතන විසින් සමාන ගුණාත්මක භාවයෙන් සහ ප්‍රමිතියෙන් යුතුව ක්‍රියාත්මක කෙරෙන අනෙකුත් සමාන වැඩසටහන් හා සමගාමීව කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය යටතේ චීන භාෂාව සහ සංස්කෘතිය ඉගෙනීමට ඇති උනන්දුව දිරිමත් කිරීම.
- කොළඹ විශ්වවිද්‍යාලය තුළ සිටින සිසුන්ට මෙන්ම චීන භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ ප්‍රවීණතාවය සහ කුසලතා ලබා ගැනීමට අපේක්ෂා කරන විෂය පිළිබඳව උනන්දුවක් දක්වන අනෙකුත් සියලුම සහභාගිවන්නන් සඳහා විශිෂ්ට ඉගෙනුම් අවස්ථා ලබා දීම.
- රජය විසින් සිදු කරනු ලබන පශ්චාත් ගැටුම් සංවර්ධන ක්‍රියාවලියට අවශ්‍ය ප්‍රවීණතාවයෙන් හා නිපුණතාවයෙන් යුතු මානව සම්පත් නිෂ්පාදනය කිරීමෙන් ජාතික අවශ්‍යතා සඳහා දායක වීම.
- රැකියා වෙළෙඳපොළ අවශ්‍යතා සහ චීන භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ උසස් අධ්‍යාපන අපේක්ෂාවන්ට සහාය වෙමින් කොළඹ විශ්වවිද්‍යාලය තුළ චීනය සහ එහි සංස්කෘතිය පිළිබඳ ඉගෙනීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත්වීම,

2.22 පුස්තකාලය

දැක්ම

ඉගෙනීම, ඉගැන්වීම හා බුද්ධිමය අභිවෘද්ධිය උදෙසා උචිත වටපිටාවක් නිර්මාණය කිරීමට ප්‍රයත්න දැරීම තුළින් දැනුම, අධ්‍යාපනය සහ පර්යේෂණ අතර ඇතිවන ඒකාබද්ධතාව ගොඩනැගීමේ විශ්වවිද්‍යාලයීය දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා සහයෝගය දැක්වීම

මෙහෙවර

කාර්ය මණ්ඩලය, සිසුන් හා පර්යේෂකයින්ගේ දැනුම් පිපාසය සංසිඳවීම සඳහා ඉහළ ගුණාත්මක සේවාවක් ලබා දීම මගින් විශ්වවිද්‍යාලයීය මෙහෙවර ශක්තිමත් කිරීම

අ. සම්පත් පිළිබඳ විස්තර

පුස්තකාලය	ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු පරිපාලන කාර්ය මණ්ඩලය	මුළු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
	2022	**2022**	**2022**	**2022**	**2022**
ප්‍රධාන පුස්තකාලය	9,644	285	04	34	311
වෛද්‍ය පුස්තකාලය	1,655	317	-	-	74
විද්‍යා පුස්තකාලය	2,886	337	04	-	84
භෞද විද්‍යා පුස්තකාලය	380	17	-	-	-
නාක්ෂණ පුස්තකාලය	1,247	03	-	-	09
එකතුව	**15,812**	**959**	**08**	**34**	**478**

ආ. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

පුස්තකාලය	පුස්තකාල යාධිපති	නි. පුස්තකාලයාධිපති	ජ්‍යෙෂ්ඨ සහ. පුස්තකාලයාධිපති (I)	ජ්‍යෙෂ්ඨ සහ. පුස්තකාලයාධි-පති II	සහ. පුස්තකාලයාධිපති
පුස්තකාලය	01	01	04	06	06
පුරප්පාඩු	-	-	-	-	02
එකතුව	**01**	**01**	**04**	**06**	**08**

ඇ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර : පරිපාලන

පුස්තකාලය	සහ. ලේ.	ජ්‍යෙ. සහ. ලේ.	නි. ලේ.	මුළු එකතුව	සටහන්
පුස්තකාලය	01	01	-	02	* වත්මන් ජ්‍යෙ. සහ. ලේඛකාධිකාරී 2019 සිට නි. ලේඛකාධිකාරී තනතුරට සුදුසුකම් සපුරා ඇත. **(**උසස්වීම් ඉල්ලා ඇත.**)** * වත්මන් සහ. ලේඛකාධිකාරී 2018 සිට ජ්‍යෙ. සහ. ලේඛකාධිකාරී තනතුරට සුදුසුකම් සපුරා ඇත. **(**උසස්වීම් ඉල්ලා ඇත**)**
පුරප්පාඩු	-	-	-	-	
එකතුව	01	01		02	

ඇ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර: වෙනත්

පුස්තකාලය	අධ්‍යයන සහායක	තාක්ෂණික නිලධාරී	ජ්‍යෙෂ්ඨතම (පු.තො.ස) ජෙ. මා. සහ.	ජ්‍යෙෂ්ඨ (පු.තො.ස) මා.ස.	කනිෂ්ඨ (පු.තො.ස) I/II/III	සුලු සේවක (පොත් බඳින්නා / පුස්. සහ./ වැඩ සහයක)
ප්‍රධාන පුස්තකාලය	-	01	02	05	20	පොත් බඳින්නා - 08 පුස්. සහායක - 11 වැ. සහායක - 04
වෛද්‍ය පුස්තකාලය	-	-	01	-	08	පුස්. සහායක - 02 වැ. සහායක - 04
විද්‍යා පුස්තකාලය		කළ.සහ. - 01	-	-	07	පුස්. සහායක - 04
තාක්ෂණ පුස්තකාලය	-	-	-	-	-	-
හෙද විද්‍යා පුස්තකාලය	-	-	-	-	-	-
පුරප්පාඩු	01	01	-	-	03	පොත් බඳින්නා – 01 පුස්. සහායක - 07
එකතුව	**01**	**03**	**03**	**05**	**38**	**41**

* තාක්ෂණ පුස්තකාලය සහ හෙද විද්‍යා පුස්තකාලය සඳහා අනුමත සේවක තනතුරු ස්ථාපිත කිරීමට ඉල්ලීම් සිදු කර ඇත. (පුස්තකාල තොරතුරු සහායකයන් දෙදෙනෙකු හා පුස්තකාල සහායකයන් දෙදෙනෙකු බැගින්)
කෙසේ වෙතත් තාක්ෂණ පීඨයට අනුමත සේවක තනතුරුවලින් තාක්ෂණ පුස්තකාලය සඳහා පුස්තකාල තොරතුරු සහායකයෙකු සහ පුස්තකාල සහායකයෙකු බඳවා ගනු ලැබිණි.

ඉ. පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂයය	ප්‍රකාශයට පත්කළ	අලෙවි කළ	ඉදිරිපත් කළ
	2022	**2022**	**2022**
අ. පර්යේෂණ සංඛ්‍යාව- පුස්තකාලය (ප්‍රධාන සහ පීඨ)	20	-	13
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. වාරසඟරා ලිපි සංඛ්‍යාව	07	-	-
ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව (ග්‍රන්ථ පරිච්ඡේද)	02	02	-
ඉ. විශේෂාංග ලිපි සංඛ්‍යාව (පුවත්ලිපි)	02	-	-
ඊ. වෙනත් (සමූළු/පර්.සම්.සැසි සාරසංක්ෂේප)	13	-	13
එකතුව	**44**	**02**	**26**

ඊ. පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු

විෂයය	සහභාගි වූ	සම්පූර්ණ කළ
	2022	**2022**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-
උදා: සිංහල අ.අ.	-	-
උදා: ආර්ථික විද්‍යා අ.අ.	-	-
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සංඛ්‍යාව	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-
ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	-
ඊ.වෙනත්	-	-

ප්‍රධාන පුස්තකාලය		
● මෙන්ඩලි විමර්ශන කළමනාකරණ පද්ධතිය භාවිතා කිරීම පිළිබඳ වැඩමුළුව	01	01
● අලුතින් බඳවාගත් කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල පුහුණුව	03	03
● කාර්යාල කටයුතු සඳහා EXCEL ඵලදායී ලෙස භාවිතා කිරීම		
● විශ්වවිද්‍යාලයීය සුරක්ෂිතාගාරයට සම්පත් උඩුගත කිරීම පිළිබඳ පුහුණු සැසි	01	01
● පුස්තකාල සහ තොරතුරු විද්‍යා ඩිප්ලෝමා සිසුන් සඳහා පුස්තකාලයේ කාර්යයන් පිළිබඳ පුහුණුව	01	01
● පුස්තකාලයේ කාර්යයන් පිළිබඳ ප්‍රායෝගික පුහුණුව		
● අපගේ මනස, මානසික සෞඛ්‍යය සහ මානසික අසනීප ගැන දැන ගනිමු		
● කාර්යාල කටයුතු සඳහා Gmail පිළිබඳ පුහුණුව	01	01
● ස්වර්ණාලේපන යන්ත්‍රය (Gilding Machine) පිළිබඳ පුහුණුව		
● නව මධ්‍යම පුස්තකාල කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුහුණුව		
● කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල තොරතුරු කළමනාකරණ පද්ධතිය (UCLIMS) පිළිබඳ පුහුණුව	01	01
● පර්යේෂණ සැලැස්මෙහි දාර්ශනික මූලයන්		
	01	01
	01	01
	01	01
	01	01
	02	02
	01	01
විද්‍යා පීඨ පුස්තකාල දිශානතිගතකිරීම් වැඩ සටහන		
EC-1004 - 1 මට්ටම සඳහා තොරතුරු කුසලතා සංවර්ධනය	01	01
● පශ්චාත් උපාධි සිසුන් සඳහා කෙටිකාලීන පාඨමාලාව	01	01
● අධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු වැඩ සටහන්	01	01
	04	04
වෛද්‍ය පීඨ පුස්තකාලය		
● උපාධි අපේක්ෂක පුහුණු වැඩසටහන්		
● පළමු වසර සිසුන් සඳහා ව්‍යාපෘති ඉදිරිපත් කිරීම ඇගයීම - 14.02.2022	02	02
● දිශානතිගතකිරීම් වැඩ සටහන	01	01
● කෙටිකාලීන පුහුණු පාඨමාලාව		
	01	01
	01	01
හෙද විද්‍යා පුස්තකාලය		
● දිශානතිගතකිරීම් වැඩ සටහන	02	02
එකතුව	**29**	**29**

a. ලැබුණු සම්මාන පිළිබඳ තොරතුරු

විෂයය	සම්මාන සංඛ්‍යාව	ආචාර්යවරුන් සංඛ්‍යාව	සිසුන් සංඛ්‍යාව
	2022	**2022**	**2022**
අ. දේශීය සම්මාන	03	03	-
ආ. ජාතික සම්මාන	-	-	-
ඇ.අන්තර්ජාතික සම්මාන	-	-	-
ඈ. වෙනත්			
එකතුව	**03**	**03**	**-**

මෙම වාර්තාවට අදාළ වෙනත් විස්තර/ කාර්ය සාධනයන්

කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල තොරතුරු කළමනාකරණ පද්ධතිය

- කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල තොරතුරු කළමනාකරණ පද්ධතිය (UCLIMS) සහිත කොහා විවෘත මෘදුකාංගය ස්ථාපිත කිරීම සම්පූර්ණ කරන ලදී. මෙමගින් සියලුම ශාඛා පුස්තකාල ප්‍රධාන පුස්තකාල පද්ධතිය සමඟ ඒකාබද්ධ කරන ලදී.

2.23 අභ්‍යන්තර තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA)

කලින් අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය (IQAU) ලෙස හැඳින්වූ කොළඹ විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික (QA) ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කිරීම සහ IQAC (අභ්‍යන්තර තත්ත්ව සහතික කුටිවල) ප්‍රගතිය සම්බන්ධීකරණය කිරීමේ වගකීම දරයි. තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය සෘජුවම උපකුලපතිවරයා යටතේ පවතින අතර කළමනාකරණය කරනු ලබන්නේ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වන අධ්‍යක්ෂවරයෙකු විසිනි. (වර්තමාන අධ්‍යක්ෂ මහාචාර්ය ගෝමින්ද පොන්නම්පෙරුම - වෛද්‍ය පීඨය). තත්ත්ව සහතික මධ්‍යස්ථානයෙහි පරිපාලන හා මූල්‍ය කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ පීඨාධිපතිවරුන්, අධ්‍යක්ෂවරුන් සහ සියලුම පීඨ/ආයතනවල හා ශ්‍රීපාලි මණ්ඩපයෙහි අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ කුටිවල අධ්‍යයන සම්බන්ධීකාරකවරුන්ගෙන් සහ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන්ගෙන් සමන්විත ‘සනාතන සභාවේ තත්ත්ව සහතික මධ්‍යස්ථාන ස්ථාවර කමිටුව’ විසිනි. තත්ත්ව සහතික මධ්‍යස්ථාන ස්ථාවර කමිටුව මාසිකව නිශ්චිත දිනයක රැස්වන අතර එහි සභාපතිත්වය උපකුලපතිවරයා විසින් දරනු ලැබේ. එහි ප්‍රගතිය සහ ක්‍රියාකාරකම් කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේදී මාසිකව වාර්තා වේ. තත්ත්ව සහතික මධ්‍යස්ථාන අධ්‍යක්ෂ තත්ත්ව සහතික කිරීම පිළිබඳ විවිප්‍රකොා ස්ථාවර කමිටුවේ සාමාජිකයෙකු ද වන අතර ඔහු කොළඹ විශ්වවිද්‍යාලය නියෝජනය කරයි. අධ්‍යක්ෂවරයා තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයෙහි ප්‍රගතිය පිළිබඳව විවිප්‍රකොා ස්ථාවර කමිටුවට වාර්තා කරන අතර, කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ, ආයතන සහ මණ්ඩප නියෝජනය කරන අභ්‍යන්තර තත්ත්ව සහතික සම්බන්ධීකාරකවරුන් හරහා තත්ත්ව සහතික කිරීම ආශ්‍රිත සියලුම ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම සිදු කරයි. තත්ත්ව සහතිකකරණයට අදාළ සියලුම ක්‍රියාකාරකම් සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂවරයාට සහාය වේ.

දැක්ම

දැනුම, අධ්‍යාපනය, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය අතර සහයෝගීතාවයන් ගොඩනඟා ගනිමින් කලාපීය හා ජාත්‍යන්තර කීර්තියේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීමට පරිශ්‍රම දැරීම.

මෙහෙවර

පරිවර්තනීය අධ්‍යාපනය සඳහා විනිවිදභාවය, වගවීම සහ ප්‍රත්‍යාවර්තකතාවයෙන් විශ්ව විද්‍යාල ඉගැන්වීම්, ඉගෙනුම්, තක්සේරු කිරීම් සහ අධ්‍යයන පාලනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා මිණුම් දණ්ඩක් වීම.

පරමාර්ථය

විශ්වවිද්‍යාලය තුළ තත්ත්ව සහතික සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම.

අරමුණු

1. ජාතික මාර්ගෝපදේශ සහ ජාත්‍යන්තර භාවිතයන්ට අනුකූලව තත්ත්ව සහතික සංස්කෘතියක් ආයතනගත කිරීම.

2. විශ්වවිද්‍යාල ක්‍රියා පටිපාටි විවිප්‍රකොා අවශ්‍යතා සහ ජාතික මාර්ගෝපදේශ සමඟ අනුගාමී බවට සහතික වීම.

3. තත්ත්ව සහතික කිරීමේ ක්‍රියා පටිපාටිවල නිරන්තර පරිවය මත පදනම් වූ අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම තුළින් විශ්වවිද්‍යාලය පිළිබඳ හිතකර මහජන සංජානනය වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.

මෙම අරමුණු ළඟා කර ගැනීම පිණිස මධ්‍යස්ථානය පහත කටයුතුවල නිරත වෙයි.

- බාහිර තත්ත්ව සහතික ඇගයීම් සහ ප්‍රතීතන අවශ්‍යතා සඳහා සූදානම් වීම සඳහා විශ්වවිද්‍යාලයට සහ විශ්වවිද්‍යාලය තුළ වැඩසටහන් ඉදිරිපත් කරන ආයතනවලට සහාය වීම.

- පාඨමාලා පිරිනමන ආයතනවලට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් මාර්ගෝපදේශ, ජාතික අවශ්‍යතා සහ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව සහ විෂය මිණුම් ප්‍රමිති වැනි ජාතික විමර්ශන ලක්ෂ්‍යයන්ට අනුකූලව උපාධි පැතිකඩ, විෂයමාලා ද ඇතුළුව සිය පාඨමාලා අරමුණු සහ ප්‍රතිඵල නිර්වචනය කිරීමට ඔවුන්ගේ වැඩසටහන් සකස් කිරීමේදී මග පෙන්වීම සහ සහාය ලබා දීම.
- විශ්වවිද්‍යාල ආයතන තුළ තත්ත්ව සහතිකකරණ කුටි පිහිටුවීමට සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහාය වීම
- වැඩමුළු පැවැත්වීම, සම්මන්ත්‍රණ පැවැත්වීම, අත්පොත් සංවර්ධනය සහ අනෙකුත් සුදුසු ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම් හරහා විශ්වවිද්‍යාලය තුළ සියලුම තත්ත්ව සහතික සම්බන්ධ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය (QAC) සහ අනෙකුත් බාහිර තත්ත්ව සහතික කිරීමේ ආයතන මෙන්ම අදාළ ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සම්බන්ධ වීම
- තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානයෙහි පාලනය සහ කළමනාකරණය සඳහා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම, සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම

2022 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- මහාචාර්ය ගෝමින්ද පොන්නම්පෙරුම මහතා 2022 මැයි 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී.
- ආචාර්ය නර්මදා ප්‍රනාන්දු මහත්මිය 2022 නොවැම්බර් 01 දින සිට මාස හයක (06) කාලයක් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය ලෙස පත් කරන ලදී.
- කොළඹ විශ්වවිද්‍යාලයේ වැඩ සම්මත ලේඛනය 2022 අගෝස්තු 29 වන දින පැවති තත්ත්ව සහතිකකරණය පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුවේ 55 වන රැස්වීමේදී සහ 2022 නොවැම්බර් 30 දින පැවති 480 වන සනාතන සභා රැස්වීමේදී සභාගත කර සම්මත කර ගැනුනි.
- තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා තත්ත්ව සහතිකකරණ සම්බන්ධීකාරකවරුන්ගේ සහාය ඇතිව තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ උපායමාර්ගික සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා ස්ථානීය රැස්වීම පැවැත්වීය.
    - තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාලයේ ඉදිරි ආයතනික සමාලෝචනයට සූදානම් වීම සඳහා SER ලිවීමේ කණ්ඩායම සමඟ රැස්වීමක් සංවිධානය කළේය. ආයතනික සමාලෝචනය සඳහා ස්වයං-ඇගයුම් වාර්තාව ලිවීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ආරම්භ කරන ලදී.
    - 2023-2027 සඳහා පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචන සැලැස්ම පිළි, ආයතනය සහ මණ්ඩපය වෙතින් එකතු කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරන ලදී.
    - තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරකගේ සහාය ඇතිව තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා විසින් මාසික රැස්වීම් පැවැත්වීම සම්බන්ධීකරණය, රැස්වීමේ සභා වාර්තාව සහ අනෙකුත් ලේඛන ඉදිරිපත් කිරීම සහ විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ ස්ථාවර කමිටුවේ ගත් තීරණ දැනුම් දීම සිදු කරනු ලැබේ.
    - අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ කුටිවල කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ ඒවා ගැන යාවත්කාලීන වීම
    - තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ හිටපු අධ්‍යක්ෂ විසින් ශ්‍රී ලංකා බ්‍රිතාන්‍ය කවුන්සිලය සමඟ කර්මාන්ත ස්ථානගත කිරීම් / උපාධි සීමාවාසික පුහුණුව වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙය සිදුවෙමින් පවතී.
    - තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය නව උපාධි වැඩසටහන් අනුමත කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සලසා ඇත.

2.24 ශාරීරික අධ්‍යාපන අංශය

ශාරීරික අධ්‍යාපන අංශයෙහි සමස්ත අරමුණ වන්නේ විශ්ව විද්‍යාලය තුළ ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම මෙන්ම තරඟකාරී සහ විනෝදාත්මක ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීමයි.

විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන විෂය බාහිර ක්‍රියාකාරකම් රාශියකින් ශිෂ්‍ය ජීවිතය වැඩිදියුණු වේ. ක්‍රීඩා පිටියක්, ගෘහස්ථ ක්‍රීඩාගාරයක්, ටෙනිස් පිටියක්, පැසිපන්දු පිටියක් සහ අංගසම්පූර්ණ නවීන බර ඉසිලීම් ශාලාවක් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ හැකියාවන් උපරිමයෙන් ගවේෂණය කිරීමට සහ වර්ධනය කිරීමට අවස්ථාව ලබා දෙයි.

2022 වර්ෂය තුළ ශාරීරික අධ්‍යාපන අංශයෙහි ක්‍රියාකාරකම්

1. ශූරයන්ගේ රාත්‍රිය (වර්ණ රාත්‍රිය 2019,2020/2021)
2. නවීකරණය කරන ලද ප්‍රේක්ෂකාගාරය විවෘත කිරීමේ උත්සවය
3. වර්ෂ දෙකකට පසු ක්‍රීඩා කටයුතු ආරම්භ කිරීම
4. ලේ දන්දීමේ වැඩසටහන
5. වාර්ෂික මහා සභා රැස්වීම 2022
6. ක්‍රීඩා ආබාධ තක්සේරු මධ්‍යස්ථානය
7. නායකත්ව පුහුණු වැඩසටහන 2022 2022
8. ආරාධිත පැසිපන්දු තරඟාවලිය
9. ක්‍රීඩා දිශානතිගතකරණ වැඩසටහන
10. ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල කබඩි ශූරතාවලිය 2022 2022
11. රන් කුසලාන 2022
12. නවක ශූරතාව 2022
13. කොළඹ විශ්වවිද්‍යාලය අන්ධ ක්‍රිකට් කණ්ඩායම් පිහිටුවීම.
14. ආරාධිත විශ්වවිද්‍යාල ටෙනිස් ශූරතාවලිය සංවිධානය කිරීම
16. IDUS 2022 සත්කාරකත්වය දැරීම
17. කොළඹ විශ්වවිද්‍යාලයීය කාන්තා රග්බි කණ්ඩායම පිහිටුවීම
18. සම්පත් වලිමුණි අනුස්මරණ එල්ලේ තරඟාවලිය ‘22 සංවිධානය කිරීම
19. ආරාධිත ඔරු පැදීමේ තරඟය සංවිධානය කිරීම– 2022 ඔක්. 02
20. අන්තර් විශ්වවිද්‍යාල රග්බි ශූරතාවලිය 2022
21. අන්තර් විශ්වවිද්‍යාල ක්‍රිකට් ශූරතාවලිය - 2022
22. අන්තර් විශ්වවිද්‍යාල කරාටෙ ශූරතාවලිය 2022
23. නව ක්‍රීඩා සහ ව්‍යායාම වෛද්‍ය ඒකකය

2.25 පාරිසරික මුලපිරීම් සඳහා වූ මධ්‍යස්ථානය (CEI)

පාරිසරික ආරක්ෂාව සහ තිරසාර හරිත සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා පාරිසරික මුලපිරීම් සඳහා මධ්‍යස්ථානය (CEI) ස්ථාපනය කරන ලදී. පාරිසරික මුල පිරීම් මධ්‍යස්ථානයේ අරමුණු පහත පරිදි වේ:

- හරිත මූලාරම්භයන් අනුගමනය කරමින් 2020 දී හරිත විශ්ව විද්‍යාලයක් බවට පත්වීම
- විශ්වවිද්‍යාලය සඳහා විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම
- විශ්වවිද්‍යාලයීය පරිසරය ආරක්ෂා කිරීම සහ විශ්වවිද්‍යාල පරිශ්‍රය වඩාත් පරිසර හිතකාමී බවට පත් කිරීම

- විශ්වවිද්‍යාල ප්‍රජාව අතර සහ විශ්වවිද්‍යාලයෙන් පිටත (පාසල්) පාරිසරික දැනුවත්භාවය ඇති කිරීම සහ හරිත ක්‍රියාකාරකම් සඳහා වෙනත් සහයෝගයන් ලබා දීම

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී විශ්ව විද්‍යාල ප්‍රජාව අතර පාරිසරික දැනුවත්භාවය ඇති කිරීම සඳහා බොහෝ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නිලධාරීන්ගේ සහ සංවිධානවල සහය ඇතිව වැඩසටහන් රැසක් සංවිධානය කිරීමට පාරිසරික මූලපිරීම් සඳහා මධ්‍යස්ථානය සැලසුම් කරයි.

2022 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- 2030 වන විට ගෝලීය විමෝචනය අඩකින් අඩු කිරීම සහ වඩාත් සෞඛ්‍ය සම්පන්න කාබන් ශූන්‍ය ලෝකයක් නිර්මාණය කිරීම අරමුණු කර ගත් Race to zero ව්‍යාපාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන
- පාරිසරික මූලපිරීම් සඳහා මධ්‍යස්ථානයේ නිතිපතා මාසික කළමනාකරණ කමිටු රැස්වීම් සහ කළමනාකරණ මණ්ඩල රැස්වීම්
- ආපනශාලා කාර්ය මණ්ඩලය, සනීපාරක්ෂක කාර්ය මණ්ඩලය සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් දෙදෙනෙකු සමඟ පැවැත්වෙන රැස්වීම්
- සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම සහ නව පරිසර නිලධාරියෙකු පත් කිරීම
- අපද්‍රව්‍ය කළමනාකරණය සහ අපද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ නිරන්තර අධීක්ෂණ කටයුතු

2.26 විශ්වවිද්‍යාල ව්‍යාපාර සංධාරක කුටිය (UBL)

විශ්ව විද්‍යාල දැනුම, පර්යේෂණ, නවෝත්පාදන සහ අති නවීන තාක්ෂණයේ පෙරමුණ ගෙන සිටී. කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ශක්තීන්ගෙන් එකක් වන්නේ කැපවීමෙන්, විවිධත්වයෙන් සහ පරිණත බවින් යුතුව අති නවීන පර්යේෂණවල නියැලෙන පර්යේෂකයන් කණ්ඩායමයි. එබැවින්, පර්යේෂණ හා නවෝත්පාදන මත පදනම් වූ ශාස්ත්‍රීය සංස්කෘතියක් නිර්මාණය කිරීමට යත්න දරන කොළඹ විශ්වවිද්‍යාලය සිය පර්යේෂණ ප්‍රතිඵල මහජන භාවිතය සඳහා ප්‍රයෝජනවත් නිෂ්පාදන සහ සේවා බවට පත් කළ යුතු අතර ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමෙන් ජනතාවට ප්‍රතිලාභ ලබා දිය යුතුය යන අදහසින් පසුවේ. ඉහත සඳහන් කළ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රතිඵල කර්මාන්ත හා ව්‍යාපාර වෙත පැවරීම අත්‍යවශ්‍ය වේ. මෙම පසුබිම යටතේ, කොළඹ විශ්වවිද්‍යාලය තුළ අංක 10/2016 දරන විවිප්‍රකෝ චක්‍රලේඛය ක්‍රියාවට නැංවීම සඳහා උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියේ ද සහය ඇතිව විශ්වවිද්‍යාල ව්‍යාපාර සංධාර කුටිය (UBL) පිහිටුවීම අත්‍යවශ්‍ය පියවරකි. කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ හුවමාරු කාර්යාලය (TTO) ලෙස ක්‍රියා කරන විශ්වවිද්‍යාල ව්‍යාපාර සංධාර කුටිය විශ්වවිද්‍යාලය තුළ කෙරෙන නවෝත්පාදනයන් සුරක්ෂිත කිරීම, කළමනාකරණය කිරීම සහ වාණිජකරණය කිරීම සඳහා පහසුකම් සපයන අතර මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා පර්යේෂණ ප්‍රතිඵල වෙළඳපොළට ගෙන ඒමට සහාය වේ.

දැක්ම

කොළඹ විශ්වවිද්‍යාලය තුළ සජීවී නවෝත්පාදන පරිසරයක් නිර්මාණය කරමින් තාක්ෂණ හුවමාරුව සහ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛයා බවට පත්වීම.

මෙහෙවර

විශ්වවිද්‍යාලය විසින් නිර්මාණය කරන ලද තාක්ෂණය මහජන භාවිතය සහ ප්‍රතිලාභ සඳහා නව නිෂ්පාදන සහ සේවාවන් බවට හැරවීමට පහසුකම් සැලසීම සහ විශ්වවිද්‍යාලය තුළ පවත්නා දැනුම් ප්‍රාග්ධනය සහ ව්‍යාපාරික ප්‍රජාවගේ ව්‍යවසායක විශිෂ්ටත්වය සම්බන්ධ කරමින් ජාතික සංවර්ධනයට දායක වීම.

අරමුණු

විශ්වවිද්‍යාල ව්‍යාපාර සංධාර කුටිය පහත අරමුණු අපේක්ෂා කරයි:

- අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ විද්‍යාර්ථීන් අතර විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධය (UBL) ජනප්‍රිය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
- විශ්වවිද්‍යාල පර්යේෂණ සහ නවෝත්පාදනවලින් උත්පන්න වන බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම සහ වාණිජකරණය කිරීම
- විශ්වවිද්‍යාල පර්යේෂණ මහජන භාවිතය සහ ප්‍රයෝජනය සඳහා නව නිෂ්පාදන සහ සේවා බවට පරිවර්තනය කිරීමට පහසුකම් සැලසීම
- විශ්වවිද්‍යාලවල සිදු කෙරෙන පර්යේෂණ සහ නවෝත්පාදනවල ඵල මහජනතාව වෙත ගෙන යාම
- කාර්මික සමාජයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ශිෂ්‍ය ව්‍යාපෘති වැඩිදියුණු කිරීමට සහාය වීම

- ජාතික සහ ජාත්‍යන්තර ගොනු කිරීම සහ ලියාපදිංචිය තුළින් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශ්වවිද්‍යාල පර්යේෂකයන්ට අවශ්‍ය සහාය ලබා දීම
- ප්‍රාරම්භක අවස්ථාවෙහි පවතින ව්‍යාපාර වැනි නව ව්‍යාපාර ආරම්භ කිරීමට විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට සහ විද්‍යාර්ථීන්ට මග පෙන්වීම
- විශ්වවිද්‍යාලයේ බුද්ධිමය වත්කම් කළමනාකරණයට සහාය වීම
- ව්‍යාපාරික ප්‍රජාව විශ්වවිද්‍යාල සම්පත් සමඟ සම්බන්ධ කිරීමෙන් විශ්වවිද්‍යාල-කර්මාන්ත සහයෝගිතා සහ හවුල්කාරිත්වය වැඩි දියුණු කිරීම
- තාක්ෂණය පදනම් කරගත් ආර්ථික සංවර්ධනය සහ රැකියා උත්පාදනය සඳහා ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීමට විශ්ව විද්‍යාලය දිරිමත් කිරීම
- බලපත්‍ර ලබාදීම හරහා විශ්වවිද්‍යාලයට නව ආදායම් මාර්ග උත්පාදනය කිරීම

2.27 වෘත්තීය මාර්ගෝපදේශක ඒකකය (CGU)

දැක්ම

කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්ට ප්‍රශස්ත වෘත්තියක් ආරම්භ කිරීමට සහ ශ්‍රම බලකායේ කාර්යක්ෂම සාමාජිකයින් වීමට අවශ්‍ය ආකල්පය, අභිප්‍රේරණය සහ කුසලතා ඇතුළුව අවශ්‍ය සම්ප්‍රේෂණය කළ හැකි කුසලතා ලබා දීම සහ පුහුණු කිරීම.

අරමුණු

පහත දැක්වෙන අරමුණු ඇතිව වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU) නිර්මාණය කරන ලදී:

- විශ්වවිද්‍යාලය සහ රැකියා අංශය අතර සබඳතා අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක ලෙස වර්ධනය කර ගැනීම
- විද්‍යාර්ථීන්ගේ හැකියාව, ආශාව සහ පවතින අවස්ථා මත පදනම්ව ප්‍රශස්ත වෘත්තීය මාවතක් තෝරා ගැනීමට හා ඉදිරියට යාමට උපාධි අපේක්ෂකයින්ට උපකාර කිරීම.
- උපාධි අපේක්ෂකයින්ට රැකියා අංශය වෙත දිශානතියක් ලබා ගැනීමට සහ ඵලදායී සන්නිවේදන කුසලතා, නායකත්ව කුසලතා, කණ්ඩායම් වැඩ කිරීමේ කුසලතා සහ කළමනාකරණ කුසලතා වැනි හුවමාරු කළ හැකි කුසලතා වර්ධනය කර ගැනීමට උපකාර කිරීම තුළින් ඔවුන් කායී බලකායේ ඵලදායී හා කායීක්ෂම සාමාජිකයින් බවට පත්කිරීම
- පවතින රැකියා අවස්ථා සෙවීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයතන සමඟ සම්බන්ධ වී උපාධිධාරීන්ගේ අවධානයට යොමු කර වඩාත් සුදුසු අයැදුම්කරුවන් සංවිධානය වෙත යොමු කිරීම.

අප විසින් විද්‍යාර්ථීන්ට පිරිනමන සේවාවන්

- වෘත්තීය සංවර්ධනය සඳහා උපදේශන සහ මග පෙන්වීම
- පෞද්ගලික උපදේශනය සහ මනෝවිද්‍යාත්මක උපදේශනය
- උපාධි අපේක්ෂකයින්ගේ ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ව්‍යවසාය පදනම් වූ ව්‍යාපෘතිය
- සේවා නියුක්තිය සහ මෘදු කුසලතා වැඩි දියුණු කිරීම පිළිබඳ වැඩමුළු පැවැත්වීම
- උපාධිධාරීන් ස්ථානගත කිරීම/ සේවා පළපුරුද්ද ලබා ගැනීම (කර්මාන්ත නිරාවරණය ලබා ගැනීම සඳහා අවස්ථා ලබා දීම)
- ප්‍රජා මූලික ක්‍රියාකාරකම් (සමාජ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා)
- වෘත්තීය සංවර්ධන වැඩසටහන (පාසලෙන් විශ්වවිද්‍යාල පරිසරයට මාරුවීමට පහසුකම් සැලසීම)

සමාලෝචන දත්ත සමුදාය

සමාගම් වර්ගය	ලියාපදිංචිවීම් සංඛ්‍යාව
රාජ්‍ය ආයතන සහ සංවිධාන	101
රජයේ අධ්‍යාපන ආයතන	21
පෞද්ගලික ආයතන සහ සමාගම්	470

පෞද්ගලික අධ්‍යාපන ආයතන	26
විදේශ අධ්‍යාපන ආයතන සහ තානාපති කාර්යාල	5
එකතුව	**623**

2.28 ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය (CFGE)

කොළඹ විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය (CGE) කැපවී සිටින්නේ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය ප්‍රජාවෙහි පුරුෂයින් හා කාන්තාවන් අතර සමගිය, සහයෝගිතාවය සහ අන්‍යෝන්‍ය ගෞරවය ප්‍රවර්ධනය කිරීම සඳහා ය.විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) නියෝග සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ස්ථාවර කමිටුවේ පෙරදසුන යටතේ පිහිටුවන ලද කොළඹ විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ සියලුම සාමාජිකයන් සඳහා හිතකර, සාධාරණ ස්ත්‍රී පුරුෂ සමාජභාවී වැඩ සහ ඉගෙනුම් පරිසරයක පැවැත්ම සහතික කිරීමෙහි නිරතව සිටී.

කොළඹ විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සමානාත්මතාවය සහතික කිරීමේ පෘථුල සංකල්පය තුළ, ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය පහත සඳහන් කාර්යයන්හි නිරත වේ.

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ සංකල්ප සහ කරුණු පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රජාව අතර දැනුවත්භාවය ඇති කිරීම
2. කොළඹ විශ්වවිද්‍යාලය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අසමානතාවය, අසාධාරණත්වය සහ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමට ක්‍රම සහ විධි හඳුනා ගැනීම.
3. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අසමානතාවය, අසාධාරණත්වය සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට විශ්වවිද්‍යාල ප්‍රජාව බල ගැන්වීම
4. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සම්පත් ගොනුවක් පවත්වා ගැනීම
5. විශ්වවිද්‍යාලය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය ඉහළ නැංවීම සඳහා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් තොර සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම සඳහා නියාමන කටයුතු සිදු කිරීම සහ යෝජනා ඉදිරිපත් කිරීම.
6. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අසමානතාවය, අසාධාරණත්වය සහ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ පැමිණිලි විසඳීමට සහ විශ්වවිද්‍යාලයට සහාය වීම.

කොළඹ විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ, මණ්ඩපය සහ ආයතන නියෝජනය කරන සාමාජිකයින්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් හරහා මෙම කටයුතු සිදු කෙරේ.

2022 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ තොරතුරු සහ සම්පත් සහිත වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම
- 2022 සැප්තැම්බර් 22 වැනි දින විද්‍යා පීඨයේ අධ්‍යයන හා අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා විශ්වවිද්‍යාලවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිරිහැර පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් පැවැත්වීම
- ගෘහස්ථ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය කෙරෙහි ආර්ථික අර්බුදයෙහි බලපෑම, එහි මනෝවිද්‍යාත්මක සහ නීතිමය පැතිකඩ, විශ්වවිද්‍යාල සිසුන් ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුවත්භාවය ඇති කරන්නේ කෙසේද යන්න සහ ඔවුන්ට ඒ පිළිබඳව කළ හැකි දේ, ඒ සඳහා උපකාර ලබා දෙන සම්පත් සහ සංවිධාන යනාදිය පිළිබඳව ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ඇමරිකානු මධ්‍යස්ථානය විසින් 2022 දෙසැම්බර් 1 වන දින පවත්වන ලද විද්වත් සාකච්ඡාවකට සිසුන්ගේ සහභාගිත්වය සම්බන්ධීකරණය කිරීම. මෙම සැසිය සඳහා විවිධ පීඨවල විද්‍යාර්ථීන් 11 දෙනෙකු නම් කරන ලදී.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය සඳහා වූ මධ්‍යස්ථානය විසින් පවත්වන ලද 'විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම' පිළිබඳ පුහුණු පුහුණු වැඩසටහන සඳහා මෙහෙයුම් කමිටු සාමාජිකයින් අට දෙනෙකු සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතා මධ්‍යස්ථානයේ වැඩබලන අධ්‍යක්ෂ සහභාගී විය.
- විශ්වවිද්‍යාල වෙබ් අඩවිය, පීඨ වෙබ් අඩවි සහ ශිෂ්‍ය අත්පොත් හරහා සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට නවක වදය සහ ලිංගික හිංසනය පිළිබඳ ප්‍රතිපත්ති සහ නීති සම්පාදනය කෙරේ.
- විශ්වවිද්‍යාලය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී

2.29 දුම්කොළ විරෝධී මධ්‍යස්ථානය (CCT)

දුම්කොළ විරෝධී මධ්‍යස්ථානය (CCT) යනු දුම්කොළ පාලනය පිළිබඳ රාමු සම්මුතියේ (FCTC) 5.3 වගන්තිය යටතේ කොළඹ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨයේ පිහිටුවන ලද ශ්‍රී ලාංකික දුම්කොළ නිරීක්ෂණාගාරයයි. මෙහි අරමුණ වන්නේ 5.3 වගන්තිය ශ්‍රී ලංකාව සහ කලාපය තුළ ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ දුම්කොළ කර්මාන්ත ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමයි. දුම්කොළ පාලනය පිළිබඳ රාමු සම්මුතිය (FCTC) යනු ලෝක සෞඛ්‍ය සංවිධානයේ 56 වන ලෝක සෞඛ්‍ය සභාව (WHO) විසින් 2003 මැයි මාසයේදී සම්මත කරන ලද අන්තර්ජාතික නීති යටතේ ඇති ගිවිසුමකි. මෙය 2005 පෙබරවාරි සිට බලාත්මක වූ අතර, 2019 වන විට එය අනුමත කරන රටවල් 181 ක් ඊට නීත්‍යානුකූලව බැඳී සිටී. දුම්කොළ පාලනය පිළිබඳ රාමු සම්මුතියේ 5.3 වගන්තියට බැඳුනු පාර්ශවයන් තම මහජන සෞඛ්‍ය ප්‍රතිපත්ති දුම්කොළ කර්මාන්තයේ වාණිජමය හා වෙනත් වේෂ්ටිත බැඳියාවන්ගෙන් ආරක්ෂා කර ගත යුතුය.

කොළඹ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨයේ මධ්‍යස්ථානයක් ලෙස දුම්කොළ විරෝධී මධ්‍යස්ථානය ක්‍රියා කරයි. (UCFM)

2022 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- ගෝලීය වශයෙන් COVID-19 සහ ව්‍යාප්තිය අතරතුර දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් සහ ක්‍රියාකාරකම් පිළිබඳව සිදු කරන ලද විමර්ශන පර්යේෂණ
- ලෝක දුම්කොළ විරෝධී දිනය සැමරීම සඳහා දුම්කොළ කර්මාන්තය විසින් දකුණු ආසියාවට එල්ල කර ඇති බලපෑම පිළිබඳ වාර්තා වූ සිදුවීම්වල සාරාංශය ප්‍රකාශයට පත් කරමින් නව පිටු මාලාවක් දියත් කරන ලදී.
- ඉන්දියාවේ මහජන සෞඛ්‍ය අධිශිෂ්‍යත්වය සහ වෙබිනාර් මාලාව සඳහා විශේෂඥ දැනුම ලබා දීම.
- දුම්කොළ සහ මධ්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණ සැසි සමුළුවට(NSTAP) සහභාගී වීම
- Tobacco Unmasked යෙදුම සහ hotspots හරහා රට සහ කලාපය තුළ දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් නිරීක්ෂණය කිරීම.

2.30 සන්නිවේදන හා නිර්මාණාත්මක කලා අධ්‍යයන අංශය

(පෙර ජනමාධ්‍ය ඒකකය ලෙස හඳුන්වන ලද)

සන්නිවේදන හා නිර්මාණාත්මක කලා අධ්‍යයන අංශය (පෙර ජනමාධ්‍ය ඒකකය ලෙස හැඳින්විණි) සිසුන්ට සන්නිවේදනය සහ නිර්මාණාත්මක කලා අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දේ. මේ වන විට අධ්‍යයන අංශය විද්‍යාර්ථීන් 1100 කට අධික සංඛ්‍යාවක් සඳහා පහසුකම් සපයයි. ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා යටතේ 1991 පෙබරවාරි මාසයේදී ජනමාධ්‍ය ඒකකය ආරම්භ කරන ලදී. 1992 මැයි මාසයේදී, ආසියා පදනමේ සහයෝගය ඇතිව ඒකකය කොළඹ විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍යවේදය ප්‍රථම උපාධි පාඨමාලාව ආරම්භ කළේය. 2003 දී, වත්මන් අවශ්‍යතා සපුරාලීම සඳහා ඒකකයේ අධ්‍යයන විෂය පථය පුළුල් කරන ලද අතර, ශික්ෂණය පිළිබඳ පුළුල් පරාසයක දැනුමක් සැපයීම සඳහා සම්පූර්ණ විෂය නිර්දේශය සංශෝධනය කරන ලදී. මේ වන විට අධ්‍යයන අංශය සන්නිවේදන සහ නිර්මාණාත්මක කලාව පිළිබඳ ගෞරව උපාධියක් පිරිනමයි. 2023 ජනවාරි මාසයේ සිට ජනමාධ්‍ය ඒකකය සන්නිවේදන හා නිර්මාණ කලා අධ්‍යයන අංශය ලෙස අධ්‍යයන අංශ මට්ටමට උසස් කර ඇත. අධ්‍යයන අංශය සතුව එක් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක්, කථිකාචාර්යවරු තිදෙනෙක් සහ තාවකාලික සහකාර කථිකාචාර්යවරයෙක් සිටිති.

2.31 අරාබි සහ ඉස්ලාමීය ශිෂ්ටාචාර ඒකකය

අරාබි සහ ඉස්ලාමීය ශිෂ්ටාචාර ඒකකය සිය පිරිනැමීම් තුළින් භාෂාව සහ ශිෂ්ටාචාර අධ්‍යයනයන් සඳහා වන වරණයන් පුළුල් කිරීම මගින් සහ සහ සියලුම විෂයයන්ගෙන් සිසුන් සහතික කිරීම මගින් අරමුණු කරයි. ඉස්ලාමීය ඉතිහාසය සහ ශිෂ්ටාචාරය, සංසන්දනාත්මක ආගම් සහ මැදපෙරදිග අධ්‍යයනයන් පිළිබඳව උගන්වන විවිධ පාඨමාලා ඒකක අතරින්

එකක් හෝ කීපයක් තෝරා ගැනීමට පීඨයේ විද්‍යාර්ථීන්ට අවස්ථාව ලබාදීම තහවුරු කිරීම මගින් ඉස්ලාමීය ඉතිහාසය සහ ශිෂ්ටාචාරය යන ක්ෂේත්‍රවල සමීප සහයෝගීතාවයක් සහ සංවර්ධනයක් ඇති කර ගැනීමට අපේක්ෂා කරයි.

ඒකකයෙහි වැඩසටහන් මගින් ඉස්ලාමීය ඉතිහාසය සහ ශිෂ්ටාචාරය පිළිබඳ අවබෝධය තුළින් ඉස්ලාමීය ලෝකය පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති කිරීම සහ පොදුවේ ඉස්ලාමීය සංස්කෘතිය අවබෝධ කර ගැනීම අවධාරණය කෙරෙයි. අපගේ භාෂා පාඨමාලා වලදී විද්‍යාර්ථීහු කථන සහ ලිඛිත අරාබි යන භාෂා දෙකෙහිම උසස් ප්‍රවීණතා මට්ටම් කරා ළඟා වෙති. මෙම වැඩසටහන් සැලසුම් කර ඇත්තේ විද්‍යාර්ථීන්ගේ සියලුම ඉස්ලාමීය ඓතිහාසික කාලපරිච්ඡේදවල සහ මුස්ලිම් ලෝකයේ සාහිත්‍ය, ආගමික, නීතිමය සහ ඓතිහාසික ග්‍රන්ථ කියවීමේ හැකියාව වර්ධනය කිරීමට සහ මුස්ලිම් ජනයාගේ අන්තර්ශික්ෂණ අභිලාෂයන් දිරිමත් කිරීම සහ විවිධ සංස්කෘතික වටිනාකම් අගය කිරීම සඳහා ය.

දැක්ම:

විශ්ව විද්‍යාලයේ සහ සමස්ත ජාතියේ සංවර්ධනයට දායක වන විශ්ව විද්‍යාලයේ ප්‍රමුඛ අංශයක් වීම.

මෙහෙවර:

අරාබි භාෂාව සහ ඉස්ලාමීය අධ්‍යයනයන් ඉගැන්වීම මගින් සදාචාරය වර්ධනය කිරීම, ජාත්‍යන්තර භාෂාවක සහ ප්‍රධාන ලෝක ශිෂ්ටාචාරයක දැනුමින් විද්‍යාර්ථීන් පොහොසත් කිරීම සහ ඉහළ ගුණාත්මයකින් යුතු කාර්ය සාධනයන් සඳහා මඟ පෙන්වීම තුළින් අන්තර් විශ්වවිද්‍යාලයීය ප්‍රජාවට, කලාපයට සහ සමස්ත ජාතියටම සේවය කිරීම.

2022 දී ඒකකය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

1. උපාධි අපේක්ෂක ක්ෂේත්‍ර පර්යේෂණ පුහුණුවක් පවත්වන ලදී
2. විෂයමාලා සමාලෝචන හා සංවර්ධන සැසි දෙකක් පවත්වන ලදී
3. නවීන අරාබි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහනක් නිර්මාණය කර අනුමැතිය ලබාගෙන ඇතසංනිවේදන අරාබි භාෂාව පිළිබඳව සහතික පත්‍ර පාඨමාලාවේ 4 වන කණ්ඩායම සම්පූර්ණ කළ අතර 4 වන කණ්ඩායම ආරම්භ කළේය.

2.32 දත්ත විද්‍යාව සඳහා වූ මධ්‍යස්ථානය (CDS)

2016 දී විද්‍යා පීඨයේ සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය යටතේ දත්ත විද්‍යා මධ්‍යස්ථානය (CDS) පිහිටුවන ලද්දේ ආචාර්යවරුන් , ශිෂ්‍යයන් සහ දත්ත විද්‍යා ක්ෂේත්‍රය අතර සහයෝගීතාව ඉහළ නැංවීම සඳහාය. ශ්‍රී ලංකාවේ දත්ත විද්‍යාවේ පර්යේෂණ හා සංවර්ධනයේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය බවට පත්වීම දත්ත විද්‍යා මධ්‍යස්ථානයෙහි **දැක්ම** වන අතර එහි **මෙහෙවර** වන්නේ ශාස්ත්‍රීය හා කාර්මික යන දෙඅංශයෙහිම හා දේශීය හා ජාත්‍යන්තර ප්‍රවීණයන් සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාවේ දත්ත විද්‍යාව පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනයට පහසුකම් සැලසීමයි.
පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට මධ්‍යස්ථානය උත්සාහ කරයි:

- දේශීය හා ජාත්‍යන්තර විද්වතුන් සහ කර්මාන්ත විශේෂඥයින් සමඟ සහයෝගයෙන් දත්ත විද්‍යා ක්ෂේත්‍රයේ සහයෝගී පර්යේෂණ පැවැත්වීම සහ දත්ත විද්‍යාවට අදාළ පශ්චාත් උපාධි සහ උපාධි මට්ටමේ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීම.

- වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සම්මන්ත්‍රණ හරහා සහ ගෝලීය සහනික කිරීම් සහ වෘත්තීය සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් දත්ත විද්‍යාව පිළිබඳ දැනුම බෙදා හැරීම.

- සැබෑ ලෝකයේ දත්ත විද්‍යා ශිල්පීය ක්‍රම භාවිතා කිරීමේදී සිසුන්ගේ සහ ආචාර්යවරුන්ගේ කුසලතා වැඩි දියුණු කරන අතරම ඔවුන්ට තාක්ෂණික ප්‍රවීණත්වය ලබා දෙමින් උපදේශන ව්‍යාපෘති හරහා දේශීය හා ජාත්‍යන්තර කර්මාන්ත සමඟ හවුල්කාරිත්වයට පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීම.

2022 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- සී/ස බ්‍රැන්ඩික්ස් ලංකා සමාගමට විශේෂඥ උපදේශන සේවා සැපයීම
- උපකාරක සැසි හරහා පීඨයේ පර්යේෂණයන්හි නියුතු විද්‍යාර්ථීන්ට සහාය වීම

- සී/ස එල් බී ෆිනැන්ස් ආයතනය වෙනුවෙන් උපදේශන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය සඳහා ධාරිතා ගොඩනැගීමේ වැඩමුළුවක් පැවැත්වීම
- 2023 ජනවාරි 10 වැනි දින ආරම්භ කෙරෙන Essentials of Data Science මාර්ගගත වැඩමුළු මාලාව සංවිධානය කර අයදුම්පත් කැඳවීම

2.33 කොළඹ විද්‍යා හා තාක්ෂණ කුටිය

"Cell" ලෙස හැඳින්වෙන කොළඹ විද්‍යා හා තාක්ෂණික කුටිය යනු කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය යටතේ ඇති ඇපයෙන් සීමිත සමාගමක් වන අතර එහි සියලුම සාමාජිකයින් පීඨයේ ආචාර්යවරුන් වේ. සමාගමේ වගන්ති විශ්වවිද්‍යාල පාලක සභාව සහ වි.වි. ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත කර ඇති අතර සමාගම 2013 සැප්තැම්බර් 26 දින සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ලියාපදිංචි කරන ලදී.

විද්‍යා හා තාක්ෂණික කුටිය ස්ථාපනය කිරීමෙහි අරමුණු පහත දැක්වේ:

- පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන, විද්‍යාත්මක සේවාවන් සහ දැනුම හා තාක්ෂණ හුවමාරුව තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන හා සේවා කර්මාන්ත මෙන්ම කෘෂිකර්මාන්තය ද ප්‍රවර්ධනය කිරීමට හා සේවය කිරීමට
- විශ්වවිද්‍යාල ප්‍රජාවේ සාමාජිකයින් අතර ව්‍යවසායකත්වය පෝෂණය කිරීම සඳහා
- ආර්ථික වර්ධනය ඉලක්ක කරගත් පර්යේෂණ ව්‍යාපෘති සහ උපදේශන කටයුතු ආරම්භ කිරීමේ අවස්ථා වැඩි දියුණු කිරීම සහ
- සමාගම තුළින් දියුණු කරන ලද බුද්ධිමය දේපල සඳහා අයිතිවාසිකම් ලබා ගැනීමට සහ ආරක්ෂා කිරීමට පහසුකම් සැලසීම

ස්වදේශීය තාක්ෂණයන් නවීකරණය කිරීම සහ නවීන තාක්ෂණයන් මාරු කිරීම තුළින් ප්‍රජා සංවර්ධන කටයුතුවලදී විශ්වවිද්‍යාලයට විශාල කාර්යභාරයක් ඉටු කළ හැකි අතර එම දැනුම හා කුසලතාවන් ලබා ගැනීමට හා ප්‍රයෝජනයට ගැනීමට ප්‍රජාවට ඇති හැකියාව වැඩි දියුණු කෙරේ.

2022 දී මධ්‍යස්ථානය / ඒකකය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- විද්‍යා හා තාක්ෂණික කුටිය 2022 දී සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති දෙකක නිරත වී ඇත.
- භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ තෙවන වසර විද්‍යාර්ථීන් සඳහා "බුද්ධිමය දේපල සහ පේටන්ට් දත්ත සමුදාය සෙවීම" පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.
- (විද්‍යා හා තාක්ෂණික කුටිය හරහා) පේටන්ට් බලපත්‍ර තුනක් ප්‍රදානය කරන ලදී; ඒ අතරින් දෙකක් ජාතික පේටන්ට් බලපත්‍ර (NIPO) වන අතර අනෙක ප්‍රදානය කරන ලද්දේ UK-IPO විසිනි.
- නව පේටන්ට් අයදුම්පතක් NIPO වෙත ඉදිරිපත් කරන ලදී.
- කුටියෙහි කාර්ය මණ්ඩලය WIPO දුරස්ථ ඉගෙනුම් සඳහා ලියාපදිංචි වී ඇති අතර කුටියෙහි ප්‍රධාන විධායක නිලධාරී WIPO ගිම්හාන පාසල සාර්ථකව නිම කර ඇත.

<u>පේටන්ට් පිළිබඳ විස්තර</u>**:**

<u>ලබාදුන් ජාතික පේටන්ට් බලපත්‍ර</u>

- සමේ ව්‍යුත්පන්න චර්ම ෆයිබ්‍රොබ්ලාස්ට් සෛල කෙරෙහි වැල් කැප්පෙටියා (*Mallotus repandus*) සහ පුපුළ (*Vernonia zeylanica*) බහු ඖෂධ ආසවනයක පවතින සම පුනර්ජනනය කිරීමේ හැකියාව P (LK/P/21765): ජූලි 05, 2022
-

නව නිපැයුම්කරුවන්:
මහාචාර්ය පී.වී. උඩගම
ආචාර්ය උදය සමරතුංග
මහාචාර්ය ජයමිණි සෙනෙවිරත්න
ප්‍රනීත් රත්නායක මහතා

- මානව මෙසෙන්චයිමල් ප්‍රාථමික සෛල (LK/P/21537) ප්‍රගුණනය වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වල් ගස්ලබු (*Carica papaya*) වර්ගයේ ඉදුණු කොළ යුෂ වල පරිණත පත්‍ර යුෂ වල ප්‍රමාණයෙන් බැහැර කරන වර්ණදේහයේ කොටසකින් ලබාගත් අයනික නොවන මතුපිට-ප්‍රෝටීන් සංකීර්ණයක් (LK/P/21537): නොවැම්බර් 02, 2022

  නව නිපැයුම්කරුවන්:

  මහාචාර්ය පී.වී. උඩගම
  ආචාර්ය වින්ද්‍යා උඩලමත්ත

  මහාචාර්ය ලලිත් ජයසිංහ

- <u>ලබාදුන් අන්තර්ජාතික පේටන්ට් බලපත්‍ර (එ.රා.)</u>

- එන්සයිම නොවන විද්‍යුත් රසායනික සංවේදක (GB2591455): අගෝස්තු 17, 2022

නව නිපැයුම්කරුවන්:

මහාචාර්ය එම්.එන්. කෞමාල්
ආචාර්ය එල්.එච්.ආර්. පෙරේරා
මහාචාර්ය ජී.එච්.ඩී.එම්. හෙට්ටිආරච්චි
එච්.එච්.ඒ.එම්. රුවිනි මිය
කේ.එම්. පෙරේරා මිය

- <u>පේටන්ට් අයදුම්පත්‍රය</u>
- අධෝරක්ත කිරණවලට නිරාවරණයෙන් තොරව මානව මෙලනොසයිට් සෛලවල මෙලනින් නිපදවීම සඳහා කොටදිඹුල (*Ficus hispida*) සහ ඇත්තෝර (Cassia alata) (FCD) බහු ඖෂධ මිශ්‍රණය (LK/P/22221)

  - **නව නිපැයුම්කරුවන්**:
    මහාචාර්ය පී.වී. උඩගම
    ආචාර්ය උදය සමරතුංග
    මහාචාර්ය ජයමිණි සෙනෙවිරත්න
    ප්‍රනීත් රත්නායක මහතා

2.34 ආබාධිකත්ව පර්යේෂණ, අධ්‍යාපනය හා භාවිතය සඳහා වූ මධ්‍යස්ථානය (CEDREP)

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ආබාධිකත්ව පර්යේෂණ, අධ්‍යාපනය හා භාවිතය සඳහා වූ මධ්‍යස්ථානය (CEDREP), ආබාධ සහිත පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල්වලට සම්බන්ධ ආබාධිත පර්යේෂණ, අධ්‍යාපනය සහ අදාළ ජාතික හා ජාත්‍යන්තර ආයතන සහ සංවිධාන සඳහා අධ්‍යාපනික නායකත්වය සැපයීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ස්ථාපිත කර ඇත. මෙම මධ්‍යස්ථානය විසින් ජාතික ආබාධිත ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සූත්‍රය අන්තර්ග්‍රහණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා ක්‍රියාකාරී හවුල්කරුවෙකු වීමට කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ වෙනත් හවුල්කරුවන්ගේ සමුච්චිත දැනුම සහ ප්‍රවීණත්වය එක් කරයි. මීට අමතරව, වර්තමානයේ මෙම මධ්‍යස්ථානය ආබාධ සහිත සිසුන් සඳහා ශාස්ත්‍ර පීඨය සහ අධ්‍යාපන පීඨය මගින් ඔවුන්ගේ උපාධි පාඨමාලා සාර්ථකව නිම කිරීමට උපකාරක සේවා සපයයි. මෙම සේවාවන් කොළඹ විශ්වවිද්‍යාලයේ ආබාධ සහිත ඕනෑම සිසුවෙකුට විවෘතය.

දැක්ම

අන්තර්ග්‍රහණ සංස්කෘතියක් තුළ ආබාධ සහිත පුද්ගලයින්ගේ ජීවිත පොහොසත් කිරීම සඳහා ආබාධිතභාවය පිළිබඳ අධ්‍යයන සහ භාවිතයන් ප්‍රදර්ශනය කිරීම සහ ඒ සම්බන්ධ දැනුම බෙදා හැරීම සඳහා ශාස්ත්‍රීය නායකත්වය සැපයීමේ කේන්ද්‍රස්ථානයක් වීම.

මෙහෙවර

උපාධි හා පශ්චාත් උපාධි මට්ටම් දෙකෙහිම ආබාධිත අධ්‍යයන ප්‍රවර්ධනය කිරීම මගින් විචිත්‍රවත් අධ්‍යයන පරිසරයක් තුළ ආබාධ සහිත සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ග්‍රහණ විශ්ව විද්‍යාල අත්දැකීමක් ප්‍රවර්ධනය කිරීම සහ රජය, ආයතනික අංශය, සිවිල් සමාජය සහ ආබාධ සහිත පුද්ගලයින් ඇතුළු ප්‍රජාවන් විසින් සිදු කරනු ලබන ආබාධිතබව සම්බන්ධ කාර්යයන්හි ජාතික සාක්ෂි පදනම් කරගත් භාවිතයන් සංවර්ධනය කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පර්යේෂණ සහ ඇගයීම් තුළින් සහාය වීම.

2022 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- ශාස්ත්‍ර පීඨය වෙත පිරිනැමුනු උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධන ත්වරණ (AHEAD) ව්‍යාපෘති අරමුදල් උපයෝගී කරගෙන නව ආධාරක උපකරණ මිලදී ගන්නා ලදී.
- ශාස්ත්‍ර පීඨය වෙත පිරිනැමුනු උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධන ත්වරණ (AHEAD) ව්‍යාපෘති අරමුදල් උපයෝගී කරගෙන ඩිජිටල් ශ්‍රව්‍ය ග්‍රන්ථ පුස්තකාලයක් පිහිටුවන ලදී.

අ. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

මධ්‍යස්ථානය	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
		2022	2022	2022
ආබාධිකත්ව පර්යේෂණ, අධ්‍යාපනය හා භාවිතය සඳහා වූ මධ්‍යස්ථානය	ශාස්ත්‍ර පීඨයේ සහ අධ්‍යාපන පීඨයේ ප්‍රථම උපාධි වැඩසටහන්	95	1	3
එකතුව		**95**	**1**	**3**

3 පත්වීම් හා කාර්ය මණ්ඩල තොරතුරු

පත්වීම්

2022 වර්ෂය තුළ අධ්‍යයන, අධ්‍යයන සහාය, පරිපාලන සහ මූල්‍ය සහ පරිපාලන අනෙකුත් ශ්‍රේණි සඳහා නව පත්වීම් 33ක් පියවල සිදු කරන ලදී.

අධ්‍යයන	-	26
අධ්‍යයන සහායක	-	05
පරිපාලන හා මූල්‍ය	-	01
පරිපාලන වෙනත්	-	00

කාර්ය මණ්ඩල පත්වීම්

2022 වසරේදී සිදුකරන ලද මුළු පත්වීම්, ස්ථිර කිරීම්, උසස් කිරීම් ස්ථානමාරු හා අනෙකුත් කාර්ය මණ්ඩල වෙනස් කිරීම් පහත උපලේඛනයෙහි දැක්වේ.

වගුව 3.1: කාර්ය මණ්ඩල වෙනස්වීම්

වෙනස්වීම	අධ්‍යයන	අධ්‍යයන සහායක	පරිපාලන සහ මූල්‍යය	පරිපාලන වෙනත්
නව පත්වීම්	23	5	1	0
නව පත්වීම් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මූලාසන මහාචාර්ය	04	-	-	-
ස්ථිරවීම්	31	4	6	0
උසස්වීම්	75	1	2	0
ස්ථානමාරු	0	0	3	0
සේවා දිගු	28	0	0	0
නිදහස්කිරීම්	2	0	0	1
විශ්‍රාමයාම්	6	0	0	0
ඉල්ලා අස්වීම්	10	3	0	0
තනතුරු හිස් කිරීම්	9	0	0	0
සේවා අවසන් කිරීම	1	0	0	0
සේවා අත්හිටුවීම්	0	0	0	0
සප්තවර්ෂික නිවාඩු	40	0	3	0
අධ්‍යයන නිවාඩු	35	0	0	0
අධ්‍යයන නිවාඩු දිගු	51	0	0	0
සම්මන්ත්‍රණ /සමුළු/ පුහුණු වැඩසටහන්	111	0	0	0
විවේක නිවාඩු	212	6	3	0
වෛද්‍ය නිවාඩු	13	1	0	0
අඩ වැටුප් නිවාඩු	0	0	0	0
වැටුප් රහිත නිවාඩු	4	0	0	0
සප්තවර්ෂික නිවාඩුවලින් පසු පැමිණීම්	23	0	0	0
අධ්‍යයන නිවාඩුවලින් පසු පැමිණීම්	26	0	0	0
විශේෂ නිවාඩු	1	0	0	0
සේවයෙන් නිදහස්කිරීම්	3	0	0	0
මරණ	2	0	0	0
එකතුව	**710**	**20**	**18**	**01**

වගුව 3.2: පීඨයන්හි සහ පුස්තකාලයෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව			පුරප්පාඩු
			ස්ත්‍රී	පුරුෂ	මුළු එකතුව	
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය (මූලාසන)	U-AC 5(I)&(II)	**44**	16	18	**34**	10
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U-AC 5(I)		16	10	**26**	
මහාචාර්ය	U-AC 5(II)		49	55	**104**	
සහාය මහාචාර්ය	U-AC 4		02	05	**07**	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	U-AC 3(I)		58	50	**108**	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	U-AC 3(II)	**772**	118	68	**186**	147
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (සංක්‍රාමික) / කථිකාචාර්ය (ස්ථිර නොවූ)	U-AC 3(III)		35	19	**54**	
කථිකාචාර්ය	U-AC 3(IV)		11	5	**16**	
කථිකාචාර්ය (ආධුනික)	U-AC 3(IV)		85	39	**124**	
පුස්තකාලයාධිපති	U-AC 5 (II)	**01**	01	00	**01**	00
නියෝජ්‍ය පුස්තකාලයාධිපති	U-AC 4	**01**	01	00	**01**	00
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (I ශ්‍රේණිය)	U-AC 3 (I)	**08**	08	02	**10**	-02
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (II ශ්‍රේණිය)	U-AC 3 (II)					
සහකාර පුස්තකාලයාධිපති	U-AC 3 (IV)	**10**	**03**	**03**	**06**	**04**

වගුව 3.3: පීඨයන්හි සහ පුස්තකාලයෙහි පරිපාලන, මූල්‍ය හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

	වැටුප් පරිමාණය	සේවා ප්‍රවර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව			පුරප්පාඩු
				ස්ත්‍රී	පුරප්පාඩු	මුළු එකතුව	
පරිපාලන කාර්ය මණ්ඩලය	U EX III	ජ්‍යෙෂ්ඨ මට්ටම	**02**	01	01	**02**	**00**
පරිපාලන කාර්ය මණ්ඩලය	U EX II		**31**	15	11	**26**	**05**
පරිපාලන කාර්ය මණ්ඩලය	U EX I	තෘතීය මට්ටම	**15**	09	04	**13**	**02**
වෙනත් විධායක කාර්ය මණ්ඩලය	U EX II	ජ්‍යෙෂ්ඨ මට්ටම	**02**	00	03	**03**	
වෙනත් විධායක කාර්ය මණ්ඩලය	U EX I/ U EX II	ජ්‍යෙෂ්ඨ මට්ටම / තෘතීය මට්ටම	**05**	-	-	**-**	**06**
වෙනත් විධායක කාර්ය මණ්ඩලය	U EX I	තෘතීය මට්ටම	**04**	01	01	**02**	
වෛද්‍ය නිලධාරී	U MO 2/ U MO 1	ජ්‍යෙෂ්ඨ මට්ටම	**05**	00	01	**01**	**04**
අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	U AS II/ I	තෘතීය මට්ටම	**82**	26	22	**48**	**34**

වගුව 3.4: පීඨයන්හි සහ පුස්තකාලයෙහි අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

සේවා ප්‍රවර්ගය	කාර්ය මණ්ඩල ප්‍රවර්ගය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව						ස්ථිර සේවක පුරප්පාඩු	තාවකාලික සේවක පුරප්පාඩු
				ස්ථිර			කොන්ත්‍රාත්				
				පි	ගැ	එ	පි	ගැ	එ		
ද්විතියික මට්ටම	තාක්ෂණික කාර්ය මණ්ඩලය	U-MN 4	**182**	09	17	26				**13**	**13**
		U-MN 3		00	00	00					
		U-MN 2		03	01	04					
		U-MN 1		00	00	00					
		U-MT 1		75	64	139					
ද්විතියික මට්ටම	ලිපිකරු හා සම කාර්ය මණ්ඩලය	U-MN 4	**430**	13	36	49				**48**	**44**
		U-MN 3		15	14	29	03	01	04		
		U-MN 2		01	05	06					
		U-MN 1		78	220	298					
ප්‍රාථමික මට්ටම	ප්‍රාථමික කාර්ය මණ්ඩලය	U-PL 3	**506**	55	01	56				**126**	**126**
		U-PL 2		100	23	123					
		U-PL 1		181	20	201					
	එකතුව		**1118**	**530**	**401**	**931**	**03**	**01**	**04**	**187**	**183**

4 පර්යේෂණ හා පර්යේෂණ ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

නව පර්යේෂණ රැසක් කිරීම තුළින් පර්යේෂණ ක්ෂේත්‍රයේ සිය විශිෂ්ටත්වය රැක ගැනීමට කොළඹ විශ්වවිද්‍යාලය සමත් විය. ප්‍රකාශන විශාල ප්‍රමාණයක් ප්‍රකාශනයට පත්කර ඇත. මේ අතර සමාලෝචිත සඟරා, දේශීය සහ විදේශීය සඟරා, සාරසංක්ෂේප, නිසිස සහ නිබන්ධන, ඉදිරිපත් කිරීම් සහ සංනිවේදන වේ. ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

පීඨය	2020	2021	2022
ශාස්ත්‍ර	116	105	59
අධ්‍යාපන	27	15	14
නීති	16	53	88
කළමනාකරණ	47	153	98
වෛද්‍ය	489	498	538
විද්‍යා	304	363	317
තාක්ෂණ	59	75	54
භෙද	5	13	71
ශ්‍රීපාලි මණ්ඩපය	39	114	62
එකතුව	**1102**	**1389**	**1301**

තරඟකාරී අයදුම්පත් ඉදිරිපත් කිරීම් ක්‍රියාවලියක් හරහා ආචාර්යවරුන්ට රජයේ සහ විදේශීය අරමුදල් ලබා ගත හැකි විය.

වාර්ෂික පර්යේෂණ සැසි සම්මන්ත්‍රණය 2022

කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය 2022 [ARS-UoC 2022] 2022 නොවැම්බර් 16 වන දින "උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අභියෝග අවම කිරීම සඳහා ඩිජිටල් පරිවර්තනය සහ නව්‍ය ප්‍රවේශයන්" යන තේමාව යටතේ පවත්වන ලදී. එය දෙමුහුන් ආකාරයෙන් සංවිධානය කරන ලද අතර, ස්ථානීය සහභාගිවන්නන් කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ මහාචාර්ය වී.කේ. සමරනායක ශ්‍රවනාගාරයට පෞද්ගලිකව පැමිණීමෙන් සහ මාර්ගගත සහභාගිවන්නන් සූම්, යූටියුබ් සහ ෆේස්බුක් යෙදුම් හරහා අන්තර්ජාලය ඔස්සේ සහභාගී වූහ.

වාර්ෂික පර්යේෂණ සැසි සම්මන්ත්‍රණය මගින් විශ්වවිද්‍යාල පීඨ, ආයතන, මණ්ඩපය, පාසල සහ පුස්තකාලය විසින් පවත්වනු ලබන සියලුම සම්මන්ත්‍රණ ඒකාබද්ධ කරයි. එමෙන්ම සියලුම පීඨ සහ ආයතන අතර අන්තර් ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය

කරන අතර පර්යේෂකයන්ට ඔවුන්ගේ කාර්යයන් ප්‍රදර්ශනය කිරීමට වේදිකාවක් සපයයි. මෙවර සම්මන්ත්‍රණය කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී.කරුණාරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කර තිබූ අතර කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ මහාචාර්ය කේ.පී.හේවාගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. ARS-UoC 2022 සමාරම්භක උත්සවය සම්භාවනීය අමුත්තන් සහ ආරාධිතයින් විසින් තෙල් පහන දැල්වීමෙන් ආරම්භ විය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වත්මන් සභාපති සහ මොරටුව විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මලික් රණසිංහ මහතා සහභාගී විය. මොරටුව විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන විවෘත ඉගෙනුම් වේදිකාව වැනි මුලපිරීම් සඳහා ඔහුගේ මැදිහත්වීම ලබා ගනිමින් උසස් අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනයක් හඳුන්වා දීමට උත්සාහ කළ ව්‍යාපෘතිවල සාර්ථකත්වය පිළිබඳව මහාචාර්ය රණසිංහ සිය කතාවේදී කතා කළේය. ඔහුගේ කතාවට පෙර, ඔහු විසින් පසුගිය වසරේ කොළඹ විශ්වවිද්‍යාලයේ සිදු කරන ලද පර්යේෂණ කටයුතුවලින් වැඩි ප්‍රමාණයක් ඇතුළත් වූ ARS-UoC 2022 හි වාර්තා සටහන් දියත් කරන ලදී. එය සාරසංක්ෂේප 256 කින් සහ මුඛ්‍ය දේශන, දේශන හෝ පූර්ණ දේශන 20 කින් සමන්විත වේ. මණ්ඩපය, පීඨ සහ ආයතන තමාට අදාළ 2022 සම්මන්ත්‍රණවල සාරාංශ සහ පර්යේෂණ පත්‍රිකා 371 ක් ද ප්‍රකාශයට පත් කර ඇත (මෙම සාරාංශ සමහරක් ARS-UoC 2022 වාර්තා සටහන්වල ඇතුළත් කර ඇත). වාර්තා සටහන් http://cmb.ac.lk/ars වෙතින් ලබාගත හැක.

ARS-UoC 2022 සමාරම්භක උත්සවයේදී ප්‍රධාන දේශන තුනක් පවත්වන ලදී. ඉන් පළමුවැන්න සිදු කරන ලද්දේ ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ අංශයේ ආර්ථික විද්‍යාඥයෙකු වන රියොතාරො හයාෂි මහතා විසිනි. COVID-19 වසංගත ව්‍යාප්තිය තුළ මාර්ගගත උසස් අධ්‍යාපනයේ නැගීම සහ පරිවර්තනය අතර සහසම්බන්ධතා සහ එහි අතුරුඵල වත්මන් ආර්ථික අර්බුදයට බලපා ඇති අන්දම ගැන දීපව්‍යාප්ත මාර්ගගත උසස් අධ්‍යාපන සමීක්ෂණයක දත්ත ඉදිරිපත් කරමින් ‘‘ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තන සූදානම’’ පිළිබඳව හයාෂි මහතා කතා කළේය.

ඇමරිකා එක්සත් ජනපදයේ වර්ජිනියා විශ්වවිද්‍යාලයේ ගෝලීය මුලපිරීම් සඳහා වූ ඩාඩන් ව්‍යාපාර විද්‍යාලයෙහි ආචාර්ය මරීටෝ ගාර්ෂියා ඇමරිකා එක්සත් ජනපදයේ සිට මාර්ගගතව මෙම අවස්ථාවට එක්වෙමින් "ඩිජිටල් පරිවර්තනය සඳහා නව රාමුවක් කරා: ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා විකල්ප" යන මාතෘකාව යටතේ ඊළඟට රැස්ව සිටි පිරිස ඇමතීය. ආචාර්ය ගාර්ෂියා විසින් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය ඇගයීම සඳහා පමණක් නොව අනාගතය සඳහා ගමන් මාර්ග ගෙනහැර දැක්වීමටද භාවිත කළ හැකි උසස් අධ්‍යාපන ආයතන සඳහා ඩිජිටල් පරිවර්තනයේ ධාවක අටක් ඉදිරිපත් කරන ලදී.

මෘදුකාංග සේවා සමාගම් සඳහා වන ශ්‍රී ලංකා සංගමය නියෝජනය කරමින් GTN Technologies හි ප්‍රධාන විධායක නිලධාරී අර්ජුන නානායක්කාර මහතා අවසන් ප්‍රධාන දේශනය ඉදිරිපත් කළේය. "ඩිජිටල් රැල්ලකට පරිවර්තනය වීම" යන මැයෙන් කතා කළ නානායක්කාර මහතා, උසස් අධ්‍යාපනය පිළිබඳ කර්මාන්ත පර්යාවලෝකනය ඉදිරිපත් කළ අතර, දැනට පවතින සුසමාදර්ශ වෙනස්වීම් හඳුනාගෙන ඒවාට අනුගත වීමේ අවශ්‍යතාව විශ්වවිද්‍යාලවලට අවධාරණය කළේය. කොළඹ විශ්වවිද්‍යාලයට දැක්වූ දායකත්වය අගයමින් මෙම අවස්ථාවට සහභාගී වූ මහාචාර්ය මලික් රණසිංහ, රියෝටාරෝ හයාෂි, ආචාර්ය මාරිටෝ ගාර්ෂියා සහ අර්ජුන නානායක්කාර යන මහත්වරුන්ට කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා සහ ARS-UoC 2022 කමිටු සභාපතිවරයා විසින් සමරු ඵලක පිරිනමන ලදී.

මෙවර උත්සවයේදී ලොව හොඳම පර්යේෂකයන් 2% අතරට ශ්‍රේණිගත කළ කොළඹ විශ්වවිද්‍යාලයේ පර්යේෂකයන් නව දෙනෙකුට උපහාර පිරිනැමිණි. සම්මන්ත්‍රණයේ තේමාවට අනුකූලව විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පැතිකඩ සඳහා දක්වන ලද දායකත්වය අගයමින් 2020 සහ 2021 වසර සඳහා සනාතන සම්මාන උළෙලේ ජයග්‍රාහකයින්ට ඩිජිටල් සහතික ප්‍රදානය කරන ලදී. මෙම ඩිජිටල් සහතික සංකේතාංකන යාන්ත්‍රණය භාවිතයෙන් ආරක්ෂා කර ඇති අතර QR කේතයක් ඇති මුද්‍රිත ලාංඡනය භාවිතයෙන් සත්‍යාපනය කළ හැක. පුද්ගලික/පොදු යතුරු භාවිතා කර සංකේතනය කරන ලද මෙවැනි ඩිජිටල් සහතික කොළඹ විශ්වවිද්‍යාලයෙන් නිකුත් කළ පළමු අවස්ථාව මෙයයි. එබැවින්, මෙය ක්‍රමක්‍රමයෙන් අනාගතයේදී වෙනත් සහතිකයක් දක්වා ව්‍යාප්ත කළ හැක.

උත්සවය අතරතුර, විශ්වවිද්‍යාලයේ පර්යේෂණ පැනිකඩ සහ ARS-UoC 2022 පිළිබඳව විද්‍යා පීඨ මාධ්‍ය කවය සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය (ADMT/UCSC) විසින් නිර්මාණය කරන ලද වීඩියෝ දෙකක් විකාශනය කරන ලදී. ශ්‍රී ලාංකික සංස්කෘතික උරුමය විදහා පාමින් ශ්‍රීපාලි මණ්ඩපයේ සිසුහු සමාරම්භක උත්සවයේදී නර්තන අංගයක් ද ඉදිරිපත් කළහ. ARS-UoC 2022 සඳහා පෞද්ගලික සහභාගිත්වයෙන් 300කට අධික සංඛ්‍යාවක් සහ සූම් මාධ්‍යය හරහා සබැඳි සහභාගිවන්නන් 140ක් සහභාගී වූහ. සම්පූර්ණ උත්සවය යූටියුබ් යෙදුම හරහා වෙබ් විකාශනය කරන ලද අතර පළමු පැය 18 තුළ පරිශීලකයින් 1000 කට වඩා ඊට ප්‍රවේශ වී ඇත. මාධ්‍ය ආයතන කිහිපයක් ද මෙම අවස්ථාවට සහභාගී වූ අතර ඔවුන්ගේ නාලිකා ඔස්සේ ප්‍රචාරණ කටයුතු සිදු කරන ලදී.

වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් පසුගිය වසරේ ප්‍රතිපාදනවලින් 50%ක් පමණක් යොදා ගනිමින් උත්සවය සංවිධානය කරන ලදී. උත්සවය සංවිධානය කිරීම සඳහා අනුග්‍රාහකයන් කිහිප දෙනෙකුගේ අර්ථපතිත්වය ද ලැබුණි. ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ශ්‍රී ලංකා මෘදුකාංග සේවා සමාගම් (SLASSCOM) විසින් ප්‍රධාන දේශන දෙකක් සඳහා අනුග්‍රහය දැක්වීය. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල (UCSC) විසින් ARS-UoC 2022 හි සත්කාරක පීඨය ලෙස මෙම ස්ථානය සහ තවත් සම්පත් කිහිපයක් නොමිලේ ලබා දෙමින් අනුග්‍රහය දැක්වීය. කිසිදු බාහිර උත්සව සංවිධායක සේවාවකින් තොරව මෙම අවස්ථාව කළමනාකරණය කිරීමට සංවිධායක කමිටුවේ සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ බව සඳහන් කිරීම වැදගත්ය. ARS-UoC 2022 හි සියලුම විස්තර http://www.cmb.ac.lk/ars-2022 හි ප්‍රකාශයට පත් කර තිබේ.



මහාචාර්ය මලික් රණසිංහ
ප්‍රධාන ආරාධිතයා
සභාපති – ICTA / සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය



ආචාර්ය මරීටෝ ගාර්ෂියා
ප්‍රධාන දේශක
ඩාඩින් ව්‍යාපාර පාසල, ගෝලීය මූලපිරීම් සඳහා වූ මධ්‍යස්ථානය, වර්ජීනියා විශ්වවිද්‍යාලය, ඇ.එ.ජ.



රියොතාරො හයාෂි මයා
ප්‍රධාන දේශක
සමාජ ආර්ථික විද්‍යාඥ, ආසියානු සංවර්ධන බැංකුව (ADB)



අර්ජුන නානායක්කාර මයා
ප්‍රධාන දේශක
අධ්‍යක්ෂ – SLASSCOM, CEO – GTN Technologies සහ පොදු සේවා ප්‍රධානී– GTN සමූහය

2022 කොළඹ විශ්වවිද්‍යාලයීය වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ප්‍රතිඵල

අං.	පීඨය / ආයතනය	අනු මාතෘකාව	**ARS 2022** දිනය	සාරාංශ සංඛ්‍යාව	පිළිගැනීමේ අනුපාතය **(%)**
1	IBMBB	පශ්චාත් ගෙනෝම යුගයේ තිරසාර සංවර්ධනය සඳහා බහුවිධ පර්යේෂණ	2022 අප්‍රේල් 6 - 7	47	62%
2	UCIARS	ඒකාබද්ධ පර්යේෂණ මගින් තිරසාර කෘෂිකර්මාන්තය සඳහා මාර්ගය ගවේෂණය කිරීම	2022 ජුනි 28	28	90%
3	IIM	විශ්ව ආයුෂ් ආරෝග්‍යම්	2022 ඔක්. 7 - 9	87	47%
4	FON	සහයෝගීතාවය සහ නවෝත්පාදන හරහා වඩා හොඳ සෞඛ්‍ය සේවාවක් සම-නිර්මාණය කිරීම	2022 ඔක්. 19 - 20	34	71%
5	FMF	අස්ථාවරත්වය වෙනස් කිරීමේ අභියෝග	2022 ඔක්. 21	19	58%
6	FOT	උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අභියෝග අවම කිරීමෙහි ලා තාක්ෂණයේ කාර්යභාරය	2022 නොවැ. 2	12	92%
7	FGS	තොරතුරුකරණය සහ ඩිජිටල්කරණය තුළින් මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම	2022 නොවැ. 14	32	90%
8	UOC/ ARS 2022	උසස් අධ්‍යාපන අංශයේ අභියෝග අවම කිරීම සඳහා ඩිජිටල් පරිවර්තනය සහ නව්‍ය ප්‍රවේශයන්	2022 නොවැ. 16	20	-
9	FOS	තිරසාර අනාගතයක් සඳහා විද්‍යාවේ ප්‍රගතිශීලී පර්යේෂණ	2022 නොවැ. 17	32	91%
10	SPC	ජනමාධ්‍ය සහ ප්‍රාසාංගික කලා තුළ නිර්මාණාත්මක සහ නව්‍ය ප්‍රවේශයන්	නොවැම්බර් 18	7	75%
11	IHRA	COVID – 19 වසංගතය යටතේ සේවක අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය	2022 දෙසැ. 21	30	87%
12	FOM	පර්යේෂණ, නවෝත්පාදන සහ පුහුණුවීම් හරහා තිරසාර සහ ධරණීය සෞඛ්‍ය සේවාව	2022 නොවැ. 23 - 26	64	67%
13	FOE	ඩිජිටල් පරිවර්තනය සහ අධ්‍යාපනයේ අභියෝග අවම කිරීමේ හොඳම භාවිතයන්	2022 නොවැ. 25	32	84%
14	පුස්තකාලය	පුස්තකාලවල ඩිජිටල් විප්ලවය සහ නවෝත්පාදනය: අනපේක්ෂිත දේ අපේක්ෂා කිරීම	2022 නොවැ. 29	10	100%
15	UCSC	නැගී එන කලාප සඳහා තොරතුරු හා සංනිවේදන තාක්ෂණයෙහි දියුණුව	නොවැ. 30 - දෙසැ.1	39	25%
16	PGIM	වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ සැසිය	2022 දෙසැ. 1	31	66%
17	FOL	නීති අධ්‍යාපනය, පර්යේෂණ සහ ප්‍රතිසංස්කරණ සඳහා ගෝලීය න්‍යාය පත්‍රයක්	2022 දෙසැ. 3 - 4	66	87%
18	FOA	ප්‍රතිරෝධනයෙහි සිට වැඩිදියුණු කිරීම දක්වා: අර්බුදකාරී සන්දර්භය තුළ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්හි කාර්යභාරය	2022 දෙසැ. 16	35	89%
19	NILIS	පුස්තකාල හා විඥාපන සේවා අධ්‍යාපනයේ අභියෝග අවම කිරීම සඳහා නව්‍ය ප්‍රවේශයන්	2022 දෙසැ. 29	25	83%

2021 වසරේ හොඳම විද්‍යාඥයන් 2% අතර ලැයිස්තුවට සම්මානිත මහාචාර්ය කාමිණී මෙන්ඩිස්, මහාචාර්ය සේනක රාජපක්ෂ, මහාචාර්ය සරෝජ් ජයසිංහ, මහාචාර්ය නදීරා ඩී. කරුණාවීර, මහාචාර්ය කේ. එම්. නලීන් ද සිල්වා, මහාචාර්ය ප්‍රියංග රණසිංහ, මහාචාර්ය රනිල් ජයවර්ධන සහ ආචාර්ය උමේෂ් ජයරාජා ඇතුළත්ව සිටිති. සම්මානිත මහාචාර්ය ඩබ්. ඩී. රත්නසූරිය, සම්මානිත මහාචාර්ය කාමිණී මෙන්ඩිස්, මහාචාර්ය සේනක රාජපක්ෂ සහ මහාචාර්ය නදීරා ඩී. කරුණාවීර විද්‍යාඥයින් අතරින් වෘත්තීය ජීවිතය පුරාවටම ඉහළම සිටින 2% ලැයිස්තුවේ සිටිති.



උපහාර සම්මාන සමඟින්, තම විශිෂ්ට පර්යේෂණ කර්තව්‍යයන් තුළින් විශ්වවිද්‍යාල ප්‍රජාවට දායකත්වය ලබා දුන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 72 දෙනෙකුට 2020 සහ 2021 වසර සඳහා පර්යේෂණ විශිෂ්ටතා සඳහා වන සනාතන සම්මාන ද පිරිනැමිණි.

සනාතන සම්මාන 2020

සාමාන්‍ය ප්‍රවර්ගය

ශාස්ත්‍ර පීඨය	ආචාර්ය ඩී.ඩී.පී.එම්. දුනුසිංහ
	ආචාර්ය වයි.ඒ. කරුණාරත්න
අධ්‍යාපන පීඨය	මහාචාර්ය සමුද්‍රා කුමාරි සෙනරත්
	ආචාර්ය ඩී.වී.කේ.පී. සෙනෙවිරත්න
නීති පීඨය	මහාචාර්ය ඩී.කේ.කෝනසිංහ මිය
කළමනාකරණ සහ මූල්‍ය පීඨය	මහාචාර්ය ටී.එන්. ගුණරත්න
	මහාචාර්ය පී. කෛලාසපති
වෛද්‍ය පීඨය	මහාචාර්ය ප්‍රසාද් කටුලන්ද
	මහාචාර්ය ප්‍රියංග රණසිංහ
හෙද පීඨය	මහාචාර්ය එස්.එස්.පී. වර්ණකුලසූරිය
	ආචාර්ය ජී.ඒ.එස්.ප්‍රේමකුමාර
විද්‍යා පීඨය	මහාචාර්ය ඩී.යූ.ජේ.සොන්නාදර
	මහාචාර්ය කේ.එම්.එන්. ද සිල්වා
තාක්ෂණ පීඨය	ආචාර්ය ඩබ්.කේ.එස්.එම්. අබේසේකර
	මහාචාර්ය ජේ.කේ.ඩී.එස්. ජයනෙත්ති
ශ්‍රීපාලි මණ්ඩපය	ආචාර්ය ඒ.ඩබ්.වී. අතුකෝරල මිය
පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය	මරු. එල්.ජී.සී.එන්. වාදසිංහ
	මහාචාර්ය කේ.පී. හේවාගමගේ
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල	මහාචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න
	මහාචාර්ය පී.කේ. පෙරේරා
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	ආචාර්ය ඩබ්.ඒ.එස්.එස්. වීරකෝන් මිය
ජාතික පුස්තකාල සහ විඥාපන සේවා ආයතනය	ආචාර්ය රුවන් ගමගේ
ජෛව රසායන විද්‍යා, අණුක ජීව විද්‍යා සහ ජෛව තාක්ෂණවේද ආයතනය	මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති

මුල් වෘත්තීය ප්‍රවර්ගය

ශාස්ත්‍ර පීඨය	ආචාර්ය වී.පී.අයි.එස්. විජේරත්න
නීති පීඨය	එස්.බී.අයි.පෙරේරා මෙනවිය
වෛද්‍ය පීඨය	ආචාර්ය යසිත් මතඟසිංහ
හෙද පීඨය	ආචාර්ය ජී කිසෝකාන්ත්
විද්‍යා පීඨය	ආචාර්ය එස්. අමරසේකර
	එන්.එන්.තිලකරත්න මහතා
තාක්ෂණ පීඨය	පී.එල්.සී.එස්.සිල්වා මෙනවිය
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල	ආචාර්ය ඒ.පී. සායක්කාර
ජෛව රසායන විද්‍යා, අණුක ජීව විද්‍යා සහ ජෛව තාක්ෂණවේද ආයතනය	මහාචාර්ය සමීර සමරකෝන්

සනාතන සම්මාන 2021

සාමාන්‍ය ප්‍රවර්ගය

ශාස්ත්‍ර පීඨය	ආචාර්ය වයි.ඒ. කරුණාරත්න
	ආචාර්ය ඩී.ඩී.පී.එම්. දුනුසිංහ
අධ්‍යාපන පීඨය	මහාචාර්ය සමුද්‍රා කුමාරි සෙනරත්
	ආචාර්ය එල්.එන්.පී. වෙඩිකන්දගේ
නීති පීඨය	මහාචාර්ය ඩබ්. සෙනෙවිරත්න
කළමනාකරණ සහ මූල්‍ය පීඨය	මහාචාර්ය ටී.එන්. ගුණරත්න
	මහාචාර්ය පී. කෛලාසපති

වෛද්‍ය පීඨය	මහාචාර්ය ප්‍රියංග රණසිංහ මහාචාර්ය රනිල් ජයවර්ධන
හෙද පීඨය	මහාචාර්ය එස්.එස්.පී. වර්ණකුලසූරිය ආචාර්ය ජී.ඒ.එස්.ප්‍රේමකුමාර
විද්‍යා පීඨය	මහාචාර්ය ඩී.යූ.ජේ. සොන්නාදර මහාචාර්ය කේ.එම්.එන්. ද සිල්වා
තාක්ෂණ පීඨය	ආචාර්ය ඩබ්.කේ.එස්.එම්. අබේසේකර මහාචාර්ය ජේ.කේ.ඩී.එස්. ජයනෙත්ති
පුස්තකාලය	සජීවනී ඩී සෝමරත්න මිය
ශ්‍රීපාලි මණ්ඩපය	ආචාර්ය ඩී.සී.කුරුප්පු ආචාර්ය ඒ.ඩබ්.වී. අතුකෝරල මිය
පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය	එල්.ජී.සී.එන්. වාදසිංහ මිය
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල	මහාචාර්ය කේ.පී. හේවාගමගේ ආචාර්ය සී.අයි. කැප්පිටියාගම
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	ආචාර්ය එච්.ජී.එස්.පී. හේවාගීගන මිය මහාචාර්ය පී.කේ. පෙරේරා
ජාතික පුස්තකාල සහ විඥාපන සේවා ආයතනය	ආචාර්ය රුවන් ගමගේ
ජෛව රසායන විද්‍යා, අණුක ජීව විද්‍යා සහ ජෛව තාක්ෂණවේද ආයතනය	මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති

මූල් වෘත්තීය ප්‍රවර්ගය

ශාස්ත්‍ර පීඨය	ආචාර්ය වී.පී.අයි.එස්. විජේරත්න
නීති පීඨය	ආචාර්ය අයි.ඩී.එල්. පතිරණ
වෛද්‍ය පීඨය	ආචාර්ය දක්ෂිත වික්‍රමසිංහ
කළමනාකරණ සහ මූල්‍ය පීඨය	ආචාර්ය එස්.බී. රණසිංහ
හෙද පීඨය	ආචාර්ය ජී කිසෝකාන්ත්
විද්‍යා පීඨය	ආචාර්ය එස්. අමරසේකර
තාක්ෂණ පීඨය	එන්.එන්.තිලකරත්න මයා
පුස්තකාලය	එස්.ෂබ්නම් නිශාත් මිය
ශ්‍රීපාලි මණ්ඩපය	එන්.ඩබ්.ඩබ්.ජී.කේ ප්‍රභාෂිනී මිය
පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය	ආචාර්ය එෆ්.ආර්. ඉහ්සාන්
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල	ආචාර්ය ඒ.පී. සායක්කාර
ජෛව රසායන විද්‍යා, අණුක ජීව විද්‍යා සහ ජෛව තාක්ෂණවේද ආයතනය	මහාචාර්ය සමීර සමරකෝන්

5. විභාග අංශය

විභාග ශාඛාවට අදාළ කාර්ය සාධනය

- ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි සිසුන් ලියාපදිංචි කිරීම
- පැරණි විභාග ලකුණු පොත් ඩිජිටල්කරණය සම්පූර්ණ කරන ලදී.
- නව ශිෂ්‍ය ලියාපදිංචිය සම්පූර්ණයෙන්ම සිදු කරන ලද්දේ මාර්ගගත වේදිකාවක ය.
- ආදි විද්‍යාර්ථීන් සඳහා විභාග සහතික පිටපත් නිකුත් කිරීම
- ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි ප්‍රදානෝත්සව පැවැත්වීම

06. ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල කටයුතු අංශය

මූල්‍යාධාර

මහපොළ ශිෂ්‍යයන්වය හා ශිෂ්‍යාධාර දීමනා යටතේ මූල්‍යමය ආධාර ශිෂ්‍යයන් සඳහා ලබා දුන් අතර, සියලුම පීඨ නියෝජනය වන පරිදි ඒ.ටී.එම්. යන්ත්‍ර මගින් මුදල් ලබාගැනීමේ පහසුවද සලසා තිබුණි

අ) මහපොළ ශිෂ්‍යත්ව

මෙහි මාසික කප්පාදුව (සියලුම ශිෂ්‍යයන් සඳහා වූ මාසික විශ්වවිද්‍යාල ආධාරය රු.2450 බැගිනි) නවක ශිෂ්‍යයන් හා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් සඳහා ප්‍රදානය කළ අතර 2022 වර්ෂයෙහි එහි තත්ත්වය පහත පරිදි වේ:

වගුව – 01 : මහපොළ ශිෂ්‍යත්වලාභීන් – 2022
(මාස සහ පීඨ අනුව වර්ගීකරණය කර ඇත.)

මහපොළ ලාභීන්ට විශ්වවිද්‍යාල දායකත්වය ලෙස (රු.2450/-) ගෙවූ මුළු මුදල										
	ශිෂ්‍ය සංඛ්‍යාව	ශාස්ත්‍ර	කළ. හා මූල්‍ය	නීති	වෛද්‍ය	විද්‍යා	භෞතවේදය	හෙද	තාක්ෂණ	එකතුව
ජනවාරි	4573	2,148,650	1,920,820	1,100,050	1,369,550	1,369,550	73,500	198,450	999,600	9,180,150
පෙබ.	3537	2,148,650	1,920,800	1,100,050	1,369,550	857,500	73,500	198,450	997,150	8,665,650
මාර්තු	3448	2,148,650	1,920,800	1,100,050	1,369,550	857,500	117,600	198,450	735,000	8,447,600
අප්‍රේල්										
මැයි	3266	2,148,650	1,920,800	1,100,050	1,369,550	565,950	80,850	85,750	730,100	8,001,700
ජුනි	5070	2,922,900	3,160,500	1,817,600	1,866,900	1,163,760	134,750	227,850	1,288,700	12,583,260
ජුලි	5233	2,819,950	3,104,150	1,817,900	1,866,900	1,325,690	134,750	181,300	1,288,700	12,539,340
අගෝ.	5563	3,589,250	4,067,000	2,342,200	1,866,900	1,607,200	134,750	222,950	1,288,700	15,118,950
සැප්.	4955	3,594,150	2,136,400	1,293,600	1,866,900	1,607,200	134,750	220,500	1,286,250	12,139,750
ඔක්.	5077	1,690,500	2,160,900	1,291,150	1,866,900	1,690,500	134,750	220,500	1,281,350	10,336,550
නොවැ.	-	-	-	-	-	-	-	-	-	-
දෙසැ.	-	-	-	-	-	-	-	-	-	-
එකතුව	**40,722 (2022 තුළ සැපයූ මුළු ශිෂ්‍යත්ව දායකත්වය)**	**23,211,350**	**22,312,150**	**12,962,950**	**14,812,700**	**11,044,850**	**1,019,200**	**1,754,200**	**9,895,550**	**97,012,950**

සාමාන්‍යය හෝ කුසලතා පදනම් කරගෙන පිළිවෙලින් එක් ශිෂ්‍යයෙකු මාසිකව රු. 2600/- හෝ රු. 2550/- ලබාගත් අතර ඊට අමතරව මාසිකව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින්ද රු.2450/- මුදලක් ප්‍රදානය කරන ලදි. එම නිසා, ඉහත සඳහන් කළ කාලයේදී එක් ශිෂ්‍යයෙකු මාසිකව සාමාන්‍යය හෝ කුසලතා පදනම් කරගෙන සම්පූර්ණයෙන් රු. 5050/- හෝ රු. 5000/- මුදලක් පිළිවෙලින් ලබා ගත්තේය.

ආ) ශිෂ්‍යාධාර

වර්ෂයෙහි ශිෂ්‍යාධාර වශයෙන් එක් ශිෂ්‍යයෙකු විසින් රු.4000/- මුදලක් ලබා ගැනිනි. 2022 වර්ෂයට අදාළ ශිෂ්‍යාධාර සම්බන්ධ සංඛ්‍යාලේඛන පහත දැක්වේ;

වගුව – **02 : ශිෂ්‍යාධාරලාභීන් – 2022**

(මාස සහ පීඨ අනුව වර්ගීකරණය කර ඇත)

	ශිෂ්‍ය සංඛ්‍යා	ශාස්ත්‍ර	අධ්‍යාපන	නීති	කළ. හා මූල්‍ය	භෙද	විද්‍යා	තාක්ෂණ	භෞත වේදය	එකතුව
ජනවාරි	438	492,000	48,000	-	-	380,000	4,036,000	112,000	16,000	**5,084,000**
පෙබ.	486	492,000	48,000	12,000	108,000	380,000	2,192,000	112,000	16,000	**3,360,000**
මාර්තු	308	1,536,000	96,000	12,000	392,000	760,000	-	112,000	8,000	**2,916,000**
අප්‍රේල්										
මැයි	115			64,000	128,000	536,000	-	168,000	56,000	**952,000**
ජූනි	166	-	-	16,000	292,000	304,000	352,000	144,000	12,000	**1,120,000**
ජූලි	243	764,000	16,000	16,000	196,000	260,000	184,000	56,000	12,000	**1,504,000**
අගෝ.	280	284,000	16,000	624,000	236,000	260,000	184,000	56,000	12,000	**1,672,000**
සැප්.	604	444,000	16,000	2,340,000	4,432,000	260,000	184,000	56,000	12,000	**7,744,000**
ඔක්.	692	300,000	16,000	620,000	3,120,000	260,000	184,000	56,000	12,000	**4,568,000**
නොවැ.	1330	9,480,000	16,000	2,376,000	1,368,000	260,000	4,048,000	56,000	716,000	**18,320,000**
දෙසැ.										
එකතුව	**4662***	**13,792,000**	**272,000**	**6,080,000**	**10,272,000**	**3,660,000**	**11,364,000**	**928,000**	**872,000**	***47,240,000***

***(2022** තුළ සැපයූ මුළු ශිෂ්‍යාධාර දායකත්වය)*

පීඨවල ශිෂ්‍ය සභා

2022 වර්ෂය තුළ වෛද්‍ය පීඨය තම ශිෂ්‍ය සභාවෙහි නිලවරණ පවත්වා සම්පූර්ණ කර ඇත.

ශිෂ්‍ය සංගම්

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 115 සහ 116 වගන්තිවලට අනුව විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති සහ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම් පිළිගැනීම පාලක සභාවෙහි එකඟතාව ඇතිව සිදු කළ යුතු ය. 2021 සමාලෝචිත වර්ෂය තුළ, විශ්වවිද්‍යාලය තුළ ලියාපදිංචි වී ඇති එවැනි ශිෂ්‍ය සංගම් හතළිස් අටක් (48) ඇත.

ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් සඳහා නේවාසිකාගාර ලබා දීම

මේ වන විට කොළඹ විශ්ව විද්‍යාලයේ ස්ථිර නේවාසිකාගාර දහහතරක් (14) තාවකාලික පෞද්ගලික නිවාසයක් ඇත. පහත දක්වා ඇති අයුරින් සිසුන් සඳහා නේවාසික පහසුකම් ඇත.

වගුව – **03 : විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සඳහා නේවාසිකාගාර පහසුකම් – 2022**

	නේවාසිකාගාරය	ශිෂ්‍ය සංඛ්‍යාව
01	බිලොම්ෆොන්ටේන් පිරිමි	388
02	බුලර්ස් කාන්තා	430
03	ද සේරම් 215 කාන්තා	249
04	ද සේරම් 220 කාන්තා (නව)	284
05	හැව්ලොක් කාන්තා	330
06	කිත්‍යාකර පිරිමි	378

07	කාලිංග මාවත කාන්තා (නව)	560
08	තෙලවල කාන්තා	560
09	සිව චින්නතම්බි කාන්තා	47
10	තෙලවල පිරිමි	400
11	හෙද නේවාසිකාගාරය පිරිමි	80
12	හෙද නේවාසිකාගාරය කාන්තා	160
13	තාක්ෂණ පිරිමි	400
14	තාක්ෂණ කාන්තා	400
	එකතුව	**4760**

වගුව – **04 : කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලිවල සිසුන් සඳහා නේවාසික පහසුකම් - 2022**

නිවස	ශිෂ්‍ය සංඛ්‍යාව
ග්‍රීන් පාත් කොළඹ 07 (භික්ෂු)	**50**
එකතුව	**50**

වගුව – **05 : ශිෂ්‍ය නිවාසවල වාර්ෂික කුලිය – 2022**

නේවාසිකාගාරය	**වාර්ෂික කුලිය (රු.)**
71/3 හා 71/4 ග්‍රීන් පාත් කොළඹ 07 (භික්ෂු)	4,140,000/-
එකතුව	**4,140,000/-**

ශිෂ්‍යයන්ගේ නේවාසිකාගාරවල පරිභෝජන වියදම්

ශිෂ්‍යයෙකු සඳහා උපයෝගිතා පරිභෝජන පිරිවැය = $\frac{10,989,999.43}{4860}$ = 2261.32/=

වෛද්‍ය රක්ෂණ ක්‍රමය

2022 වසර සඳහා සෞඛ්‍ය සුඛසාධන ක්‍රමය 01.01.2022 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස දොලහක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී . එහි රක්ෂණ ක්‍රම 03ක් (ක්‍රමය I, II සහ III) වශයෙන් හා තවත් බොහෝ ප්‍රතිලාභ සහිත විය. මෙම රක්ෂණ ක්‍රමයට සම්බන්ධ වූ සාමාජිකයන්ගෙන් පළමු ක්‍රමය යටතේ රු. 150 ද දෙවැනි ක්‍රමය යටතේ රු. 400 ක් ද තෙවැනි ක්‍රමය යටතේ රු. 650 ක් ද මාසිකව අයකර ගැනේ.

ප්‍රතිලාභ පහත පරිදිය:

	I වන සැලසුම	II වන සැලසුම	III වන සැලසුම
බානිර	9,000.00	18,000.00	30,000.00
ශල්‍ය සහ රෝහල් ගාස්තු	90,000.00	180,000.00	225,000.00
ඇස් කණ්නාඩි	3,500.00	5,500.00	8,000.00

දිවා සුරැකුම් මධ්‍යස්ථානය / විද්‍යාල මන්දිරය

2006.05.18 දින කොළඹ විශ්වවිද්‍යාලයේ සේවකයින්ගේ වයස අවුරුදු 2 1/2 ත් 12ත් අතර දරුවන් සඳහා විශ්වවිද්‍යාලය විසින් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කෙරිණි. 2022 වසර තුළ දිවාසුරැකුම් මධ්‍යස්ථානයට දරුවන් 11 දෙනෙක් අලුතින් ඇතුලත් කරගෙන ඇත.

2022 වර්ෂය තුළ දිවාසුරැකුම් මධ්‍යස්ථානයේ ළමුන් 32 දෙනෙකු සිටි අතර මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය එක් පෙර පාසල් ගුරුවරියක, දිවා සුරැකුම් වැඩ සහායකයකු හා උපස්ථායකයකුගෙන් සමන්විත විය.

ශිෂ්‍යත්ව

2022 වසර තුළ ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල අංශය විසින් පහත ශිෂ්‍යත්ව සම්බන්ධව කටයුතු කරන ලදී.

1. නිව් සවුත් වේල්ස් ශිෂ්‍යත්ව පිළිබඳ කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථී සංගමය – විද්‍යාර්ථීන් 09 (UCAANSW)

2. අධ්‍යාපන වෘත්තිකයන්ගේ සකසුරුවම් හා ණයදෙන සමිතිය - ප්‍රගති වාර්තා පමණක් යවන ලදී. ගෙවීම් සිදු කරන ලද්දේ EDCS මධ්‍යස්ථාන මගිනි.
3. මිට්සුබිෂි කෝපරේෂන් ඉන්ටනැෂනල් - විවිප්‍රකෝ මග පෙන්වීම අනුව වර්ෂය තුළ භාණ්ඩාගාර අරමුදල්වලින් සිසුන්15 දෙනෙකු සඳහා ගෙවීම් සිදු කරන ලදී.

4. කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරී සංගමය

සරසවි මිතුරෝ ශිෂ්‍යත්වය - 2022 වසර සඳහා සිසුන් 59 දෙනෙකු තෝරා ගන්නා ලදී. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක කාර්යාලයේ සහාය ඇතිව තේරීම් පමණක් සිදු කරන ලදී. සංගමය විසින් ගෙවීම් සිදු කරන ලදී.

5. උපකුලපති ශිෂ්‍යත්වය - ශිෂ්‍යත්වය ලබන සිසුන් 213 දෙනාටම මසකට රු. 2,500.00 බැගින් වෛද්‍ය හා අධ්‍යාපන පීඨ හැර අනෙකුත් සියලුම පීඨ වලින් ගෙවා ඇත.
6. මහරාජා ශිෂ්‍යත්වය - කළමනාකරණ පීඨයෙන් තෝරාගත් එක් සිසුවෙකුට වර්ෂය තුළ මසකට රු. 2,500.00 බැගින් ගෙවන ලදී.
7. පරිත්‍යාග ශිෂ්‍යත්වය. - ශාස්ත්‍ර, කළමනාකරණ සහ තාක්ෂණ අංශයෙන් සිසුන් 4 දෙනෙකු තෝරාගෙන මසකට රු. 2,500.00 බැගින් ගෙවන ලදී.

8. Alliant Rigserv ශිෂ්‍යත්වය - තාක්ෂණ පීඨයෙන් සිසුන් 2 දෙනෙකු තෝරාගෙන එක් සිසුවෙකුට වර්ෂය තුළ මසකට රු. . 7,500.00 බැගින් ගෙවන ලදී.

9. බ්‍රැන්ඩික්ස් මනුසත්කාර ශිෂ්‍යත්වය - කළමනාකරණ, නීති, තාක්ෂණ සහ ප්‍රාසංගික කලා පීඨවලින් සිසුන් 6 දෙනෙකු තෝරා ගන්නා ලදී. ගෙවීම් සීමාසහිත බ්‍රැන්ඩික්ස් ඇපරල් සමාගම විසිනි.

ලැප්ටොප් පරිගණක ණය

අමාත්‍යාංශය විසින් ලංකා බැංකුව සමග විශ්වවිද්‍යාල සිසුන්ට ලැප්ටොප් පරිගනක මිලදී ගැනීමට ලබාදුන් පොළී රහිත ණය පහසුකම (රු. 75,000/-) 2022 වසරේද සියලුම පීඨ සඳහා ලබා දුනි.

ආපන ශාලා

විශ්වවිද්‍යාලයෙහි ආපන ශාලා 14 ක් සහ කිරි අලෙවිහල් 03 ක් ඇත. ඉන් හයිලන්ඩ් කිරි අලවිහල සී/ස මිල්කෝ පෞද්. ආයතනයට අයත්වේ. විශ්වවිද්‍යාලය විසින් සී/ස මිල්කෝ පෞද්. ආයතනයෙන් මාසික කුලී වශයෙන් හා පරිභෝජනය කරන විදුලිය වෙනුවෙන් 01.09.2016 දින සිට මුදල් අය කර ගනී.

සෑම ආපන ශාලාවකින්ම මාසික කුලිය ලෙස රු. 1000/- ක් හා විදුලි ගාස්තු ලෙස රු.5000/- ක් මාසිකව අයකර ගැනේ.

ඡායා පිටපත් සේවය

එක් එක් පීඨවල සහ ප්‍රධාන පුස්තකාලය ද ඇතුළත්ව ඡායා පිටපත් සේවා ස්ථාන 08 ක් පවතී. එක් එක් කොන්ත්‍රාත් කරුගෙන් මාසික කුලිය වශයන් රු.8000, විදුලි බලය වෙනුවෙන් රු. 5000 ක් සහ අතිරේක ඡායා පිටපත් යන්ත්‍රයක් සඳහා රු.1500 ක් වශයෙන් ගාස්තු අය කෙරේ.

ටැබ්ලට් පරිගණක නිකුත් කිරීම

රට තුළ දැනට පවතින කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාලය කොළඹ විශ්වවිද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය සමඟ එක්ව මාඊගත දේශන සඳහා සහභාගී වීමේදී ආර්ථික අපහසුතා ඇති සිසුන්ට ටැබ්ලට් පරිගණක ලබා දීමේ වැඩසටහනක් ආරම්භ කර තිබේ.

වාර ප්‍රවේශ පත්‍ර

ප්‍රථම උපාධි අපෙක්ෂකයන් සඳහා සහන මිලට විශ්වවිද්‍යාලය විසින් බස් සහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබා දෙයි.(නේවාසික පහසුකම් නොලැබූ ශිෂ්‍යයන්ට දුම්රිය වාරප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට විශ්වවිද්‍යාලය අවසර ලබා දෙයි.)

7. ප්‍රාග්ධන කාර්ය හා සැලසුම්කරණය

ප්‍රාග්ධන වැඩ සහ සැලසුම් කිරීමේ ශාඛාවේ ප්‍රධාන කාර්‍ය වන්නේ පරිශීලක දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා අනුව කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රාග්ධන ගොඩනැගිලි ව්‍යාපෘති සැලසුම් කිරීම, ප්‍රසම්පාදනය හා අධීක්ෂණය කිරීම ය. ප්‍රසම්පාදනයට පෙර සහ පසු ක්‍රියාකාරකම් සිදු කිරීම, ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීම, ව්‍යාපෘති ප්‍රලේඛන හා ගිවිසුම් සන්නිවේදන නඩත්තුව, සහතික කිරීම සහ අතුරු ගෙවීම් සහතික නිකුත් කිරීම, බිල්පත් නිරවුල් කිරීම, ආරවුල් විසඳීම සහ පරීක්ෂණ සම්බන්ධීකරණය කිරීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා සාර්ථකව නිම කිරීම භාර ගැනීම මෙම කාර්යයන්ට අයත් වේ.

ප්‍රාග්ධන කාර්ය හා ක්‍රම සම්පාදන අංශය සමාලෝචිත වර්ෂය තුළ සම්බන්ධ වූ ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති පහත පරිදි වර්ග කළ හැක.

I. 2017 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති .

II. 2018 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති

III. 2019 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති

IV. 2020 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති

V. කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිත නව ඉදිකිරීම් ව්‍යාපෘති

VI. පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂය තුළ සිදුවෙමින් පවතින ඉදිකිරීම් සහ නව ඉදිකිරීම් ව්‍යාපෘති තුනක් කෙරෙමින් පැවතුනි. 2020 මාර්තු 11 සිට මැයි දක්වා COVID-19 වසංගතය ආශ්‍රිත හුදකලා කිරීම් සහ ඇදිරි නීතිය හේතුවෙන් ඇති වූ ප්‍රමාදයන් ඇතුළු හේතු නිසා සියලුම ව්‍යාපෘතිවල පාහේ ප්‍රගතිය කෙරෙහි යම් බලපෑමක් සිදුවී ඇති අතර, ඒවායෙහි ප්‍රධාන ඉලක්ක ප්‍රමාද විය.

I. 2017 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති .

1. කොළඹ 08 කින්සි පාරේ අංක 25 ලිපිනයේ පිහිටි කොළඹ විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨයේ පූර්ව සායනික අධ්‍යයන අංශය, පුස්තකාලය, ආපන ශාලාව සහ ඉගැන්වීම් පහසුකම් සඳහා වන යෝජිත ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් නිමා කිරීම - ඉතිරි කටයුතු

- මුළු පිරිවැය ඇස්තමේන්තුව ලං.රු. මි. 6,604 .
- පිරිනමන ලද කොන්ත්‍රාත්තු වටිනාකම ලං.රු.මි. 4,707.56 (VAT හැර).
- ව්‍යාපෘති කොන්ත්‍රාත්කරු Sanken Construction (Pvt) Ltd.
- ව්‍යාපෘති උපදේශක රාජ්‍ය ඉංජිනෙරු සංස්ථාව .
- අරමුදල් සැපයුම ශ්‍රී ලංකා රජය විසිනි.

<u>ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය</u>

ඉදිකිරීම් කටයුතු 2017 ජූනි මාසයේදී ආරම්භ කරන ලද අතර කාලය දීර්ඝ කිරීමත් සමඟ 2022 දී අවසන් කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, COVID-19 වසංගතය ආශ්‍රිත හුදකලා කිරීම සහ 2020 මාර්තු 11 සිට මැයි දක්වා ඇදිරි නීතිය සහ කොන්ත්‍රාත්කරුගේ අතපසුවීම් හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාදයන් කිහිපයක් අත්විඳින ලදී. ව්‍යාපෘතිය 2022 ජනවාරි මාසයේදී නිම කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වී ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘති සංකීර්ණත්වය සහ අවදානම් අඛණ්ඩව වැඩි වීම සහ වැඩ ක්‍රම වෙනස්වීම් සහ සැපයුම් දාමයේ බාධා කිරීම් හේතුවෙන් අමතර පීඩනයක් ඇති වීමත් සමඟ, 2022.06.08 ප්‍රායෝගික අවසන් දිනය ලෙස ගැනීමට තීරණය කළේය. 2022 නොවැම්බර් අවසානය වන විට භෞතික ප්‍රගතිය 99.9% ක් වන අතර 2022 නොවැම්බර් අවසානය දක්වා සමුච්චිත වියදම් රුපියල් මිලියන 5609.9 කි (VAT, උපදේශන සහ වෙනත් ගෙවීම් සමඟ).

II. 2018 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති .

2. **කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨ පරිශ්‍රය සඳහා යෝජිත ශිෂ්‍ය සේවා මධ්‍යස්ථානය**

- මුළු පිරිවැය ඇස්තමේන්තුව ලං.රු. මි. 468.40
- පිරිනමන ලද කොන්ත්‍රාත්තු වටිනාකම ලං.රු.මි. 439.25 (VAT සහිතව)
- ව්‍යාපෘති කොන්ත්‍රාත්කරු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.
- අරමුදල් සැපයුම ශ්‍රී ලංකා රජය විසිනි.

<u>ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය</u>

ව්‍යාපෘතිය 2018 අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලද අතර 2023 දී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. COVID-19 වසංගතය ආශ්‍රිත හුදකලා කිරීම සහ 2020 මාර්තු 11 සිට මැයි දක්වා ඇඳිරි නීතිය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාදයන් කිහිපයක් අත්විඳින අතර තවමත් යම් කාලයක් දීර්ඝ කිරීම් සමඟ සිදු වෙමින් පවතී. 2022 නොවැම්බර් අවසානය වන විට භෞතික ප්‍රගතිය 82% ක් වූ අතර 2022 නොවැම්බර් අවසානය දක්වා සමුච්චිත වියදම් රුපියල් මිලියන 319.6 කි.(වැට් බද්ද සමඟ)

III. 2019 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති

3. කොළඹ විශ්වවිද්‍යාලීය යෝජිත සුසාධ්‍යකාරක කලාපය සැලසුම් කිරීම හා ගොඩනැගීම (යෝජිත බහුකාර්ය පහසුකම්)

- මුළු පිරිවැය ඇස්තමේන්තුව ලං.රු. මි. 599.616
- පිරිනමන ලද කොන්ත්‍රාත්තු වටිනාකම ලං.රු.මි. 599.616 (VAT සහිතව)..
- ව්‍යාපෘති කොන්ත්‍රාත්කරු Kandy Constructions.
- අරමුදල් මූලාශ්‍රය ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් රුපියල් මිලියන 230 ක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් උත්පන්න අරමුදල්වලින් රුපියල් මිලියන 366.616 කි.

<u>ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය</u>

ව්‍යාපෘතිය 2019 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2023 ජූනි මාසයේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, 2020 මාර්තු 11 සිට මැයි දක්වා COVID-19 වසංගතය ආශ්‍රිත හුදකලා කිරීම් සහ ඇඳිරි නීතිය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාදයන් කිහිපයක් අත්විඳින ලදී. 2022 නොවැම්බර් අවසන් වන විට ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතිය 86% ක් වූ අතර 2022 නොවැම්බර් අවසානය දක්වා සමුච්චිත වියදම් රුපියල් මිලියන 462 (වැට් බදු සමඟ) වේ.

IV. 2020 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති
4. කොළඹ විශ්වවිද්‍යාලීය ශ්‍රීපාලි මණ්ඩපයේ පුස්තකාල ගොඩනැගිල්ලට දිගුවක් ඉදි කිරීම

- මුළු පිරිවැය ඇස්තමේන්තුව ලං.රු. මි. 60
- පිරිනමන ලද කොන්ත්‍රාත්තු වටිනාකම ලං.රු.මි. 50.76 (VAT හැර).
- ව්‍යාපෘති කොන්ත්‍රාත්කරු Malalathunga Constructions (Pvt.) Ltd.
- අරමුදල් සැපයුම ශ්‍රී ලංකා රජය විසිනි.

<u>ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය</u>

ව්‍යාපෘතිය 2020 මැයි මාසයේදී ආරම්භ වූ අතර 2021 පෙබරවාරි මාසයේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, 2020 මාර්තු 11 සිට මැයි දක්වා COVID-19 වසංගතය ආශ්‍රිත හුදකලා කිරීම සහ ඇඳිරි නීතිය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාදයන් කිහිපයක් අත්විඳින ලදී. කෙසේ හෝ දුර්වල ක්‍රියාකාරී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගේ සේවය විශ්වවිද්‍යාලය විසින් අවසන් කරන ලද අතර ඉතිරි වැඩ සඳහා ඇස්තමේන්තු කිරීම සිදුවෙමින් පවතී. සේවය අවසන් කරන ලද කොන්ත්‍රාත්කරු සඳහා 2022 නොවැම්බර් අවසානය දක්වා සමුච්චිත වියදම් රුපියල් මිලියන 27.26 කි. (වැට් බද්ද සමඟ).

V. කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිත නව ඉදිකිරීම් ව්‍යාපෘති

- **කොළඹ විශ්වවිද්‍යාලීය තාක්ෂණ පීඨය ස්ථාපනය කිරීම අදියර II – පියවර I**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත "කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය, අදියර II – පියවර I" පිහිටුවීමේ නව ව්‍යාපෘති යෝජනාව. ව්‍යාපෘතියේ ආයෝජනය සඳහා මුළු ඇස්තමේන්තුව රුපියල් මිලියන 864 කි.

- **යෝජිත ඉංජිනේරු පීඨය ස්ථාපනය කිරීම**
  "කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය පිහිටුවීම" පිළිබඳ සංශෝධිත ව්‍යාපෘති යෝජනාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. ව්‍යාපෘතියේ ආයෝජනය සඳහා මුළු ඇස්තමේන්තුව රුපියල් මිලියන 7,000 කි.

VI. පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති

සමාලෝචනය කරන ලද වර්ෂය තුළ ප්‍රාග්ධන කටයුතු හා සැලසුම් ශාඛාව විසින් පහත පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් කටයුතු හසුරුවන ලදී.

කාර්යය	කොන්ත්‍රාත්කරු	කොන්ත්‍රාත් මිල	තත්වය
කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ යෝජිත අපජලවහන කාණු පද්ධතිය	M/s Polygon K Engineering Pvt Ltd	රු. 11,443,207.60 +VAT	කොන්ත්‍රාත්තුව 2021.04.21 දින ප්‍රදානය කරන ලදී. නමුත් යම් යම් හේතූන් මත විශ්වවිද්‍යාලය විසින් කොන්ත්‍රාත්කරුගේ සේවය අවසන් කරන ලදී.
කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සත්ව විද්‍යා අධ්‍යයන අංශය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම	M/s Engineering Technocracy	රු. 25,583,690.00 +VAT	කොන්ත්‍රාත්තුව 2022.02.10 දින ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත් කාලය මාස 6 කි. වත්මන් භෞතික ප්‍රගතිය 78% කි.
කොළඹ විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ගොඩනැගිලිවල පැරණි පර්යන්තයෙහි වහල ප්‍රතිසංස්කරණය කිරීම	M/s Engineering Technocracy	රු. 17,262,245.00 +VAT	කොන්ත්‍රාත්තුව 2022.02.10 දින ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත් කාලය මාස 6 කි. වත්මන් භෞතික ප්‍රගතිය 98% කි.
කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම			ලේඛන සකස් කිරීමේ අදියර
කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සත්ව විද්‍යා අධ්‍යයන අංශ ප්‍රතිසංස්කරණය කිරීම			ලේඛන සකස් කිරීමේ අදියර
විද්‍යා පීඨය සඳහා ලං.වි.ම. උපපොල ප්‍රතිස්ථාපනය	M/s Engineering Technocracy	රු. 8,288,720.00 +VAT	කොන්ත්‍රාත්තුව 2022.11.05 දින ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත් කාලය මාස 4 කි. වත්මන් භෞතික ප්‍රගතිය 15% කි.
යෝජිත ආරක්ෂක කාර්යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලයේ බාලිකා නේවාසිකාගාරයට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම	M/s Royal T Construction PVT Ltd	රු. 15,225,942.48 +VAT	කොන්ත්‍රාත්තුව 2022.10.26 දින ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත් කාලය මාස 2 කි. වත්මන් භෞතික ප්‍රගතිය 50% කි.

සියලුම ගොඩනැගිලි ව්‍යාපෘති, ප්‍රාග්ධනය සහ පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම් අඛණ්ඩව අධීක්ෂණය කරන ලද අතර දෙසතියකට වරක් ප්‍රගති සමාලෝචන රැස්වීම් නිතිපතා පවත්වන ලදී. සැලසුම් සහ සංවර්ධන කමිටුව ද සිය මාසික රැස්වීම්වලදී ප්‍රාග්ධන පුනරුත්ථාපන ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කළේය.

8.නීති හා ප්‍රලේඛන ඒකකය

නීති හා ප්‍රලේඛන ඒකකය විශ්වවිද්‍යාලය සඳහා නීතිමය සේවාවන් කළමනාකරණය කරන අතර විශ්වවිද්‍යාලයට නීති ආධාර සැපයීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

නෛතික හා ප්‍රලේඛන ඒකකය පහත පරිදි ප්‍රධාන අංශ පහක් යටතේ සිය සේවාවන් සපයයි.

1. උපදේශන කාර්යයන්.
2. නඩු සම්බන්ධ කාර්යයන්.
3. මූලික විමර්ශන සහ අභ්‍යන්තර විනය පරීක්ෂණ සම්බන්ධ කාර්යයන්.
4. අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් වැනි සියලුම නෛතික ලේඛන පරීක්ෂා කිරීම සහ නීති සම්පාදන කමිටුව පැවැත්වීම.
5. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ විස්තර සැපයීම.

2022 දී මධ්‍යස්ථානය විසින් සිදුකළ ක්‍රියාකාරකම්

- විශ්වවිද්‍යාලය වෙනුවෙන් උසාවි නඩුවලට (මහස්ත්‍රාත් අධිකරණය, දිසා අධිකරණය, මහාධිකරණය, අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය) පෙනී සිටීම.
- විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය, මානව හිමිකම් කොමිෂන් සභාව, කම්කරු විනිශ්චය සභාව, කම්කරු දෙපාර්තමේන්තුව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය යන ආයතනයන්හි විමර්ශන සඳහා පෙනී සිටීම.
- අදාළ අංශ/අධ්‍යයනාංශ/පීඨ සමඟ සම්බන්ධීකරණයෙන් විශ්වවිද්‍යාලය තුළ විධිමත් අභ්‍යන්තර විනය පරීක්ෂණ පැවැත්වීමට පහසුකම් සැලසීමට අවශ්‍ය පියවර ගැනීම.
- මූලික විමර්ශන පැවැත්වීම.
- නීතිමය ලියකියවිලි කෙටුම්පත් කිරීම, සමාලෝචනය කිරීම, සංශෝධනය කිරීම සහ/හෝ සංශෝධනය කිරීම (එකඟතා ගිවිසුම්, ගිවිසුම්, අභිප්‍රාය ලිපි ආදිය).
- නීති හා ප්‍රලේඛන ඒකකය වෙතින් විමසන ලද අවස්ථාවලදී නෛතික, නියාමන, ප්‍රතිපත්තිමය සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නීති උපදෙස් ලබා දීම.
- නීති සම්පාදන කමිටුව සම්බන්ධීකරණය සහ පැවැත්වීම.
- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පණත යටතේ කරන ලද ඉල්ලීම් සඳහා පිළිතුරු සකස් කිරීම සහ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වීම.
- විවිධ කමිටු, ව්‍යාපෘති සහ විශේෂ සංසද ආදියෙහි නෛතික, නියාමන සහ ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් දායකත්වය ලබා දීම
- විශ්වවිද්‍යාලයට අදාළ සියලුම නඩු කටයුතු සහ විමර්ශන සම්බන්ධයෙන් ලේඛන පවත්වාගෙන යාම.
- පාලක සභාවේ තීරණ අනුව නඩු කටයුතු, විමර්ශන සහ පසු විපරම් කටයුතු සම්බන්ධයෙන් පාලක සභාව වෙත මෙමෝපත් සකස් කිරීම.
- විවිධ අධිකරණවල විශ්වවිද්‍යාලය වෙනුවෙන් පෙනී සිටීමින් නීතිපති දෙපාර්තමේන්තුව සහ නිල නොවන නීතිඥ මණ්ඩලයේ නීතිඥවරුන් සමඟ උපදේශන සම්බන්ධීකරණය සඳහා සහභාගී වීම, අවශ්‍ය තොරතුරු ලබා දීම, අවශ්‍ය ලිපි ලේඛන සකස් කිරීම සහ ගොනු කිරීම, ලිපිගොනු හැසිරවීම සහ නඩත්තු කිරීම,
- **විශ්වවිද්‍යාලයට අයත් ඉඩම්වල අයිතිය ලබා ගැනීම/ අනුරේඛනය**
    - I. ඉඩම් 03ක් සඳහා රාජ්‍ය ප්‍රදාන ලබා ගනු ලැබීය.
    - II. ඉඩම් 05 ක් සඳහා රාජ්‍ය ප්‍රදාන ලබා ගැනීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.
    - III. ඉඩම් 03 ක අයිතිය නිෂ්කාශනය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.
    - IV. ඉඩමක අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඉඩම් ලියාපදිංචි කිරීමේ ලේඛන පරීක්ෂා කිරීම සිදු කරන ලදී.
    - V. විශ්වවිද්‍යාලය සතු ඉඩම් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග නිශ්චය කරගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ නීතීඥවරයාගේ සහාය ඇතිව විශ්වවිද්‍යාලයට අයත් සියලුම ඉඩම් සමස්තයක් ලෙස පරීක්ෂා කර තත්ව වාර්තාවක් ලබා ගැනීම.

1. 2022 වර්ෂය තුළ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් (ජුනි මස සිට)

අංකය	විස්තර	අත්සන් කළ දිනය	අදාළ පීඨය / ආයතනය
1.	යාකෘත් සෛලීය පිළිකා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් "ලෝකනාථ රස" ඖෂධයෙහි අඩංගු රසදියවල යාකෘත් සෛලීය ආරක්ෂණ ක්‍රියාකාරකම්	12/08/2022	IIM
2.	කොළඹ විශ්වවිද්‍යාලය සහ වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය (ACCA) අතර අවබෝධතා ගිවිසුම	26/09/2022	කළ. හා මූල්‍ය පීඨය

3.	බුද්ධිමය දේපල බලපත්‍ර ගිවිසුම	26/09/2022	UBL
4.	පර්යේෂණ උප කොන්ත්‍රාත්තුව අංක _2223475_ (“උප කොන්ත්‍රාත්තුව”) [ප්‍රධාන අනුග්‍රාහකයා] යටතේ ("ප්‍රධාන අනුග්‍රාහකයා") ප්‍රධාන කොන්ත්‍රාත් අංකය _ U01AI136033_ ("ප්‍රධාන කොන්ත්‍රාත්තුව")	27/09/2022	වෛද්‍ය පීඨය
5.	කොළඹ විශ්වවිද්‍යාලය සහ HNB Assurance Plc අතර අවබෝධතා ගිවිසුම	10/10/2022	කළ. හා මූල්‍ය පීඨය
6.	කොළඹ විශ්වවිද්‍යාලය සහ HNB General Insurance Limited අතර අවබෝධතා ගිවිසුම	10/10/2022	කළ. හා මූල්‍ය පීඨය
7.	ක්ෂය රෝග පාලනය සහ ළය රෝග සඳහා වන ජාතික වැඩසටහන (NPTCCD), කොළඹ විශ්වවිද්‍යාලය (UOC) සහ සෞඛ්‍ය අමාත්‍යාංශය (MOH) අතර අවබෝධතා ගිවිසුම	10/10/2022	වෛද්‍ය පීඨය
8.	කොළඹ විශ්වවිද්‍යාලය සහ ආසියානු පදනම අතර අවබෝධතා ගිවිසුම	10/10/2022	වෛද්‍ය පීඨය
9.	කොළඹ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය (ACCA) අතර අවබෝධතා ගිවිසුම	21/10/2022	කළ. හා මූල්‍ය පීඨය
10.	කොළඹ විශ්වවිද්‍යාලය සහ LB FINANCE PLC අතර අනාවරණ නොවන ගිවිසුම	01/11/2022	කළ. හා මූල්‍ය පීඨය
11.	කොළඹ විශ්වවිද්‍යාලය සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA Sri Lanka) අතර අවබෝධතා ගිවිසුම	03/11/2022	කළ. හා මූල්‍ය පීඨය
12.	කොළඹ විශ්වවිද්‍යාලය සහ කේරළයේ ත්‍රිකාරහි භාරත මාතා විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම	14/11/2022	ප.උ. අධ්‍යයන පීඨය
13.	කොළඹ විශ්වවිද්‍යාලය සහ බස්නාහිර පළාත් ක්‍රිකට් සංගමය අතර අවබෝධතා ගිවිසුම	6/12/2022	අධ්‍යාපන පීඨය
14.	ද්‍රව්‍ය හුවමාරු ගිවිසුම/GHR ව්‍යාපෘතිය 16/136/68 ගෝලීය සෞඛ්‍ය පර්යේෂණ (GHR) ව්‍යාපෘතියට අදාළව ලන්ඩනයේ ඉම්පීරියල් විද්‍යා, තාක්ෂණ හා වෛද්‍ය විද්‍යාලය සහ කොළඹ විශ්ව විද්‍යාලය අතර ද්‍රව්‍ය හුවමාරු ගිවිසුම - 458 වන පීඨ සභාව, 438 වන සනාතන සභාව	19/12/2022	වෛද්‍ය පීඨය
15.	Imperial College සහ කොළඹ විශ්වවිද්‍යාලය අතර සහයෝගිතා ගිවිසුම	20/12/2022	වෛද්‍ය පීඨය
16.	රුහුණු විශ්වවිද්‍යාලය සහ ප්‍රධාන විමර්ශක කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය ඩබ්ලිව්.කේ.එස්.එම් අබේසේකර අතර ගිවිසුම.	23/12/2022	තාක්ෂණ පීඨය
17.	කොළඹ විශ්වවිද්‍යාලය සහ සවුත් වේල්ස් විශ්වවිද්‍යාලය අතර ද්‍රව්‍ය හුවමාරු ගිවිසුම	23/12/2022	වෛද්‍ය පීඨය
18.	සෙනෙවිරත්න-කප්පාගොඩ-සේනාරත්න ශිෂ්‍යත්ව සඳහා ගිවිසුම-484 වැනි පීඨ මණ්ඩලය	23/12/2022	වෛද්‍ය පීඨය
19.	විද්‍යාඥයින් සඳහා කේවල පර්යේෂණ ප්‍රදාන ගිවිසුම (RGA) අංක 22-140 RG/BIO/ASJ- FR 3240325151	29/12/2022	වෛද්‍ය පීඨය
20.	එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල සහ කොළඹ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම	29/12/2022	ශාස්ත්‍ර පීඨය
21.	Rickettsial Zoonoses ශාඛාව සරල ලිපි ගිවිසුම	29/12/2022	වෛද්‍ය පීඨය
22.	මහජන බැංකුව සහ විද්‍යා පීඨය අතර අවබෝධතා ගිවිසුම	29/12/2022	විද්‍යා පීඨය
23.	පරිසර අමාත්‍යාංශය සහ කොළඹ විශ්ව විද්‍යාලය අතර සහයෝගීතා කොන්දේසි වල පරිශිෂ්ටය	29/12/2022	IIM

<u>මෙම වාර්තාවට අදාළ අනෙකුත් විස්තර /කාර්ය සාධනයන්</u>

2022 වර්ෂය තුළ **ක්‍රියාත්මක** වූ නඩු සංඛ්‍යාව

අංකය	අධිකරණය	නඩු සංඛ්‍යාව **(ක්‍රියාත්මක)**	අවසාන වූ නඩු සංඛ්‍යාව
01	ශ්‍රේෂ්ඨාධිකරණය	14	-
02	මහාධිකරණය	04	01
03	අභියාචනාධිකරණය	08	03
04	මානව හිමිකම් කොමිසම (HRC)	06	-
05	විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය (USAB)	24	-
06	කම්කරු විනිශ්චය සභාව	07	-
07	දිස්ත්‍රික් උසාවිය	13	-
	එකතුව	**76**	**04**

2022 වර්ෂය තුළ **ක්‍රියාත්මක** වූ විමර්ශන සංඛ්‍යාව

අංකය	**ස්වභාවය**	**ක්‍රියාත්මක** සංඛ්‍යාව	අවසාන වූ සංඛ්‍යාව	මුළු එකතුව
01.	මූලික විමර්ශන	4	8	12
02.	විධිමත් විනය පරීක්ෂණ	2	1	3

2022 වර්ෂය තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීම් පිළිබඳ විස්තර

අංකය.	**ස්වභාවය**	සංඛ්‍යාව
I.	2022 වර්ෂය සඳහා තොරතුරු ඉල්ලීම් ගණන	21
II.	2022 වසර සඳහා අභියාචනා ගණන	06
III.	පූර්ණ වශයෙන් තොරතුරු සපයන ලද ඉල්ලීම් ගණන	12
IV.	අර්ධ වශයෙන් තොරතුරු සපයන ලද ඉල්ලීම් ගණන	5
V.	පනතේ 5 වැනි වගන්තිය අනුව ප්‍රතික්ෂේප කරන ලද හෝ අපලාපනය කරන ලද තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව	4
VI.	තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමට ගතවන සාමාන්‍ය කාලය (වැඩකරන දින ගණන)	7
VII.	තැපැල් මගින් ලද තොරතුරු ඉල්ලීම් ගණන	18
VIII.	විද්‍යුත් තැපෑලෙන් ලද තොරතුරු ඉල්ලීම් ගණන	4

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී /නීති සහ ප්‍රලේඛන විසින් පරීක්ෂා කිරීමෙන් පසු නීති සම්පාදන කම්ටුව වෙත යොමු කරන ලද ලේඛන

අංකය.	**විස්තර**	ලේඛන සංඛ්‍යාව
I.	අවබෝධතා ගිවිසුම් (MoU)	26
II.	අතුරු ව්‍යවස්ථා	15
III.	ව්‍යවස්ථා	06
IV.	ගිවිසුම්	25
V.	ප්‍රඥප්තිය	01
VI.	සංශෝධන සහ රෙගුලාසි	06
	එකතුව	**76**

1.3 අංශය විසින් පරීක්ෂා කරන ලද මුළු ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් එකතුව **- 85**

9. අභ්‍යන්තර විගණන අංශය

2022 වසරේ දී , කොළඹ විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව සිව් වතාවක් රැස්වූ අතර අභ්‍යන්තර විගණන වාර්තාවලින් ඉස්මතු වූ කරුණු සහ රජයේ විගණන විමර්ශන පිළිබඳ කරුණු සාකච්ඡා කෙරිණි.

කොළඹ විශ්වවිද්‍යාලයේ අනෙකුත් ආයතනවල පැවති විගණන කමිටු රැස්වීම්වල විස්තර පහත දැක්වේ.

විගණන කමිටු රැස්වීම් - ආයතන	පැවැත්වූ රැස්වීම් ගණන
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	4
මානව සම්පත් අභිවර්ධන ආයතනය	4
පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය	4
ජෛව රසායන විද්‍යා, අණුක ජීව විද්‍යා සහ ජෛව තාක්ෂණවේද ආයතනය	4
ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය	4
කෘෂි තාක්ෂණ සහ ග්‍රාමීය විද්‍යා ආයතනය	4
පශ්චාත් උපාධි දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	4
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල	4

ඉහත කී විගණනයන්ට අමතරව අප විසින් පහත සඳහන් කටයුතු සම්බන්ධව පූර්ව විගණන කටයුතු සිදුකරන ලදී.

- ✓ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල ආපසු ගෙවීම
- ✓ විශ්‍රාම පාරිතෝෂික ගෙවීම්
- ✓ විශ්‍රාම වැටුප් අයදුම්පත්
- ✓ හිඟ වැටුප ගෙවීම්

විගණන වාර්තා

වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් පහත අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කරන ලදී.

1. කොළඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
2. කොළඹ විශ්වවිද්‍යාලයේ නඩත්තු අංශයෙහි ගබඩා පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
3. සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශයේ අලුතින් ඉදිකරන ලද සයමහල් ගොඩනැගිල්ලෙහි කාර්ය මණ්ඩල කාමරවල භාවිතය පිළිබඳ භෞතික පරීක්ෂණය
4. ශ්‍රීපාලි මණ්ඩපයෙහි අත්තිකාරම් සහ ණය පිළිබඳ නියැදි විමර්ශනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
5. ශ්‍රීපාලි මණ්ඩපයෙහි මුදල් සහ බැංකු ශේෂයන් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
6. ශ්‍රීපාලි මණ්ඩප කාර්ය මණ්ඩලයේ පරිපාලනය විධිමත් කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
7. ශ්‍රීපාලි මණ්ඩපයෙහි ගබඩා කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
8. ශ්‍රීපාලි මණ්ඩපයෙහි පවිත්‍රතා සේවා පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
9. ශ්‍රීපාලි මණ්ඩපයට වැඩ ඉංජිනේරු (සිවිල්) III ශ්‍රේණිය බඳවා ගැනීම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
10. ශ්‍රීපාලි මණ්ඩපයට පැවරුම් පදනම මත කාර්මික නිලධාරී (ICT) බඳවා ගැනීම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
11. ශ්‍රීපාලි මණ්ඩපයට උද්‍යාන භාරකරු (III ශ්‍රේණිය) බඳවා ගැනීම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
12. සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය සහ සත්ව විද්‍යා අධ්‍යයන අංශයේ අවකාශ භාවිතය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
13. නඩත්තු අංශයෙහි ගබඩා පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - කොළඹ විශ්වවිද්‍යාලය
14. ශාස්ත්‍ර පීඨයේ ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා බාහිර දේශක ගාස්තු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව

15. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - PGIM
16. මුදල් අග්‍රිම ශේෂයන් සහ බැංකු ක්‍රියාකාරකම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - PGIM
17. පරිපාලන මෙහෙයුම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - PGIM
18. PGIM හි ස්ථාවර වත්කම් සහ උපකරණ සත්‍යාපනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
19. PGIM විසින් පවත්වනු ලබන විභාග පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
20. වාහන භාවිතය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - PGIM
21. මුදල් අග්‍රිම ශේෂය සහ බැංකු සැසඳුම්පත පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - NILIS
22. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - NILIS
23. ගබඩා, සුළු මුදල්, අත්තිකාරම්, වාහන සහ ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - NILIS
24. අධ්‍යයන ක්‍රියාකාරකම්, සමීක්ෂණ මණ්ඩලය සහ පෞද්ගලික ලිපිගොනු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - NILIS
25. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත්, කෙසෙල් පැළ පිළිබඳ සමායන විශ්ලේෂණය, විකුණුම් මධ්‍යස්ථානයේ මෙහෙයුම් සහ සුළු මුදල් සත්‍යාපනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - UCIARS
26. විකුණුම් මධ්‍යස්ථානය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - UCIARS
27. 2021 වාර්ෂික වාර්තාවේ අනුකූලතා වාර්තා කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - UCIARS
28. විභාග සහ ප්‍රතිඵල නිකුත් කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - UCIARS
29. හදුනා නොගත් තැන්පතු පිළිබඳ අභ්‍යන්තර විගණන පසු විපරම් වාර්තාව - UCIARS
30. 2021 සමීක්ෂණ මණ්ඩලය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - UCIARS
31. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - IBMBB
32. සුළු මුදල්, අත්තිකාරම්, ගබඩා සහ පෞද්ගලික ලිපිගොනු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - IBMBB
33. අධ්‍යයන කටයුතු ගෙවීම් වවුචර් සහ සනීපාරක්ෂක, පවිත්‍රතා, භූමි අලංකරණය සහ නඩත්තු සේවා ප්‍රසම්පාදනය පිළිබඳ සමාලෝචනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව, - IBMBB
34. ස්ථාවර තැන්පතු පොලී, ණය, බැංකු සැසඳුම්පත් ප්‍රකාශ සහ වැටුප් පාලන ගිණුම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව – IBMBB
35. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, මූල්‍ය වාර්තා කෙටුම්පත් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව – IIM
36. මුදල්, සුළු මුදල්, ගබඩා, පෞද්ගලික ලිපිගොනු, අත්තිකාරම්, වාහන සහ ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - IIM
37. 2021 අවසන් ගිණුම් කෙටුම්පත් සහ ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - IHRA
38. සුළු මුදල්, අත්තිකාරම්, ගබඩා සහ වාහන පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - IHRA
39. පෞද්ගලික ලිපිගොනු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව, සමීක්ෂණ මණ්ඩලය 2021 සහ පවිත්‍රතා සේවා තෝරා ගැනීමේ සහ බඳවා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය - IHRA
40. ස්ථාවර තැන්පතු පොලී ආදායම සහ බැංකු සැසඳුම් ප්‍රකාශ පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - IHRA
41. මුදල් ගණනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව (සරජ් කාර්යාලය) – IHRA
42. මූල්‍ය ප්‍රකාශන සහ ක්‍රියාකාරී සැලැස්ම 2021 සමාලෝචනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව – PGIIM
43. සැලසුම් කිරීම සහ පාලනය කිරීම, කාර්ය මණ්ඩල පරිපාලනය විධිමත් කිරීම, ලැබීම් වියදම් සහ අත්තිකාරම්, මුදල් අග්‍රිම ශේෂය සහ බැංකු සැසඳුම් සහ ගබඩා සහ තොග පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - PGIIM
44. සම්පත් භාවිතය, ලැබීම්, වියදම් සහ අත්තිකාරම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - PGIIM
45. අධ්‍යයන කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - PGIIM

ඉදිකිරීම් ලිපි ගොනු විගණනය කිරීම

1. වෛද්‍ය පීඨයේ ඒ සහ බී ගොඩනැගිලි සඳහා විදුලි සැපයුම වැඩිදියුණු කිරීම (MD/MR/C/62/2018 - රු. 3,168,084.55)

2. විද්‍යා පීඨයේ සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය සඳහා සයමහල් ගොඩනැගිල්ල සැලසුම් කිරීම සහ ඉදි කිරීම (UOC/CWP/02/2014/Sci/DST/Pts – රු. 9,312,754.03)

3. විද්‍යාල මන්දිරයෙහි කාණු පද්ධතිය සහ වාහන නැවැත්වීමේ ප්‍රදේශය ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම (MD/MR/C/20/2016 – රු. 1,236,515.71)

4. PGIM නව ගොඩනැගිල්ලේ මායිම් තාප්පය - රොඩ්නි වීදිය (PGIM/GA/07/RAC/01 - රු. 910,720)

5. ආපනශාලාව අලුත්වැඩියා කිරීම - IIM (IIM/AA/1/6/2021 - රු. 7,958,945)

6. අධ්‍යයන අංශ කිහිපයක් අලුත්වැඩියා කිරීම සහ වැඩිදියුණු කිරීම – IIM (AAI/3/2018/04 - රු. 5,542,082.60)

7. විද්‍යා පීඨයේ රසායන විද්‍යා අධ්‍යයන අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩල කාමර පාටිෂන් කිරීම (MD/MR/C/36/2021 - රු. 4,437,880)

8. දේශන ශාලා 7,8 හා 9 ප්‍රතිසංස්කරණය කිරීම (IIM/AA/1/6 - රු. 4,044,405)

9. දේශන ශාලා 3 හා 4 ප්‍රතිසංස්කරණය කිරීම (IIM/AA/1/6 - රු. 3,752,460)

අභ්‍යන්තර විගණන අංශය විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ පහත සඳහන් ශිෂ්‍ය සංගම් සඳහා මූල්‍ය විගණන පවත්වා තිබේ.

1. වෛද්‍ය පීඨය, භෞතචිකිත්සක ශිෂ්‍ය සුබසාධන සංගමය. 28.07.2021 – 28.03.2022 කාලසීමාව සඳහා
2. විද්‍යා පීඨය, Euphony සමාජය. 01.04.2021 – 31.03.2022 කාලසීමාව සඳහා
3. විද්‍යා පීඨය - භෞතික විද්‍යා අධ්‍යයන අංශය, තාරකා විද්‍යා සංගමය . 24/09/2020 - 23/11/2021 කාලසීමාව සඳහා
4. විද්‍යා පීඨය, BEEZ සංගමය. 31/12/2021 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
5. විද්‍යා පීඨය, ‘Starquest 22’ සමස්ත ලංකා අන්තර් පාසල් තාරකා විද්‍යා ප්‍රශ්නාවලිය - තාරකා විද්‍යා සංගමය, 2022
6. ශාස්ත්‍ර පීඨය, එක්සත් භික්ෂු සංගමය 27/05/2019 - 22/04/2021 කාලසීමාව සඳහා
7. කලා මණ්ඩලය, ආදරණීය කපුගේ ගීත හා විචාර කතිකාව සහ සරසවි මියැසිය සංගීත වැඩසටහන 2022
8. විද්‍යා පීඨය, උද්භිද විද්‍යා සංගමය 19/03/2019 - 11/09/2020 කාලසීමාව සඳහා
9. විද්‍යා පීඨය, උද්භිද විද්‍යා සංගමය 11/09/2020 - 08/10/2021 කාලසීමාව සඳහා
10. විද්‍යා පීඨය, උද්භිද විද්‍යා සංගමය 08/10/2021 - 14/08/2022 කාලසීමාව සඳහා

10. කොළඹ විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාලයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවල සාරාංශය

01 අරමුණ - ඉගැන්වීමේ හා ඉගෙනීමේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීම [*දැනුම් සම්ප්‍රේෂණය*]

- ස්වාධීන ඉගෙනීම, විවේචනාත්මක චින්තනය සහ යාවජීව අධ්‍යාපනය තුළින් උපාධිධාරී ගුණාංග ශක්තිමත් කිරීම
- පෞරුෂ සංවර්ධනය, උපදේශනය සහ වෘත්තීය මාර්ගෝපදේශනය තුළින් ශිෂ්‍යයන් වැඩිදියුණු කිරීමට පහසුකම් සැලසීම.
- කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) සහ තත්ත්ව සහතිකකරණය සම්බන්ධ කටයුතුවල නිරත වීම
- කොවිඩ්-19 සම්බන්ධ ඩිජිටල් පරිවර්තනය මිශ්‍ර ඉගෙනුම් සංස්කෘතියක් ලෙස පවත්වාගෙන යාමට ප්‍රවර්ධනය කිරීම.
- අධ්‍යයන උපදේශනය සහ මුල් වෘත්තීය සහාය පවත්වා ගැනීම.
- ජාත්‍යන්තර සහයෝගිතා ප්‍රවර්ධනය කිරීම.
- ශාස්ත්‍රීය/වෘත්තීය සංගම්වල සාමාජිකත්වය ලබා ගැනීමට දිරිමත් කිරීම
- අධ්‍යයන විශිෂ්ටත්වය සහ විෂය බාහිර ක්‍රියාකාරකම් දිරිමත් කිරීම.
- නව පීඨ/අධ්‍යයන අංශ පිහිටුවීම.

02 අරමුණ - පර්යේෂණ, නවෝත්පාදන සහ වාණිජකරණයේ විශිෂ්ටත්වය [*දැනුම් නිර්මාණය*]

- පර්යේෂණ කළමනාකරණයේ ප්‍රතිපත්ති සංවර්ධනය සහ ප්‍රශස්ත භාවිතයන් තුළින් ශක්තිමත් පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම.
- පර්යේෂණ ආචාර ධර්මයන්හි සහ අවංකත්වයෙහි ඉහළම මට්ටම සහතික කිරීම
- විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකරණ සුසාධ්‍යකාරත්වයෙහි ක්‍රියාකාරීත්වය ප්‍රශස්තකරණය
- නවීන විද්‍යාගාර පහසුකම් සහ ඒ ආශ්‍රිත පර්යේෂණ සහාය වැඩිදියුණු කිරීම/ ස්ථාපිත කිරීම
- තථ්‍ය කාලීන අධීක්ෂණය තුළින් සමඟ ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගිතාව වැඩිදියුණු කිරීම සහ පර්යේෂණ නිමැවුම් සහ ප්‍රතිඵල ඇගයීම
- ඉගැන්වීම්-ඉගෙනුම් පහසුකම් වැඩිදියුණු කිරීම / නඩත්තු කිරීම / ශක්තිමත් කිරීම
- ගොඩනැගිලි ආදිය ඒවායෙහි නියමිත ආයුකාලය පුරා සැලසුම් සහගතව නඩත්තු කිරීම

03 අරමුණ - මානව ප්‍රාග්ධනය සහ ඉගෙනුම් ආධාරක පද්ධතිවල විශිෂ්ටත්වය

- ඉගැන්වීම්-ඉගෙනුම් පහසුකම් වැඩිදියුණු කිරීම / නඩත්තු කිරීම / ශක්තිමත් කිරීම
- ගොඩනැගිලි ආදිය ඒවායෙහි නියමිත ආයුකාලය පුරා සැලසුම් සහගතව නඩත්තු කිරීම
- ඉගැන්වීම් හා ඉගෙනුම් පහසුකම්වල භාවිතය සහතික කිරීම
- කාර්ය මණ්ඩලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල වාසස්ථාන සහ ආපනශාලාවල ගුණාත්මක බව ඉහළ නැංවීම.
- යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
- ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා සිසුන් සහ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය ඉහළ නැංවීම.

04 අරමුණ - පාලනය, යහපත් පුරවැසිභාවය සහ ජාතික සංවර්ධනය තුළ ප්‍රශස්ත භාවිතයන් තිරසාරව පවත්වාගෙන යාම

- අධ්‍යයන, පරිපාලන සහ මූල්‍ය කළමනාකරණයේ ප්‍රශස්ත භාවිතයන් කාර්ය මණ්ඩලය අතර බෙදා ගැනීමට පහසුකම් සැලසීම.
- ජාතික මට්ටමේ සංවර්ධනය සඳහා කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය දිරිමත් කිරීම.
- සිසුන්ට ඔවුන්ගේ නිපුණතා ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය ඉඩ පහසුකම් නිර්මාණය කිරීම.
- බාහිර සංවිධාන සහ ප්‍රජාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට කාර්ය මණ්ඩලය සහ සිසුන් දිරිමත් කිරීම.
- තිරසාර පරිභෝජනය සහ සංවර්ධනයන්හි ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම.
- වාර්ගික, සමාජීය සහ ආගමික අන්තර්ග්‍රහනයන් සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.

11. ධරණීය සංවර්ධනය මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාවක්

I.කොළඹ විශ්වවිද්‍යාලය පරිසරය ආරක්ෂා කර ගැනීමට සහ පරිසරයට වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට සැලසුම් කරයි. කොළඹ විශ්ව විද්‍යාලය හරිත විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීම සඳහා 'අන්තර්ජාල මෙවලම් භාවිතා කරමින් කඩදාසි රහිත කාර්යාලයක් නිර්මාණය කිරීම', 'පොලිතින්වලින් තොර පරිසරයක්', 'හරිත ගොඩනැගිලි පිහිටුවීම', 'හරිත ගොඩනැගිලි පිහිටුවීම', සූර්ය බලශක්ති අස්වැන්න', 'වැසි ජලය රැස් කිරීම' සහ ' තිරසාර බලශක්ති සංවාදය' වැනි පියවර ගෙන තිබේ. එමෙන්ම පාරිසරික ආරක්ෂාව සහ තිරසාර හරිත සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කොළඹ විශ්වවිද්‍යාලය විසින් කොළඹ විශ්වවිද්‍යාලයීය පාරිසරික මුල පිරීම් මධ්‍යස්ථානය (CEI) පිහිටුවන ලදී. පාරිසරික මුල පිරීම් මධ්‍යස්ථානයේ අරමුණු පහත පරිදි වේ:

- හරිත මූලාරම්භයන් පිළිගැනීම සහ හරිත විශ්වවිද්‍යාලයක් බවට පත්වීම
- විශ්වවිද්‍යාලය සඳහා නිසි සන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමයක් ස්ථාපිත කිරීම
- විශ්වවිද්‍යාල පරිසරය ආරක්ෂා කිරීම සහ වඩාත් පරිසර හිතකාමී කිරීම
- විශ්වවිද්‍යාල ප්‍රජාව සහ විශ්වවිද්‍යාලයෙන් පිටත (පාසල්) අතර පාරිසරික දැනුවත්භාවය ඇති කිරීම සහ හරිත ක්‍රියාකාරකම් සඳහා වෙනත් අයට සහාය වීම.

II.අනාගත පරම්පරාව සඳහා පරිසරය ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දිගුකාලීන තිරසාරභාවය සුරක්ෂිත කිරීමට ඉවහල් වීම සඳහා තමා වෙත වැදගත් කාර්යභාරයක් පැවරී ඇති බව කොළඹ විශ්වවිද්‍යාලය පිළිගනී. කොළඹ විශ්වවිද්‍යාලයේ ඉහළ පරිපාලන/කළමනාකරණ බලධාරීහු දැනට පවතින නීතිමය අවශ්‍යතාවලට අනුකූලව විශ්වවිද්‍යාලයෙහි තිරසාර සම්පත් පරිභෝජනය, පරිසර දූෂණය වැළැක්වීම සහ අඛණ්ඩ පාරිසරික වැඩිදියුණු කිරීම් සඳහා කැපවී සිටිති. අපි පහත සඳහන් ප්‍රතිපත්ති සහ යහපත් භාවිතයන් අනුගමනය කරමු.

- පාරිසරික අධ්‍යාපනය, ව්‍යාප්තිය සහ දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම
- බලශක්ති, ජලය සහ ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම
- අපද්‍රව්‍ය කළමනාකරණය සහ 3R සංකල්පය ක්‍රියාත්මක කිරීම
- පරිසර හිතකාමී නිෂ්පාදන මිලදී ගැනීම හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම
- විෂ සහිත අපද්‍රව්‍ය කළමනාකරණය
- නව හරිත මුල පිරීම් සහ හරිත තාක්ෂණයන් හඳුන්වා දීම
- ආයතන, කර්මාන්ත, සමාගම් සහ පළාත් පාලන ආයතන සමඟ හරිත හවුල්කාරිත්වය වර්ධනය කිරීම

III.තවද විශ්වවිද්‍යාල ආචාර්යවරුන් තිරසාර සංවර්ධනය සහ පරිසරය සහ ආපදා බලපෑම් තක්සේරු විශ්ලේෂණය සම්බන්ධයෙන් විවිධ පර්යේෂණ සිදු කර ඇති අතර මෙම පර්යේෂණවල ප්‍රතිඵල වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ සැසිවාරයේදී ඉදිරිපත් කරනු ඇත.

IV.පාරිසරික තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීම කොළඹ විශ්වවිද්‍යාලයේ 2021-2025 උපාය මාර්ගික සැලැස්මේ එක් අරමුණක් වන අතර එම අරමුණ යටතේ තිරසාර පාරිසරික මුලපිරීම් හඳුන්වා දීමට සහ ඒවා ප්‍රායෝගිකව භාවිත කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ඇත. හරිත තිරසාර මූලාරම්භයන් ප්‍රවර්ධනය කිරීම සහ ජලය සහ බලශක්තිය සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ද විශ්වවිද්‍යාලය විසින් සැලසුම් සකස් කර ඇත.

V.උපකුලපතිවරයාගේ උපදෙස් පරිදි කොළඹ විශ්වවිද්‍යාලය හරිත ආයතනයක් බවට පත්කිරීමේ ගමන ශක්තිමත් කිරීම සඳහා පාරිසරික මුල පිරීම් මධ්‍යස්ථානය විසින් පාරිසරික සහ තිරසාර මාර්ගෝපදේශ මාලාවක් හඳුන්වා දී ඇත. මෙම මාර්ගෝපදේශ පොදු පරිසර හිතකාමී භාවිතයන් සහ තේරුම් ගත හැකි ආකෘතියකින් යුතු විවිධ තත්වයන්ට අදාළ වන අලුතින් සංස්ථාපිත උපදෙස් වලින් සමන්විත වේ. කාර්ය මණ්ඩලය සහ සිසුන් තමා අයත් වන කණ්ඩායම මත අදාළ මාර්ගෝපදේශ/උපදෙස් අනුගමනය කිරීම අපේක්ෂා කෙරේ. විශ්වවිද්‍යාල පරිසරය සම්බන්ධයෙන් සිය කාර්යභාරය සහ වගකීම අවබෝධ කරගෙන විශ්වවිද්‍යාලයේ හරිත අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වීම විශ්වවිද්‍යාලය ඔබගෙන් අපේක්ෂා කරයි.

VI.කොළඹ විශ්වවිද්‍යාලය විසින් තිරසර සංවර්ධන අරමුණු වේදිකාව හරහා SDG සඳහා වෙන් කරන ලද විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ වෙබ් පිටුවක් සකස් කරන ලද අතර මෙය විශ්වවිද්‍යාලය විසින් තිරසර සංවර්ධන අරමුණු සඳහා දක්වන ලද දායකත්වය වැඩිදියුණු කිරීමේ උත්සාහයක් ලෙස සිදු කරන ලදී. [URL: https://cmb.ac.lk/sdgs/]

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක ඉදිරියට ගෙන යාමට කොළඹ විශ්ව විද්‍යාලයේ දායකත්වය (SDG)

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
	**පර්යේෂණ**	▪ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට සම්බන්ධ ආයතන සමඟ ශාස්ත්‍රීය සහයෝගීතාව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ සහයෝගයෙන් දරිද්‍රතාවය තුරන් කිරීමේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සඳහා ආචාර්යවරුන් සම්බන්ධ කර ගැනීම
	ඉගැන්වීම සහ ඉගෙනීම	▪ ප්‍රාදේශීය ප්‍රජාවට ආධාර කිරීම/අදාළ අධ්‍යාපනය හෝ සම්පත් හරහා මූල්‍යමය හා සමාජීය වශයෙන් තිරසාර ව්‍යාපාර ආරම්භ කිරීමට සහාය වීම ▪ ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා UCIARS විසින් මෙහෙයවනු ලබන පටක වගාව / කෙසෙල් වගා වැඩමුළුව සහ කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) විසින් පවත්වනු ලබන සියලුම දැනුවත් කිරීමේ වැඩසටහන්. https://uciaර්. cmb.ac.lk/
	ප්‍රජා සත්කාරය	▪ ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ ජීවනෝපාය නඟා සිටුවීම සඳහා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති හඳුන්වා දීම කළමනාකරණ හා මූල්‍ය පීඨය 2013 වසරේ සිට ව්‍යාපාර පරිපාලනය (BBA) උපාධි පාඨමාලාවේ මූලික අංගයක් ලෙස ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක් ඉදිරිපත් කරයි. වසර අටකට වැඩි කාලයක් පුරා රට පුරා විවිධ පුද්ගලයන්ගේ ජීවිත නඟා සිටුවීමට ශිෂ්‍ය කණ්ඩායම් විසින් විවිධ ව්‍යාපෘති සිදු කර ඇත. මෙම ව්‍යාපෘති මගින් සමාජ වගකීම් සහිත පුරවැසියන් ලෙස සිසුන්ගේ දැනුම, කුසලතා සහ නිපුණතා සහ ආකල්ප පෙන්නුම් කරයි. https://mgmt.cmb.ac.lk/community-development-project ▪ කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) අතිරේක අරමුදල් සපයමින් කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) අතිරේක අරමුදල් සපයමින් කෘෂිකර්මාන්තයට සම්බන්ධ වීමට කැමති ගොවීන් සහ සිසුන් සඳහා පුහුණුව ලබා දෙයි.
	පරිපාලනය	▪ මූල්‍ය ආධාර යෝජනා ක්‍රම සහ අනෙකුත් පහසුකම් විශ්වවිද්‍යාල සිසුන්ට විශ්වවිද්‍යාල මෙන්ම රජය ද මූල්‍ය ආධාර යෝජනා ක්‍රම කිහිපයක් සපයයි. මහපොළ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය සහ ශිෂ්‍යාධාරය සමඟ කොළඹ විශ්වවිද්‍යාලය සිසුන්ට නොමිලේ නේවාසිකාගාර (නවාතැන්)/ නොමිලේ වෛද්‍ය ආධාර/ නොමිලේ ක්‍රීඩා පහසුකම්/ සහනාධාර ප්‍රවාහන යෝජනා ක්‍රම සපයයි.
	**පර්යේෂණ**	-
	ඉගැන්වීම සහ ඉගෙනීම **ප්‍රජා සත්කාරය**	▪ කෘෂි තාක්ෂණ උපාධි වැඩසටහන වයස, ඉඩකඩ, කාලය සහ අධ්‍යාපනික පසුබිම යන කරුණු වලින් බාධා රහිතව කෘෂිතාර්මික ප්‍රජාවට උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම සඳහා මිශ්‍ර දූරස්ථ ඉගැන්වීම් ක්‍රමයක් සහිත ආයතනයක් ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) පිහිටුවා ඇත. මෙම ආයතනය ස්ථාපනය මගින් කෘෂිතාර්මික ප්‍රජාව නවීන දැනුමෙන් සහ තොරතුරු තාක්ෂණයෙන් සන්නද්ධ කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ගොවිතැන කීර්තිමත් රැකියාවක් ලෙස නඟා සිටුවීමට ශ්‍රී ලංකා රජය ගත් ස්ථිර ක්‍රියාමාර්ගයක යුගයක් සනිටුහන් විය. https://uciars.cmb.ac.lk/wp-content/uploads/2021/05/UCIARS-Curriculam.pdf
	පරිපාලනය	▪ විශ්වවිද්‍යාලය සිසුන් සඳහා සෞඛ්‍ය සම්පන්න සහ ඉහළ සහනාධාර සහිත ආපනශාලා පහසුකම් සපයයි. සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන්ගෙන් සමන්විත ආපනශාලා කමිටු විශ්වවිද්‍යාලය සතුව ඇත.
	**පර්යේෂණ**	▪ කායික විද්‍යා අධ්‍යයන අංශයෙහි 2013 දී පිහිටුවන ලද ස්නායු භෞතික විද්‍යා පර්යේෂණ රසායනාගාරය හරහා ස්නායු විද්‍යා පර්යේෂණ ආරම්භ කර ඇත. දැනට රසායනාගාරය ස්නායු සන්නායක අධ්‍යයනය, විභවයන් මතු කිරීම, විද්‍යුත් එන්සෙෆලෝග්‍රැෆි සහ විද්‍යුත් විශ්ලේෂණ සඳහා පහසුකම් සපයයි. ▪ සතුන් තුළ ජලහීතිකා රෝගයට එරෙහිව එන්නත් කිරීමෙන් පසු

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
		ප්‍රතිශක්තිකරණය වෛද්‍ය පීඨයේ කායික විද්‍යා අධ්‍යයන අංශයෙහි සිදු කෙරෙන අධ්‍යයනය, සංසන්දනය සඳහා අවශ්‍ය සම්මත තත්ව යටතේ රසායනාගාර සත්ව ආකෘති භාවිතා කරමින් රට තුළ අලෙවි කරන ජලභීතිකානාශක එන්නත් වල ප්‍රතිශක්තිකරණ හා ප්‍රබලතාව කෙරෙහි අවධානය යොමු කරයි. ඉන් අනතුරුව ප්‍රතිශක්තිකාරක ධාරිතාව මත පදනම් වූ තෝරාගත් එන්නත් හතරක් සහිත සුනඛයන් සම්බන්ධ ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කරයි. අපගේ අරමුණ වන්නේ ඉහළ ප්‍රතිශක්තිකරණ ධාරිතාවක් සහිත වඩාත් සුදුසු සත්ව ජලභීතිකා රෝගයට එරෙහි එන්නත සොයා ගැනීම සහ එමඟින් සුනඛ ගහනය තුළ රංචු ප්‍රතිශක්තිය ස්ථාපිත කිරීමට සහාය වීමයි. මෙම ඉලක්ක මඟින් 2030 වන විට මානව ජලභීතිකා මරණ ශූන්‍ය කරා ළඟා කර ගැනීමේ ගෝලීය ඉලක්කයට උපකාරී වනු ඇත.
	ඉගැන්වීම සහ ඉගෙනීම	• දිශානති වැඩසටහන් විෂයමාලාවේ සහ ලිංගික සහ ප්‍රජනන දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා අන්තර්ගත වේ. ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය ගැන දේශන හරහා මුල් කාලයේ දී අවධානය යොමු කෙරේ. ප්‍රජා වෛද්‍ය අධ්‍යයන අංශය ශිෂ්‍ය වෛද්‍ය ප්‍රතිකාර පිළිබඳව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි https://med.cmb.ac.lk/student-life-fom/services/#1629091767136-6783a1fa-c0bf • උපදෙස් ලබා ගැනීම සඳහා ඕනෑම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වෙත ප්‍රවේශ වීමට සිසුන්ට අවස්ථාව ලබා දී ඇත. ශිෂ්‍ය උපදේශකයින් හරහා සහ වෛද්‍ය පීඨයේ පුද්ගලික උපදේශක වැඩසටහන, දිශානති වැඩසටහන, නොමිලේ වැඩමුළු, ලිංගික හා ප්‍රජනන වැඩසටහන්, පුස්තකාලයෙන් ඕනෑම මාතෘකාවක් සඳහා තොරතුරු ප්‍රදානය කිරීම මඟින් නොමිලේ ශිෂ්‍ය උපදේශන සේවා සහ ශාස්ත්‍රීය උපදේශනය සපයයි.https://lib.cmb.ac.lk/ • උපදේශන වැඩසටහන, නවක වදයට එරෙහි කම්ටුව, ශිෂ්‍ය උපදේශකයන් සහ පුද්ගලික උපදේශකයන් බොහෝ සිසුන්ට එවැනි ගැටළු වලට උපකාර වන ප්‍රධාන වැඩසටහන් දෙක වේ. සෑම සිසුවෙකුටම ඕනෑම ආකාරයක කාරණයක් සඳහා ඕනෑම වේලාවක හමු විය හැකි පුද්ගලික උපදේශකයෙකු ලබා දී ඇත. සිසුන් උපාධියෙන් පසුව පවා ආචාර්යවරුන් සමඟ සම්බන්ධතා පවත්වන අතර ඔවුන් සමඟ බොහෝ අවස්ථාවන් බෙදා ගන්නා බැවින් මෙය ඉතා ප්‍රයෝජනවත් වැඩසටහනකි. ශිෂ්‍ය උපදේශකයෝ වෘත්තීය සහය ලබාදීම මඟින් සිසුන්ගේ මානසික යහපැවැත්ම නංවාලීමට සේවය කරති. • ශාරීරික ක්‍රියාකාරීත්වය ඉහල නැංවීම සඳහා “SportySam” ජංගම වැඩසටහන (mobile application) එය ජංගම ක්‍රීඩාවක් හරහා පරිශීලකයින්ට ඔවුන්ගේ ශාරීරික හා මානසික යහපැවැත්ම වැඩිදියුණු කිරීමට ඉඩ සලසන ක්‍රීඩා සෞඛ්‍ය යෙදුමකි. පෙළඹවීමක් නොමැතිකම, වැඩ-ජීවිත සමතුලිතතාවය සහ නව වසංගත ප්‍රේරිත ජීවන රටාවන් හේතුවෙන් බොහෝ අයගේ ජීවන රටාව අක්‍රිය වී ඇත. 'Sporty Sam' මෙම හිඩැස පිරවීම සඳහා නව්‍ය විසඳුමක් ලෙස තාක්ෂණය භාවිතා කරන අතර මිනිසුන්ට ඔවුන්ගේ යෝග්‍යතාවය නැවත ලබා ගැනීමට සහ සෞඛ්‍යය ඉහළ නැංවීමට උපකාරී වේ. මෙම යෙදුම සාමාන්‍ය සෞඛ්‍ය යෙදුමක් වෙනුවට ක්‍රීඩා යෙදුමක් ලෙස ඇතුළත් වේ. අප උපකල්පනය කරන්නේ එමඟින් ශාරීරික යහපැවැත්මට කල්පවත්නා බලපෑමක් ඇති කළ හැකි මෙම යෙදුම දිගු කාලයක් භාවිතා කිරීමට පරිශීලකයින් පෙළඹෙනු ඇති බවයි.
	ප්‍රජා සත්කාරය	▪ සනීපාරක්ෂාව, පෝෂණය, පවුල් සැලසුම්, ක්‍රීඩා, ව්‍යායාම, යහවයෝවෘද්ධිය සහ අනෙකුත් සෞඛ්‍ය සහ යහපැවැත්ම සම්බන්ධ මාතෘකා ඇතුළුව සෞඛ්‍ය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාව තුළ (ශිෂ්‍ය ස්වේච්ඡා වැඩසටහන් ඇතුළත් විය හැකි) ප්‍රජා සත්කාරක වැඩසටහන් සහ ව්‍යාපෘති පිරිනැමීම. ▪ විශ්ව විද්‍යාල ප්‍රජාවට (සියලු කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට) සහ සමාජ මාධ්‍ය හරහා මහ ජනතාවට භාවනා පුහුණුව සමඟින් සෞඛ්‍යයට සම්බන්ධ ප්‍රතිඵල කෙරෙහි භාවනාවේ බලපෑම පිළිබඳ මාසික අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම සඳහා කායික විද්‍යා අධ්‍යයන අංශය පීඨයේ පර්යේෂණ ප්‍රවර්ධන සහ පහසුකම් මධ්‍යස්ථානය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. මෙය භාවනාව සහ සෞඛ්‍යය පිළිබඳ ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක කොටසකි. https://www.youtube.com/watch?v=1J96zGvoKok

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
		▪ ස්වයංක්‍රීය ක්‍රියාකාරිත්වය සහ ආමාශ ආන්ත්‍රික කායික විද්‍යාගාරය ස්ථාපනය කිරීම වෛද්‍ය පීඨයෙහි කායික විද්‍යා අධ්‍යයන අංශය ශ්‍රී ලංකා ජාතික රෝහලට (NHSL) සායනික රෝග විනිශ්චය සේවා සැපයිය හැකි සම්පතම ආයතනයකි. දැනට මෙම රෝග විනිශ්චය සේවාවන් ජාතික රෝහලෙහි නොමැති බැවින් වෛද්‍ය පීඨය තුළ මෙම සේවාව ස්ථාපිත කිරීම දියවැඩියා රෝගීන්ගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහතික කිරීම සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වනු නොඅනුමානය.
	පරිපාලනය	▪ සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා සෞඛ්‍ය මධ්‍යස්ථානය කොළඹ විශ්වවිද්‍යාලය වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක් ක්‍රියාත්මක කරයි එකක් රීඩ් මාවතේ මධ්‍යගතව පිහිටා ඇති අතර දෙවැන්න වෛද්‍ය පීඨයේ නවකයින් සඳහා වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම, අවශ්‍යතා මත එන්නත් ලබාදීම, වෛද්‍ය උපදේශනය සහ රසායනාගාර පරීක්ෂණ ඇතුළු සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා වෛද්‍ය පීඨයෙහි වේ. https://cmb.ac.lk/health-centre/#services
4 QUALITY EDUCATION	**පර්යේෂණ**	▪ AHEAD ව්‍යාපෘතිය හරහා පර්යේෂණ වාණිජකරණය සඳහා සහාය වීම කඩිනම් උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන ව්‍යාපෘතිය (AHEAD) යටතේ, ව්‍යාපෘති වාණිජකරණය කිරීමට කාර්ය මණ්ඩලයට සහාය දෙනු ලැබේ. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයෙහි (IIM) ද්‍රව්‍යගුණ විඤ්ඤාණ අධ්‍යයන අංශය යටතේ ස්වභාවික නිෂ්පාදන පර්යේෂණ සහ සංවර්ධන ඒකකය (URDNP) පිහිටුවන ලද්දේ විද්වතුන්, අදාළ රාජ්‍ය බලධාරීන්, ඖෂධ කර්මාන්ත ආයතන සහ අනෙකුත් උනන්දුවක් දක්වන කණ්ඩායම්වල උපායමාර්ගික සන්ධානයක් ගොඩනැගීම සඳහා සහ පර්යේෂණ සහ සංවර්ධන කතිකාවෙහි නිරත වීම සහ ස්වභාවික නිෂ්පාදන පර්යේෂණ සංවර්ධනය සහ වාණිජකරණය සඳහා උපාය මාර්ගික සංවර්ධන ක්‍රියාවලිය විකාශනය උදෙසාය.
	ඉගැන්වීම සහ ඉගෙනීම **ප්‍රජා සත්කාරය**	▪ රාජ්‍ය පාසල් පද්ධතියේ ශික්ෂා සහ ගුරු ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්වල සහයෝගිතා ව්‍යාපෘති හරහා තිරසාරත්වය කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ) පූර්ණකාලීන අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGDE සිසුහු සිංහල සහ දෙමළ දේශීය පාසල් දෙකක් තෝරා ගනිමින් පාසල් දරුවන්ගේ නව්‍ය හා නිර්මාණාත්මක කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ශික්ෂා/ගුරු ධාරිතා වර්ධන වැඩසටහන් සංවිධානය කරමින් විෂයමාලා ක්‍රියාකාරකම්වල නිරත වෙති. ▪ "අධ්‍යාපන සංවාද" තුළින් දැනුම බෙදා හැරීම අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGDE) පූර්ණකාලීන සිසුන් සඳහා ඔවුන්ගේ වසරක අධ්‍යයන වැඩසටහන තුළ පවරා ඇති තවත් වැදගත් විෂයානුබද්ධ ක්‍රියාකාරකමක් වන්නේ "අධ්‍යාපන සංවාද" ලෙසින් හැඳින්වෙන වාර්ෂික අධ්‍යාපනික සභරාවක් ප්‍රකාශයට පත් කිරීමයි. සභරාවේ නම ඉංග්‍රීසි භාෂාවෙන් "Educational Dialogues" වේ. මෙම සභරාව අධ්‍යාපන ක්ෂේත්‍රයේ නවතම දැනුම පාසල් ප්‍රජාව සහ අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර බෙදා ගැනීමට උත්සාහ කරයි. ▪ සිසුන් අතර ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය කිරීම කළමනාකරණය සහ මූල්‍ය පීඨය විසින් ව්‍යාපාර පරිපාලනවේදී (BBA) විෂයමාලාවේ VI වන අධ්‍යයන වාරය තුළ මූලික ව්‍යාපෘතියක් ලෙස ව්‍යවසාය පාදක ව්‍යාපෘතියක් පවත්වනු ලබන්නේ සිසුන්ට පන්තියේදී උගත් න්‍යායන් ප්‍රගුණ කිරීමට සහ ව්‍යවසායකයෙකු වීමේ අත්දැකීම් අත්කර ගැනීමට දිරිගැන්වීමට සහ අවස්ථාව ලබා දීමටය. මෙහිදී, සිසුන් පර්යේෂණ සහ ක්ෂේත්‍ර කටයුතු වලින් පසුව තෝරාගත් භාණ්ඩයක් හෝ සේවාවක් මත පදනම් වූ නව ව්‍යාපාරයක් සඳහා ව්‍යාපාර සැලැස්මක් සකස් කරන ස්වාධීන ව්‍යාපෘතියක් දියත් කළ යුතුය. https://mgmt.cmb.ac.lk/enterprise-based-project ▪ කෙටිකාලීන පාඨමාලා මොඩියුල පිරිනැමීම දිවයින පුරා සිටින අධ්‍යාපන නිලධාරීන් සඳහා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පර්යේෂණ ක්‍රමවේද කෙටිකාලීන වැඩසටහන ක්‍රියාත්මක වේ. ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යාපන නිලධාරීන්, ජාතික ගුරුවරුන් මෙන්ම විද්‍යා පීඨ කථිකාචාර්යවරුන් සඳහා ගුරු අධ්‍යාපනඥයන් පුහුණු කිරීමේ වැඩසටහන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් පැවැත්වෙයි. ▪ විද්‍යා පීඨයේ ගණිතය අධ්‍යයන අංශය ගණිත ගුරු පුහුණු වැඩසටහන්,

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
		මූල්‍ය ආකෘතිකරණයට අදාළ පුහුණු වැඩසටහන්, කෙටිකාලීන පාඨමාලා, වැඩමුළු සහ මූල්‍ය තක්සේරුව සහ ක්‍රියාකාරී තක්සේරුව පිළිබඳ සම්මන්ත්‍රණ සහ ගණිතමය ආකෘති නිර්මාණය ඇතුළුව පුළුල් ප්‍රජා සේවාවන් ක්‍රියාත්මක කරයි.
	පරිපාලනය	▪ උසස් අධ්‍යාපනය සඳහා නිදහස් හා සමාන අවස්ථා ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වන කොළඹ විශ්වවිද්‍යාලය, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පණතට අනුකූලව රටේ සමාජ හා ආර්ථික විෂමතා සැලකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC) විසින් අධීක්ෂණය කරනු ලබන ජාතික විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රමයට සමගාමීව උපාධි අපේක්ෂකයින්ට නොමිලේ අධ්‍යාපනය ලබා දෙයි. දේශීය සුදුසුකම් ඇති සිසුන්ට අමතරව, විදේශීය සුදුසුකම් ඇති සීමිත සිසුන් සංඛ්‍යාවක් සඳහා වාර්ෂිකව ප්‍රථම උපාධිය සඳහා උපාධි අපේක්ෂක අධ්‍යයන කටයුතු සඳහා විශේෂ ප්‍රතිපාදන සකස් කර ඇත. ▪ ශිෂ්‍ය/කාර්ය මණ්ඩල සුබසාධනය කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සහ සේවක කටයුතු අංශය අඩු ආදායම්ලාභී පවුල්වල සහ දුරස්ථ නිවාසවල සිටින පවුල්වල උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර 12ක් පවත්වාගෙන යයි. ශිෂ්‍ය සහ සේවක කටයුතු අංශය කොළඹ විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ සියලුම සිසුන්ගේ සුබසාධනය සඳහා වගකිව යුතුය. සිසුන්ට පරිසරය හුරු කරවීමට සහ ඔවුන්ගේ අධ්‍යයන අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙන්ම සංස්කෘතිය සහ ප්‍රජාව සමඟ සිසුන්ට උපකාර කිරීම සඳහා එය සියලුම පරිපාලන හා අධ්‍යයන අංශ සමඟ සමීපව ක්‍රියා කරයි.
5 GENDER EQUALITY	**පර්යේෂණ**	-
	ඉගැන්වීම සහ ඉගෙනීම	▪ MBBS උපාධි අපේක්ෂකයින්ට මෙන්ම දේශන සහ ප්‍රායෝගික සැසි හරහා මෙන්ම නීතීඥයින්ට විස්තීරණ පාඨමාලා මගින් ලිංගික හිංසන අධිකරණ වෛද්‍ය පරීක්ෂණය පිළිබඳ ඉගැන්වීම් සැසි සිදු කෙරේ.
	ප්‍රජා සත්කාරය	▪ වෙනම සේවාවක් ලෙස සංවිධානය නොවූවත්, එවැනි සේවාවන් ඉල්ලා සිටින සිසුන්ට අවශ්‍ය යොමු කිරීම් පුද්ගලික සහ ශිෂ්‍ය උපදේශකයින් විසින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා විශ්ව විද්‍යාල මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලබන අතර ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් වෙත තනි යොමු කිරීම් ද සිදු කෙරේ.https://cmb.ac.lk/cge/ ▪ ස්වේච්ඡා ශිෂ්‍යයන් විසින් පවත්වාගෙන යන වැඩසටහන් ද ඇතුළුව (උදා: සකස් කළ දේශන හෝ ආදර්ශන) විශ්වවිද්‍යාල මට්ටමින් ඔබ්බෙහි ග්‍රාමීය පාසල්වල, ප්‍රජාව තුළ අධ්‍යාපනික ක්‍රියාකාරකම්වල නිරත වීම
	පරිපාලනය	▪ විශ්වවිද්‍යාලය වාර්ගිකත්වය, ආගම, ආබාධිත හෝ ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා සිසුන්ට සමාන අවස්ථා සඳහා ප්‍රවේශයක් ලබා දෙයි/ අධ්‍යයන වැඩසටහන් සඳහා තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටි අදාළ අතුරු ව්‍යවස්ථාවල සඳහන් තේරීම් නිර්ණායක මත පදනම් වේ. ▪ ආයතනයක් ලෙස විශ්ව විද්‍යාලය මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය හරහා උපදේශනය සහ අනෙකුත් ඉලක්කගත සහාය හරහා කාන්තාවන් සඳහා ප්‍රවේශ යෝජනා ක්‍රම සපයයි.https://cshr.cmb.ac.lk/ ▪ කොළඹ විශ්වවිද්‍යාලය පිරිනමන කිසිදු අධ්‍යයන ක්ෂේත්‍රයක කාන්තාවන් අඩුවෙන් නියෝජනය නොවේ. ▪ ලිංගික හිංසනයට එරෙහි කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය. https://cmb.ac.lk/policy-against-sexual-harassment/
6 CLEAN WATER AND SANITATION	**පර්යේෂණ**	▪ විශ්ව විද්‍යාලය ජල සංරක්ෂණය පිළිබඳ ව්‍යාපෘති, වෙබිනාර් සහ ක්‍රියාකාරකම් කිහිපයක් පවත්වා ගෙනයයි. https://fos.cmb.ac.lk/blog/carbon-footprint-faculty--university-colombo-year-2014/ https://science.cmb.ac.lk/plant-sciences/
	ඉගැන්වීම සහ ඉගෙනීම	▪ කෘෂි තාක්ෂණවේදී උපාධිය ගොවි ප්‍රජාව සඳහා කෘෂිකර්මාන්තයේදී මනා ජල කළමනාකරණය පිළිබඳ පුහුණුවකින් සමන්විත වන අතර, UNDP අරමුදල් ව්‍යාපෘතියේ ප්ලොට් අංක 1 යටතේ - වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ මහජන අධ්‍යාපනික සහ මනා ජල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. https://uciars. cmb.ac.lk/wp-content/uploads/2021/05/UCIARS-Curriculam.pdf ▪ UCIARS හි කුඹුරුවලින් එන ජලය (අපවහන ජලය) එකතු කිරීම සඳහා ජලාශයක් ඇත. https://uciars. cmb.ac.lk/

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
		UNDP අරමුදල් සහිත ව්‍යාපෘතියේ ප්ලොට් අංක 1 - වාරිමාර්ග සහ ජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වාරිමාර්ග, ජල කළමනාකරණය සහ ජල සුරක්ෂිත කෘෂිකර්මය පිළිබඳ පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා පළාත් පාලන මට්ටම, පළාත් මට්ටම සහ ජාතික මට්ටමේ පාලන ආයතන සහයෝගයෙන් කටයුතු කරන ලදී.
	ප්‍රජා සත්කාරය	▪ මාර්ගගත වේදිකා, පෝස්ටර් ආදිය හරහා සවිඥානික ජල පරිභෝජනය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමට විශ්ව විද්‍යාලය සියලු පියවර ගෙන ඇත. https://fos.cmb.ac.lk/blog/carbon-footprint-faculty-විද්‍යා-university-colombo-year-2014/
	පරිපාලනය	▪ කළමනාකරණ සහ මූල්‍ය පියය සහ තාක්ෂණ පියය තුළ අපද්‍රව්‍ය පවිත්‍රාගාර ක්‍රියාත්මක කර ඇති අතර පශ්චාත් උපාධි පියයේ වැසි ජලය රැස් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. https://mgmt.cmb.ac.lk/ and https://tech.cmb.ac.lk/ ▪ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල බාහිර දූෂිත ජලයෙන් අපවිත්‍ර වීම වැලැක්වීම සඳහා ඉදිකිරීම් අදියරේදී ජල සම්පයට සම්මත ජල ආරක්ෂණ ක්‍රමයේ ද්විත්ව ස්ථරයක් යෙදීම සිදු කර ඇත. අනෙකුත් සියලුම පීඨ/ආයතන/මණ්ඩපය විසින් අපජලය බැහැර කිරීම සහ පිරිපහදු කිරීම සඳහා නිසි යාන්ත්‍රණයන් භාවිතා කෙරෙයි. (කොළඹ මහ නගර සභාවේ - CMC ප්‍රමිතීන්ට අනුව අපජලය තනුක කර අපජල ඇළවලට මුදා හැරීම).
7 AFFORDABLE AND CLEAN ENERGY	**පර්යේෂණ**	▪ මෙවැනි ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා දායක වූ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය/ පීඨ කාර්ය මණ්ඩලය සමඟ වැඩසටහන් පැවැත්වීම, රාජ්‍ය ආයතනවලින් ලැබෙන සහනික/ පීඨ නියෝජනය, පවිත්‍ර බලශක්තිය හා බලශක්ති කාර්යක්ෂම තාක්ෂණයන් පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගන්නන් දැනුවත් කිරීමෙහි නියුතු දේශගුණික විපර්යාස අවම කිරීම පිළිබඳ විශේෂඥ කම්ටුවල සාමාජිකයන් ලෙස කාර්ය මණ්ඩලය කටයුතු කරයි. ▪ විද්‍යා පීඨය කාබන් පියසටහන් විශ්ලේෂණය (carbon footprint analyses) හරහා අවම කාබන් මුල පිරීම්වලට සහය දැක්වීමට සහ අවම කාබන් විකල්ප සඳහා නිර්දේශ ලබා දීමට සම්බන්ධ වී ඇත. https://science.cmb.ac.lk/
	ඉගැන්වීම සහ ඉගෙනීම	-
	ප්‍රජා සත්කාරය	-
	පරිපාලනය	-
8 DECENT WORK AND ECONOMIC GROWTH	**පර්යේෂණ**	-
	ඉගැන්වීම සහ ඉගෙනීම	▪ සැමට මූලික සේවාවන් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීමට පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම මානව සම්පත් අභිවෘද්ධි ආයතනය, රටේ සියලුම සේවක කාණ්ඩවලට හැදෑරිය හැකි ශ්‍රම කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධි වැඩසටහනක් පිරිනමයි. මානව සම්පත් අභිවෘද්ධි ආයතනය විසින් කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයින්, ජාතික අධ්‍යාපන ආයතනයේ විදුහල්පතිවරුන්, වැල්ලවත්ත ශාන්ත ක්ලෙයාර් විද්‍යාලයේ පාසල් ගුරුවරුන් සහ IHRA හි සේවා කළමනාකරණ මාස්ටර්ස් උපාධි වැඩසටහනේ ශාස්ත්‍රපති සිසුන් සඳහා "සේවා ඉගෙනීම" පිළිබඳ වැඩමුළු 4ක් සාර්ථකව පවත්වන ලදී. 2020 ජනවාරි මස පවත්වන ලද මෙම වැඩමුළු මාලාව සඳහා සම්පත් පුද්ගලයා ලෙස මැලේසියාවේ මලයා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන පීඨයේ AUA විශාරද මහාචාර්ය විශාලාක්ෂි බාලක්‍රිෂ්ණන් සහභාගී වූවාය.https://www.ihra.cmb.ac.lk/
	පරිපාලනය	▪ ශ්‍රී ලංකාවේ කම්කරු නීති සංග්‍රහය සහ විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 24 වැනි පරිච්ඡේදය III http://www.labourdept.gov.lk/index.php?option=com_content&id=65&Itemid=59&lang=en ▪ විශ්වවිද්‍යාල පණත - XI කොටස (ugc.ac.lk) https://www.ugc.ac.lk/index.php?option=com_content&view=article&id=37&Itemid=195&lang=en

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE 	පර්යේෂණ	-
	ඉගැන්වීම සහ ඉගෙනීම	-
	ප්‍රජා සත්කාරය	-
	පරිපාලනය	▪ කොළඹ විද්‍යා හා තාක්ෂණ කුටිය පිහිටුවීම https://cell.cmb.ac.lk/ කුටිය විද්‍යා පීඨයේ අධ්‍යයන අංශ 7ක හවුල් ව්‍යාපාරයකි. එලදායී ලෙස කර්මාන්ත/බාහිර පර්යේෂණ ව්‍යාපෘතිවලට සේවය සැපයීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් ලෙස මනා මූල්‍ය කළමනාකරණ පද්ධතියක් තිබීමේ වැදගත්කම විද්‍යා පීඨය විසින් අවබෝධ කර ගන්නා ලදී. ▪ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක (UBL) කුටිය පිහිටුවීම UBL-UOC විශ්වවිද්‍යාල නවෝත්පාදනයන් ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම සහ වාණිජකරණයට පහසුකම් සපයන අතර පර්යේෂණ ප්‍රතිඵල මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා වෙළඳපොළට ගෙන ඒමට සහාය වේ.
10 REDUCED INEQUALITIES 	පරිපාලනය	▪ ලිංගික හිංසාවන්ට එරෙහි ප්‍රතිපත්තිය සහ බලාත්මක කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටි පියවර | කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව (cmb.ac.lk) ▪ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද, තෛපොංගල් සැමරුම්, නත්තල් සැමරුම් ඇතුළු අදාළ පීඨවල සහ ආයතනවල ජාතික හා ආගමික උත්සවවල වාර්ෂික සැමරුම් ▪ https://cmb.ac.lk/category/news/page/10/ https://cmb.ac.lk/event/culture-challenges-covid-19/ https://cmb.ac.lk/deans-lecture-series-arts-4/
11 SUSTAINABLE CITIES AND COMMUNITIES 	ඉගැන්වීම සහ ඉගෙනීම	▪ සාමය, අවිහිංසාව සහ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම: ඉතිහාසය සහ ප්‍රජා ව්‍යාපෘතිය දශක ගණනාවක් පුරා පැවති ජනවාර්ගික අර්බුදය හේතුවෙන් දෙමළ සහ සිංහල ප්‍රජාවෝ තමන් බෙදා ගන්නා පොදු ඉන්දියානු උපමහාද්වීපයේ අතීතය අමතක කරමින් ඇත් වූහ. කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ අදහස වන්නේ ශ්‍රී ලංකාවේ ඉතිහාස ලිවීම, ඉගැන්වීම සහ ඉගෙනීම (අනෙකුත් බොහෝ පසුබිම්වල මෙන්) වාර්ගික අර්බුදයට විවිධ ආකාරවලින් වකුව දායක වී ඇති බවයි. මේ අනුව, සාමය, අවිහිංසාව සහ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමේ පුළුල් අරමුණ ඇතිව කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශය සමඟ එක්ව 2009 වසරේ ඉතිහාසය සහ ප්‍රජා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ අතීතයේ පැවති පරස්පර ඓතිහාසික විග්‍රහයන්ට සිසුන් නිරාවරණය කිරීම සහ විවිධ ජනවාර්ගික ප්‍රජාවන් විසින් සංජානනය කරන විවිධ අර්ථකථන බෙදාහදා ගැනීම සහ අත්දැකීම් ලබා ගැනීමයි. තවද මෙම මුලපිරීම මගින් 'අනෙක්' ප්‍රජාව සමඟ සම්බන්ධ වීමෙන් සිසුන්ගේ විවේචනාත්මක චින්තනය ශක්තිමත් කිරීමට හැකි වේ. වසර ගණනාවක් පුරා, ඉතිහාස අධ්‍යයනාංශය විසින් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය සහ යාපනය විශ්වවිද්‍යාලය ඇතුළු අනෙකුත් රාජ්‍ය විශ්වවිද්‍යාල වෙත මෙම ව්‍යාපෘතිය ව්‍යාප්ත කර ඇත. මෑතකදී, යාපනය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශය එය වාර්ෂික සැමරුමක් බවට පත් කිරීම සඳහා අප සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට එකඟ වී ඇත. 2022 සිට මෙම ව්‍යාපෘතිය ඉතිහාස ගෞරව උපාධි වැඩසටහනේ දෙවන වසරේ අනිවාර්ය අවශ්‍ය ඒකකයක් (ත්‍රෙඩිට් 6ක් සහිත) ලෙස පිරිනමනු ලැබේ. ප්‍රාථමික මූලාශ්‍ර සහ ඓතිහාසික ස්ථාන අර්ථකථනය කිරීමේදී කොළඹ සිසුන්ට යාපනයෙහි සිසුන් සමඟ දැඩිව සම්බන්ධ විය යුතු කණ්ඩායම් පැවරුම් මෙයට ඇතුළත් වේ.
	ප්‍රජා සත්කාරය	-
	පරිපාලනය	▪ පරිසරය සහ තිරසාර මාර්ගෝපදේශ https://cmb.ac.lk/environmental-and-sustainability-guidelines/
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION 	පර්යේෂණ	
	ඉගැන්වීම සහ ඉගෙනීම	• වඩා පවිත්‍ර නිෂ්පාදන සහ දේශගුණික විපර්යාස වැනි විෂය ක්ෂේත්‍ර විෂය මාලාවට ඇතුළත් විය. වෘත්තීය මාර්ගෝපදේශ ඒකක සහ ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂි විද්‍යා සමූහය වැනි සංවිධාන හරහා ඇතැම් වැඩසටහන් පවත්වන ලදී. (FOGSL), BEEZ. https://science.cmb.ac.lk/
	ප්‍රජා සත්කාරය	▪ පාරිසරික මූල පිරීම් මධ්‍යස්ථානය විසින් හඳුන්වා දුන් තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය (CEI)

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
		2017 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආරම්භ කරන ලද ‘පිළිසරු’ ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයට විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට එකඟ විය. ජාතික වශයෙන් වැදගත් පාරිසරික ගැටලුවක් විසඳීමේ මෙම හවුල්කාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස, විශ්වවිද්‍යාල පුරා පවතින අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලු විසඳීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලය විසින් "පාරිසරික මූල පිරීම් මධ්‍යස්ථානය (CEI)" පිහිටුවන ලදී. ▪ අපද්‍රව්‍ය නිෂ්පාදනය අවම කිරීමට විශ්වවිද්‍යාලය දැඩි පරිශ්‍රමයක් දරයි. ආහාර අපද්‍රව්‍යවලින් වැඩි ප්‍රමාණයක් උෆරු ගාලට යැවෙයි. බොහෝ විශ්වවිද්‍යාල ආයතන තම අපද්‍රව්‍යවලින් කොම්පෝස්ට් නිෂ්පාදනය කරන අතර එය ශීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතී. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි දිරාපත් නොවන අපද්‍රව්‍යවලින් බහුතරයක් ප්‍රතිචක්‍රීකරණය කෙරේ. මීට අමතරව, කාබන් විමෝචනය පියවා ගැනීම සඳහා හරිත ආවරණ ප්‍රමාණය වැඩි කිරීමට රුක් රෝපණ සිදු කරනු ලැබේ.
	පරිපාලනය	▪ කොළඹ විශ්වවිද්‍යාලය පොලිතින් මුක්ත කලාපයකි https://cmb.ac.lk/polythene-free-zone/ ▪ https://www.pressreader.com/sri-lanka/sunday-times-sri-lanka/20200809/281522228437363
	**පර්යේෂණ, ඉගැන්වීම සහ ඉගෙනීම**	▪ දේශගුණික විපර්යාස අවම කිරීම සහ අනුවර්තනය වීම සහ පූර්ව අනතුරු ඇඟවීම් ආදිය සම්බන්ධව දැනුවත් කිරීම් ආචාර්යවරුන් විසින් ඉදිරිපත් කිරීම් සහ ප්‍රකාශන මගින් සිදු කර ඇත. දේශගුණික විපර්යාස අවදානම්, බලපෑම්, අවම කිරීම, අනුවර්තනය, බලපෑම් අඩු කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම් ආදිය පිළිබඳ දේශීය අධ්‍යාපන වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ. https://www.apn-gcr.org/bulletin/article/evaluation-of-best-management-practices-with-greenhouse-gas-benefits-for-salt-affected-paddy-soils-in-south-asia/ http://archive.cmb.ac.lk:8080/research/handle/70130/5112 https://link.springer.com/article/10.1186/s13021-020-00152-5 ▪ https://www.sundaytimes.lk/211003/news/first-ever-study-to-gauge-the-carbon-footprint-from-energy-use-in-tea-production-457186.html
	ප්‍රජා සත්කාරය	▪ ප්‍රාදේශීය ප්‍රජාව සහ පාර්ශවකරුවන් ඉලක්ක කරගනිමින් UNDP අරමුදල් ව්‍යාපෘතිය යටතේ Lot 2- සාමාන්‍ය දැනුවත් කිරීම, දේශගුණය/කාලගුණ තොරතුරු සහ දේශගුණික සහ කාලගුණික සුහුරු කෘෂිකර්මය, දේශගුණික විපර්යාස අවම කිරීම සහ අනුවර්තනය පිළිබඳ පුහුණු වැඩසටහන් ආදිය පවත්වනු ලැබේ. http://lankajalani.org/gwp-core-activities/
	පරිපාලනය	▪ හරිත විශ්වවිද්‍යාලයක් කරා. https://cmb.ac.lk/path-towards-a-green-university/ https://fos.cmb.ac.lk/blog/carbon-footprint-faculty-විද්‍යා-university-colombo-year-2014/ ▪ https://www.pressreader.com/sri-lanka/sunday-times-sri-lanka/20200809/281522228437363
	**පර්යේෂණ**	▪ පර්යේෂණ සන්නිවේදනය/ සමුද්‍ර පරිසර විද්‍යාඥ හොල්ගර් ජේම්ස් / උපාධි පාඨමාලා හරහා "මාළු සහ ධීවර කර්මාන්තය ආශ්‍රිතව ඕස්ට්‍රේලියානු වෙරළ වෘක්ෂලතා පරිසර පද්ධතියේ වටිනාකම" පිළිබඳ ආරාධිත දේශනයක් ▪ http://archive.cmb.ac.lk:8080/research/handle/70130/5526
	ඉගැන්වීම සහ ඉගෙනීම	▪ විද්‍යා පීඨයේ සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ විෂය ප්‍රමාණිකයන් , මාස්ටර්ස් සහ පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා මගින් https:// science.cmb.ac.lk/academic/postgraduate-programs/msc-pg-dip-programs/
	ප්‍රජා සත්කාරය	▪ UNDP අරමුදල් සහිත ව්‍යාපෘතියේ ලොට් අංක 1 යටතේ - වාරිමාර්ග හා

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
		ජල කළමනාකරණ පුහුණු සංරචක කිහිපයක් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වැව් ප්‍රජනන පාදක පරිසර පද්ධති සඳහා වෙන් කර ඇත. http://lankajalani.org/gwp-core-activities/ ▪ විද්‍යා පීඨයේ සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරුන්/ විෂය ප්‍රාමාණිකයන් මීට සම්බන්ධව සිටිති. විද්‍යාපති / ඩිප්ලෝමා වැඩසටහන් හරහා ද ශිෂ්‍ය සංගම් සහ ආචාර්යවරුන් විසින් පාසල් සිසුන්, ප්‍රාදේශීය ප්‍රජාවන් සහ අත්‍යවශ්‍ය පරිසර පද්ධතිවල අදාළ පාර්ශවකරුවන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් රාශියක් පැවැත්වෙයි.https://science.cmb.ac.lk/academic/postgraduate-programs/msc-pg-dip-programs/ ▪ පරිසර අමාත්‍යාංශය යටතේ ඇති ජාතික කමිටුවල සාමාජිකයන්/ ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනයේ වාර්ෂික රැස්වීම්වලදී පර්යේෂණ සන්නිවේදනය හරහා/ ශිෂ්‍ය සංගම් සහ ආචාර්යවරුන් පාසල් සිසුන්, ප්‍රාදේශීය ප්‍රජාවන් සහ අත්‍යවශ්‍ය පරිසර පද්ධතිවල අදාළ පාර්ශවකරුවන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් රාශියක් පවත්වයි. https://science.cmb.ac.lk/cmm/research/ ▪ පීඨයේ ආචාර්යවරුන්ගේ උපදේශන සහ ස්වේච්ඡා සේවය https://science.cmb.ac.lk/zoology/ ▪ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ආධාර යටතේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සහයෝගීතාව සමඟ එක්ව කොළඹ මහනගර ප්‍රදේශයේ තෝරාගත් ප්‍රදේශවල ජල අපවහන සැලැස්ම සඳහා වූ ව්‍යාපෘතිය පිළිබඳ උපාය මාර්ගික පාරිසරික තක්සේරුව යටතේ කළුඔය සහ බොල්ගොඩ ද්‍රෝණියේ ජලයේ ගුණාත්මක බව නිරීක්ෂණය කෙරේ. එම පරිසර පද්ධති දෙකෙහි තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා ශාක හා සත්ත්ව සමීක්ෂණ පවත්වන ලදී https:// science.cmb.ac.lk/cmm/reearch/
	පරිපාලනය	
15 LIFE ON LAND	**පර්යේෂණ, ඉගැන්වීම සහ ඉගෙනීම** **ප්‍රජා සත්කාරය**	පහත උත්සව සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ BEEZ ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලදී. ඒ සියල්ලම සාමාන්‍ය ජනතාවට විවෘත විය. “ජෛවවිවිධත්වය” සැමරීම සඳහා වූ වෙබිනාරය https://www.facebook.com/BEEZUOC/posts/2653606951542204 බෙල්ලන්විල - අත්තිඩිය කුරුළු අභයභූමියේ 30 වැනි සංවත්සර සැමරුම https://www.facebook.com/BEEZUOC/posts/2703429396559959 සොබා ඇකය: 1- "කඩොලාන ජෛව විවිධත්වය කෙරෙහි දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම් සහ එම බලපෑම් අවම කිරීමට හැකි විසඳුම්" පිළිබඳ දේශනය– https://www.facebook.com/1619322324970677/posts/2756626897906875/- සොබා ඇකය:2- "තිරසාර සංවර්ධනය සඳහා මෙවලම්" පිළිබඳ දේශනය - https://www.facebook.com/1619322324970677/posts/2766389410263957/ https://fb.watch/2AajD9nzHV/ සොබා ඇකය 3- “හනුමාන්ගේ සිට හම්බෝල්ට් දක්වා” යන මැයෙන් දේශනය”- https://www.facebook.com/1619322324970677/posts/2776976569205241/ https://www.facebook.com/1619322324970677/posts/2780315172204714/ https://fb.watch/2AamHiwZBO/ සොබා ඇකය විශේෂ- කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨයේ සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ අප පර්යේෂකයෝ ශ්‍රී ලංකාවේ කුරුළු විශේෂයකට තවත් අලුත්ම හැඳින්වීමක් සම්පාදනය කළේය. https://www.facebook.com/1619322324970677/posts/2827194820850082/ https://www.facebook.com/1619322324970677/posts/2837526343150263/

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
		https://fb.watch/2AasPxlMV1/ වැඩමුළුව: වනජීවී වීඩියෝකරණය - කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සියවස් සමරුව නිමිත්තෙන් සංවිධානය කරන ලද සොබාදහම් වීඩියෝකරණ තරගයේ පූර්ව සැසියක් ලෙස https://www.facebook.com/1619322324970677/posts/2836716489897915/ https://www.facebook.com/1619322324970677/posts/2837365979832966/
	**ඉගැන්වීම සහ ඉගෙනීම**	• ප.උ. අධ්‍යයන පීඨය ශ්‍රී ලංකා පරිපාලන සේවාවන්හි නිලධාරීන් ඉලක්ක කර ගනිමින් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව පිරිනමයි.
	ප්‍රජා සත්කාරය	▪ දේශීය, කලාපීය හෝ ජාතික රජයට නිශ්චිත විශේෂඥ උපදෙස් ලබා දීම (උදා: ප්‍රතිපත්ති මාර්ගෝපදේශය හරහා, කමිටුවලට සහභාගී වීම, සාක්ෂි දීම) ▪ සභාපති, මූල්‍ය ප්‍රතිපත්ති උපදේශක කමිටුව, මහ බැංකුව, පෞද්ගලික දේශීය විශ්වවිද්‍යාල සඳහා ශාස්ත්‍රීය උපදේශනය, ජාතික කාර්මික ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා කණ්ඩායම් නායක, කාර්මික හා ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ මධ්‍යස්ථානයේ (CERIPA) සම-නිර්මාතෘ සහ හිටපු අධ්‍යක්ෂ, කොළඹ විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල-කර්මාන්ත කුටියෙහි සම-නිර්මාතෘ සහ හිටපු අධ්‍යක්ෂ ▪ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී සහාය ලබා දෙන ජාතික විද්වත් කමිටුවල විශ්වවිද්‍යාලයට නියෝජනය කරමින් සේවය කරන සාමාජිකයෝ සිටිති. වෙබ් සබැඳිය: https://www.res.cmb.ac.lk/zoology/erandathie-lokupitiya/ ▪ වෛද්‍ය අධ්‍යාපන හා රෝහල් කමිටුව, ආයුර්වේද වෛද්‍ය සභාව, ආයුර්වේද සූත්‍ර කමිටුව, Covid 19 වසංගතයට එරෙහිව සටන් කිරීම ග්‍රාමීය හා ආයුර්වේද සංවර්ධන සහ මහජන සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා දේශීය වෛද්‍ය ක්‍රමයේ ජාතික කමිටුව, ආයුර්වේද සහ යුනානි සඳහා අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුව, ආයුර්වේද හා යුනානි WHO ක්‍රියාකාරී කණ්ඩායම් සම්මත පාරිභාෂිතය, සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව සහ පර්යේෂණ සංවර්ධනය, මිනමාටා සහ බාසල් සම්මුති නියාමන කමිටුව ▪ වෛද්‍ය පීඨයේ කාර්යයන්: ශ්‍රී ලංකාව සඳහා ආහාර පදනම් කරගත් ආහාර මාර්ගෝපදේශ සංවර්ධනය සඳහා පීඨ කාර්ය මණ්ඩලය දායක වී ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර උපදේශන කමිටුවේ ආහාර ලේබල් කිරීමේ අනු කමිටුව, පෝෂණ හා දේශීය වෛද්‍ය පෝෂණ ජෛව රසායන විද්‍යාඥ සහ ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණ සන්නිවේදනය පිළිබඳ අනුකමිටුව ▪ රජයේ දෙපාර්තමේන්තු සමග සහයෝගයෙන් ප්‍රතිපත්ති කේන්ද්‍ර කරගත් පර්යේෂණ සිදු කිරීම ළමයින් සුරැකීමේ ව්‍යාපෘතිය / දරුවන්ට එරෙහි මාර්ගගත හිංසනය පිළිබඳ දකුණු ආසියාවේ පළමු අධ්‍යයනය, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යාලය විසින් යෝජනා කරන ලද ජාතික ආරක්ෂාව සහ උපාය මාර්ගික අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා විෂයමාලා මොඩියුල සංවර්ධනය කිරීම ප.උ. අධ්‍යයන පීඨය විසින් භාර ගන්නා ලදී. ජාතික අවශ්‍යතාවයකට දායක වන ප.උ. අධ්‍යයන පීඨය, අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් පවත්වනු ලබන SLQF/ දැනට ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති කේන්ද්‍ර කරගත් ආචාර්ය උපාධි පර්යේෂණ කටයුතුවලට සමගාමීව පාඨමාලා මොඩියුල සංවර්ධනය කිරීමට දායක වන විෂය විශේෂඥයින් සමඟ NDC සඳහා සහය දැක්වීමට කටයුතු කළේය. https://sparc.cmb.ac.lk/?page_id=406 ▪ විද්‍යා පීඨය: ගර්භණී දියවැඩියා පරීක්ෂාව පිළිබඳ පර්යේෂණ, ගර්භනී අපස්මාරය පිළිබඳ ලේඛනයක් ස්ථාපිත කිරීම, ගුණාත්මක සත්කාර වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පිළිබඳ පර්යේෂණ. ▪ COVID-19ට එරෙහි සටන: මතුවන සහ නැවත නැවත මතුවන ආසාදන පිළිබඳ සම්මන්ත්‍රණයේ "අනාගත වසංගත වැළැක්වීම: ග්‍රහලෝක මට්ටමෙහි සෞඛ්‍ය ප්‍රතිචාරයක් ගවේෂණය කිරීම" පිළිබඳ ඉදිරිපත් කිරීම. SLMA සංවත්සරය. ජාත්‍යන්තර වෛද්‍ය සම්මේලනයෙහි 133 වැනි සංවත්සරය. 2020 ජූලි 22 සිට 24 දක්වා. කොළඹ (සූම්). 2020 ලෝක ප්‍රජා විද්‍යා දිනයේ "COVID-19, සමාජ-ආර්ථික අනාරක්ෂිතතා සහ සෞඛ්‍යය" පිළිබඳ ඉදිරිපත් කිරීම: Covid-19ට තිරිංග දැමීම. කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රජා විද්‍යා අධ්‍යයනාංශය.

අරමුණ	ක්ෂේත්‍රය	දායකත්වය/ දායකත්වයන්
17 PARTNERSHIPS FOR THE GOALS 	**පර්යේෂණ ඉගැන්වීම සහ ඉගෙනීම**	• පෝෂණය සඳහා කෘෂිකර්මය සහ ආහාර පද්ධති පිළිබඳ ගෝලීය මණ්ඩලය විසින් සිදු කළ "අනාගත ආහාර පද්ධති: මිනිසුන් අපගේ ග්‍රහලෝකය සහ සමෘද්ධිය සඳහා, " පිළිබඳ ප්‍රකාශනය සම සම්මාලෝචනය කරන ලදී. https://foresight.glopan.org/ ▪ ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් දකුණු ආසියාවේ කාන්තා ලිංගික සෞඛ්‍ය අයිතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රශස්ථ භාවිතයන් වර්ධනය කිරීම පිළිබඳ කලාපීය රැස්වීම්වලට පීඨ සාමාජිකයෝ සහභාගී වෙති. සංස්කරණය කළේ රූබිනා සොහේල් සහ නරේන්ද්‍ර මල්හෝත්‍රා, ශ්‍රී ලංකාවේ තත්ව විශ්ලේෂණය පිළිබඳ පරිච්ඡේදය - මහාචාර්ය අතුල කළුආරච්චි සහ ආචාර්ය යූ.ඩී.පී.රත්නසිරි ▪ විද්‍යාව සහ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර ජාලයට දායක වීම- මෙම කාල සීමාව තුළ AuthorAID විසින් සංවිධානය කරන ලද මාර්ගගත පර්යේෂණ පුහුණු වැඩසටහන් (MOOCS) දෙකක ආගන්තුකයන් සඳහා පහසුකම් සපයන්නා ලෙස කටයුතු කළේය. AuthorAID හි භාරකරු - උපදේශක සැලසුම් කණ්ඩායමේ සාමාජික - උපදේශකත්වය පිළිබඳ ජාත්‍යන්තර නියමු අධ්‍යයනයක් පවත්වන ලදී. සම-සම්මාලෝචනය කරන ලද ජාත්‍යන්තර සඟරාවල ප්‍රකාශයට පත් කිරීම සඳහා පර්යේෂණ පත්‍රිකා ලිවීමට දේශීය පර්යේෂකයින්ට සහාය වීම සඳහා ලේඛන සම්ප්‍රේෂණය කරන ලදී. අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවලද ලේඛන සම්ප්‍රේෂණ පිහිටුවා ඇත. OWSD හි සාමාජික - තරුණ කාන්තා විද්‍යාඥයින් ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණවල ජයග්‍රහණ ප්‍රදර්ශනය කිරීමට ආරාධිත විද්‍යාඥයෙකු බවට පත් විය - OWSD විසින් වීඩියෝවක් සකස් කරන ලදී. https://blog.inasp.info/writing-clubs-medical-පර්යේෂණ-communication-sri-lanka, https://www.eventbrite.co.uk/e/authoraid-webinar-wellbeing-in-academia-tickets- ▪ 188183892087 https://www.youtube.com/watch?v=9SBwJMwH4Ls
	පරිපාලනය	▪ **ජාත්‍යන්තර සහයෝගිතා සහ පර්යේෂණ හරහා තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායක වීමේ හවුල්කාරිත්වය, සංසන්දනාත්මක ප්‍රවේශයන් සම්මාලෝචනය කිරීම සහ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) වලට මුහුණ දීම සඳහා ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් ප්‍රවර්ධනය කිරීම** ▪ විශ්වවිද්‍යාලය බොහෝ ජාත්‍යන්තර සහයෝගිතාවල නිරත ව සිටී. https://cmb.ac.lk/colombo-un75-dialogue/ https://www.facebook.com/earthmates1/posts/231346191933148

මූල්‍යමය සමාලෝචනය

2023 ජූනි 30

විගණකාධිපති වෙත

මූල්‍යමය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණ නියෝජනය

94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03 ලිපිනයේ පිහිටි කොළඹ විශ්වවිද්‍යාලයේ 2022-12-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට සහ 2022- 01-01 දින සිට 2022-12-31 දක්වා කාලයට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන, අදාළ සියලු අංශවලින්, මූල්‍ය තත්ත්වය, මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත්ද යන්න පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා අපි මෙම ලිපිය සපයන්නෙමු. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය, මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ සාධාරණ ඉදිරිපත් කිරීමකට අප වගකිව යුතු බව අපි තහවුරු කරමු.

මෙම ලිපියේ සමහර නිරූපණයන් සැලකියයුතු කරුණු වලට සීමා වේ. පවතින තත්වය යටතේ, මෙහි තොරතුරු මත යැපෙන සාධාරණ පුද්ගලයෙකුගේ විනිශ්චය වෙනස් කිරීමට හෝ මහ හැරීම මගින් බලපෑම් කිරීමට ඉඩ ඇති ගිණුම් තොරතුරු මහ හැරීමක් හෝ වැරදි ලෙස අර්ථ දැක්වීමක් සිදුවුවහොත් එම අයිතමයන්හි ප්‍රමාණය නොසලකා ඒවා සැලකිය යුතු කරුණු ලෙස සැලකේ.

විගණනයේදී ඔබට ඉදිරිපත් කරන ලද පහත දැක්වෙන නිරූපණයන් (විගණකාධිපති වාර්තාවේ දිනය අනුව) අපගේ දැනුම සහ විශ්වාසය අනුව උපරිම ලෙස අපි තහවුරු කරමු.

1. ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇති අතර පෙර වර්ෂයට අනුකූලව සකස් කර ඇත

2. අප විසින් විගණකාධිපති වෙත පහත සඳහන් සියල්ල සපයා ඇත:
   අ.) විගණකාධිපති විසින් ඉල්ලා සිටින ලද මූල්‍ය සටහන් හා වෙනත් තොරතුරු
   ආ.) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අධ්‍යක්ෂ කමිටු රැස්වීම් වාර්තා සහ මෙතෙක් වාර්තා සකසනු නොලැබූ මෑතකාලීන රැස්වීම්වල සාරාංශ

3. මූල්‍ය හෝ වෙනත් වාර්තාකරණ පිළිවෙත් වලට අනුකූල නොවීම හෝ අඩුපාඩු පිළිබඳව නියාමන ආයතනවලින් කිසිදු සන්නිවේදනයක් ලැබී නොමැත.

4. මූල්‍ය ප්‍රකාශනවල අධස්ත ගිණුම් වාර්තා වල නිසි ලෙස සටහන් වී නොමැති ද්‍රව්‍යමය ගනුදෙනු නොමැත.

5. පහත සඳහන් අන්දමේ කිසිවක් සිදුව නැත:
අ.) කළමනාකරණය හෝ අභ්‍යන්තර පාලනයෙහි සැලකිය යුතු භූමිකාවක් සහිත සේවකයින් සම්බන්ධ වංචාවක්
ආ.) මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති කළ හැකි වෙනත් වංචාවක්

6. වත්කම් හා වගකීම්වල ධාරක වටිනාකමට හෝ වර්ගීකරණයට සැලකියයුතු තරම් බලපාන සැලසුම් හෝ අභිප්‍රායන් විශ්වවිද්‍යාලයට නොමැත.

7. ආයතනය සහ පාලක සභාවෙහි ඕනෑම සාමාජිකයෙකු අතර ඇති සියලුම ගිවිසුම් කොළඹ විශ්වවිද්‍යාලයේ ගනුදෙනු පිළිබඳ සෘජු හෝ වක්‍ර උනන්දුවක් නොදක්වයි.

8. පහත සඳහන් කරුණු මූල්‍ය ප්‍රකාශනවල නිසි ලෙස සටහන් කර හෝ අනාවරණය කර ඇත:

අ.) ගාස්තු ලෙස ලද ආදායම්, මිලදී ගැනීම්, ණය, මාරුවීම්, කල්බදු විධිවිධාන සහ ඇපකර ඇතුළුව අදාළ පාර්ශවීය ගනුදෙනු සහ අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු හෝ ගෙවිය යුතු මුදල්.

ආ.) විශ්වවිද්‍යාලය අවිනිශ්චිත වගකීමක් වන ලිඛිත හෝ වාචික ඇපකර

9. පහත සඳහන් අන්දමේ කිසිවක් සිදුව නැත:

අ.) මූල්‍ය ප්‍රකාශනවල අවිනිශ්චිතතාවයක් ලෙස හෙළිදරව් කිරීම සඳහා සලකා බැලිය යුතු නීති හෝ රෙගුලාසි උල්ලංඝනය කිරීම් හෝ විය හැකි උල්ලංඝනයන්.

ආ.) අපගේ නීතිඥයා අපට උපදෙස් දී ඇති ප්‍රකාශ නොකළ හිමිකම් හෝ ලැබීමට ඉඩ ඇති හිමිකම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය වීමක්

ඇ.) උපචිත හෝ අනාවරණය කිරීමට අවශ්‍ය වන වගකීම් හෝ ලාභ හෝ අලාභ අවිනිශ්චිතතාවයන්

ඈ.) විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මෙහි හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇතිවිය හැකි සිදුවීම් හෝ කොන්දේසි වලට අදාළ සැලකියයුතු අවිනිශ්චිතතාවයක්

10. අනුකූල නොවීමකදී මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති කළ හැකි කොන්ත්‍රාත් ගිවිසුම්වල සියලු අංශවලට ආයතනය අනුකූල වී ඇත.

11. නිෂ්පාදන පෙළ හෝ වෙනත් සැලසුම් හෝ අභිප්‍රායන් අත්හැරීමට හෝ කිසියම් අතිරික්ත හෝ යල් පැන ගිය තොග ඇති වන අන්දමෙහි කිසිදු සැලසුමක් අප සතුව නොමැති අතර, ශුද්ධ සාක්ෂාත් කරගත හැකි අගයට වඩා වැඩි ප්‍රමාණයකින් බඩු තොග ප්‍රකාශ කර නොමැත.

12. විශ්වවිද්‍යාලයට සියළුම වත්කම් සඳහා සතුටුදායක හිමිකම් ඇති අතර මූල්‍ය ප්‍රකාශන 2.2.1 (ආ.) සටහනෙහි දක්වා ඇති පරිදි හැර විශ්වවිද්‍යාලයේ වත්කම් සඳහා වගකීම් හෝ බැඳීම් නොමැත.

13. අපගේ කිසිදු මුදල් හා ආයෝජන ගිණුම් සමඟ විධිමත් හෝ අවිධිමත් වන්දි ශේෂ විධිවිධාන නොමැත.

14. ප්‍රාග්ධන කොටස් නැවත මිලදී ගැනීමේ විකල්පයන් සහ ගිවිසුම් සහ විකල්පයන් සඳහා වෙන් කර ඇති ප්‍රාග්ධන සංචිත සහ වෙනත් අවශ්‍යතා පිළිබඳව අප විසින් මූල්‍ය ප්‍රකාශනවල නිසි ලෙස වාර්තා කර හෝ හෙළිදරව් කර ඇත.

අපගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව, ශේෂ පත්‍රයේ දිනට පසුව මෙම ලිපියේ දැක්වෙන දිනය තෙක් ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශයේ ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය වන කිසිදු සිදුවීමක් සිදුවී නොමැත.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න	ජේ.ටී.එල්. ධර්මසේන	කේ.ඒ.එස්. එඩ්වර්ඩ්
උපකුලපති	මූල්‍යාධිකාරී	ලේඛකාධිකාරී

පාලක සභාව වෙනුවෙන්

වන්න ද සිල්වා නන්දික බුද්ධිපාල

- ඉංග්‍රීසි බසින් සම්පාදිත *2022* වාර්ෂික වාර්තාවේ මුල් පිටපතෙහි සඳහන් ගිණුම් ලේඛනයන්හි ඉහත නිලධාරීන්ගේ අත්සන් ඇතුලත් වේ.

කොළඹ විශ්වවිද්‍යාලය

මූල්‍ය කාර්ය දර්ශන ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	**2022** (රු.)	පුනර්ප්‍රකාශිත **2021** (රු.)
ආදායම			
පුනරාවර්තන			
විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම - පුනරාවර්තන			
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන		4,865,000,000	4,709,000,000
ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යත්ව		56,285,500	25,476,000
වෙනත් ප්‍රදාන	1	225,446,936	131,237,243
අභ්‍යන්තර ආදායම්	2	62,160,598	18,315,442
විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන මුළු ආදායම - පුනරාවර්තන		**5,208,893,034**	**4,884,028,685**
විනිමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම - පුනරාවර්තන			
අභ්‍යන්තර ආදායම්	3	2,791,758,271	1,465,520,726
විනිමය ගනුදෙනු වලින් ලැබෙන මුළු ආදායම - පුනරාවර්තන		**2,791,758,271**	**1,465,520,726**
මුළු ආදායම - පුනරාවර්තන		**8,000,651,305**	**6,349,549,411**
ප්‍රාග්ධනය			
විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම - ප්‍රාග්ධන			
ප්‍රාග්ධන මාරු කිරීම්		2,850,616,299	3,525,557,561
ප්‍රාග්ධන මාරු කිරීම් - අභ්‍යන්තර අරමුදල්		378,328,462	232,152,973
ත්‍යාග සහ පරිත්‍යාග		18,172,605	22,353,687
විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන මුළු ආදායම -ප්‍රාග්ධන		**3,247,117,366**	**3,780,064,221**
මුළු ආදායම - ප්‍රාග්ධන		**3,247,117,366**	**3,780,064,221**
මුළු ආදායම		**11,247,768,671**	**10,129,613,632**

කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය කාර්ය දර්ශන ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	2022 (රු.)	පුනර්ප්‍රකාශිත 2021 (රු.)
වියදම්			
පුනරාවර්තන			
පෞද්. වැටුප් සහ වේතන	4	4,954,168,381	4,559,532,298
වෙනත් පුනරාවර්තන වියදම්	4	1,193,881,508	774,288,555
ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යත්ව වියදම්	4	56,285,500	25,476,000
නිර්වාචිත ප්‍රතිලාභ වගකීම	14	131,742,466	113,172,049
ප්‍රතිසංස්කරණ පුනරාවර්තන වියදම්	4	24,342,039	47,848,134
පැරණි තොග බැහැර කිරීමෙන් පාඩු		206,968	-
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් පාඩු		3,467,490	7,018,518
AHEAD ව්‍යාපෘතිය	5	192,952,376	78,836,542
මුළු පුනරාවර්තන වියදම් (ප්‍රාග්ධන නොවන ස්වභාවය)		**6,557,046,727**	**5,606,172,097**
වියදම්			
ප්‍රාග්ධන			
ක්ෂය	10	1,356,341,319	983,700,160
ක්‍රමක්ෂය	11	4,110,246	-
මුළු ප්‍රාග්ධන වියදම්		**1,360,451,565**	**983,700,160**
මුළු වියදම්		**7,917,498,291**	**6,589,872,257**
කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය)		**3,330,270,379**	**3,539,741,375**
කාල සීමාව සඳහා පුනරාවර්තන අතිරික්තය/(හිඟය)		1,443,604,578	743,377,314
කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය)		1,886,665,801	2,796,364,061
කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය)		**3,330,270,379**	**3,539,741,375**

කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනට

2022 දෙසැම්බර් 31 දිනට	සටහන	**2022 (රු.)**	පුනර්ප්‍රකාශිත **2021 (රු.)**
වත්කම්			
ජංගම වත්කම්			
මූල්‍ය හා මූල්‍ය පර්යාය	6	219,749,925	128,709,212
අත්තිකාරම් සහ ලැබියයුතු	7	1,087,520,624	902,017,660
ආයෝජන	8	173,595,583	135,778,057
බඩු තොග හා කොටස්		90,331,955	75,205,061
මුළු ජංගම වත්කම්		**1,571,198,087**	**1,241,709,990**
ජංගම නොවන වත්කම්			
අත්තිකාරම් සහ ලැබියයුතු	7	76,890,570	178,367,073
කාර්ය මණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම්	9	151,233,947	147,672,844
ආයෝජන	8	2,871,486,472	2,921,352,591
අස්පෘශ්‍ය වත්කම්	10	11,061,373	8,686,373
දේපළ, පිරියත හා උපකරණ	11	52,195,823,728	44,041,613,782
කෙරෙමින් පවතින වැඩ	12	854,808,670	6,516,670,711
මුළු ජංගම නොවන වත්කම්		**56,161,304,760**	**53,814,363,375**
මුළු වත්කම්		**57,732,502,848**	**55,056,073,365**
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු	13	496,323,723	322,285,973
විලම්බිත ආදායම		1,159,713,585	1,734,888,253
මුළු ජංගම බැරකම්		**1,656,037,308**	**2,057,174,226**
ජංගම නොවන බැරකම්			
ගෙවිය යුතු	13	77,095,353	99,099,344
විලම්බිත ආදායම		408,773,252	129,855,774
විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම	14	1,568,587,320	1,523,030,457
මුළු ජංගම නොවන බැරකම්		**2,054,455,925**	**1,751,985,575**
මුළු බැරකම්		**3,710,493,233**	**3,809,159,801**

ශුද්ධ වත්කම්		**54,022,009,614**	**51,246,913,564**
කොටස්/ශුද්ධ වත්කම්			
සංචිත අරමුදල්			
පුනරාවර්තන සංචිත අතිරික්ත/(හිඟ)		(1,914,184,964)	(2,737,269,483)
ප්‍රාග්ධන සංචිත අතිරික්ත/(හිඟ)		17,312,625,425	15,425,959,624
වත්කම් ප්‍රත්‍යාගණන සංචිත		36,622,756,070	36,622,756,070
මුළු සංචිත අරමුදල්		**52,021,196,532**	**49,311,446,210**
සංචිත සහ සීමිත අරමුදල්			
නාමිකළ අරමුදල්	15	1,786,691,437	1,744,515,529
පරිත්‍යාග අරමුදල්		214,121,645	190,951,824
මුළු සංචිත සහ සීමිත අරමුදල්		**2,000,813,082**	**1,935,467,353**
මුළුකොටස් / ශුද්ධ වත්කම්		**54,022,009,614**	**51,246,913,563**

සැකසුම්:

ඩී.ඩබ්. හෙට්ටිගේ
සහකාර මූල්‍යාධිකාරී

සහතික කිරීම:

ජේ.එල්.ටී. ධර්මසේන
මූල්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සාමාජිකයින් වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන පාලක සභාව විසින් අනුමත කරන ලද අතර ඒ වෙනුවෙන් අත්සන් කරන ලදී.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න	වන්න ද සිල්වා	නන්දික බුද්ධිපාල
උපකුලපති.	පාලක සභා සාමාජික	පාලක සභා සාමාජික

- ඉංග්‍රීසි බසින් සම්පාදිත *2022* වාර්ෂික වාර්තාවේ මුල් පිටපතෙහි සඳහන් ගිණුම් ලේඛනයන්හි ඉහත නිලධාරීන්ගේ අත්සන් ඇතුලත් වේ.

කොළඹ විශ්වවිද්‍යාලය
කොටස් / ශුද්ධ වත්කම් වෙනස්වීම් ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

පුනර්ප්‍රකාශිත

	වැය කළ උත්පන්න ප්‍රාග්ධන ප්‍රදාන	වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	සංචිත සහ සීමිත අරමුදල්	ත්‍යාග සහ ආධාර	වත්කම් ප්‍රත්‍යාගණන සංචිත	ප්‍රාග්ධන අතිරික්ත / (හිඟ)	පුනරාවර්තන අතිරික්ත / (හිඟ)	එකතුව (රු.)
2021 ජනවාරි 01 වන දිනට ශේෂය	**12,395,015,545**	**(229,226,019)**	**1,688,447,851**	**397,509,266**	**38,541,256,070**	**-**	**(2,701,077,695)**	**50,091,925,018**
වත්කම් ප්‍රත්‍යාගණන සංචිතවල ශුද්ධ සංචලන					(1,918,500,000)			(1,918,500,000)
ප්‍රාග්ධන අතිරික්ත/ හිඟවලට මාරු කිරීම්	(12,395,015,545)	229,226,019		(397,509,266)		12,629,595,561		66,296,769
වර්ෂය තුළ වැය කළ හා වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන						2,796,364,061		2,796,364,061
කාල සීමාව සඳහා අතිරික්ත / (හිඟ)							743,377,315	743,377,315
අරමුදල් මාරුකර යැවීම්							(532,549,600)	(532,549,600)
අරමුදල්වල ශුද්ධ සංචලනය			197,641,230				(197,641,230)	-
කොන්ත්‍රාත්තු කඩකිරීම් අරමුදලට මාරුකිරීම			10,583,634				(10,583,634)	-
පොලී ආදායමට මාරු කිරීම- උපකුලපති අරමුදල			10,462,270				(10,462,270)	-
පොලී ආදායමට මාරු කිරීම -UCDF අරමුදල			11,677,642				(11,677,642)	-
පොලී ආදායමට මාරු කිරීම - සීමිත අරමුදල්			16,654,724				(16,654,724)	-
2021 දෙසැම්බර් 31 වනවිට ශේෂය	**-**	**-**	**1,935,467,353**	**-**	**36,622,756,070**	**15,425,959,622**	**(2,737,269,481)**	**51,246,913,564**
වර්ෂය තුළ වැය කළ හා වැය නොකළ ප්‍රාග්ධන								

ප්‍රදාන						-		-
කාල සීමාව සඳහා අතිරික්ත / (හිඟ)			(75,149,250)	-		1,886,665,801	1,443,604,578	3,330,270,380
මාරු කිරීම්					-		(646,528,203)	(646,528,203)
පුනස්ථාපිත ක්ෂය						-	166,503,123	166,503,123
අරමුදල්වල ශුද්ධ සංචලනය			(75,149,250)				-	(75,149,250)
ලෝගු කුලියට ගැනීමේ ගාස්තු ගිණුමට මාරුකිරීම			152,450				(152,450)	-
කොන්ත්‍රාත්තු කඩකිරීම් අරමුදලට මාරුකිරීම			52,330,580				(52,330,580)	-
පොලී ආදායමට මාරු කිරීම -UCDF අරමුදල			30,203,948				(30,203,948)	-
පොලී ආදායමට මාරු කිරීම - සීමිත අරමුදල්			57,808,001				(57,808,001)	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**-**	**2,000,813,082**	**-**	**36,622,756,070**	**17,312,625,425**	**(1,914,184,964)**	**54,022,009,614**

කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය සංසරණ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	**2022 (රු.)**	පුනර්ප්‍රකාශිත **2021 (රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පන්න මූල්‍ය ප්‍රවාහ		
සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්ත/ හිඟ	1,443,604,578	743,377,315
ගැලපුම්		
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා ප්‍රතිපාදන	131,742,466	113,172,049
පොලී ආදායම	(443,887,255)	(141,460,579)
උපලබ්ධි නොවූ විදේශ මුදල් ලාභ	(31,598,323)	(2,663,000)
බදු පොලිය	625,990	850,243
වත්කම් බැහැර කිරීම මත පාඩු	3,467,490	7,018,518
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය	1,103,954,946	720,294,546
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
ගබඩා සහ භාණ්ඩ තොගවල (වැඩිවීම)/ අඩුවීම	(15,126,894)	(3,191,799)
වෙනත් ලැබිය යුතු ලැබීම්වල (වැඩිවීම)/ අඩුවීම	(164,543,912)	(89,496,751)
අත්තිකාරම්වල (වැඩිවීම)/ අඩුවීම	80,517,452	7,929,745
විලම්බිත ආදායම වැඩිවීම/ (අඩුවීම)	(296,257,190)	196,686,331
ගෙවියයුතු තැන්පතු වැඩිවීම/ (අඩුවීම)	152,033,759	(488,436,785)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පන්න මුදල් ප්‍රවාහ	860,578,162	343,785,286
පාරිතෝෂික ගෙවීම්	(86,185,604)	(108,188,173)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පන්න ශුද්ධ මුදල් ප්‍රවාහ	774,392,558	235,597,113
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් උත්පන්න මුදල් ප්‍රවාහ		
ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම්	(384,301,187)	(274,074,779)
කෙරෙමින් පවතින වැඩ	(410,877,924)	(669,586,506)
ආයෝජන වැඩිවීම්	(69,148,966)	(918,063,071)
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ශේෂය	1,246,539	426,355
ආයෝජන වෙතින් පොලී	179,535,385	24,785,646
ඍස්කිරීම් අත්තිකාරම්	(26,876,125)	(13,299,958)
අභ්‍යන්තර අරමුදලේ ශුද්ධ වැඩිවීම	(520,577,020)	252,484,950
බදුකුලී ගෙවීම්	(2,611,812)	(2,611,812)
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් උත්පන්න ශුද්ධ මුදල් ප්‍රවාහ	(1,233,611,110)	(1,599,939,176)
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් උත්පන්න මුදල් ප්‍රවාහ		
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන	126,500,000	395,000,000
ප්‍රාග්ධන වියදම් සඳහා විවිප්‍රකො ප්‍රදාන	100,000,000	496,715,586
ආයෝජන අඩුවීම්	323,759,265	343,889,827
පරිත්‍යාග	-	22,353,687
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් උත්පන්න ශුද්ධ මුදල් ප්‍රවාහ	550,259,265	1,257,959,100
වර්ෂය තුළ මූල්‍ය සහ මූල්‍ය පර්යායයෙහි ශුද්ධ වෙනස්කම්	91,040,713	(106,382,963)
කාල පරිච්ඡේදය ආරම්භයේදී මූල්‍ය හා මූල්‍ය පර්යාය	128,709,212	235,092,175
කාල පරිච්ඡේදය අවසානයේදී මූල්‍ය හා මූල්‍ය පර්යාය	219,749,925	128,709,212
මූල්‍ය හා මූල්‍ය පර්යායයන්හි ශුද්ධ වැඩිවීම/ අඩුවීම	**91,040,713**	**(106,382,963)**

කොළඹ විශ්වවිද්‍යාලය – ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

1.1 නෛතික හා ප්‍රභවාත්මක ස්වරූපය

කොළඹ විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් ස්ථාපිත කර ඇත. එහි ප්‍රධාන පරිපාලනය කොළඹ 3, කුමාරතුංග මුණිදාස මාවතෙහි අංක 94 යන ලිපිනයෙහි පිහිටි විද්‍යාල මන්දිරයෙහි සිදු වෙයි.

2007 අංක 7 දරණ සමාගම් පනතේ පළමු උපලේඛනයට අනුකූලව සීමිත වගකීම් සමාගමක් (ඇපකාර) ලෙස කොළඹ විද්‍යා හා තාක්ෂණ කුටිය ස්ථාපිත විය.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්

ස්වභාවය

අ.) සිසුන් ඇතුළත් කර ගැනීම සහ අනුමත කරන ලද ඉගෙනුම් අංශයකින් උපදෙස් ලබා දීම

ආ.) විවිධ ඉගෙනුම් අංශයන්හි ප්‍රවීණතාවය ලබා ඇති පුද්ගලයින් පිළිබඳ තහවුරු කර ගැනීම සඳහා විභාග පැවැත්වීම

ඇ.) ගුරුවරුන්, සිසුන් සහ විද්වතුන් හුවමාරු කර ගැනීමෙන් හෝ වෙනත් ආකාරයකින්, විශ්වවිද්‍යාලයට සමාන හෝ සැලකිය යුතු ලෙස සමාන අරමුණු ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි වෙනත් විශ්ව විද්‍යාල හෝ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම;

ඈ.) පශ්චාත් උපාධි පාඨමාලා සැපයීම සහ මේ සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි වෙනත් විශ්ව විද්‍යාල හෝ බලධාරීන් සමඟ විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන අරමුණු සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම;

ඉ.) විශ්වවිද්‍යාලයේ හෝ පිළිගත් ආයතනයක අනුමත අධ්‍යයන පාඨමාලා හැදෑරූ සහ අතුරු ව්‍යවස්ථා මගින් නියම කර ඇති විශ්ව විද්‍යාලයේ විභාග සමත් වූ පුද්ගලයින්ට සහ උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් අධ්‍යයන සාමාර්ථයන් ලබා දීම

ඊ.) සම ක්‍රියාකාරකමක් ලෙස පර්යේෂණයන්හි නියැලීම සහ දැනුම ප්‍රචාරණය

දැක්ම

සමාජයේ අභිවෘද්ධිය උදෙසා මානව හැකියාවන් සුපෝෂණය කිරීම සඳහා අධ්‍යාපනය, පර්යේෂණ හා සිය පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය යන අංශයන්ගෙන් ගෝලීයව විශිෂ්ට මධ්‍යස්ථානයක් වීම.

මෙහෙවර

දැනුම සොයා ගැනීම සහ බෙදා හැරීම; නවෝත්පාදන වැඩි දියුණු කිරීම; කර්මාන්තය හා ප්‍රජාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් විශ්වවිද්‍යාලය පුරා සහ ඉන් ඔබ්බට පුළුල් විමර්ශන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම

1.3 අඛණ්ඩ පැවැත්ම පිළිබඳ මූලධර්මය

විශ්වවිද්‍යාලය සිය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ස්වයං ඇගයීමක යෙදී ඇති අතර දෘශ්‍ය අනාගතයේදී සිය අඛණ්ඩ පැවැත්ම නොපිරිහෙලා පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සෑහීමකට පත්වේ. එසේම සිය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සුවිශේෂී සැක මතුකළහැකි ද්‍රව්‍යමය අස්ථිරතාවයක් පිළිබඳ සනාතන සභාව දැනුම්වත් නොවේ. එබැවින් කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ මූලධර්මය මත පදනම්ව සකසා ඇත.

.

1.4 ගිණුම් කාලපරිච්ඡේදය

විශ්වවිද්‍යාලයේ ගිණුම් කාලපරිච්ඡේදය 2022 ජනවාරි 01 වනදා සිට දෙසැම්බර් 31 වනදා දක්වා වේ.

භාවිතා කර ඇති සියලු මූල්‍ය ප්‍රතිපත්ති පසුගිය වසරෙහිදී භාවිත මූල්‍ය ප්‍රතිපත්ති හා සැසඳෙන අතර අවශ්‍ය තන්හිදී සන්සන්දනය සඳහා අවශ්‍ය අගයන් මෙම වසරෙහි ඉදිරිපත් කිරීම හා සැසඳීමේදී එකී වෙනස් වීම හා අනුකූලවීම සඳහා ගළපා ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

1.5.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

කොළඹ විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූල වන ලෙස පිළියෙල කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන මුල්‍ය කාර්යදර්ශන ප්‍රකාශය, මූල්‍ය තත්ව ප්‍රකාශය, මූල්‍ය සංසරණ ප්‍රකාශනය, කොටස් / ශුද්ධ වත්කම් වෙනස්වීම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්වලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ වන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදයන් සඳහා මෙම ප්‍රතිපත්ති නිරන්තරයෙන් අදාළ වේ

විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගම්වල සහ කොළඹ විද්‍යා සහ තාක්ෂණ කවුළුවේ මූල්‍ය ප්‍රකාශයන් මෙම මූල්‍ය ප්‍රකාශයන් තුළ අඩංගුකර නොමැත.

1.5.2 මිනුම් පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් සුදුසු අනාවරණය කිරීම් සිදු කරනු ලැබුවහොත් හැර, උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම යටතේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.5.3 තුලනාත්මක තොරතුරු

වර්තමාන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සහ තුලනාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල වාර්තා වී ඇති සියලු මුදල් සඳහා පෙර කාල පරිච්ඡේදයට සාපේක්ෂව ප්‍රමාණාත්මක, ආඛ්‍යානමය හා විස්තරාත්මක තොරතුරු ඇතුළු තුලනාත්මක තොරතුරු මින් අනාවරණය වේ.අවශ්‍ය නැන්හි සංසන්දනාත්මක සංඛ්‍යා වත්මන් වර්ෂය ඉදිරිපත් කිරීමට අනුරූප වන පරිදි නැවත සකස් කර ඇත.

1.5.4 මූල්‍ය ප්‍රකාශනවල වගකීම සහ අනුමැතිය

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ඔවුන්ගේ වගකීම පිළිගත් කොළඹ විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසින් 2023.03.08 දින පැවති පාලක සභා රැස්වීමේදී මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

1.5.5 ද්‍රව්‍යවාදය හා සමූහනය

සමාන අයිතම සහිත ද්‍රව්‍ය එක්ව වර්ගීකරණය කර ඇති අතර නොසැලකිය යුතු තරම් කුඩා අසමානතා ඇති අවස්ථාවල හැර ස්වභාවයෙන් හෝ කාර්ය වශයෙන් අසමාන අයිතම වෙන්වෙන්ව දක්වා ඇත.

1.5.6 අනුලම්බගත කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලින් ඉල්ලා සිටින විට හෝ අවසර දෙන අවස්ථාවල හැර වෙනත් කිසිම විටක වත්කම් හා බැරකම්, අය සහ වැය අනුලම්බගත කර නැත.

1.5.7 කෘත්‍යාත්මක සහ ව්‍යවහාරික මුදල් ඒකකය

කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන වල අයිතම විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වූ ප්‍රාථමික ආර්ථික පසුබිම මත (කෘත්‍යාත්මක මුදල් ඒකකය) ගණනය කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කර ඇත්තේ විශ්වවිද්‍යාලයේ කෘත්‍යාත්මක සහ ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

1.5.8 විදේශ මුදල් ගනුදෙනු

සියලුම විදේශ මුදල් ගනුදෙනු පිළිබඳ වාර්තා කරන මුදල් වර්ගය ගනුදෙනු සිදු කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාතවලට අනුව ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කෙරෙයි.

වර්ෂය තුළ එම ගනුදෙනු පියවීමෙන් සහ මූල්‍ය වත්කම්වලින් ලැබෙන විදේශ විනිමය ලාභ/අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

1.5.9 වැටයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකින් දක්වා ඇත් නම් මිස, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණය ආසන්නතම රුපියලට වටයා ඇත.

1.6 සුවිශේෂ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමේදී, කළමණාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගි කර ගැනීමෙහි සහ වාර්තා කරන ලද වත්කම්, බැරකම්, ආදායම සහ වියදම් සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනවලට එළඹීම අවශ්‍ය වේ. තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු හා භාවිතා කරන විනිශ්චයන්ගෙන් වෙනස් විය හැකිය.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණයන්ට වඩාත්ම වැදගත් බලපෑමක් ඇති කරන, ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ඇස්තමේන්තු, අවිනිශ්චිතතාව සහ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ:

අ.) නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම

සේවකයින්ගේ විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමේ පිරිවැය තීරණය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක හර (PUC) ක්‍රමයෙනි. එවැනි ක්‍රමයකට පොලී අනුපාතය, වැටුප් වැඩිවීමේ අනුපාතය සහ විශ්‍රාම යන වයස පිළිබඳ උපකල්පන භාවිතා කිරීම ඇතුළත් වේ. සැලැස්මේ දිගුකාලීන ස්වභාවය නිසා එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ.

ආ.) ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්හි වෙනස්කම්

ගිණුම්කරණ ඇස්තමේන්තු වල යම් වෙනසක් සහ විවේචනාත්මක විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශනවල අදාළ ස්ථානවල අනාවරණය වේ.

1.7 අවිනිශ්චිත වත්කම් හා බැරකම්

අවිනිශ්චිත වත්කම් සහ බැරකම් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අංක 8 ට අනුකූලව ගිණුම්ගත කර ඇත. ඒ අනුව, අවිනිශ්චිත වගකීමක් යනු වැඩසටහනේ පාලනයෙන් බැහැර වන අනාගත අවිනිශ්චිත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීම හෝ සිදු නොවීම නිසා හෝ පියවීම සඳහා සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වනු ඇතැයි සිතිය නොහැකි හඳුනා නොගත් වර්තමාන වගකීමක් පැවතීම හේතුවෙන් ජනිත වගකීමකි.

අතිශය කලාතුරකින් අවස්ථාවක විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වගකීමක් පවතින අවස්ථාවලදීද අවිනිශ්චිත වගකීමක් පැන නගී. අවිනිශ්චිතභාවය අවිනිශ්චිත වගකීමක් හඳුනා නොගන්නා නමුත් මූල්‍ය ප්‍රකාශනයේ එහි පැවැත්ම හෙළිදරව් කරයි.

අවිනිශ්චිත වත්කමක් යනු විශ්ව විද්‍යාල පාලනයෙන් බැහැර අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීම හෝ සිදු නොවීම මගින් එහි පැවැත්ම තහවුරු වන අතීත සිදුවීම් වලින් පැන නගින වත්කමකි. විශ්ව විද්‍යාලය අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ තිබුණද ප්‍රායෝගිකව නිශ්චිත නොවන අවස්ථාවන්හිදී එහි පැවැත්ම හෙළිදරව් කරයි.

1.8 ප්‍රකාශන දිනයෙන් පසු සිදු වූ සිදුවීම්

ප්‍රකාශන දිනයෙන් පසු සිදුවූ සියලු සැලකිය යුතු අවස්ථා සැලකිල්ලට භාජනය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය තන්හිදී සුදුසු ගැළපීම් හා එළිදරව් කිරීම් සිදු කර ඇත.

2 විශේෂිත ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය

2.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

1. ආදායම් හඳුනා ගැනීම – භාණ්ඩාගාර සහ වෙනත් දීමනා

පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන, පර්යේෂණ ප්‍රදාන සහ ව්‍යාපෘතිවල ආදායම, වත්කම් සහ පරිත්‍යාග අත්පත් කර ගැනීම සඳහා ලැබෙන ප්‍රදාන ඒවා ලැබෙන විට ආදායම ලෙස හඳුනාගෙන ඇති අතර අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

රජයේ ආධාර සඳහා ගිණුම්කරණය

භාණ්ඩාගාරයෙන් සහ අනෙකුත් ආයතනවලින් ලැබුණු ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (*SLIPSAS* 11) අනුකූලව (විනිමය නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම (බදු සහ ස්ථාන මාරු)) වාර්තා කර ගිණුම්ගත කර ඇත.

පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ විනිමය නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම ලෙස හඳුනාගෙන මුදල් පදනම මත පිළිගැනේ.ඊට අමතරව, *PPE* පුනරුත්ථාපනය සඳහා ලැබුණු සහ වැය කරන ලද ප්‍රදාන සහ පර්යේෂණ සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය ද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේදී පුනරාවර්තන ප්‍රදාන ලෙස හඳුනා ගැනේ.

ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග

ආදායමට අනුව දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් සහ අනෙකුත් ණය දෙන ආයතනවලින් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට (*SLPSAS 11)* අනුව විනිමය නොවන ගනුදෙනු (බදු සහ මාරු කිරීම්) ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. පරිත්‍යාග වශයෙන් ලැබුණු වත්කම්වල සාධාරණ වටිනාකම ලැබුණු වර්ෂයේ ආදායම ලෙස ගණන් බලා ඇත.

අභ්‍යන්තරික උත්පන්න ආදායම

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට *(SLPSAS 10)* අනුව විනිමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම අනුව පාඨමාලා ගාස්තු, විභාග ගාස්තු, වැඩමුළු ගාස්තු, ලියාපදිංචි ගාස්තු සහ අනෙකුත් ක්‍රියාකාරකම්වල ආදායම වැනි ගාස්තු අය කරන පාඨමාලා වලින් ලැබෙන ආදායම පාඨමාලාවේ සහ උපාධි වැඩසටහනෙහි කාලසීමාව තුළ උපචිත පදනම මත හඳුනා ගැනේ. සම්පූර්ණ කරන ලද ක්‍රමයේ ප්‍රතිශතය අනුව පාඨමාලා ගාස්තු හඳුනාගෙන ඇත.

මූල්‍ය ආදායම

ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම උපචිත පදනම මත හඳුනා ගැනේ.

2. දේපළ, පිරියත හා උපකරණ වෙතින් ලැබීම් /පාඩු

දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත ශුද්ධ ලාභ සහ අලාභ, නිශ්චිත අදාළ විකුණුම් වියදම් සඳහා බැහැර කරන ලද භාණ්ඩයේ ධාරක වටිනාකම, බැහැර කිරීමෙන් ලැබෙන ආදායමෙන් අඩු කිරීමෙන් පසු මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. කිසියම් ප්‍රත්‍යාගණන වත්කමක් සම්බන්ධයෙන්, ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ඉතිරිව ඇති ඕනෑම ශේෂයක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ.

අ.) වෙනත් ආදායම්

ඉහත කාණ්ඩ යටතේ නිශ්චිතව දක්වා නොමැති වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

ආ.) සීමිත ප්‍රදාන වලින් ලැබෙන ආදායම

අරමුදල් ලැබීමේ කොන්දේසි සේවාවක කාර්ය සාධනයකට හෝ වෙනත් ක්‍රියාවලියකට සම්බන්ධ වන අවස්ථාවක ගිවිසුම්, කොන්ත්‍රාත්තු හෝ වෙනත් අවබෝධයක් මත පදනම්ව සීමිත ප්‍රදාන සපයනු ලබයි. විශ්වවිද්‍යාලය විසින් සම්පාදනය කර ඇති කොන්දේසි වලට අනුකූල වීම සහ අපේක්ෂිත වගකීම් ඉටු කිරීම හරහා දායකත්වය උපයා ගනී. ප්‍රදාන ලැබෙන බවට සාධාරණ සහතිකයක් ලැබෙන තෙක් සහ එය ලැබීම සඳහා නියම කර ඇති කොන්දේසිවලට අනුකූල වන තෙක් සහ වන්දි ගෙවීමට අපේක්ෂා කරන අදාළ වියදම් දැරීමට සහ අය කර ගන්නා තෙක්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම හඳුනාගනු නොලැබේ. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අරමුදල් ලැබීමෙන් දායකත්වයට අනුයුක්ත කර ඇති කොන්දේසි සපුරා ඇති බවට හෝ ඉටු කිරීමට නියමිත බවට තීරණාත්මක සාක්ෂි සපයන්නේ නැත. කොන්දේසි සපුරාලන තුරු, දායකත්වය සී අරමුදල්වල කොටසක් ලෙස සැලකේ.

කිසියම් සීමිත ප්‍රදානයක් ලැබීමෙන් පසු, ප්‍රදානය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පිළිගනු ලැබේ. ඉන්පසුව, ක්‍රමානුකූල පදනමක් මත, එම කාලය තුළ එකඟ වූ "සීමා කළ" ක්‍රියාකාරකම් සඳහා වියදම් කර ඇති මුදලට සමාන මුදලක් ආදායමට ගනු ලැබේ. උපයෝජනය නොකළ අරමුදල් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එලෙසම ඉදිරියට ගෙන යනු ලැබේ.

2.1.2 වියදම් හඳුනා ගැනීම

අ.) විශ්වවිද්‍යාලයේ සියළුම ක්‍රියාකාරකම් සිදුකිරීමේ වියදම් උපචිත පදනම මත හඳුනාගෙන ඇති අතර ඒවා සිදු වූ කාල සීමාව තුළ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

ආ.) උපාධි අපේක්ෂක අධ්‍යාපනය සඳහා වන සියළුම වියදම් රජයේ පුනරාවර්තන ප්‍රදානයට ඇතුළත් කර ඇත.

ඇ.) සිසුන්ගේ ඉගෙනුම් ධාරිතාව ඉදිරියට ගෙනයාම හෝ වැඩි කිරීම සඳහා ස්ථීර ස්වභාවයක් ඇති වත්කම් අත්පත් කර ගැනීම හෝ වැඩිදියුණු කිරීම සඳහා කරන ලද සියලු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ඈ.) විස්තිරණ ආදායම් ප්‍රකාශයේ වියදම් හඳුනාගෙන ඇත්තේ විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාමේ පිරිවැය අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත වන අතර ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වා ගෙන යාමේ වියදම වර්ෂය සඳහා අතිරික්තය / හිඟය ගණනය කිරීමේදී ආදායම ලෙස සැලකේ.

2.1.2.1 ව්‍යාපෘති වියදම්

විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති හා අනෙකුත් ක්‍රියාකාරකම් සිදුකිරීමේ වියදම් ඔවුන් විසින් දරනු ලබන කාල පරිච්ඡේදය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයකින් හඳුනාගෙන ඇති අතර ව්‍යාපෘති වියදම් හඳුනා ගැනීමේ පදනම ප්‍රධාන වශයෙන් ව්‍යාපෘතියේ ස්ථාන, ව්‍යාපෘතියට වෙන් කර ඇති කාර්ය මණ්ඩලය සහ ව්‍යාපෘති යෝජනාවට අනුව ව්‍යාපෘතියේ කටයුතු ප්‍රක්ෂේපණය කර ඇත.

පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පිරිවැය හඳුනාගනු ලැබුවේය.

2.1.2.2. මෙහෙයුම් වියදම්

විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාමේ දී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ දී දරන ලද සියලු වියදම්, වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේදී ලැබෙන ආදායමට එරෙහිව අයකරනු ලැබේ.

විභාග, සම්මන්ත්‍රණ සහ පාඨමාලා සඳහා වන වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේදී උපචිත පදනම මත හඳුනා ගැනේ.

2.1.2.3 මූල්‍ය වියදම

මුදල් වියදම් ගෙවනු ලබන විට හෝ වගකීම් ඇති කරන විට උපචිත පදනම මත හඳුනා ගැනේ.

3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

3.1 ජංගම වත්කම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමෙන් පසු වසරක් ඇතුළත අයකර ගනු ලබන ඒවා වේ.

3.1.1 මූල්‍ය හා මූල්‍ය පර්යාය

අතැති මුදල්, බැංකු ශේෂයන් සහ මාස තුනක මුල් කල්පිරීමක් සහිත සහ කෙටි කාලීන තැන්පතු මූල්‍ය හා මූල්‍ය පර්යායන්ට ඇතුළත් වේ.

3.1.2 බඩුතොග හා කොටස්

පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම අතර වඩා අඩු අගය මත බඩු තොග පෙන්වාදී ඇත. සමස්ත වශයෙන් පිරිවැය පෙර පිවිසි පෙර නිකුත් පදනමක් මත ගණනය කරනු ලබන අතර එහිදී අදාළ තොග අත්පත් කර ගැනීමටත්, ඒවා පවත්නා තත්ත්වයට පත්කරලීමට හා පවත්නා ස්ථානයට ගෙන ඒමටත් වැයවූ වියදම ඊට ඇතුළත් වෙයි.

විශ්වවිද්‍යාලයෙහි බඩු තොගවලට ලිපිද්‍රව්‍ය, රසායනික, පරිභෝජන ද්‍රව්‍යය හා නඩත්තු අයිතම ඇතුළත් වෙයි.

3.2 ජංගම නොවන වත්කම්

3.2.1 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමට සහ භාවිතයට ගෙන ඒමට දරන පිරිවැයේ පදනම මත ය.

පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම හා සම්බන්ධ පිරිවැය වියදමක් ලෙස හඳුනා ගැනේ. පහත සඳහන් නිර්ණායක සපුරා ඇති විට විශ්වවිද්‍යාලය විසින් පාලනය කරනු ලබන හඳුනාගත හැකි සහ අද්විතීය මෘදුකාංග නිෂ්පාදන නිෂ්පාදනය සමඟ සෘජුවම සම්බන්ධ වන පිරිවැය අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ:

(i) මෘදුකාංග නිෂ්පාදනය සම්පූර්ණ කිරීමට තාක්ෂණික වශයෙන් ශක්‍යතාවක් වන අතර එමඟින් එය භාවිතය සඳහා ලබා ගත හැකි වන අතර කළමනාකරණයට මෘදුකාංග නිෂ්පාදනය භාවිතය සඳහා සම්පූර්ණ කිරීම

(ii) මෘදුකාංග නිෂ්පාදනය භාවිතා කිරීමේ හැකියාව;

(iii) මෘදුකාංග නිෂ්පාදනය අනාගත ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කරන ආකාරය නිරූපණය කිරීමේ හැකියාව;

(iv) සංවර්ධනය සම්පූර්ණ කිරීමට සහ මෘදුකාංග නිෂ්පාදනය භාවිතා කිරීමට ප්‍රමාණවත් තාක්ෂණික, මූල්‍ය සහ වෙනත් සම්පත් තිබීම; හා

(v) මෘදුකාංග නිෂ්පාදනයේ සංවර්ධන කාලය තුළ එයට ආරෝපණය කළ හැකි වියදම් විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම

මෘදුකාංග සංවර්ධන සේවක පිරිවැය සහ අදාළ පොදු කාර්යයන්හි සුදුසු කොටසක් මෘදුකාංග නිෂ්පාදනයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇති සෘජුවම ආරෝපණය කළ හැකි පිරිවැය අතර ඇතුළත් වේ.

මෘදුකාංග සංවර්ධනයට අදාළ පිරිවැය මෘදුකාංගය භාවිතයට සුදානම් වන තෙක් කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ලෙස ඉදිරියට ගෙනයනු ලැබේ.

3.2.2 දේපල, පිරියත හා උපකරණ

භූමි, ගොඩනැගිලි, විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ, තිරවුරු සහ සවිකුරු, පුස්තකාල පොත් හා වාර සඟරා, මෝටර් වාහන, උපාධි ලෝගු, සහ රජයේ ප්‍රදාන, පර්යේෂණ ප්‍රදාන, අභ්‍යන්තරිකව ජනිත අරමුදල් සහ පරිත්‍යාග මඟින් ලබා ගත් වෙනත් වත්කම්

තාක්ෂණ පීඨය පිහිටුවීම සඳහා රජය විසින් ලබාදුන් හෝමාගම, පිටිපන, මාහේනවත්ත පිහිටි ඉඩමේ අයිතිය ලබා ගැනීමට විශ්වවිද්‍යාලය නාගරික සංවර්ධන අධිකාරියට රු.මි. 781ක් ගෙවියයුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය මෙම මුදල ගෙවීමට පසුගිය වසරේදී එකඟ වී ඇත.

හඳුනාගැනීමේ හා මිනුම් පදනම

දේපළ, පිරියත හා උපකරණ හඳුනාගෙන ඇත්තේ ආයතනය වෙත ඒවායෙන් යථා කාලයේදී බොහෝ කොට මූල්‍යමය වාසිදායි තත්ත්වයන් ගලා ඒමේ හැකියාවක් ඇත්නම් පමණක් හා එකී අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස ගිණිය හැකි නම් පමණි.

සියළුම දේපල, පිරියත සහ උපකරණ මුලින් පිරිවැය මත ප්‍රකාශ කර ඇති අතර පසුව අඩු වශයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ යම් හානියක් සිදුවුවහොත් එය මනිනු ලැබේ. අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී හඳුනාගෙන ඇත. සිදුවීම් හෝ තත්වයන්හි වෙනස්වීම් මඟින් දේපල, පැලෑටි සහ උපකරණවල ධාරක වටිනාකම් නැවත ලබා ගත නොහැකි බව පෙන්නුම් කරන විට ඒවා ධාරක හානි වටිනාකම් සඳහා සමාලෝචනය කෙරේ.

(i) සමාරම්භක හඳුනා ගැනීම

උපකරණ සඳහා රු. එක් එක් අයිතමයකට රුපියල් 2,500කට අඩු පිරිවැයක් සහිත උපකරණ සාමාන්‍යයෙන් මිලදී ගත් වර්ෂයේදී ලියා හරිනු ලැබේ. අනෙකුත් සියලුම උපකරණ ස්වභාවයේ පදනම මත ප්‍රාග්ධනීකරණය කර ඇත. ස්පෘශ්‍ය සහ වසරකට වැඩි ආයු කාලයක් සහිත උපකරණ ප්‍රාග්ධනීකරණය කර ඇත.වත්කමක ආයුකාලයේ තීරකය එහි වර්ගීකරන 8ක් මත තෝරා ගැනෙන අතර එය වසර 4 සිට 20 දක්වා දිවෙයි.

(ii) පවත්නා දේපළ, පිරියත හා උපකරණ මත පසුව ඇති වූ වියදම්

පහත දැක්වෙන ගනයන්ට අයත් නොවන විටදී යම් ස්පෘශ්‍ය වත්කම් මත සිදුකරන ලද වියදම් එකී වියදම සිදුකරන ලද කාලපරිවර්ජේදය තුළ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත්කර දක්වා ඇති අතර එහිදී එය ප්‍රාග්ධනිත කර අදාල පදනම් මත පිහිටා ක්ෂය ගණනයට ලක් කර ඇත.

අ.) ස්ථාවර වත්කම්වල වෙළඳපොළ වටිනාකම් සැලකියයුතු තරම් ඉහළ යන ලද අවස්ථාවන්හි
ආ.) වත්කම් පරාසයේ වැඩි විමකදී
ඇ.) ප්‍රතිදානයෙහි තත්ත්වයේ තිරසාර වර්ධනයක් හෝ ක්‍රියාකාරී පිරිවැයෙහි අඩු වීමක්
ඈ.) අලුත්වැඩියාවෙන් හා නඩත්තුවෙන් ස්ථිරවන ප්‍රමාණයටද වඩා සැලකිය යුතු අන්දමේ වත්කම් ආයු වර්ධනයක්

(iii) ප්‍රත්‍යාගණන ආකෘතිය

- මූලික හඳුනාගැනීමෙන් පසුව, විශ්වවිද්‍යාලය එම පිරිවැය ප්‍රත්‍යාගණන ආකෘතිය සඳහා වන SLPSAS 7 හි අවශ්‍යතාවයට අනුකූලව, එනම් පිරිවැය හැර සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පදනමකට අනුකූලව සියලු දේපල, පිරියත සහ උපකරණ මැනීමේ පිරිවැය ආකෘතිය තෝරා ගනී.

- කෙසේ වෙතත්, ඵලදායී ජීවකාලය සමාලෝචනය කිරීමේදී මතුවන තාක්ෂණික ගැටළු හේතුවෙන් ශූන්‍ය ශුද්ධ පොත් අගයකින් වාර්තා වන පුස්තකාල පොත් සහ වාර සඟරාවල **ඉතිරි ඵලදායී ජීවකාලය සමාලෝචනය නොකෙරෙයි.** පොතෙහි අන්තර්ගතය යල් පැන ගිය විට භාවිතය අඩු විය හැක. එබැවින්, පොත්වල ඵලදායී ජීවකාලය පිළිබඳ විශ්වසනීය තක්සේරුවක් ලබා ගැනීමට අපහසුය.

- SLPSAS 7 අනුව භාණ්ඩ සමීක්ෂණයේදී බැහැර කිරීමට නිර්දේශ කරනු ලැබ ඇති වත්කම්වල ඵලදායී ජීවකාලය සමාලෝචනය නොකෙරේ.

(iv) වෙනත් ආයතන වලට අයත් ගොඩනැගිලි

විශ්වවිද්‍යාල භූමියේ පිහිටා ඇති ජෛව රසායන විද්‍යා අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණවේදය ආයතනයේ ගොඩනැගිලි, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල, ජාතික පුස්තකාල සහ විඥාපන සේවා ආයතනය

(V) ක්ෂයවීම්

මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ සඳහා ඒවා භාවිතය සඳහා ගන්නා ලද දිනයේ පටන් ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමය යටතේ ගණනය කර ක්ෂය හඳුනා ගෙන ඇත. ඉඩම් සඳහා ක්ෂය ගණනයක් කර නොමැත. ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලයන් මෙසේය.

වත්කම් ප්‍රවර්ගය	ඵලදායී ජීව කාලය අවු.
ගොඩනැගිලි	*20*
ගෘහභාණ්ඩ සහ උපකරණ	*10*
විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ	*5*
සවිකුරු සහ තිරවුරු	*10*
පුස්තකාල පොත්, වාර සඟරා හා ලේඛ	*5*
මෝටර් වාහන	*5*
මෘදුකාංග පැකේජ	*5*
ක්‍රීඩා භාණ්ඩ	*4*

භාවිත කළ කාලය මත පදනම්ව, මිලදී ගත් දිනයේ සිට සහ බැහැර කරන දිනය දක්වා ක්ෂයවීම් ලබා දෙනු ඇත.

(vi) කල්බදු හා මූල්‍ය කල්බදු

විශ්වවිද්‍යාලයේ හිමිකමට අදාළ සැලකියයුතු සියලුම අවදානම් සහ ප්‍රතිලාභ කල්බදු යන්නෙන් මෙහිදී අදහස් වේ. මූලික හඳුනා ගැනීම මත දේපල, පිරියත හා උපකරණ ඒවායේ සාධාරණ මිල හෝ අවම කල්බදු මිල යන දෙකෙන් අවම මිලට ගණනය කරනු ලබයි.මූලික හඳුනාගැනීමෙන් පසු එම වත්කමට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය මත එම වත්කම ගණනය කරනු ලැබේ.

මූල්‍ය කල්බදු යටතේ එන අවම ගෙවීම් මූල්‍ය වියදම් සහ උපචිත වගකීම් අතර බෙදීයයි. කල්බදු කාලය තුළ වගකීමේ ශේෂය සඳහා ස්ථාවර පොලී වාරික අනුපාතයක් පවත්වා ගතහැකි පරිදි මූල්‍ය වියදම කාල වකවානු අතර බෙදනු ලැබේ

වර්ෂය තුළ විශ්වවිද්‍යාලය විසින් රු. 2,611,812 කල්බදු ලෙස ගෙවන ලදී.

(vii) පරිශ්‍ර නඩත්තුව

විශ්වවිද්‍යාලය සතුව වරින්වර සමාලෝචනයට ලක්වන නඩත්තු සැලසුමක් පවතින අතර දැනට සිදු වෙමින් පවතින නඩත්තු කටයුතු සිදුවන්නේ ඒ අනුවය. නඩත්තු වියදම ආදායම් හා වියදම් ගිණුමට යොමුකෙරේ.

(viii) පුස්තකාල පොත්

පුස්තකාල පොත්වල මිල වසර පහක කාලයක් තුළ සරල රේඛා පදනම මත කපා හැර ඇති අතර සම්පූර්ණයෙන්ම ක්ෂය වූ පොත් නැවත ප්‍රකාශ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ix) පරිගණක සහ උපාංග නැවත වර්ගීකරණය

2022 ජනවාරි *1* වැනි දිනට පෙර පරිගණක සහ උපාංග විද්‍යාගාර ඉගැන්වීමේ උපකරණ සහ කාර්යාල සහ ගෘහ භාණ්ඩ යනුවෙන් කාණ්ඩ දෙකක් යටතේ වර්ගීකරණය කර තිබිණි. *2022* වර්ෂයේදී කාර්යාලීය ගෘහභාණ්ඩ උපකරණ යටතේ වර්ගීකරණය කර ඇති සියලුම වත්කම් ඉවත් කර වසර *5*ක ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ කාණ්ඩය යටතේ සියලුම පරිගණක සහ උපාංග නැවත වර්ගීකරණය කරන ලද රුපියල් *146.9* ක මුදල රසායනාගාර සහ ඉගැන්වීම් උපකරණ කාණ්ඩයට මාරු කර ඒ අනුව සමුච්චිත ක්ෂයවීම් සකස් කරන ලදී.

3.2.3 කෙරෙමින් පවතින වැඩ

කෙරෙමින් පවතින වැඩවල ප්‍රගතිය හානි හැර පිරිවැය මත ප්‍රකාශ කර ඇත. මේවා ප්‍රාග්ධනීකරණය සඳහා බලාපොරොත්තු වන දේපල, පිරියත සහ උපකරණ ඉදිකිරීම සඳහා සෘජුවම දරනු ලබන ප්‍රාග්ධන ස්වභාවයක වියදම් වේ. කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් භාවිත කළ හැකි තත්වයට පත්වූ විට දේපල, පිරියත සහ උපකරණවල අදාළ වත්කම් කාණ්ඩයට මාරු කරනු ලැබේ. එනම් එය විශ්වවිද්‍යාලය විසින් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වීමට උචිත පිහිටීමක සහ අනෙකුත් තත්වයන් යටතේ පවතින විටදීය. ස්ථාවර වත්කම් වලට එකතු කිරීමේ කොටසක් තුළ මූල්‍ය පිරිවැය ප්‍රාග්ධනීකරණය වී නොමැත.

3.3 ජංගම බැරකම්

ශේෂ පත්‍රයෙහි වර්ගීකරණය කරන ලද ජංගම බැරකම් ශේෂ පත්‍ර දිනෙන් පසු වසරක් ඇතුළත පියවා ගනු ලබන වත්කම් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම ගම්‍ය වත්කම් සැලකිල්ලට ගෙන ඇත.

අ.) ණයගැතියන් සහ උපචිත වියදම්

ණයගැතියන් සහ වියදම් ගණනය කිරීම සාධාරණ වටිනාකම මත සිදුකරනු ලබන අතර එලදායී පොලී අනුපාතය මත ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබිණි.

ආ) විලම්බිත ආදායම

මාස කිහිපයක කාල සීමාවක් පුරා ක්‍රියාත්මක වන පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන්වලට අදාළ ඉන්වොයිසි පාඨමාලාව මුලදී අයකරගත්විට විලම්බිත ආදායම් ජනනය වේ. විලම්බිත ආදායම පාඨමාලාව ක්‍රියාත්මක වූ ප්‍රමාණය දක්වා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනෙන අතර ආදායම හඳුනා ගන්නා තෙක් ඉතිරිව ඇති කාල සීමාව සඳහා ආරෝපණය කළ යුතු ශේෂය මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ වගකීමක් ලෙස හඳුනා ගැනේ.

3.4 ජංගම නොවන බැරකම්

අ.) සේවක ප්‍රතිලාභ - විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

සේවක නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම යනු නිර්වචනය කරන ලද දායක සැලැස්මක් හැර පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. ස්වාධීන ආයුගණකඥවරයකු විසින් ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය භාවිතා කරමින් නිර්වාචිත ප්‍රතිලාභ ගණනය කරනු ලබයි. නිර්වාචිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලා ඒම වට්ටම් කිරීමෙනි. ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලින් නියම කර ඇති පොලී අනුපාත භාවිතා කරමින් සහ අදාළ වගකීම්වල නියමයන්ට ආසන්න වශයෙන් පරිණතභාවයට කොන්දේසි ඇත. නිර්වාචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම රඳා පවතින්නේ වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක සහ මරණ අනුපාත පිළිබඳ උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ක්‍රියාකාරී පදනමක් මත තීරණය වන සාධක ගණනාවක් මත ය. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය නිසා, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට පත්වේ.

සෑම උපකල්පනයක්ම වාර්තා කරන දිනයකදී සමාලෝචනය කෙරේ. ඒ අනුව, සේවක ප්‍රතිලාභ වගකීම පදනම් වී ඇත්තේ 2022 දෙසැම්බර් 31 දින වන විට ආයුගණක තක්සේරුව මත ය. පාරිතෝෂිකය සඳහා වන විශ්ව විද්‍යාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය නම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී ඒවා සම්පූර්ණයෙන්ම සිදුවන කාල පරිච්ඡේදය තුළ ක්‍රියාකාරී වාසි සහ අලාභ හඳුනා ගැනීමයි.

ආ.) නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

අදාළ ප්‍රඥප්ති හා රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයෝ සුදුසුකම් ලබති. මෙය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගෙන ඇත. සේවකයින්ගේ දළ වැටුප් වලින් 7%, 8% සහ 3% ප්‍රමාණයන්ගෙන් පිළිවෙලින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්ව විද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලය දායක වේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සේවකයෝ ද 10% ක දායකත්වයක් ලබා දෙති. කෙසේ වෙතත් වැඩිදුර මුදල් ගෙවීමට නීත්‍යානුකූල හෝ සාධනීය බැඳීමක් නොමැත. මෙම බැඳීම රැකියා ප්‍රතිලාභ පිළිබඳ SLPSA 19 අර්ථ දක්වා ඇති දායකත්ව සැලැස්මේ විෂය පථයට අයත් වේ. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ අදාළ සේවාව සපයන බැවින් දායක සැලැස්ම නිර්වචනය කිරීමට දායක වීමේ වගකීම හඳුනාගෙන ඇත.

3.5 සංචිත සහ සීමිත අරමුදල්

අරමුදල්, ප්‍රදාන සහ සංචිත ලැබීම් සහ භාවිතය සඳහා ගිණුම්කරණය.

විශ්වවිද්‍යාලයට විශේෂිත සංවර්ධන කියාකාරකම්. ශිෂ්‍ය කියාකාරකම්, පරිත්‍යාග යනාදිය සඳහා විවිධ ප්‍රදාන ලැබිණි. අරමුදල්,

කොළඹ විශ්වවිද්‍යාලය – ගිණුම්කරණ ප්‍රතිපත්ති ර්ගීකරණය කර ඇත.

අ.) පරිත්‍යාග අරමුදල්

වත්කම් නොසිඳී ඇති වත්කමක් ලෙස ලැබෙන විට, එම වත්කම් වලින් උපයන ලද ආදායම පමණක් හඳුනාගෙන ආදායමක් ලෙස භාවිතා කළ හැකිය.
ඉහත එක් එක් කාණ්ඩ යටතේ ලබා ගත හැකි අරමුදල්වලින් ලැබෙන ආදායම සහ අනෙකුත් ලාභ.

ආ.) නම් කරන ලද නිශ්චිත අරමුදල්

ක්‍රියාකාරකම්වල වියදම්වලට වඩා ආදායමේ අතිරික්තය සාමාන්‍යයෙන් ගණනය කරනු ලබන්නේ විශ්වවිද්‍යාල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නම් කරන ලද පොදු අරමුදල් යටතේ ය. නම් කරන ලද පොදු අරමුදල් අතර විශ්ව විද්‍යාලයේ පීඨ, දෙපාර්තමේන්තු සහ ස්වයං මූල්‍ය කටයුතු වැනි සැලසුම් සහගත මෙහෙයුම් කටයුතු වැනි නිශ්චිත හෝ කැපවූ අරමුණු සඳහා වෙන් කර ඇති අරමුදල් ඇතුළත් වේ.

3.6 කොටස්

අ.) ප්‍රාග්ධන ප්‍රදාන

රජයේ ප්‍රාග්ධන ප්‍රදානය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් *11* අනුව හඳුනා ගැනේ.

විශ්වවිද්‍යාලයේ භාවිතය සඳහා පරිත්‍යාග කරන ලද ක්ෂය නොවන ස්ථාවර වත්කම් හැර පරිත්‍යාග කරන ලද අස්පෘෂ්‍ය ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති *11* ට අනුව අගය කොට ගිණුම්ගත කරනු ලැබේ.

ආ.) පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන මුදල් පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගනු ලබන අතර විනිමය නොවන ගනුදෙනු වෙතින් ආදායමක් ලෙස සලකනු ලැබේ.

4. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් සහ ආයෝජන ක්‍රියාකාරකම්වල දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගෙන ඇති *SLPSAS* වලට අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත. මූල්‍ය හා මූල්‍ය පර්යාය කෙටි කාලීන, අධික ද්‍රවශීල ආයෝජනයක් වන අතර ඒවා දන්නා මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි අතර වටිනාකමේ වෙනස්වීම්වල නොසැලකිය යුතු අවදානමකට යටත් වේ.

5. බදු

5.1 ආදායම් බදු

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව සහ එහි සංශෝධනවලට අනුව විශ්වවිද්‍යාල ව්‍යතිරේක සංවිධානයක් ලෙස සලකන බැවින්සාමාන්‍ය ව්‍යාපාරයක් මෙන් ආදායම මත ආදායම් බද්ද ගෙවීමට කොළඹ විශ්වවිද්‍යාලය බැඳී නැත

5.2 අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT)/ අත්තිකාරම් ආදායම් බදු

විශ්වවිද්‍යාලය සේවකයාගේ කැමැත්ත පරිදි ප්‍රාථමික ආදායම සහ ද්විතියික ආදායම මත අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද (*APIT)* අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අඩු කළ මුදල ප්‍රේෂණය කරයි.

5.3 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL)

කොළඹ විශ්වවිද්‍යාලය සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවිය යුතු වේ. ඒ අනුව, *2022-01-10-2022* සිට *31-12-2022* දක්වා කාලය සඳහා ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බදු ලෙස විශ්ව විද්‍යාලය රුපියල් *4,561,867* ලබා දී ඇත.

5.4 මුද්දර ගාස්තු

මුද්දර ගාස්තු පනතට අනුව ගෙවීම් මත මුද්දර ගාස්තු අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අඩු කළ අගයන් ප්‍රේෂණය කෙරෙයි.

කොළඹ විශ්වවිද්‍යාලය රටේ බදු නීතිවල වෙනස්කම්වලට අනුකූල වන අතර ඒ අනුව බදු අය කෙරේ.

සටහන 01	2022	2021
වෙනත් ප්‍රදාන	(රු.)	(රු.)
පර්යේෂණ ශක්තිමත් කිරීම	8,422,724	12,067,112
වි.වි.ප්‍ර.කොා වෙතින් ප්‍රදානය - අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා	5,000,000	-
පුනරුත්ථාපන වියදම් සඳහා රජයේ ප්‍රදානය	13,500,234	40,333,589
පුනරුත්ථාපන වියදම්- සංවර්ධන අරමුදල්	5,571,602	-
AHEAD ව්‍යාපෘතිය	192,952,376	78,836,542
එකතුව	**225,446,936**	**131,237,243**

සටහන 02	2022	2021
අභ්‍යන්තර ආදායම - විනිමය නොවන ගනුදෙනු	(රු.)	(රු.)
පුස්තකාල දඩ	107,337	197,110
සංවර්ධන අරමුදල් වලින් පුනරාවර්තන ආදායමට මාරු කිරීම	4,868,457	-
ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උපයෝගිතා ගාස්තු	9,453,909	7,534,698
බැඳුම්කර කඩ කිරීමෙන් ලැබෙන ආදායම	47,730,895	10,583,634
එකතුව	**62,160,598**	**18,315,442**

සටහන 03	2022	2021
අභ්‍යන්තර ආදායම - විනිමය ගනුදෙනු	(රු.)	(රු.)
ලියාපදිංචි ගාස්තු - ප්‍රථම උපාධි අපේක්ෂකයන්	10,559,574	9,538,109
ලියාපදිංචි ගාස්තු - පශ්චාත් උපාධි අපේක්ෂකයන්	1,276,547	1,011,000
විභාග ගාස්තු-ප්‍රථම උපාධි අපේක්ෂකයන්	3,460	7,875
විභාග ගාස්තු -පශ්චාත් උපාධි අපේක්ෂකයන්	263,500	447,003
පංති ගාස්තු -ප්‍රථම උපාධි අපේක්ෂකයන්	177,587,062	87,205,266
පංති ගාස්තු -පශ්චාත් උපාධි අපේක්ෂකයන්	1,357,000	14,331,500
ණය සහ අත්තිකාරම් වලින් පොලී	6,191,029	6,288,702
ආයෝජන වලින් පොලී	443,887,255	141,460,579
ප්‍රකාශන විකුණුම්	74,800	-
දේපල වලින් කුලී	3,356,249	3,655,948
වෛද්‍ය ගාස්තු	74,700	71,350
සවිස්තර විභාග සහතිකපත් ගාස්තු- පශ්චාත් උපාධි අපේක්ෂකයන්	6,944,477	5,595,135
සවිස්තර විභාග සහතිකපත් ගාස්තු-ප්‍රථම උපාධි අපේක්ෂකයන්	1,990,889	1,665,456
ශිෂ්‍ය හැඳුනුම්පත් ගාස්තු	131,250	49,650
උපාධි ප්‍රදාන උත්සව ගාස්තු- ප්‍රථම උපාධි අපේක්ෂකයන්	25,443,200	8,192,000
අනුබද්ධ ක්‍රියාකාරකම්	7,337,500	1,068,955
විවිධ ලැබීම්	35,419,713	31,848,986
ටෙන්ඩර් ගාස්තු	1,175,000	1,622,500
විනිමය ලාභ	31,598,323	2,663,000
ව්‍යාජ්ති පාඨමාලා වලින් ලැබෙන ආදායම	1,476,284,748	760,677,944
පර්යේෂණ වලින් ලැබෙන ආදායම - බාහිර	177,771,940	148,442,087
මධ්‍යස්ථාන වලින් ලැබෙන ආදායම	42,210,551	19,710,780
නම්කළ අරමුදල් වලින් ලැබෙන ආදායම	338,535,614	217,627,485
පරිත්‍යාග අරමුදල් වලින් ලැබෙන ආදායම	2,283,890	2,339,416

එකතුව			**2,791,758,271**			**1,465,520,726**

සටහන 04 **පුනරාවර්තන වියදම**	භාණ්ඩාගාර	භාණ්ඩාගාර නොවන	**2022** **(රු.)**	භාණ්ඩාගාර	භාණ්ඩාගාර නොවන	**2021** **(රු.)**
වැටුප් සහ වේතන - අධ්‍යයන						
වැටුප් සහ වේතන	936,229,382	27,929,735	964,159,117	906,144,150	19,430,026	925,574,176
වි.වි.අ. අරමුදල	218,068,140	72,465	218,140,605	211,620,081	132,301	211,752,382
සේ.නි.භාර අරමුදල-හිඟ	-	299,207	299,207	-	-	-
විශ්‍රාම වැටුප්	118,372,852	-	118,372,852	112,907,992	-	112,907,992
සේ.අර්. අරමුදල	67,069,545	55,751	67,125,296	65,095,590	19,845	65,115,435
වැඩ බැලීමේ දීමනා	248,435	-	248,435	2,806	-	2,806
අධ්‍යයන දීමනා	1,209,282,443	-	1,209,282,443	1,170,186,898	-	1,170,186,898
සමකරණ දීමනා	171,120	-	171,120	773,766	-	773,766
බාහිර කථිකාචාර්ය දීමනා	28,355,413	169,595,257	197,950,670	22,122,680	143,879,967	166,002,647
ජීවන වියදම් දීමනා	88,165,091	-	88,165,091	86,412,279	-	86,412,279
දීමනා	15,000	15,776,710	15,791,710	-	19,382,909	19,382,909
වෙනත් දීමනා	17,584,834	85,055,219	102,640,053	9,749,832	51,691,762	61,441,594
පර්යේෂණ දීමනා	269,636,304	-	269,636,304	264,929,041	-	264,929,041
20% දීමනා	161,230,965	-	161,230,965	158,395,456	-	158,395,456
සංග්‍රහ දීමනා	-	738,956	738,956	-	-	-
ගැලපුම් දීමනා	4,677	-	4,677	-	-	-
5000 මාසික දීමනාව	55,004,523	8,675,997	63,680,520	-	-	-
ස්ථිර නොවන වැටුප්	401,028	-	401,028	1,605,944	-	1,605,944
මුළු එකතුව	**3,169,839,753**	**308,199,296**	**3,478,039,049**	**3,009,946,516**	**234,536,810**	**3,244,483,326**
වැටුප් සහ වේතන - අනධ්‍යයන						
වැටුප් සහ වේතන	554,671,108	85,540,588	640,211,697	548,016,574	78,091,103	626,107,677
වි වි.වි.අ. අරමුදල	78,709,103	8,279,007	86,988,109	78,394,262	7,558,949	85,953,211
විශ්‍රාම වැටුප	56,303,407	-	56,303,407	53,492,808	-	53,492,808
සේ.අර්. අරමුදල	27,229,990	1,969,729	29,199,719	26,189,407	1,562,437	27,751,844
වැඩ බැලීමේ දීමනා	482,667	-	482,667	48,855	-	48,855
අතිකාල	53,668,552	10,586,956	64,255,508	31,486,589	2,673,884	34,160,473
නිවාඩු දීමනා	380,691	-	380,691	231,130	-	231,130
ජීවන වියදම් දීමනා	106,437,646	-	106,437,646	104,028,829	-	104,028,829
දීමනා	-	1,961,800	1,961,800	-	4,935,946	4,935,946
වෙනත් දීමනා	8,994,642	51,470,691	60,465,333	4,390,044	23,650,832	28,040,876
සමකරණ දීමනා	128,535	-	128,535		-	-
20% දීමනා	130,735,069	-	130,735,069	179,204,575	-	179,204,575
අන්තර් දීමනා	-		-	189,510		189,510
පර්යේෂණ දීමනා	6,451,070		6,451,070	5,936,900		5,936,900
ගැලපුම් දීමනා	-	-	-	363	-	363
M C A 35% දීමනාව	227,681,771	-	227,681,771	164,965,977	-	164,965,977
5000 මාසික දීමනාව	64,446,309	-	64,446,309	-	-	-
එකතුව	**1,316,320,561**	**159,808,771**	**1,476,129,332**	**1,196,575,822**	**118,473,151**	**1,315,048,973**
මුළු පෞද්ගලික වැටුප්	**4,486,160,314**	**468,008,067**	**4,954,168,381**	**4,206,522,338**	**353,009,961**	**4,559,532,298**
ප්‍රවාහනය						
දේශීය	538,806	26,317,041	26,855,847	593,492	7,271,629	7,865,121
විදේශීය	801,793	8,448,002	9,249,795	1,981,037	496,370	2,477,407
මුළු එකතුව	**1,340,599**	**34,765,043**	**36,105,641**	**2,574,529**	**7,767,999**	**10,342,528**
සැපයුම් සහ අවශ්‍යතා						
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	31,566,786	18,326,547	49,893,332	24,414,282	15,393,889	39,808,171
ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	19,786,409	-	19,786,409	12,675,234	18,000	12,693,234
නිල ඇඳුම්	4,940,275	-	4,940,275	4,095,909	-	4,095,909
යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ	2,197,224	-	2,197,224	601,364	-	601,364
රසායනික ද්‍රව්‍ය සහ පාරිභෝගික භාණ්ඩ	13,165,908	7,180,917	20,346,825	10,710,110	14,235,386	24,945,496

වෛද්‍ය සැපයුම්	535,611	24,139,426	24,675,037	1,809,124	8,899,522	10,708,646
වෙනත්	16,304,046	46,081,845	62,385,891	18,555,762	26,250,422	44,806,184
මුළු එකතුව	**88,496,257**	**95,728,735**	**184,224,993**	**72,861,784**	**64,797,219**	**137,659,004**
වත්කම් නඩත්තු වියදම්						
වාහන	13,013,718	-	13,013,718	11,317,380	-	11,317,380

සටහන 04 **පුනරාවර්තන වියදම්**	භාණ්ඩාගාර	භාණ්ඩාගාර නොවන	**2022** **(රු.)**	භාණ්ඩාගාර	භාණ්ඩාගාර නොවන	**2021** **(රු.)**
පිරියත, යන්ත්‍ර සහ උපකරණ	30,533,834	4,686,988	35,220,823	22,633,765	5,378,843	28,012,608
ගොඩනැගිලි සහ ඇකිලි	24,350,823	8,849,005	33,199,828	17,470,753	1,382,511	18,853,264
ගෘහභාණ්ඩ	140,288	-	140,288	69,275	-	69,275
වෙනත්	10,054,067	8,922,931	18,976,997	6,843,701	1,768,095	8,611,796
මුළු එකතුව	**78,092,730**	**22,458,924**	**100,551,654**	**58,334,874**	**8,529,449**	**66,864,323**
කොන්ත්‍රාත් සේවා						
ප්‍රවාහනය	8,775,095	4,847,639	13,622,734	12,022,582	2,315,653	14,338,235
විදුලි සංදේශන	44,157,107	14,109,982	58,267,088	40,218,704	3,423,904	43,642,607
තැපැල් ගාස්තු	1,784,779	1,589,240	3,374,020	1,588,491	348,357	1,936,848
විදුලිය	116,386,511	3,195,406	119,581,917	64,838,835	-	64,838,835
ආරක්ෂක සේවා	100,359,047	4,600,182	104,959,230	40,101,361	423,621	40,524,982
ජලය	27,538,555	456,864	27,995,419	17,014,642	4,590	17,019,232
පවිත්‍රතා සේවා	106,183,281	2,839,944	109,023,225	98,740,654		98,740,654
වාරික සහ බදු කුලී	5,958,125	3,023,644	8,981,769	12,526,387	3,760,934	16,287,321
වරිපනම් සහ බදු පළාත්පාලන ආයතන සඳහා	4,559,598	6,835,279	11,394,877	3,876,387	-	3,876,387
මුද්‍රණය සහ ප්‍රචාරණය	13,212,645	5,724,433	18,937,079	12,405,644	4,516,701	16,922,345
වෙනත්	1,473,441	1,931,250	3,404,691	932,757	4,853,176	5,785,933
එකතුව	**430,388,186**	**49,153,863**	**479,542,049**	**304,266,444**	**19,646,935**	**323,913,379**
වෙනත් සේවා						
විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ප්‍රවාහන දීමනා	-	-	-	-	35,000	35,000
විශේෂ සේවා පාලක සභාව හා කමිටු	4,970,303	-	4,970,303	3,945,112	-	3,945,112
විශේෂ සේවා- වෘත්තිය සහ වෙනත්	11,327,164	6,832,158	18,159,323	12,929,202	1,395,034	14,324,236
වැඩමුළු, සම්මන්ත්‍රණ හා රැස්වීම්	424,939	57,213,242	57,638,181	90,500	23,024,249	23,114,749
ශාස්ත්‍රීය පර්යේෂණ	390,067	4,448,453	4,838,520	683,685	2,470,488	3,154,173
දේශීය පුහුණු සේවා (කාර්ය මණ්ඩල සංවර්ධන)	1,851,825	121,083	1,972,908	2,220,405	-	2,220,405
පශ්චාත් උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව	184,441	-	184,441	13,292	140,146	153,438
ශිෂ්‍යයන් සහ ඉගෙනීමේ ගුණාත්මක සංවර්ධනය සඳහා පාඨමාලා ද්‍රව්‍ය	1,062,950	1,057,000	2,119,950	1,529,890	-	1,529,890
කර්මාන්ත සීමාවාසික පුහුණුව, ප්‍රායෝගික හා වෘත්තීය මාර්ගෝපදේශ	191,038	-	191,038	20,000	-	20,000
ශිෂ්‍ය සංවර්ධන පියවර සහ ප්‍රජා සම්බන්ධතා	7,037,037	-	7,037,037	1,408,771	-	1,408,771
විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතු	1,928,722	-	1,928,722	33,500	-	33,500
ශිෂ්‍ය සුබ සාධන, සේවක සුබ සාධන, ශිෂ්‍ය සභා සහ සමාජ සංහිඳියා	7,551,600	42,394,542	49,946,142	2,445,300	30,612,258	33,057,558
නිවාඩු බලපත්‍ර	11,588,311	-	11,588,311	3,405,430	-	3,405,430
සංග්‍රහ වියදම්	5,804,779	33,027,430	38,832,209	4,146,342	3,614,395	7,760,737
බැංකු ගාස්තු	74,324	-	74,324	51,133	-	51,133

ත්‍යාග සහ වන්දි පරිත්‍යාග	860,500	1,520,090	2,380,590	159,591	644,750	804,341
දායකත්ව සහ සාමාජික ගාස්තු	1,793,785	4,085,848	5,879,633	2,875,950	24,349,751	27,225,701
උපාධි ප්‍රදානෝත්සවය	16,486,672	258,650	16,745,322	7,641,998	-	7,641,998
විභාග වියදම	41,672,867	78,130,506	119,803,373	30,828,686	51,379,880	82,208,566
ව්‍යාජ්ති පාඨමාලා / පශ්චාත් උපාධි පාඨමාලා සඳහා වියදම්	-	1,723,656	1,723,656	-	-	-
වෙනත්	7,807,358	35,710,555	43,517,914	6,778,241	10,901,700	17,679,941
නේවාසිකාගාර ශිෂ්‍යාධාර	472,000	-	472,000	-	-	-

සටහන 04 පුනරාවර්තන වියදම	භාණ්ඩාගාර	භාණ්ඩාගාර නොවන	**2022 (රු.)**	භාණ්ඩාගාර	භාණ්ඩාගාර නොවන	**2021 (රු.)**
දේපල ණය සඳහා පොලී සහනාධාර	2,827,283	-	2,827,283	4,884,401	-	4,884,401
කල්බදු පොලී	625,990	-	625,990	850,243	-	850,243
එකතුව	**126,933,957**	**266,523,213**	**393,457,170**	**86,941,671**	**148,567,650**	**235,509,321**
වෙනත් පුනරාවර්තන වියදම් එකතුව	**725,251,730**	**468,629,778**	**1,193,881,508**	**524,979,302**	**249,309,253**	**774,288,555**
මහපොළ, ශිෂ්‍යාධාර හා ශිෂ්‍යත්ව වියදම්						
ශිෂ්‍යාධාර	54,168,000	-	54,168,000	25,476,000	-	25,476,000
මහපොළ	190,000	-	190,000	-	-	-
විදේශීය සිසුන්ට ශිෂ්‍යත්ව	1,927,500	-	1,927,500	-	-	-
එකතුව	**56,285,500**	**-**	**56,285,500**	**25,476,000**	**-**	**25,476,000**
ප්‍රතිසංස්කරණ පුනරාවර්තන වියදම්	**19,071,837**	**5,270,202**	**24,342,039**	**44,158,162**	**3,689,972**	**47,848,134**
එකතුව	**5,286,769,381**	**941,908,047**	**6,228,677,428**	**4,801,135,802**	**606,009,186**	**5,407,144,988**

සටහන 05 පුනරාවර්තන වියදම - AHEAD ව්‍යාපෘතිය	**2022 (රු.)**	**2021 (රු.)**
	20,449,312	
වැටුප් සහ වේතන		27,290,390
සේ. අර්. අර.	4,396,764	4,929,546
සේ.අර්. අරමුදල	659,515	739,408
දීමනා	561,629	3,905,076
ප්‍රවාහන දේශීය	857,482	717,542
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	827,310	92,154
යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ	-	15,377
රසායනික ද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය	9,179,555	4,522,674
වෙනත් සැපයුම්	80,815,544	2,903,123
පිරියත සහ නඩත්තුව	388,366	257,975
විදුලි සංදේශ	3,278,528	17,013
මුද්‍රණය සහ ප්‍රචාරණය	895,804	602,315
විශේෂ සේවා - වෘත්තීය සහ වෙනත්	5,593,545	6,438,204
වැඩමුළු, සම්මන්ත්‍රණ සහ රැස්වීම්	4,270,930	1,198,002
පුහුණු සේවා දේශීය (කාර්ය මණ්ඩල සංවර්ධන)	-	175,197
කාර්ය මණ්ඩල සංවර්ධනය	185,525	-

පශ්චාත් උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව		54,690,381			24,762,743
වෙනත්		5,902,187			269,804
එකතුව		**192,952,376**			**78,836,542**

සටහන 06 **මූල්‍ය හා මූල්‍ය පර්යාය**	**2022** **(රු.)**	**2021** **(රු.)**
සංක්‍රමණය වන මුදල්	1,660,557	5,252,833
භාණ්ඩාගාර අරමුදල්		
මුදල් පොත - 086-100-1911-89654	2,257,598	1,106,001
මුදල් පොත - 1001-9317-0314	5,503,271	8,927,755
මුදල් පොත - 1004-100-1802-10864	7,652,984	161,668
මුදල් පොත - 086-100-1711-89650	8,918,650	12,199,493
මුදල් පොත - 0000719973	116,807	218,953
මුදල් පොත - 041-1-001-4-0084742	4,087,232	-
මුදල් පොත - 0000719972	909,568	2,179,772
භාණ්ඩාගාර නොවන අරමුදල්		
මුදල් පොත - 086-100-1011-89762	20,000	20,000
මුදල් පොත - 086-100-1811-89659	21,729,417	3,815,244
මුදල් පොත - 086-100-1411-89661	6,420,970	7,292,286
මුදල් පොත - 00008049142	3,272,784	2,529,009
මුදල් පොත - 167-1001-1317-0313	202,956	4,621,520
මුදල් පොත - 086-100-1611-89655	12,384,735	3,503,543
මුදල් පොත -086-100-1611-89660	55,422,824	13,412,171
මුදල් පොත -086-100-1111-89691	864,577	864,577
මුදල් පොත - 086-100-1311-89666	7,265,007	7,101,327
මුදල් පොත - 086-100-1300-13550	6,065,117	11,002,832
මුදල් පොත - 086-2-001-7-0210864	85,739	-
මුදල් පොත - 086-200-1711-89654	5,203,602	1,834,296
මුදල් පොත - 167-2001-7317-0314	3,668,351	401,746
මුදල් පොත - 167-2001-9317-0313	2,004,174	636,943

ඉතුරුම් ගිණුම්

මුදල් පොත- RFC ගිණුම

	50,872,321	36,077,809
ආයෝජන තෙමස් ස්ථාවර තැන්පතු		
	13,160,685	5,549,435
එකතුව	**219,749,925**	**128,709,212**

සටහන 07 අත්තිකාරම් සහ ලැබියයුතු	ජංගම	ජංගම නොවන	2022 (රු.)	ජංගම	ජංගම නොවන	2021 (රු.)
ප්‍රාග්ධන සැපයුම් සඳහා අත්තිකාරම්	-	-	-	10,356,195	1,083,450	11,439,645
පුස්තකාල පොත් සඳහා අත්තිකාරම්	-	-	-	2,609,618	83,333	2,692,951
රැස්කිරීම් අත්තිකාරම්	25,478,117	48,534,441	74,012,558	-	146,334,537	146,334,537
විදේශ සැපයුම් සඳහා අත්තිකාරම් ගෙවීම	-	-	-	52,929	-	52,929
පර්යේෂණ අත්තිකාරම්	1,265,502	75,000	1,340,502	1,826,789	75,000	1,901,789
විවිධ අත්තිකාරම්	7,634,492	-	7,634,492	1,052,653	-	1,052,653
විභාග වියදම් අත්තිකාරම්	17,600	-	17,600	48,100	-	48,100
ලැබිය යුතු ආදායම් ගිණුම්	125,000	-	125,000	144,000		144,000
විවිධ ණය ගැතියන්	1,973,314	-	1,973,314	4,749,289	-	4,749,289
තැන්පතු ගෙවීම්	2,495,000	21,690,603	24,185,603	261,000	21,179,603	21,440,603
ලැබිය යුතු පොලී	278,477,080	-	278,477,080	44,528,200	-	44,528,200
වි.වි.ප්‍ර.කො. වෙතින් ලැබිය යුතු ශිෂ්‍යාධාර	18,320,000	-	18,320,000	1,528,000	-	1,528,000
ප්‍රාග්ධන සැපයුම් සඳහා අත්තිකාරම්	7,268,912	-	7,268,912	5,597,141	200,000	5,797,141
පුස්තකාල පොත් සඳහා අත්තිකාරම්	8,643,058	-	8,643,058	-	-	-
වෙනත් ගිණුම්කරණ ඒකක වලින් ලැබිය යුතු	766,166	-	766,166	594,884	-	594,884
වි.වි.ප්‍ර.කො. වෙතින් ලැබිය යුතු	85,485	-	85,485	22,655	-	22,655
පරිභෝජන භාණ්ඩ සඳහා ලැබිය යුතු	4,974,214	-	4,974,214	656,225	2,811,644	3,467,869
තැපැල් තැන්පතු	3,959,013	-	3,959,013	2,593,696	-	2,593,696
වෙනත් ආයතනවලින් ලැබිය යුතු	9,709,572	-	9,709,572	8,557,155	-	8,557,155
ලැබිය යුතු වෙනත් ඉපැයීම්	-	981,550	981,550	-	981,550	981,550
පෙර ගෙවීම්	-	5,000,000	5,000,000	-	5,000,000	5,000,000
වෛද්‍ය ප්‍රදර්ශන ණය	-	608,975	608,975	-	608,975	608,975
කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයට ණය	-	-	-	97,284,414		97,284,414
බ්‍රිතාන්‍ය පුස්තකාලයට තැන්පතු ගෙවීම	-	-	-	-	8,980	8,980
අතිරේක බඳවා ගැනීම් සඳහා AHEAD වෙතින් ලැබිය යුතු	1,546,992	-	1,546,992	-	-	-
සේවකයින්ගෙන් ලැබිය යුතු	4,654,133	-	4,654,133	-	-	-
Secondmet නිකුතුවෙන් ලැබිය යුතු	58,243	-	58,243	-	-	-
CeDARC වෙතින් ලැබිය යුතු	710,068,732	-	710,068,732	719,554,719	-	719,554,719
එකතුව	**1,087,520,624**	**76,890,570**	**1,164,411,194**	**902,017,660**	**178,367,073**	**1,080,384,733**

සටහන **08** **ආයෝජන**	**2022** **(රු.)**	**2021** **(රු.)**
ජංගම		
ආයෝජන විශේෂ දීමනා	18,000,000	-
ආයෝජන	155,389,332	135,576,866
පරිත්‍යාග අරමුදල් ආයෝජන	206,251	201,191
එකතුව	**173,595,583**	**135,778,057**
ජංගම නොවන		
සුරක්ෂණ තැන්පතු	395,657	213,047
ආයෝජන විශේෂ දීමනා	130,000,000	209,465,955
ආයෝජන	2,531,234,966	2,514,730,401
පරිත්‍යාග අරමුදල් ආයෝජන	209,855,849	196,943,188
එකතුව	**2,871,486,472**	**2,921,352,591**

සටහන **09** **කාර්ය මණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම්**	**2022** **(රු.)**	**2021** **(රු.)**
උත්සව අත්තිකාරම්	536,750	243,750
කාර්ය මණ්ඩල ණය	410,118	436,084
ආපදා ණය	145,764,728	142,709,319
ප්‍රවාහන ණය	2,443,182	2,429,292
පරිගණක ණය	2,051,869	1,829,500
විශේෂ අත්තිකාරම්	27,300	24,900
එකතුව	**151,233,947**	**147,672,844**

සටහන **10** **අස්පෘශ්‍ය වත්කම්**	**2022** **(රු.)**	**2021** **(රු.)**
පිරිවැය		
වසර ආරම්භයේ ශේෂය	32,227,005	125,402,791
වර්ෂය තුළ නවීකරණ සහ එකතුකිරීම්	350,000	7,066,379
බැහැර කිරීම්	(438,187)	-
ගැලපුම්	-	(100,242,164)
වසර අවසානයේ ශේෂය	32,138,818	32,227,005
ක්‍රමක්ෂය		
වසර ආරම්භයේ ශේෂය	23,540,632	101,676,785
වසර සඳහා ක්‍රමක්ෂය	4,110,246	5,053,725
බැහැර කිරීම්	(438,187)	-
ගැලපුම්	(6,135,246)	(83,189,878)
වසර අවසානයේ ශේෂය	21,077,445	23,540,632
ශුද්ධ වටිනාකම	**11,061,373**	**8,686,373**

සටහන - 11
දේපළ, පිරියත හා උපකරණ

විස්තර	ඉඩම්	ගොඩනැගිලි	ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන	මෝටර් රථ	උපාධි ලෝගු	පරීක්ෂණාගාර සහ ඉගැන්වීම් උපකරණ	ඇමුණුම් සහ වැද්දුම්	ක්‍රීඩා භාණ්ඩ	එකතුව (රු.)
01.01.2022 දිනට ශේෂය	34,234,180,000	10,480,588,235	1,106,540,444	460,479,574	149,935,395	6,333,900	1,530,593,136	573,586,235	31,514,569	48,573,751,488
ආරම්භක ශේෂය සඳහා ගැලපුම්	-	-	(153,053,274)	-	-	-	146,906,454	6,146,820	-	-
වර්ෂය තුළ ගැලපුම්	-	(28,664)	1,697,094	-	-	-	-	(41,000)	-	1,627,429
වර්ෂය තුළ නවීකරණ සහ එකතුකිරීම්	-	8,460,604,510	173,237,150	3,330,596	-	3,940,650	385,673,609	320,289,647	6,552,499	9,353,628,662
වර්ෂය තුළ බැහැර කිරීම්	-	-	(12,652,283)	-	(9,850)	-	(17,653,183)	(1,804,165)	-	(32,119,481)
31.12.2022 දිනට ශේෂය	34,234,180,000	18,941,164,081	1,115,769,130	463,810,169	149,925,545	10,274,550	2,045,520,017	898,177,538	38,067,068	57,896,888,098
ක්ෂය අනුපාතය	0%	5%	10%	20%	20%	20%	20%	10%	25%	
01.01.2022 දිනට සමුච්චිත ක්ෂය ශේෂය	-	2,544,516,373	483,247,251	425,953,818	113,228,021	4,277,129	789,593,340	155,438,232	16,154,452	4,532,408,616
ආරම්භක ශේෂය සඳහා ගැලපුම්	-	-	(74,480,947)	-	-	-	74,429,723	51,224	-	-
වර්ෂය තුළ ගැලපුම්	-	(3,000)	90,764	-	-	-	-	-	-	87,764
වර්ෂය සඳහා ක්ෂය කිරීම්	-	776,012,168	132,140,327	14,371,848	21,275,233	1,182,987	328,532,079	75,591,647	7,235,029	1,356,341,319
අඩු: ප්‍රත්‍යාගණනය කළ වත්කම් මත ක්ෂය කිරීම්	-	-	(38,510,240)	-	(33,593,029)	(220,000)	(83,393,523)	(2,302,106)	(2,348,979)	(160,367,877)
අඩු: බැහැර කළ වත්කම් මත ක්ෂය කිරීම්	-	-	(10,144,805)	-	(9,850)	-	(15,682,692)	(1,568,105)	-	(27,405,452)
31.12.2022 දිනට සමුච්චිත ක්ෂය	-	3,320,525,541	492,342,349	440,325,666	100,900,376	5,240,116	1,093,478,927	227,210,892	21,040,502	5,701,064,370
31.12.2022 දිනට ශුද්ධ වත්කම	**34,234,180,000**	**15,620,638,541**	**623,426,780**	**23,484,503**	**49,025,169**	**5,034,433**	**952,041,090**	**670,966,646**	**17,026,566**	**52,195,823,728**

සටහන **12** **කෙරෙමින් පවතින වැඩ**	**2022** **(රු.)**	**2021** **(රු.)**
පූර්ව සායනික ඒකකය වෛද්‍ය පීඨය	-	5,970,290,536
හැව්ලොක් නේවාසිකාගාරය	7,311,265	1,382,796
සත්ව විද්‍යාව අ.අ.	13,898,025	-
නීති පීඨය- ප්‍රධාන ගොඩනැගිල්ල	4,316,540	764,943
ප්‍රේක්ෂකාගාරය	-	11,983,920
ශිෂ්‍ය සේවා මධ්‍යස්ථානය	320,985,767	243,067,164
අකුණු සහ ක්ෂෝභ ආරක්ෂණ පද්ධතිය - ශ්‍රීපාලි මණ්ඩපය	-	8,968,919
සහය කලාපය	482,828,139	255,702,161
පුස්තකාලය ශ්‍රීපාලි මණ්ඩපය	25,268,934	21,652,789
ඉන්ටකොම් පද්ධතිය	-	2,367,032
WIP- අකුණු ආරක්ෂණ පද්ධතිය	-	490,452
WIP- කාලිංග මාවත නේවාසිකාගාරය	200,000	-
එකතුව	**854,808,670**	**6,516,670,711**

සටහන 13 ගෙවිය යුතු	ජංගම	ජංගම නොවන	2022 (රු.)	ජංගම	ජංගම නොවන	2021 (රු.)
මුද්දර ගාස්තු	208,750	-	208,750	203,625	-	203,625
විවිධ ණය හිමියෝ	17,958,242	-	17,958,242	11,244,979	-	11,244,979
රඳවා ගැනීමේ ගිණුම	32,537,347	62,311,418	94,848,765	76,212,418	67,640,150	143,852,568
ගෙවීම් සඳහා ලැබූ මුදල්	26,109,479	8,116,715	34,226,194	16,090,702	9,634,099	25,724,801
වෙනත් ගිණුම් ඒකකවලට ගෙවියයුතු	4,833,735	-	4,833,735	5,291,174	-	5,291,174
ගෙවියයුතු සේ.භා. අරමුදල	4,613,280	-	4,613,280	3,122,879	-	3,122,879
ජලය/ විදුලිය සඳහා ගෙවිය යුතු	197,312	-	197,312	1,194,451	-	1,194,451
N.C.A.S. ගිණුම	335,768	-	335,768	-	-	-
ණය හිමියෝ	173,373,669	-	173,373,669	61,949,979	-	61,949,979
කල්බදු ණයකරු -BoC	2,611,812	1,490,888	4,102,700	1,985,824	4,102,698	6,088,522
ඉපයුම් මත බදු ගෙවිය යුතු	-	-	-	1,065,755	-	1,065,755
පූර්ව ආදායම් ලැබීම් ගිණුම	55,000	-	55,000	-	-	-
ගෙවියයුතු සේ.අර්. අරමුදල	604,905	-	604,905	9,744	-	9,744
විදේශ සිසු ශිෂ්‍යත්ව සඳහා ගෙවියයුතු	30,000	370,000	400,000	-	370,000	370,000
කො.වි.වි. ආදි විද්‍යාර්ථී නිවි සවුත්වෙල්ස් ශිෂ්‍යාධාර අරමුදල	95,000	-	95,000	-	-	-
උපයන විට ගෙවීමේ රැඳවුම් බද්ද	-	-	-	817,873	455,853	1,273,726
සමාජ ආරක්ෂණ දායක බද්ද	4,561,867	-	4,561,867			
ගෙවියයුතු පාරිතෝෂික	629,390	3,122,166	3,751,556	-	3,122,166	3,122,166
උපචිත වියදම්	203,577,040	-	203,577,040	127,790,124	-	127,790,124
ගෙවියයුතු VAT ගිණුම -තාක්ෂණ පීඨය	36,811	-	36,811	-	-	-
ටෙන්ඩර් තැන්පතු	537,100	-	537,100	353,000	37,500	390,500
විවිධ තැන්පතු	48,823	-	48,823	-	-	-
පුස්තකාල තැන්පතු	20,303,254	-	20,303,254	6,655,871	13,736,878	20,392,749
ආරක්ෂක තැන්පතු	474,141	-	474,141	218,408	-	218,408
නිදර්ශක තැන්පතු	2,036,000	-	2,036,000	-	-	-
උපාධි ලෝගු තැන්පතු	555,000	-	555,000	6,395,000	-	6,395,000
ගෙවිය යුතු ප්‍රමාද ගාස්තු ගිණුම - තාක්ෂණ පීඨය	-	1,684,167	1,684,167	1,684,167		1,684,167
එකතුව	**496,323,723**	**77,095,353**	**573,419,076**	**322,285,973**	**99,099,344**	**421,385,317**

සටහන **14**					
විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම				**2022 (රු.)**	**2021 (රු.)**
වසර ආරම්භයේ ශේෂය				1,523,030,458	1,518,483,078
එකතු කළා-:					
කාල සීමාව සඳහා පොලී පිරිවැය				175,148,503	121,478,646
අතීත සේවා පිරිවැය				20,302,981	-
කාල සීමාව සඳහා ජංගම සේවා පිරිවැය				92,618,399	89,742,959
ශුද්ධ ආයුගණක අලාභය/ (ලාභය)				(156,327,418)	(98,049,558)
ශුද්ධ එකතුව				**131,742,466**	**113,172,047**
වසර තුළ කළ ගෙවීම්				(86,185,604)	(108,624,669)
වසර අවසානයේ ශේෂය				**1,568,587,320**	**1,523,030,457**

සටහන **15** **සංචිත සහ සීමිත අරමුදල්**	**01.01.2022** දිනට ශේෂය	ලැබීම්	ගෙවීම්	මාරුකිරීම්	**31.12.2022** දිනට ශේෂය
කොළඹ විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල	403,055,646	133,051,583	244,934,055	5,104,692	286,068,482
පීඨ සංවර්ධන අරමුදල්	221,336,571	170,810,112	56,023,718	17,191,081	318,931,885
පුස්තකාල සංවර්ධන අරමුදල්	37,918,640	2,946,488	4,330,469	-	36,534,659
ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන අංශ සංවර්ධන අරමුදල්	72,215,419	3,752,003	5,750,877	320,802	69,895,744
වෛද්‍ය පීඨයේ අධ්‍යයන අංශ සංවර්ධන අරමුදල්	101,262,514	57,862,961	31,726,699	208,425	127,190,350
අධ්‍යාපන පීඨයේ අධ්‍යයන අංශ සංවර්ධන අරමුදල්	8,804,372	394,695	2,266,060	-	6,933,008
නීති පීඨයේ අධ්‍යයන අංශ සංවර්ධන අරමුදල්	52,316,802	13,762,624	6,263,968	46,000,000	13,815,458
විද්‍යා පීඨයේ අධ්‍යයන අංශ සංවර්ධන අරමුදල්	72,803,404	44,089,000	22,190,316	-	94,702,088
ශ්‍රීපාලී මණ්ඩප අධ්‍යයන අංශ සංවර්ධන අරමුදල්	4,524,426	(270,528)	-	-	4,253,898
ශිෂ්‍ය පරිගණක ඒකක සංවර්ධන අරමුදල්	24,620,420	5,160,767	2,622,802	-	27,158,385
ක්‍රීඩා ප්‍රවර්ධන අරමුදල්	19,240,422	13,466,064	18,910,875	-	13,795,610
පරිපාලන අරමුදල්	726,416,893	291,495,932	214,786,805	15,714,149	787,411,871
එකතුව	**1,744,515,529**	**736,521,702**	**609,806,644**	**84,539,149**	**1,786,691,437**

1. මූල්‍ය ප්‍රකාශන පුනර්ප්‍රකාශනය

රජයේ ප්‍රාග්ධන ප්‍රදානය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11 අනුව හඳුනා ගෙන ඇති අතර ප්‍රතිඵලයේ සාරාංශය පහත පරිදි වේ.

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය			
2022 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	**පෙර වාර්තා වූ පරිදි**	**ගැලපුම්**	**පුනර් ප්‍රකාශිත පරිදි**
ආදායම			
විනිමය නොවන ගණුදෙනු වෙතින් ආදායම - පුනරාවර්තන			
වෙනත් දීමනා - ක්‍රමක්ෂය	*699,481,918*	*(568,244,675)*	*131,237,243*
මෙහෙයුම් ප්‍රතිඵල			
ක්ෂය සහ ක්‍රමක්ෂය	*983,700,160*	*983,700,160*	*-*
කාල සීමාව සඳහා වත්මන් අතිරික්තය/(හිඟය).	**327,921,830**	**415,455,485**	**743,377,315**
ආදායම - ප්‍රාග්ධන ප්‍රදානය	*-*	*3,780,064,221*	*3,780,064,221*
ක්ෂය සහ ක්‍රමක්ෂය	*-*	*983,700,160*	*983,700,160*
ප්‍රාග්ධන ප්‍රදානය සඳහා ගිණුම්කරණයෙන් පසු කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය).	**-**	**2,796,364,061**	**2,796,364,061**
	-		
කාලසීමාව සඳහා මුළු අතිරික්තය/(හිඟය).	**327,921,830**	**3,211,819,546**	**3,539,741,376**

මූල්‍ය තත්ව ප්‍රකාශය			
2022 දෙසැම්බර් 31 වන දිනට	**පෙර වාර්තා වූ පරිදි**	**ගැලපුම්**	**පුනර් ප්‍රකාශිත පරිදි**
ප්‍රාග්ධනය			
ප්‍රාග්ධන ප්‍රදාන	*15,421,552,156*	*(15,421,552,156)*	*-*
ත්‍යාග සහ පරිත්‍යාග	*419,862,953*	*(419,862,953)*	*-*
	15,841,415,109	*(15,841,415,109)*	*-*
සමුච්චිත අරමුදල්			
සමුච්චිත අතිරික්ත/(හිඟ)	*(3,152,724,968)*	*415,455,485*	*(2,737,269,483)*
ප්‍රාග්ධන සමුච්චිත අතිරික්ත/(හිඟ)	*-*	*15,425,959,624*	*15,425,959,624*
	(3,152,724,968)	*15,841,415,109*	*12,688,690,141*
එකතුව	**12,688,690,141**	**-**	**12,688,690,141**

2. උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධන ත්වරණ ව්‍යාපෘතිය (AHEAD)

බැංකු අරමුදල් සහිත උසස් අධ්‍යාපන ව්‍යාප්ති හා සංවර්ධන (AHEAD) මෙහෙයුමක් මගින් උසස් අධ්‍යාපන අංශයට සහාය වීමට ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව එකඟ වී තිබේ.

AHEAD ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයයි (MOE). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විශ්වවිද්‍යාලවල කටයුතු සම්බන්ධීකරණය කරනු ඇත. මෙහෙයුම් අධීක්ෂණ සහ සහායක කණ්ඩායමක් (OMST) පත්කර ඇති අතර එය MOE, UGC සහ විශ්වවිද්‍යාල අතර සියලුම AHEAD ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා සහාය වනු ඇත. විශ්ව විද්‍යාල මට්ටමින් ව්‍යාපෘති ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරනු ලබන්නේ එක් එක් විශ්ව විද්‍යාලයට අනුයුක්ත මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය (OTS) විසිනි.

2022-12-31 දිනට AHEAD ව්‍යාපෘතිය යටතේ කොළඹ විශ්වවිද්‍යාලය විසින් කරන ලද ප්‍රදාන පහත පරිදි වේ.

පර්යේෂණ ක්ෂේත්‍රය (Research Area)	පදානය	ප්‍රදාන සංඛ්‍යාව	පීඨය / අධ්‍යයන අ.	ප්‍රමාණය රු.	2022-12-31 දිනට ප්‍රදානය කරන ලද ව්‍යාපෘති වියදම්
RA 1 - ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමුඛතා අංශයේ උසස් අධ්‍යාපනයට බඳවා ගැනීම් වැඩි කිරීම	*STEM (විද්‍යා තාක්ෂණ ඉංජිනේරු සහ වෛද්‍ය විද්‍යාව)*	*4*	තාක්ෂණ පීඨය	*80,000,000.00*	*76,508,025.42*
			වෛද්‍ය පීඨය	*30,000,000.00*	*29,699,835.00*
			UCSC	*20,000,000.00*	*18,952,769.00*
			තාක්ෂණ පීඨය	*75,000,000.00*	*56,879,709.76*
	සිවිල් වැඩ	*1*	තාක්ෂණ පීඨය	*350,000,000.00*	*343,042,272.14*
RA2 - උසස් අධ්‍යාපන ගුණත්වය ඉහළ නැංවීම	*ELTA -ELE/*පීඨ *(ඉගෙනීම, ඉගැන්වීම් සහ ඇගයුම් පොහොසත් කිරීම/ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම)*	*7*	විද්‍යා පීඨය	*120,000,000.00*	*102,375,785.13*
			ශාස්ත්‍ර පීඨය	*120,000,000.00*	*84,022,411.48*
			ශාස්ත්‍ර පීඨය(මානව ශාස්ත්‍ර සඳහා තො.තා.)	*23,500,000.00*	*6,554,729.09*
			ශ්‍රීපාලි මණ්ඩපය(මානව ශාස්ත්‍ර සඳහා තො.තා)	*10,750,000.00*	*9,004,785.70*
			කළමනාකරණ පීඨය	*120,000,000.00*	*53,443,662.08*
			ශ්‍රීපාලි මණ්ඩපය	*50,000,000.00*	*17,573,430.76*
			IARS	*15,000,000.00*	
	*ELTA-ELASE/*අධ්‍යයන අංශ *(ඉගෙනීම, ඉගැන්වීම් සහ ඇගයුම් පොහොසත් කිරීම/ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම)*	*5*	සමාජ විද්‍යා අ.අ.	*18,000,000.00*	*9,759,609.89*
			භෞතික විද්‍යා අ.අ.	*18,000,000.00*	*6,734,016.00*
			රසායන විද්‍යා අ.අ.	*18,000,000.00*	*8,932,872.84*
			ගණකාධිකරණ අ.අ.	*18,000,000.00*	*9,161,821.54*
			ජා. සම්බන්ධතා අ.අ.	*18,000,000.00*	*13,298,276.19*
RA3 - පර්යේෂණ ප්‍රදාන	*RIC (පර්යේෂණ සහ නවෝත්පාදන වාණිජකරණය)*	*1*	භෞතික විද්‍යා අ.අ.	*25,000,000.00*	*24,001,590.16*
	ICE (නවෝත්පාදන වාණිජකරණය වැඩිදියුණු කිරීම)-1	*3*	*UCSC*	*40,000,000.00*	*34,177,147.53*
			IARS	*40,000,000.00*	*35,768,723.04*
			විද්‍යා පීඨය	*40,000,000.00*	*38,381,161.01*
	DOR (සංවර්ධන දිශානතිගත පර්යේෂණ)-1	*3*	වෛද්‍ය පීඨය	*40,000,000.00*	*32,664,713.73*
			ප,උ.අ. පීඨය	*10,000,000.00*	*5,558,665.70*
			ඉංග්‍රීසි අ.අ.	*10,000,000.00*	*9,662,063.86*
	DOR (සංවර්ධන දිශානතිගත පර්යේෂණ) -2	*3*	විද්‍යා පීඨය *1*	*40,000,000.00*	*39,306,475.99*
			වෛද්‍ය පීඨය	*37,000,000.00*	*23,243,226.83*
			විද්‍යා පීඨය *2*	*40,000,000.00*	*25,996,826.53*

	*UBL (*වි.වි. ව්‍යාපාර සංධාරක*)* කුටිය			*18,000,000.00*	*4,168,569.70*
ආචාර්ය උපාධි ශිෂ්‍යක්ව			සම්මාන *22*	*203,485,682.37*	*131,053,920.07*
	ලැබූ අමතර බදවා ගැනීමේ අරමුදල				*50,806,163.14*
			එකතුව	**1,647,735,682.37**	**1,300,733,259.31**

2018 දී ලද ප්‍රතිපාදන	*641,000,000.00*
2019 දී ලද ප්‍රතිපාදන	*821,215,000.00*
2020 දී ලද ප්‍රතිපාදන	*45,000,000.00*
2021 දී ලද ප්‍රතිපාදන	*132,254,500.00*
2022 දී ලද ප්‍රතිපාදන	*8,266,182.37*
	1,647,735,682.37

3. මහපොළ, ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යත්ව

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව හාර අරමුදල *2019* අප්‍රේල් මාසයේ සිට සිසුන්ගේ මහපොළ ශිෂ්‍යත්ව වාරිකය සෘජුවම සිසුන්ගේ බැංකු ගිණුම් වෙත මාරු කර ඇත. මහපොළ හාර අරමුදල සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මහපොළ ශිෂ්‍යත්වය ලෙස වර්ෂය තුළ පිළිවෙළින් රුපියල් මිලියන *57.09*ක් සහ රුපියල් මිලියන *54.83*ක් වැය කර ඇත. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන්ට ශිෂ්‍යාධාර ලෙස රුපියල් මිලියන *54.168*ක් ගෙවා ඇත.

4. අත්තිකාරම් සහ ලැබියයුතු

2022.12.31 දිනට බැඳුම්කර සහ ගිවිසුම් කඩ කළ සේවකයින්ගෙන් රුපියල් මිලියන *138.9* ක මුදලක් අයකරගත යුතුව තිබේ. ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගෙන ඇත.

5. වත්කම්වල ඵලදායී ජීව කාලයෙහි වෙනස්කම්

පහත සඳහන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල ඵලදායී ජීව කාලය වසර තුළ පත්කළ කමිටුවක් විසින් තක්සේරු කර වත්කම් ලේඛනයට ඇතුළත් කරන ලදී. ඇස්තමේන්තුවලට පවතින නවතම, විශ්වාසදායක තොරතුරු මත පදනම් වූ විනිශ්චය ඇතුළත් වේ. එබැවින්, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය 2.2.2 (*අ) (v) (*ක්ෂය වීම්) හි හෙළිදරව් කර ඇති ඵලදායී ජීව කාලයට වඩා වෙනස් විය.

	රු.
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	*38,510,240*
මෝටර් වාහන	*33,593,029*
උපාධි ලෝගු	*220,000*
රසායනාගාර සහ ඉගැන්වීම් උපකරණ	*83,393,523*
සවිකුරු සහ තිරවුරු	*2,302,106*
ක්‍රීඩා භාණ්ඩ	*2,348,979*
මෘදුකාංග	*6,135,246*
එකතුව	**166,503,123**

6. කල්බදු හා මූල්‍ය කල්බදු

විශ්වවිද්‍යාලයේ හිමිකමට අදාළ සැලකියයුතු සියලුම අවදානම් සහ ප්‍රතිලාභ කල්බදු යන්නෙන් මෙහිදී අදහස් වේ. මූලික හඳුනා ගැනීම මත දේපල, පිරියත හා උපකරණ ඒවායේ සාධාරණ මිල හෝ අවම කල්බදු මිල යන දෙකෙන් අවම මිලට ගණනය කරනු ලබයි.මූලික හඳුනාගැනීමෙන් පසු එම වත්කමට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය මත එම වත්කම ගණනය කරනු ලැබේ.

මූල්‍ය කල්බදු යටතේ එන අවම ගෙවීම් මූල්‍ය වියදම් සහ උපචිත වගකීම් අතර බෙදීයයි. කල්බදු කාලය තුළ වගකීමේ ශේෂය සඳහා ස්ථාවර පොලී වාරික අනුපාතයක් පවත්වා ගතහැකි පරිදි මූල්‍ය වියදම කාල වකවානු අතර බෙදනු ලැබේ.

වර්ෂය තුළ විශ්වවිද්‍යාලය විසින් රු. 2,611,812 කල්බදු ලෙස ගෙවන ලදී.

7. වෛද්‍ය පීඨය සඳහා දහහත්මහල් ගොඩනැගිල්ල ඉදි කිරීම

2022 වර්ෂය තුළදී, අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය සහ විශ්වවිද්‍යාල අරමුදල් මගින් ලබාගත් ණය මුදලින් ඉදිකරන ලද වෛද්‍ය පීඨයේ දහහත් මහල් පූර්ව සායනික ගොඩනැගිල්ල තථ්‍ය ඉදිකිරීම් පිරිවැය මත පදනම්ව ප්‍රාග්ධනීකරණය කරන ලදී.ඒ අනුව මෙය රුපියල් 7,783,484,720.78 ගොඩනැගිල්ලක් ලෙස ප්‍රාග්ධනීකරණය කරන ලද අතර ඊට පසුගිය වර්ෂවල වාර්තා කරන ලද ක්‍රියාකාරී ප්‍රගතිය සහ වර්ෂය තුළ ගෙවූ බිල්පත්වල වටිනාකම සහ ගෙවිය යුතු බිල්පත්වල වටිනාකම ද ඇතුළත් විය.

8. කාලිංග මාවත නේවාසිකාගාරය

නේවාසිකාගාර සඳහා *2022* වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් මහල් *12* කින් යුත් නිවාස සංකීර්ණයක් විශ්වවිද්‍යාලයට භාර දෙන ලදී. රුපියල් මිලියන *847,891,236.51* ක ඉදිකිරීම් පිරිවැය *2022-02-15* දින නව ගොඩනැගිල්ලක් ලෙස ප්‍රාග්ධනීකරණය කරන ලදී. ඉදිකිරීම් අවසන් වූ වහාම නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයට පවරා දී ඇත.

ඉඩමේ නීත්‍යානුකූල අයිතිය විශ්වවිද්‍යාලයට පවරා ගැනීමේ ක්‍රියාවලිය *2022-12-31* දිනට අවසන් වී නොතිබිණි. වර්ෂය තුළ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉඩම් වටිනාකම ලබා නොදේ. නීත්‍යානුකූලව පැවරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු ඉඩම තක්සේරු කිරීමට සහ ගිණුම් ගත කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ඇත.

9. විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වගකීම

සුදුසුකම් ලත් සමාගමක් වන Actuarial and Management Consultant (Pvt) Ltd විසින් නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම-පාරිතෝෂිකය මත 20*22-12-31* දිනට ආයුගණක අගය තක්සේරු කර ඇත. විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා පිරිවැය තීරණය කිරීම සඳහා භාවිතා කරන උපකල්පන පහත පරිදි වේ.

කාර්ය මණ්ඩලය	
අධ්‍යයන කාර්ය මණ්ඩලය	*2%* වාර්.
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	*0.50%* වාර්.
වට්ටම් අනුපාතය	*18%* වාර්.
වැටුප් වැඩි වීමේ අනුපාතය	
අධ්‍යයන කාර්ය මණ්ඩලය	*16%* වාර්.
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	*14%* වාර්.
විශ්‍රාම යන වයස	
අධ්‍යයන කාර්ය මණ්ඩලය	අවු. *65*
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	අවු. *60*

10. නිර්වාචිත බැඳීම්

2022 දෙසැම්බර් *31* දින වන විට තක්සේරුවේදී උපකල්පනය කරන ලද වට්ටම් අනුපාතයේ සහ වැටුප් වර්ධන අනුපාතයේ වැදගත්කම පැහැදිලි කිරීම සඳහා පහත සඳහන් වට්ටම් අනුපාත සහ වැටුප් වර්ධන අනුපාතය උපකල්පනය කරමින් සියලුම සේවකයින් සඳහා සංවේදීතා විශ්ලේෂණයක් සිදු කරන ලදී.

වෙනස් වූ විචල්‍යය (අනෙක් සියළු උපකල්පන නොවෙනස්ව පවතින අතර)	**නිර්වචනය කර ඇති ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම** **රු.**
වට්ටම් අනුපාතයේ සියයට එකක වැඩිවීම *(+1%)*	*1,467,035,953*
වට්ටම් අනුපාතයේ සියයට එකක අඩුවීම *(-1%)*	*1,684,050,709*
වැටුප් වැඩි කිරීමේ අනුපාතය සියයට එකක වැඩිවීම *(+1%)*	*1,685,009,642*
වැටුප් වැඩි කිරීමේ අනුපාතය සියයට එකක අඩුවීම *(-1%)*	*1,464,743,303*

වත්මන් සේවා පිරිවැය – රු.92,618,398

11. අදාළ පාර්ශ්ව හෙළිදරව් කිරීම්

(i) උපකුලපති, මණ්ඩපාධිපති සහ පීඨාධිපතිවරු විශ්වවිද්‍යාල පාලක සභාවෙහි සාමාජිකයෝ වෙති.2022 වර්ෂය තුළ එම සාමාජිකයින්ට ගෙවන ලද වේතනය සහ අනෙකුත් ආදායම රු. 93,810,632.79 කි.

(ii) විශ්වවිද්‍යාලයේ කළමනාකරණය භාර ප්‍රමුඛ පුද්ගලයන් වන ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, පුස්තකාලයාධිපති යන අයට 2022 වර්ෂය තුළ විශ්වවිද්‍යාලයෙන් වේතනය සහ අනෙකුත් ආදායම ලෙස රුපියල් 12,912,544.46 ක් ගෙවා ඇත.

(iii) රැස්වීම් සඳහා රැස්වීම් දීමනා ලෙස අනෙකුත් පාලක සභා සාමාජිකයන්ට ගෙවන ලද මුදල රු. 522,000.00 කි.

12. අසම්භාව්‍ය බැරකම් සහ වත්කම්

12.1 අසම්භාව්‍ය බැරකම්

(i) විශ්වවිද්‍යාලයට පක්ෂව සහ විපක්ෂව පවතින නඩුවල තත්වය මෙසේය.

	අංකය	**නඩුව පිළිබඳ විස්තර**	**කාරණය**	**සටහන්**	**කළ. කමිටුව**
උපාධි ලියාපදිංචිය	*01*	*SC/HCCA/LA/ 332/2016* නව අං. *52/2017* සී පී ඒ අබේසිංහ මයා / ටී එම් එස් අතුකෝරල මිය	මහාචාර්ය අතුකෝරල සිවිල් අභියාචනා මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළේ එම ක්‍රියාවෙන් තමා නිදහස් කරන ලෙසට නියෝග කරන ලෙසයි. ඇයගේ අයදුම්පත නිෂ්ප්‍රභ කරමින් නියෝගයක් ලබාදී ඇති අතර මේ වන විට ඇය ශ්‍රේෂ්ඨාධිකරණයට මෙම ඉල්ලීම ඉදිරිපත් කර තිබේ.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.

	02	*SC/SPL/LA /77/19* සුදීප ප්‍රියංග ජයතිලක මහතා	විශ්වවිද්‍යාලයට පක්ෂව නිෂ්ප්‍රභ කරන ලද අභියාචනාධිකරණ *CA (Writ) 187/14* නඩුවේ නියෝගයට එරෙහිව *UCSC* හි සේවය අවසන් කරන ලද කථිකාචාර්ය ජයතිලක මහතා විසින් මෙම නඩුව පවරා ඇත.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	03	*SC/SPL/LA/413/2019,414/2019* එස්. කාංජනා එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය	*2019.09.30* දින දරන බස්නාහිර පළාතේ පළාත් මහාධිකරණයේ නියෝගයට එරෙහිව එස්.කාංජනා මහත්මිය මෙම අභියාචනය ගොනු කර ඇත.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	04	*SC(FR) 169/2019* එච්.ආර්.ටී ද සිල්වා එදිරිව. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තවත් *37* දෙනෙක්	ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ නඩුව ගොනු කරනු ලැබුවේ කොළඹ විශ්වවිද්‍යාලයේ හෙද පීඨයේ සායනික හෙද අධ්‍යයන අංශයෙහි කථිකාචාර්ය (ආධුනික) එච්. ආර්.ටී. සිල්වා මිය විසිනි.	නඩුව විභාග වෙමින් පවතී.	මිලියන *2*
	05	මීපේ වල්පිට ගමගේ රනුලි පෙහාරා සහ තවත් *37* දෙනෙක් එදිරිව. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තවත් *17* දෙනෙක්	එම් ඩබ් ජී රනුලි පෙහාරා මෙනවිය සහ ජීව විද්‍යා විෂය ධාරාවෙන් නව විෂය නිර්දේශය යටතේ *2019* උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන් *37* දෙනෙකු ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ නඩුව ගොනු කර ඇත.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	06	*SC/FRA/ 213 /2021* පී. අතුල එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය	මේ වන විටත් කොළඹ විශ්වවිද්‍යාලයෙහි හෙද පීඨයේ කාර්යාල සහකාර ලෙස සේවය කරන පී. අතුල මහතා මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ගොනු කර ඇත.	තීන්දුව ලැබී ඇත.	විශ්වවිද්‍යාලයට වාසිදායක තීන්දුවක් ලබා දී ඇත (ඉවත් කිරීමට)
	07	*SCFR 249/2021* ආචාර්ය කේ.පී.ඩී.සී. පෙරේරා එදිරිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තවත් *28* දෙනෙක්	අධ්‍යයන නිවාඩු සහ පාඨමාලාව අත්හිටුවීමේ කාරණය සම්බන්ධයෙනි.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	08	*SC/FRA/378/21* ටී.උමෙෂා දිල්ෂානි එදිරිව විභාග කොමසාරිස් ජනරාල් බී. සනත් පූජිත සහ තවත් *08* දෙනෙක්	කොළඹ විශ්වවිද්‍යාලයේ හෙද පාඨමාලාව සඳහා ලියාපදිංචි වී සිටින ටී.යූ. දිල්ෂානි මෙය ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ගොනු කර ඇත.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	09	*SC(SPL) LA No.71/21* මහාචාර්ය එස්.එම්. විජයරත්න එදිරිව උසස් අධ්‍යාපන අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ඇතුළු *192* දෙනෙක්	කොළඹ විශ්වවිද්‍යාලයේ ශල්‍ය වෛද්‍ය විද්‍යා මහාචාර්ය එස්.එම්. විජයරත්න *2021/03/10* දින ලබා දුන් අංක *CA (Writ) 398/2015* නඩු තීන්දුවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ගොනු කර ඇත.	තීන්දුව ලැබී ඇත.	විශ්වවිද්‍යාලයට වාසිදායක තීන්දුවක් ලබා දී ඇත.

	10	*SC(SPL) LA No.68/21* කොළඹ විශ්වවිද්‍යාලයේ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය ඩී.එන් සමරසේකර	*2021/03/10* දින ලබා දුන් අංක *CA (Writ) 332/2015* නඩු තීන්දුවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනයක් ගොනු කරන ලදී.	තීන්දුව ලැබී ඇත.	විශ්වවිද්‍යාලයට වාසිදායක තීන්දුවක් ලබා දී ඇත.
	11	*SC(SPL) LA/135/22* ආචාර්ය එස්.එම්.පී.ඩී ද සිල්වා සහ තවත් *07* දෙනෙක් එදිරිව. ආචාර්ය ඒ.ඩී.පී. අතුකෝරල සහ තවත් *76* දෙනෙක්	මැදිහත්වීමේ විකිරණවේදියෙකු ලෙස *1* වන වගඋත්තරකරු වන ආචාර්ය ඒ.ඩී.පී. අතුකෝරලගේ මණ්ඩල සහතිකය අභියෝගයට ලක් කරමින් උපදේශක මැදිහත්වීමේ විකිරණවේදින් කණ්ඩායමක් අභියාචනාධිකරණයට රිට් අයදුම්පතක් ගොනු කර ඇත.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	12	*SC (SPL) LA.*නඩු අංක. *264/2022* වෛද්‍ය පොන්නයියා අනුෂන් මධුෂංක එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය සහ තවත් *51* දෙනෙක්	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලට අනුයුක්තව සේවය කරන වෛද්‍ය පොන්නයියා අනුෂාන් මධුශංක *CA (Writ) 207/2021* නඩුවේ තීන්දුවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනයක් ගොනු කර ඇත.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
ඉ ති	*13*	*WP/HCCA/COL.No.211/2014* උපාලි ගුණසේකර විදුහල්පති රාජකීය විද්‍යාලය එදිරිව. ඩී.ටී.කේ. දිසානායක සහ තවත් *15* දෙනෙක්	ආචාර්ය ශ්‍රී ලක්ෂ්මන් ද සිල්වාගේ අවසන් කැමැත්තෙන් කොළඹ විශ්වවිද්‍යාලය වෙත ලැබිය යුතු මුදල් ප්‍රමාණය සම්බන්ධයෙනි.	නඩුව විභාග වෙමින් පවතී.	අන්තිම කැමැත්ත අනුව විශ්වවිද්‍යාලයට මිලියන 6ක් ලැබිය යුතුය.
	14	*HCALT 37/2019* නිමල් ගුණරත්න එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය	පසු වැටුප් සමඟ නැවත සේවයේ පිහිටුවීම සඳහා	තීන්දුව ලැබී ඇත.	විශ්ව විද්‍යාලයට වාසිදායක තීන්දුවක් ලබා දී ඇත.
	15	*HCALT 48/2020* මීත් නිමාෂා ලන්දේ බණ්ඩාර *0713148708* එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය	එල්. බණ්ඩාර මහත්මිය *2014.03.20* දින සිට විශ්ව විද්‍යාලයේ පූර්ණ කාලීන උප පාලිකාවක් ලෙස සේවය කළාය. පසුව, පරිවාස කාලය තුළ ඇයගේ සේවය අවසන් කර ඇත. මේ සම්බන්ධයෙන් ඇය ඉහත නඩුව පවරා ඇත	තීන්දුව ලැබී ඇත.	විශ්වවිද්‍යාලයට වාසිදායක තීන්දුවක් ලබා දී ඇත.
	16	*WP/HCCA/COL/118/2019* ඩී.ටී.ආර්. වික්‍රමරත්න සහ තවත් අයෙක් එදිරිව පූජ්‍ය මහාචාර්ය විජිතපුර විමලරත්න සහ තවත් *27* දෙනෙක්	දිසා අධිකරණය පැමිණිලිකරුවන්ට එරෙහිව තීන්දුවක් දී ඇති අතර ඔවුන් දිසා අධිකරණයේ තීන්දුවට එරෙහිව කොළඹ සිවිල් අභියාචනා මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත.	නඩුව විභාග වෙමින් පවතී. ඉල්ලුම් කළ හිමිකම රු. මි. *600*	තවම තීරණය කළ නොහැකිය.

	17	*WP/HCCA/COL/316/22LA* කොළඹ විශ්වවිද්‍යාලය එදිරිව මේජර් පී.එච්. නිමල් චන්ද්‍රසේකර සහ තවත් *5* දෙනෙක්		නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
			කොළඹ දිසා අධිකරණයේ *2022.11.14* දිනැති අංක *5154/18* දරන නඩුවේ නියෝගයට එරෙහිව *2006* අංක *54* සහ සිවිල් නඩු විධාන සංග්‍රහයේ *754(2)* වගන්තියට අනුව සංශෝධිත *1990* අංක *19* දරන පළාත් මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ මෙම නඩුව ගොනු කරනු ලැබේ.		
මාධ්‍ය නිවේදන නිකුත් කිරීම	*18*	*HRC N0:3851/2019* ආචාර්ය පී.එන් වීරසිංහ එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය	ලිංගික හිරිහැර, සැක සහිත සේවා පරිසරය	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	19	*HRC N0:2989/2019* අබ්බාස් අහමඩ් එදිරිව. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කොවිවි.	කම්කරු නඩුවකි	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.

	20	*HRC/917/21* කේ. පී.ඩී.සී. පෙරේරා එදිරිව *IIM, UGC, PGIIM, GWVIM* සහ කොා.වී.වි.	කම්කරු නඩුවකි	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	21	*HRC/HO/5138/22* ජේ.පී.එස්.කේ. කුමාර	වෙනත් ස්ථානයකට (නේවාසිකාගාරය) මාරු වීමට ඉල්ලීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	22	*HRC 1991/2020* මහාචාර්ය සමරසේකර	මහාචාර්ය තනතුර සඳහා වන වාචික විභාගය සම්බන්ධ කාරණයකි.		තවම තීරණය කළ නොහැකිය.
	23	ජී.ඩී.එච්.ඩී. පතිරගොඩ		නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	24	*HRC-HO-3085-22* එස් වික්‍රමසේකර එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය	වැටුප් වර්ධකය අත්හිටුවීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
අභියාචනාධිකරණය	*25*	*CA(Writ) 142/2015* ආචාර්ය කේ.සී.පී. පෙරේරා එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය සහ තවත්*238* දෙනෙක්	විභාගය සම්බන්ධ කාරණයකි *PGIM*	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	26	*CA(Writ)27/2016* එස්.එල්.පී. ෆොන්සේකා එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය සහ තවත් *25* දෙනෙක්	සේවය අවසන් කිරීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	27	*CA(Writ) 359/2020* ආචාර්ය වන්දන කස්තුරිආරච්චි එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය සහ තවත් *31* දෙනෙක්	සේවය අවසන් කිරීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	28	*CA(Writ) 207/2021* වෛද්‍ය පොන්නයියා අනුෂන් මධුෂංක එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය සහ තවත් *50* දෙනෙක්	*PGIM*	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	29	*CA(Writ) 507/2021* කේ.ඊ. වසන්ත ජයසිරි එදිරිව මෛත්‍රී ඊවන් වික්‍රමසිංහ සහ තවත් *15* දෙනෙක්	නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තෝරා ගැනීම සම්බන්ධයෙන්	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	30	*CA(Writ) 506/2021* ඕ.වී.එල්. ප්‍රියන්ත අනුර ජයසිරි එදිරිව මෛත්‍රී ඊවන් වික්‍රමසිංහ සහ තවත් *15* දෙනෙක්	නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තෝරා ගැනීම සම්බන්ධයෙන්	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	31	*USAB 987* එල්.එන්.ද සොයිසා	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරේ වැඩ තහනම් කිරීම සම්බන්ධයෙනි.	නඩුව අවසානය.	පෙත්සම්කරු විසින් නඩුව ඉල්ලා අස්කරගෙන ඇත

	32	*USAB No:995* කේ. ඒ. වසන්ත ජයසිරි මහතා	සහකාර අභ්‍යන්තර විගණක/ නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය ගණකාධිකාරී තනතුරට උසස් වීමට	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	33	*USAB No:996* ඕ.වී.ලලිත් ප්‍රියන්ත මහතා	සහකාර අභ්‍යන්තර විගණක/ නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය ගණකාධිකාරී තනතුරට උසස් වීමට	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	34	*USAB No:997* ජී.ඩබ්.ඒ විජේසිංහ	සහකාර අභ්‍යන්තර විගණක/ නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය ගණකාධිකාරී තනතුරට උසස් වීමට	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	35	*USAB No:1023* වෛද්‍ය එන්.ඒ.ආර්. ආර්. නිශ්ශංක	කථිකාචාර්ය තනතුරට පත් කිරීම - *IIM*	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	36	*USAB No:1024* ආචාර්ය එස් එම් නස්මීර්	උසස්වීම	තීන්දුව ලැබී ඇත.	තීන්දුව විශ්වවිද්‍යාලයට පක්ෂව නොවේ. නමුත් විශ්වවිද්‍යාලය වෙතින් මුදල් ඉල්ලීමක් කර නොමැත
	37	*USAB No:1020* ආචාර්ය එස්.එම්.ඒ.සී.දිල්රුක්ෂි මිය	කථිකාචාර්ය තනතුර (ආධුනික/ ස්ථිර නොවූ / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය *I* සහ *II* ශ්‍රේණිය)	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	38	*USAB No. 1030* පී අතුල මහතා	ශ්‍රමය සම්බන්ධ කරුණකි.	තීන්දුව ලැබී ඇත.	අභියාචකයාට පක්ෂ තීන්දුවකි
	39	*USAB No. 1047* ආර්.එස්. මදනායක එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය සහ තවත් *03* දෙනෙක්	කථිකාචාර්ය (පරිවාස) තනතුර අවසන් කිරීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	40	*USAB 1033(a)* ආචාර්ය ඩබ්.ඒ.ආර්.පී. වීරසිංහ එදිරිව. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සහ තවත්.	අධ්‍යයන නිවාඩු සහ පාඨමාලාව අත්හිටුවීම සම්බන්ධයෙනි.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	41	*USAB 1034(a)* ආචාර්ය කේ.පී.ඩී.සී.පෙරේරා එදිරිව. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සහ තවත්.	අධ්‍යයන නිවාඩු සහ පාඨමාලාව අත්හිටුවීම සම්බන්ධයෙනි.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	42	*USAB 1035(a)* ආචාර්ය එස්.එච්.කේ. දීප්තිකා එදිරිව. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සහ තවත්.	අධ්‍යයන නිවාඩු සහ පාඨමාලාව අත්හිටුවීම සම්බන්ධයෙනි.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.

	43	*USAB 1051* මහාචාර්ය ගංගානී වන්දිමා සමරවීර එදිරිව රුහුණු විශ්වවිද්‍යාලය සහ තවත් *12* දෙනෙක්	කෘෂිකර්ම ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ මූලාසන මහාචාර්යවරයා පත් කිරීම.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	44	*USAB 1054* එච්.ජී.ජේ. දිල්රුක් එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය සහ තවත් වගඋත්තරකරුවෙක්	වැඩ තහනම් කිරීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	45	*USAB 1055* ආචාර්ය එම්.එච්. මොහොමඩ් නසීම් එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය සහ තවත්.	සහාය මහාචාර්ය තනතුරට උසස් කිරීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	46	*USAB 1058* ආචාර්ය ආර්.සී.ජී ගමගේ එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය සහ තවත් වගඋත්තරකරුවන් *02* දෙනෙක්	සහාය මහාචාර්ය/ මහාචාර්ය තනතුර	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	47	*USAB 1060* එච්.ඊ.එම්.අයි.ජී. තලතා ජීවනී ඒකනායක එදිරිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තවත් *09* දෙනෙක්	නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරට උසස් කිරීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	48	*USAB 1062* ඩබ්.ඒ.ජේ.එස්. වික්‍රමසිංහ එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය සහ තවත් *03* දෙනෙක්.	සේවා අවසන් කිරීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
දිසාසිඛරණය	*49*	*DMR 6638/2009* ඒ.පී.කේ. වීරරත්න එදිරිව *IIM*, කොළඹ විශ්වවිද්‍යාලය	*2007.08.22* දින *IIM* හි හිටපු අධ්‍යක්ෂ වෛද්‍ය සායක්කාර ජයවර්ධනට පහරදීමේ සිද්ධිය සම්බන්ධයෙන් *IIM* හි ශිෂ්‍යයෙකු වන ඩබ්.ඩී. උදයකුමාර මහතාට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් ඒ.පී.කේ. වීරරත්න මහතාගේ ශිෂ්‍ය භාවය තාවකාලිකව අත්හිටුවා ඇත. මේ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පැවැත්වුණු අතර මූලික පරීක්ෂණ වාර්තාව පදනම් කරගෙන පාලක සභාවේ අනුමැතිය ඇතිව සිසුන් දෙදෙනාටම චෝදනා පත්‍ර ඉදිරිපත් කෙරිණි.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	50	නඩු අංක*: 63752/01/16* කුරුඳුවත්ත පොලිසිය එදිරිව ජී.එම්. මලිත් විජේරත්න	සත්ව විද්‍යා අධ්‍යයන අංශයට කඩාවැදීම සම්බන්ධයෙන්	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	51	*DC No: M 3257/21* එච්.පී.සජිතා ලක්මාලි එදිරිව ආචාර්ය ජයන්ත වනසිංහ සහ තවත්.	හොරණ ශ්‍රී පාලී මණ්ඩපයට අනුයුක්තව සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩලය *04* දෙනෙකුට එරෙහිව හොරණ දිසා අධිකරණයේ නඩු පවරා ඇත.	නඩුව විභාග වෙමින් පවතී. රු. මි. *500* ක	තවම තීරණය කළ නොහැකිය.

				හිමිකමක් ඉල්ලා ඇත	
	52	නඩු අංක*: DMR 2299/2021* ඩබ්.නවීන් ශ්‍රී වික්‍රමගේ එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය	සේවය අත්හිටුවීම	නඩුව විභාග වෙමින් පවතී. රු. මි. *3*ක හිමිකමක් ඉල්ලා ඇත.	
	53	නඩු අංක *19687/MR* කේ.එම්.සී.කේ. කමල්ගොඩ සහ තවත් දෙදෙනෙක්	බැඳුම්කර කඩ කිරීම	තීන්දුව ලැබී ඇත.	විශ්වවිද්‍යාලය ට රු. *180549628* ක් ලැබිය යුතුය.
	54	නඩු අංක *DMR/5154/2018* කොා.වි.වි. එදිරිව එච් එම් එච් සිරිවර්ධන මිය	බැඳුම්කර කඩ කිරීම	තීන්දුව ලැබී ඇත.	විශ්වවිද්‍යාලය ට රු *1797115.45* ක් ලැබිය යුතුය
	55	නඩු අංක *DMR/5153/2018* කොා.වි.වි. එදිරිව එච් එම් එච් සිරිවර්ධන මිය	බැඳුම්කර කඩ කිරීම	තීන්දුව ලැබී ඇත.	විශ්වවිද්‍යාලයට රු *1797115.45* ක් ලැබිය යුතුය

	56	නඩු අංක *DMR/02721/22* කොා.වි.වි. එදිරිව අයි.එස්. බද්දේවෙල සහ තවත් *02* දෙනෙක්	බැඳුම්කර කඩ කිරීම	නඩුව විභාග වෙමින් පවතී.	විත්තිකරු රු. *3881337.87* ගෙවීමෙන් නඩුව සමථයකට පත් කර ගැනීමට කැමැත්තෙන් සිටී. පාලක සභා තීරණය බලාපොරොත්තුවෙන් පසුවෙයි.
	57	නඩු අංක *DMR/03641/22*කොා.වි.වි. එදිරිව එෂානි සමන්ති බැද්දේවල සහ තවත් *2* දෙනෙක්.	බැඳුම්කර කඩ කිරීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.

	58	*DMR 6638/2009* ඒ.පී.කේ. වීරරත්න එදිරිව *IIM*, කොළඹ විශ්වවිද්‍යාලය	*2007.08.22* දින *IIM* හි හිටපු අධ්‍යක්ෂ වෛද්‍ය සායක්කාර ජයවර්ධනට පහරදීමේ සිද්ධිය සම්බන්ධයෙන් *IIM* හි ශිෂ්‍යයෙකු වන ඩබ්.ඩී. උදයකුමාර මහතාට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් ඒ.පී.කේ. වීරරත්න මහතාගේ ශිෂ්‍ය භාවය තාවකාලිකව අත්හිටුවා ඇත. මේ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පැවැත්වුණු අතර මූලික පරීක්ෂණ වාර්තාව පදනම් කරගෙන පාලක සභාවේ අනුමැතිය ඇතිව සිසුන් දෙදෙනාටම චෝදනා පත්‍ර ඉදිරිපත් කෙරිණි.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
කම්කරු විනිශ්චය සභාව	59	ක.වි.ස. නඩු අංක *02/473/2014* එස් එස් ඩී එස් ප්‍රියංග ජයතිලක එදිරිව *UCSC*, කොා.වි.වි.	කම්කරු නඩුවකි.	ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක *SC/SPL/LA/ 77/19* තීන්දුව ලැබෙන තුරු බහා තබන ලදී.	තවම තීරණය කළ නොහැකිය.
	60	ක.වි.ස. නඩු අංක *01/Add/20/2016* දුම්න්ද රොහාන් ගුණරත්න එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය	වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිගණක යෙදුම් සහකාර *III* ශ්‍රේණියේ සේවය කළ දුම්න්ද රොහාන් ගුණරත්න මහතා තමාව නැවත සේවයේ පිහිටුවීමට, ආපසු වැටුප් හෝ සාධාරණ වන්දියක් ඉල්ලා උපකුලපතිවරයාට එරෙහිව කම්කරු විනිශ්චය සභාවට ඉහත නඩුව පවරා ඇත.	බහා තබන ලදී.	තවම තීරණය කළ නොහැකිය.
	61	ක.වි.ස. නඩු අංක *08/857/2015* එස්.ඩී.මුතුකුඩආරච්චි එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය	විශ්වවිද්‍යාලයීය පරිගණක පාසලේ (*UCSC*) *II* ශ්‍රේණියේ විදුලි කාර්මිකයෙකු ලෙස සේවය කළ මොහුගේ සේවය විශ්වවිද්‍යාලය විසින් අවසන් කර ඇති බව පවසමින් කම්කරු විනිශ්චය සභාවෙහි නඩුවක් ගොනු කර ඇත. සේවයෙන් පහ කිරීමට විකල්පයක් ලෙස ඔහු එම තනතුරෙන් ඉල්ලා අස් වූ අතර *2015.02.11* දින පැවති *492* වැනි පාලක සභා රැස්වීමේදී ඔහුගේ ඉල්ලා අස්වීම පිළිගෙන ඇත. කෙසේ වෙතත් ඔහු කම්කරු විනිශ්චය සභාවෙහි මෙම නඩුව පවරා ඇත.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.

	62	ක.වි.ස. නඩු අංක *13/16/2020* ඩී.සී.ආර්.එම්.සී.පී ගුණවර්ධන එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය සහ වි.වි.ප්‍ර. කොමිසම	කොවි.වි. පරිගණක පාසල *(UCSC)* විශ්වවිද්‍යාලයට එරෙහිව කම්කරු විනිශ්චය සභාවෙහි ඉහත නඩුව ගොනු කර ඇත.	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	63	ක.වි.ස. නඩු අංක.*31/68/2020* ආර් එම් අමරතුංග එදිරිව කොළඹ විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය සහ වි.වි.ප්‍ර. කොමිසම	කැලණිය විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන උප ශාලාධිපතිවරයෙකු ලෙස කටයුතු කළ ආර්. එම්. අමරතුංග මහතා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් කැලණිය විශ්වවිද්‍යාලයට මාරු කිරීමට පෙර කොළඹ විශ්වවිද්‍යාලයේ සේවය කර ඇති බැවින් කොළඹ විශ්වවිද්‍යාලය වගඋත්තරකරුවෙකු ලෙස දක්වමින් කම්කරු විනිශ්චය සභාව හමුවේ ඉහත නඩුව ගොනු කර ඇත.	කම්කරු විනිශ්චය සභාව කොළඹ විශ්වවිද්‍යාල යට ඒක පාක්ෂික තීන්දුවක් ලබාදීමට තීරණය කළේය.	තවම තීරණය කළ නොහැකිය.
	64	*UOC/LD/LD/007* *cc/c/IR/10/219/2020* ආර් එම් අමරතුංග	*I* ශ්‍රේණියේ උපශාලාධිපති තනතුරට උසස් කිරීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	65	ක.වි.ස. නඩු අංක. *8/721/2013*කේ. කේ. වීරමන් එදිරිව. කොවි.වි.	සේවය අවසන් කිරීම	නඩුව විභාග වෙමින් පවතී.	තවම තීරණය කළ නොහැකිය.
	66	ක.වි.ස. නඩු අංක. *02/add/01/2021* පී අතුල	ඔහුගේ රැකියාව අවසන් කිරීම	නඩුව අවසානය.	පෙත්සම්කරු නඩුව ඉල්ලා අස්කර ගත්තේය.

(ii) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව විශ්වවිද්‍යාලය විසින් අඩු කරන ලද දුවශීලතා හානි අත්හැරීමට කොන්ත්‍රාත්කරු ඉල්ලා සිටියේය. දැනටමත් උපදේශකයන් විසින් නිර්දේශිත කාල සීමාවෙන් ඔබ්බට කාලය දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩලය එකඟ වූයේ නම් සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පියවා නොගන්නේ නම් විශ්වවිද්‍යාලයට පහත සඳහන් වියදම් දැරීමට සිදුවේ.

I) අත්හැරීමේ දුවශීලතා හානිය –රු.මි.119

II) මිල විචල්‍යය– රු.මි.184

12.2 අසම්භාව්‍ය වත්කම්

2022-12-31 දින වනවිට බැදුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් රුපියල් *138,919,322* අයකර ගැනීමට නියමිතය. කෙසේ වෙතත්, මෙම මුදල් අයකර ගැනීම සඳහා අඛණ්ඩ පසු විපරම් සිදු කරනු ලැබේ.

13. ශුද්ධ පොත් අගය ශූන්‍ය ලෙස වාර්තා කර ඇති රු.376,491,731 වටිනා පුස්තකාල පොත් SLPSAS 7 ට අනුව ඉතිරිව ඇති ප්‍රයෝජනවත් ජීවිතය සඳහා සංශෝධනය කර නොමැත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එච්ඊබී/බි/යූඕසී/2022/එෆ්ඒ/01

මබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 අගෝස්තු 09 දින

UNIVERSITY OF COLOMBO RECEIVED 07 AUG 2023 VICE CHANCELLORS OFFICE

09 AUG 2023 කොළඹ විශ්ව විද්‍යාලය

උපකුලපති,
කොළඹ විශ්වවිද්‍යාලය.

කොළඹ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

DIA

ඩබ්ලිව්.එම්.පී.ඒ. ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

VC

පිටපත් -

1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය,
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. } එච්ඩී/ඩී/යූඕසි/2022/එෆ්ඒ/01 මෙම අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 ජූලි 31 දින

උපකුලපති,
කොළඹ විශ්වවිද්‍යාලය.

කොළඹ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කොළඹ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට

කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
2021 දෙසැම්බර් 21 දිනැති අංක 03/2021 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය	දේශීය අරමුදලින් විදේශ අධ්‍යයන සංචාර සඳහා වියදම් දැරීම අත්හිටුවා තිබුණද විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී විදේශ අධ්‍යයන චාරිකා වෙනුවෙන් රු.9,249,795 ක් දේශීය අරමුදලින් වැය කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 අනෙකුත් කරුණු

(අ) වර්ෂ 1 ත් වර්ෂ 35 ත් අතර කාලයක සිට පවතින ගිවිසුම් කඩකල ආචාර්යවරුන් 34 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 138,919,322 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඉන් අධ්‍යයන නිවාඩු සඳහා විදේශගතව සිටියදී 2022 වර්ෂයේදී සේවය අවසන් කර තිබුණු නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවීමට ඇති මුදල රු.72,294,305 ක් විය.

(ආ) ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS) වෙනුවෙන් 2019, 2020 හා 2021 වර්ෂවල දරන ලද විදුලි වියදමෙන් අයවිය යුතු රු. 2,237,312 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඇ) 2018 වර්ෂයේදී කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයට විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලින් ලබා දී තිබුණු රු.5,000,000 ක ණය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඈ) වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා පැරණි එකතුව රු.20,663,677 ක් වූ ගෙවිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි.

(ඉ) 2020 හා 2021 වර්ෂවලදී රු. 16,930,946 ක් වැයකර සංවර්ධනය කර තිබුණු නීති පීඨයේ ශ්‍රවණාගාරය සඳහා අවශ්‍ය පුටු මිලදී ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ශ්‍රවණාගාරය උපයෝජනය කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2023.08.25

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය.

කොළඹ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කොළඹ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙණු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) *(iii)* වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 *(1) (ඈ) (iv)* වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**	
2021 දෙසැම්බර් *21* දිනැති අංක 03/2021 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය	දේශීය අරමුදලින් විදේශ අධ්‍යයන සංචාර සඳහා වියදම් දැරීම අත්හිටුවා තිබුණද විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී විදේශ අධ්‍යයන චාරිකා වෙනුවෙන් රු.9,249,795 ක් දේශීය අරමුදලින් වැයකර තිබුණි.	මෙම රු.*9,249,795* වියදම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ මධ්‍යම භාණ්ඩාගාරයේ අරමුදල් භාවිතා නොකරමින් Centers හා Research Grants යටතේ මුදල් වියදම් කර සිදු කරන ලද්දකි. එබැවින් මෙම ඡේදය හා එකඟ නොවේ.

11020-0211	*FOREIGN - MEDICINE*	*65,000.00*
11020-0219	*FOREIGN - Sri Palee Campus*	*185,000.00*
11020-0221	*FOREIGN*	*390,500.00*
	Research (Art Faculty)	*5,820,000.00*
11020-0253	*Foriegn - Funds*	*2,237,502.00*
11020-0301	*FOREIGN - Teaching Resources*	*500,000.00*
11020-1002	*FOREIGN - FL-DEPT.PUBLIC & INTERNATIONAL LAW*	*32,832.75*
11020-1203	*FOREIGN - FMGT-DEPT.FINANCE*	*18,960.00*
		9,249,795.00

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.	
2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.	
2.3 අනෙකුත් කරුණු ----------	
(අ) වර්ෂ 1 ත් 35 ත් අතර කාලයක සිට පවතින ගිවිසුම් කඩකල ආචාර්යවරුන් 34 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.138,919,322 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඉන් අධ්‍යයන නිවාඩු සඳහා විදේශගතව සිටියදී 2022 වර්ෂයේදී සේවය අවසන් කර තිබුණු නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවීමට ඇති මුදල රු.72,294,305 ක් විය.	2022.12.31 දින වනවිට විගණන විමසුමේ ආචාර්යවරු 39 බැඳුම්කර ගිවිසුම් කඩකර ඇති අතර එම ආචාර්යවරු 39 දෙනාට අදාළව **2023.08.08** දිනට වර්තමාන තත්ත්වය පහත දැක්වේ. මෙම බැඳුම්කර කඩකළ ආචාර්යවරුන් 39 අතරින් 13 දෙනෙකු 2022 වසරේ බැඳුම්කර කඩකර ඇත. එම ආචාර්යවරු 13 දෙනාට අදාළ වර්තමාන තත්ත්ව පහත දක්වා ඇත. • 2023.08.08 දිනට සම්පූර්ණ බැඳුම්කර මුදල ගෙවා නිමකල ආචාර්යවරු 03 දෙනෙකි. එම මුදල ලෙස රු15,351,346.59 විශ්වවිද්‍යාලය එම ආචාර්යවරු තිදෙනාගෙන් අයකර ගෙන ඇත. • ආචාර්යවරු තුන් දෙනෙකු බැඳුම්කර මුදලේ කොටසක් වශයෙන් රු.23,295,520.09 සෘජු ගෙවීම් හා පාරිතෝෂික මුදල ලෙස අයකරගෙන ඇත. ඉතිරිය විශ්‍රාම වැටුප, අර්ථසාධක අරමුදල තුළින් අයකර ගැනීමට තම කැමැත්ත පලකර ඇති අතර එම ආචාර්යවරුන්ට අදාළ විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමුකර ඇත. • එක් ආචාර්යවරයෙකුගෙන් බැඳුම්කර මුදල, කොටසක් ලෙස රු.11,327,657.65ක මුදලක් විශ්‍රාම වැටුප, අර්ථසාධක අරමුදල හා සෘජු ගෙවීම් ලෙස අයකරගෙන ඇති අතර ඉතිරිය වාරික වශයෙන් වසරක් ඇතුළත ගෙවීමට එකඟ වී ඇත. ඒ අනුව ඔහුගෙන් රු.982,016.33 මුදලක් (පොලියද සමඟ) වාරික තුනකදී අයකරගෙන ඇත. 08.08.2023 වන විට

	ඔහුගෙන් මුළු මුදල ලෙස රු.12,309,673.98ක මුදලක් පොලියද ඇතුළුව අයකරගෙන ඇත. • ආචාර්යවරුන් දෙදෙනෙකු බැඳුම්කර මුදල කොටසක් ගෙවා ඉතිරිය ගෙවීමට සීමිත කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇති අතර ඒ අනුව එම මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමින් ඇත. • එක් ආචාර්යවරයෙකු ගෙවීම පැහැර හැර ඇති නිසා එයට එදිරිව නීති මඟින් කටයුතු කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. එහෙත් එසේම බැඳුම්කර ගිවිසුමේ අංක 15(a) ප්‍රකාරව අර්ථසාධක අරමුදල විශ්වවිද්‍යාලයට ලබා ගැනීමට අර්ථසාධක අරමුදල් පත්‍රිකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. කෙසේ වෙතත්, 2023.07.13 දිනැති අංක 04/2023 කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව මෙම ආචාර්යවරයා නැවත සේවයේ පිහිටුවීම සඳහා පාලක සභාව වෙත මෙමෝ පත්‍රයක් ඉදිරිපත් කර ඇත. • එක් ආචාර්යවරයෙක් සම්බන්ධ බැඳුම්කර මුදල විශ්‍රාම වැටුප, අර්ථසාධක අරමුදල හා පාරිතෝෂික මුදල මඟින් සම්පූර්ණයෙන්ම පියවාගත හැකි අතර ඊට අදාළ විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමුකර ඇත. • ආචාර්යවරුන් දෙදනෙකු සම්බන්ධයෙන් බැඳුම්කර අයකර ගැනීමට කටයුතු කරමින් සිටී. • ඒ අනුව එම ආචාර්යවරු 13 දෙනාට අදාළ රු.61,338,797.68 මුදලක් 08.08.2023 දිනට පොලිය සමඟ අයකර ගෙන ඇත. ඉහත සඳහන් ආචාර්යවරු 13 දෙනාට අමතරව ඉතිරි ආචාර්යවරු 26 දෙනා 2022 වසරට පෙර වර්ෂයන්හි ගිවිසුම් කඩකල ආචාර්යවරුන් වන අතර එම ආචාර්යයවරු 26 දෙනාට අදාළ වර්තමාන තත්වය පහත දක්වා ඇත. • 2022 වසරට පෙර වර්ෂයන්හි ගිවිසුම් කඩකල ආචාර්යවරුන් දස දෙනෙකු තම බැඳුම්කර මුදල පොලිය සමඟ ගෙවා නිම කර ඇත. ඒ අනුව රු.61,675,347.85 මුදලක් 08.08.2023 දිනට ලබාගෙන ඇත. මෙම ආචාර්ය

	වරුන් තුල එක් ආචාර්යවරයෙක් බැඳුම්කර වටිනාකම වූ රු. 3,881,337.87 ක මුදල අවසන් සම්පූර්ණ මුදල ලෙස ගෙවා නඩු කටයුතු නිමාකර ඇති අතර එම ආචාර්යවරයාගේ සම්පූර්ණ පියවන ලද බැඳුම්කර මුදලද මෙම මුදල තුල අන්තර්ගත වේ. • එසේම 2022 වසරට පෙර බැඳුම්කර ගිවිසුම් කඩකළ ආචාර්යවරයකු වාරික වශයෙන් බැඳුම්කර මුදල ගෙවා ඇති අතර මේ දක්වා පොලියද සමග රු.**6,362,722.12** මුදලක් අය කර ගෙන ඇත. • ආචාර්යවරු දෙදෙනෙකුගේ බැඳුම්කර මුදල විශ්‍රාම වැටුප්, අර්ථසාධක අරමුදල් අයකර ගැනීමට කටයුතු යොදන අතර එහිදී දායකයා වගකීමට අදාළ කාලය සම්බන්ධ එකඟතාවයක් ඇතිකර ගැනීමෙන් අනතුරුව එම මුදල් අයකරගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. එමෙන්ම ආචාර්යවරු දෙදෙනාගෙන් බැඳුම්කර එකතුව වූ රු. 19,085,509.22 මුදලින් රු.13,200,826.40 මුදලක් 08.08.2023 දින වන විට අයකරගෙන ඇත. • එමෙන්ම ගිවිසුම් කඩකල ආචාර්යවරයවරුන් තුන් දෙදෙනෙකු සම්පූර්ණ බැඳුම්කර මුදල ගෙවා ඇතත් බැඳුම්කර මුදලට අදාළ පොලිය ගෙවීම දිගින් දිගටම ප්‍රතික්ෂේප කර ඇත. එය අයකරගැනීමට කටයුතු යොදා ඇත. • එසේම බැඳුම්කර කඩකල ආචාර්යවරු 07 දෙනෙක් සම්බන්ධයෙන් නඩු කටයුතු අරඹා ඇති අතර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නීති හා ප්‍රලේඛන අංශය භාරදී ඇති අතර එම මුදල් අයකර ගැනීම සම්බන්ධව කොළඹ විශ්වවිද්‍යාලයේ නීති හා ප්‍රලේඛන අංශය අවශ්‍ය කටයුතු කරමින් පවතී. • එමෙන්ම ගිවිසුම් කඩකල ආචාර්යවරයවරුන් දෙදෙනෙකු සම්පූර්ණ බැඳුම්කර මුදල ගෙවා ඇතත් බැඳුම්කර මුදලට අදාළ පොලිය ගෙවීම දිගින් දිගටම ප්‍රතික්ෂේප කර ඇත. එය අයකරගැනීමට නීතිමය කටයුතු කිරීම සඵලදායි නොවන බැවින් බැඳුම්කර කමිටුවේ තීරණයකට අනුව එම ආචාර්යවරුන්ගේ හිඟ බැඳුම්කර පොලී මුදල් එකතුව වන රු.61,869.21 මුදල 609 වන පාලකසභා අනුමැති යටතේ කපා හැරීමට තීරණය විය. • බැඳුම්කර කඩකල ආචාර්යවරුන්ගෙන් එක් අයකු තම අයවීම් නිසි පරිදි නොගෙවීමට ක්‍රියා කරන බැවින් පස්වන බැඳුම්කර කමිටුවේ තීරණයකට අනුව එම ආචාර්යවරයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් සිටී.

	• ඉහත බැදුම්කර කඩකල ආචාර්යවරුන් 26 දෙනාට අදාලව 08.08.2023 දිනට රු. 164,219,416.10 ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් පොලිය සමඟ අයකරගෙන ඇත. 2022.12.31 දිනට ශ්‍රී පාලි මණ්ඩපයට අදාළව පවතින බැඳුම්කර කඩකළ ආචාර්යවරුන් 04 ගෙන් අය විය යුතු මුදල රු.21,146,162.24 වන අතර 2022.12.31 දිනට අයකර ගත් මුදල රු. 2,030,255.20 වේ.
(ආ) ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යායතනය (NILIS) වෙනුවෙන් 2019, 2020 හා 2021 වර්ෂවල දරන ලද විදුලි වියදමෙන් අයවිය යුතු රු. 2,237,312 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.	රු.*1,059,350.85* ක මුදලක් NILIS ආයතනය විසින් *2023* වසරේ කොළඹ විශ්වවිද්‍යාලය වෙත ප්‍රතිපූර්ණය කර ඇත.
(ඇ) 2018 වර්ෂයේදී කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයට විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලින් ලබා දී තිබුණු රු. 5,000,000 ක ණය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.	*2023* වර්ෂයේදී අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) වර්ෂ 01 සිට 03 දක්වා පැරණි එකතුව රු.20,663,677 ක් වූ ගෙවිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි.

දිනය	පුද්ගලයා / ආයතනයේ නම	විස්තරය	මුදල (රු.)	
21.12.2021	Hi End Products and Solutions (Pvt) Ltd	Payable to camera Equipment AV Unit	11,019,770	මෙම මුදල් අදාළ සේවා සැපයුම් ආයතනයට ගෙවීමට රටේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් මහාභාණ්ඩාගාරය මගින් විශ්වවිද්‍යාල සඳහා ප්‍රාග්ධන අරමුදල් ලබා දීම සීමා කර තිබුනු හෙයින් ගෙවීම් කිරීමට නොහැකි විය. *2023* වසරේදී ගෙවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලැබේ.
31.12.2020		Medical Faculty Balance (Temptation World Charity)	5,053,353	වෛද්‍ය පීඨයෙහි Temptation World Charity සඳහා *10.07.2020* දින විදේශ ගිණුමට ඩොලර් *104,255.55* (රු.*19,361,736.06*) මුදලක් ලැබුනු අතර, එම මුදලින් ඩොලර් *75,449.80* (රු.*14,308,383.00*) මුදලක් ගෙවීම් සිදු කර ඇති අතර ඉතිරි මුදල ගෙවීමට අදාළ වියදම් වවුචර් මේ වනතුරු ලැබී නොමැති බැවින් මෙම මුදල (රු.5,053,353.00) ගෙවිය යුතු අන්තර් ගිණුම්හි ඉතිරි වී ඇත. මෙම මුදල *2023* වර්ෂයේ වෛද්‍ය පීඨයට ගෙවීමට කටයුතු කරනු ලැබේ.


		03.05.2021		Suhaibdeen Mohd Abdeen Alim	595,292	මෙම මුදල් හඳුනා නොගත් ලැබීම් බැවින් *2023* වර්ෂයේ ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ.
		03.05.2021		100000000521 6001460	19,915	
		10.11.2021		1-521 6001460	14,161	
		31.12.2020	Alumni Association UOC	Swimming Pool	2,277,020	මෙම මුදල කොළඹ විශ්වවිද්‍යාලීය ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ පිහිනුම් තටාකය ඉදි කිරීම සඳහා පරිත්‍යාග කරන ලද්දකි. මේ වන විටත් පිහිනුම් තටාකයේ කටයුතු ආරම්භ නොවූ බැවින් එම මුදල ඉදිරියේදී වෙනත් කටයුත්තක් සඳහා යෙදවීමට ආදි විද්‍යාර්ථයන්ගේ සංගමය සමඟ සාකච්ඡා කර කටයුතු කරනු ඇත.
		31.01.2021	Study on Prevalence of Gauche Grant	4110806 Contribution	156,974	2023.04.19 වන දින ගෙවා ඇත.

02.03.2019	MOHE & CA	Mr. Hassan Anwar	100,000	රු.*25,000.00* ක මුදලක් *2023* ජනවාරි මස ගෙවීම් කර ඇත ඉතිරි මුදල අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යවා ඇත
03.03.2019	MOHE & CA	Ms. Suha Waheed	90,000	
5.11.2019	MOHE & CA	Ms. Suha Waheed	180,000	
12/31/2021	Late charges Payable	Analytical instruments	1,684,166	00134/2020 දරණ Delivery Note අනුව භාණ්ඩ බාරදී ඇත්තේ 2020.11.20 දිනදීය. ඒ අනුව ප්‍රමාද ගාස්තු අයකර ඇත. නමුත් අදාළ භාණ්ඩ 2020.10.09 දින බාරදුන් බවට කෘෂි තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධාන විසින් සහතික කොට ඇත. ඒ අනුව මෙම මුදල අදාළ සැපයුම්කරු වෙත නැවත ගෙවීමට කටයුතු කරනු ඇත.
			21,190,651	

(ඉ) 2020 හා 2021 වර්ෂවලදී රු. 16,930,946 ක් වැයකර සංවර්ධනය කර තිබුණු නීති පීඨයේ ශ්‍රවණාගාරය සඳහා අවශ්‍ය පුටු මිලදී ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ශ්‍රවණාගාරය උපයෝජනය කර නොතිබුණි.	*2022* වර්ෂයට වෙන්කර තිබූ මුදල් නොලැබීම සහ *2022.04.06* දින නිකුත් කරන ලද රාජ්‍ය අයවැය චක්‍ර ලේඛ අංක *03/2022* මගින් සියලු රාජ්‍ය වියදම් පාලනය කරන ලෙසත්, වැඩ හා භාණ්ඩ මිලදී ගැනීම නවත්වන ලෙසද දැනුම්දෙන ලද බැවින් ඒ අනුව ඒ සඳහා අනුගත වී ඇත. එම යෝජනාව අනුමත කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී. ඉහත විස්තර කර ඇති පරිදි රටෙහි පවතින අර්බුදකාරී තත්වය මත වියදම් කපා හැර ඇති බැවින් ප්‍රාග්ධන යෝජනා සැලසුම් අනුමත කිරීම භාණ්ඩාගාරය විසින් තාවකාලිකව නවතා ඇති බවද කාරුණිකව දන්වනු කැමැත්තෙමි.

Sign

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න
උපකුලපති



University of Colombo
No:94,
Cumarathunga Munidasa Mw,
Colombo 03
Sri Lanka

Web: www.cmb.ac.lk
Email: vc@cmb.ac.lk / registrar@cmb.ac.lk
Facebook: www.facebook.com/university.colombo
Twitter: twitter.com/colombouni
Tel: +94 11 2581835

© 2023 Academic and Publications, UOC. All Right Reserved

mila Sandaruwan
Photography